# පුනර්ජීවනය

ගුවන්තොටුපළ සහ ගුවන්සේවා
(ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව 2023

# පුනර්ජීවනය

අපි පෙර වාර්තාවේ උද්දීපනය කළ ඉහළ යෑම අනුගමනය කරමින්, සමාලෝචිත වර්ෂය තුළ අපගේ ආගන්තුක සත්කාර සන්නාමය සඳහා ඉල්ලුමෙහි සැලකිය යුතු වැඩිවීමක් දුටුවෙමු.

අප කෙරෙහි ඔවුන්ගේ ඇති පක්ෂපාතිත්වය සහ විශ්වාසය පිළිබඳ සාක්ෂි සපයමින් ලොව පුරා සිටන, නැවත පැමිණෙන අමුත්තන්ගේ පැමිණීමේ වැඩිවීමක් ඇති අතර ඒ පිළිබදව අපි අතිශයින් කෘතඥ වෙමු. සුවිශේෂී පාරිභෝගික සේවාවක් හරහා විශ්මයජනක අත්දැකීමක් ලබා දීමට අපගේ කැපවීම පිළිබදව පැහැදුණු නව ජනවිකාසයක් ආකර්ෂණය කර ගැනීමට අපට හැකියාව ලැබී ඇත.

දිවයින වටා පිහිටි විවිධ ගුවන්තොටුපළවල් වල ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වෙහෙස නොබලා කටයුතු කළ අපගේ කැපවූ සේවකයින්ගේ සහයෝගය නොමැතිව මෙම පුනර්ජීවනය අත්කරගත නොහැකි වනු ඇත.

එපමනක් නොව, වෙළඳපොලේ විකාශනය වන ඉල්ලීම් සපුරාලීමට හැකි නව ක්‍රම පිළිබදව අප නිරන්තරයෙන් අවදියෙන් සිටින බැවින් අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීමට අනුවර්තනය වීමට සහ විවර්තනිය වීමට අපගේ ව්‍යාපාරයට හැකියව ලැබී ඇත. අපි අනාගතය පිළිබදව උද්යෝගිමත්ව ඉදිරියට යන අතරතුර, දේශීය දක්ෂතාවයෙන් ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ පිරිනැමීම් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සහ පුළුල් කිරීමට කැපවී සිටිමු.

පුනර්ජීවනය හරහා, අපි වෙන කවරදාටත් වඩා ශක්තිමත් සහ ප්‍රත්‍යස්ථිතික ලෙස මතු වනු ඇත.

# පටුන

8 මූල්‍ය සුවිශේෂිතා
9 කාර්යසාධන සුවිශේෂිතා
10 ආයතනික ව්‍යුහය
11 වසරේ සාරාංශය
12 සභාපතිතුමාගේ පණිවුඩය
16 නායකත්ව කණ්ඩායම
22 ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම
25 සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව
32 විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව (AMC)
35 කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය
52 මූල්‍ය සමාලෝචනය
57 මානව සම්පත් කළමනාකරණය
63 අවදානම් කළමනාකරණය
68 යහපාලනය
75 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව
88 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
89 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
90 හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය
91 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
92 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
121 දස වසරක සාරාංශය
122 අප හා සබැඳි ගුවන්සමාගම් සහ ගුවන්යානා ගොඩ බැස්විය හැකි විවිධ ස්ථාන
124 ආයතනික තොරතුරු



# දැක්ම

"තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම"

# මෙහෙවර

"ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තෘප්තිය තහවුරු කිරීම සඳහා තරඟකාරී, ආරක්ෂිත ගුවන්සේවා සහ නවීන තාක්ෂණයෙන් හා වඩා හොඳ පරිචයන්ගෙන් සමන්විත වූ විශිෂ්ඨ වූ ආගන්තුක අත්දැකීම් ලබා දීම"



සැ.යු.:
මෙය ඉංග්‍රීසි වාර්ෂික වාර්තාවේ පරිවර්තනයක් වන හෙයින්, සංශෝධන හෝ ගැටළු ඇත්නම් කරුණාකර ඉංග්‍රීසි වාර්ෂික වාර්තාව භාවිතා කරන්න.





# පුනර්ජීවනය

## ව්‍යප්තිය හා වර්ධනය

**1930**
- එක්සත් රාජධානිය සහ ඉන්දියාව අතර ගුවන් තැපැල් සේවාව ශ්‍රී ලංකාව හරහා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා අග්‍රාණ්ඩුකාරවරයා විසින් සාකච්ඡා කරනු ලැබීම්

**1934**
- රත්මලානෙහි ගගන යාත්‍රාංගනයක් ඉදිකිරීමට ලංකා රාජ්‍ය සභාව තීරණය කිරීම්

**1936**
- රත්මලානේ ගගන යාත්‍රාංගනය නිම කිරීම්
- ලංකා ගුවන් සමාජය විසින් මහජනතාවට ගුවන් ගමන් අවස්ථා සැලසීම්

**1937**
- පළමු ගුවන් සංචලන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම
- ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සලකුණු දරන පළමු ගුවන් යානා තුන ගුවන් යානා ලේඛනයට ඇතුළත් කිරීම්

**1938**
- පෙබරවාරි 28 වන දින රත්මලාන ගුවන්තොටුපළ (ර.ගු.) විවෘත කිරීම.
- සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂවරයා ලෙස රාජ්‍ය වැඩ අධ්‍යක්ෂවරයා පත් කිරීම.

**1968**
- විශාල පර්යන්ත ගොඩනැගිල්ලක්, ගුවන්යානා නැසිරවීමේ අංගනයක් සහ ගුවන් ධාවන පථයට පිවිසුම් මාර්ගය ඉදිකිරීම.

**1979**
- ජාතික ප්‍රවාහකයා ලෙස එයාර් ලංකා ගුවන්සේවය ආරම්භ කිරීම.
- 1979 දී ගුවන්තොටුපළ අධිකාරි පනත ප්‍රකාශයට පත්කර, ගුවන්තොටුපළ අධිකාරිය පිහිටුවාලීම.

**1980**
- ගුවන්තොටුපළ අධිකාරිය විසින් සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව වෙතින් සිවිල් ගුවන්තොටුපළ මෙහෙයුම් පවරා ගැනීම.

**1981**
- ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා කටයුතු සඳහා රජය සතු සමාගමක් පිහිටුවීමට රජය තීරණය කිරීම.

**1982**
- ගුවන් නාවික පනත වෙත සංශෝධන සිදු කිරීම.

**1983**
- ගුවන්තොටුපළවල සමස්ත සංවර්ධනය, නඩත්තු කිරීම, පරිපාලනය සහ සේවා සැපයීම අධීක්ෂණය කිරීම සඳහා ගු.ගු.සේ.ස. ස්ථාපිත කිරීම.

**1984**
- නව ධාවන පථයක්, මඟී පර්යන්ත ගොඩනැගිල්ලක්, භාණ්ඩ ගොඩබහාලන සංකීර්ණයක්, පාලක කුළුනු සහ සංඥා සේවා සහ නඩත්තු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සංවර්ධන වැඩසටහනක් ආරම්භ කිරීම.

**1987/88**
- වාර්ෂිකව මිලියන 3.5 ක මඟීන් ප්‍රමාණයක් හැසිරවීමේ ධාරිතාවයෙන් යුත් නව ධාවන පථය සහ මඟී පර්යන්ත ගොඩනැගිල්ල ආරම්භ කිරීම.

**1992**
- ගුවන් භාණ්ඩ බහාලුම් ගම්මානය විවෘත කිරීම.

**1998**
- ඩුබායි පදනම් වූ එමිරේට්ස් සමාගම විසින් එයාර් ලංකා සමාගම අර්ධ වශයෙන් අත්පත් කර ගැනීමෙන් පසුව "ශ්‍රී ලංකන් ගුවන් සමාගම" ලෙස සන්නාමගත කිරීම.

**2005**
- ගුවන් පාලම් අටක්, පුළුල් කළ පර්යන්තය, විවේකාගාර සහ වෙනත් පහසුකම් සමඟින් නව පර්යන්තයක් ඉදිකිරීමෙන් ගුවන්තොටුපළට සම්පූර්ණයෙන්ම නව මුහුණුවරක් එක් කිරීම.

**2008**
- ගු.ගු.සේ.ස. විසින් සිය 25 වන රිදී ජුබිලිය සැමරීම.

## අපගේ ඓතිහාසික සන්ධිස්ථාන

එවකට 'දිවයින' හරහා ගුවන් මාර්ග සේවාවක් ආරම්භ වීමත් සමග ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස.) හි මූලාරම්භය වර්ෂ 1932 දක්වා දිවයයි. එතැන් පටන් ගෙවී ගිය අනූ දෙවසර පුරා සෑම ආකාරයකින්ම ගුවන්සේවා කේන්ද්‍රස්ථානය වෙනස්කම් වලට භාජනය වී ඇත. සෑම කාලයකදීම ඉදිරි ගමන් මඟ ශක්තිමත් කරනු ලබන නව සංවර්ධනයන් සහ වෙනස්කම් දැකගැනීමට හැකි විය. "තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම" යන දැක්ම පෙරදැරි කරගනිමින්, ගු.ගු.සේ.ස. විසින් සිය විශිෂ්ටත්වය කරා යන ගමනේ කාර්යභාරය නිමවා ඇත. වර්තමානයේ ගු.ගු.සේ.ස. විසින් ලොව පුරා සිටින සිය සියලුම පාර්ශවකරුවන් වෙත මහඟු සේවයක් දායාද කරනු ලබයි.

1983 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සියලුම ගුවන් තොටුපළවල්හි සමස්ත සංවර්ධනය, නඩත්තුව, පරිපාලනය සහ සේවා සැපයුම ඔස්සේ ගු.ගු.සේ.ස. විසින් සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. එහි සංස්ථාගත කිරීමත් සමඟ, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) සාමාජිකයෙකු ලෙස රාජකාරි භාර ගැනීමට රජයේ නියෝජිතයා ලෙස ගු.ගු.සේ.ස. පත් කරන ලදී.

**2022**
- ඉහළ මට්ටමේ සේවා ලබා ගන්නා මඟීන් සඳහා 'විශිෂ්ඨ ගුවන්තොටුපළ අත්දැකීමක්' ලබා දීම සඳහා **'ගෝල්ඩ් රූට්'** විවේකාගාර සේවාව ආරම්භ කිරීම.

**2023**
- නව පැමිණීමේ ඉලෙක්ට්‍රොනික සාප්පු සංකීර්ණය මඟීන්ට නව අත්දැකීමක් ලැබදේ.

**1939**

- පුත්තලමේදී හදිසි ගොඩබෑමක් සිදු කිරීම.

**1942**

- දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමත් සමඟ, රත්මලාන ගුවන්තොටුපළේ කටයුතු රාජකීය ගුවන් හමුදාව යටතට පත්වීම.

**1945**

- එක්සත් රාජධානිය - ඕස්ට්‍රේලියාව - 'ලැන්කස්ට්‍රියානු' ගුවන්සේවය ශ්‍රී ලංකාව හරහා ආරම්භ කිරීම.

**1946**

- ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව පිහිටුවාලීම.
- රත්මලාන ගගන යාත්‍රාංගනය සිවිල් ගුවන් ගමන් සඳහා රාජකීය ගුවන් හමුදාව විසින් පවරා ගැනීම.

**1947**

- එයාර් සිලෝන් - ජාතික ගුවන්සේවය, සන්නිවේදන සහ වැඩ අමාත්‍යාංශය යටතේ පිහිටුවාලීම.
- යාපනය හරහා කොළඹ සිට මදුරාසියට ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කිරීම.

**1948**

- ශ්‍රී ලංකාව, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) සාමාජිකයෙකු ලෙස පත් කිරීම.

**1950**

- 1950 අංක 15 දරන ගුවන් නාවික පනත ප්‍රකාශයට පත්කිරීම.
- නියමුවන් පුහුණු කිරීම සඳහා ආයතනයක් පිහිටුවාලීම.

**1955**

- එයාර් සිලෝන් සමාගම, KLM රාජකීය ලන්දේසි ගුවන් සමාගම සමඟ ගිවිසුමකට එළඹීම.

**1959**

- ජාත්‍යන්තර ගුවන් ගමන්, කටුනායකට ගෙන යාම.

**1963**

- කටුනායක ගුවන්තොටුපළ සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීම.
- RAF ධාවන පථය, කැනඩා රජයේ ආධාර මත මීටර් 1,840 සිට මීටර් 3,350 දක්වා පුළුල් කිරීම.
- වසරකට මගීන් 150,000 ක් හැසිරවිය හැකි පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

**1967**

- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.ජා.ගු.) විවෘත කිරීම.

**2010**

- 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු ලෙස ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා ක්‍රියාත්මක කිරීම සඳහා ගු.ගු.සේ.ස. වෙත සහතිකය සහ බලපත්‍රය නිකුත් කිරීම.

**2012**

- පළමු ගුවන් යානය 1912 දෙසැම්බර් 7 වන දින කොළඹ තුරඟ තරඟ පිටියේදී සිය සාර්ථක ගුවන් ගමන ආරම්භ වීමත් සමග සිවිල් ගුවන්සේවා අංශය වසර 100ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**2013**

- ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ වන හම්බන්තොට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.රා.ජා.ගු.) විවෘත කිරීම.

**2015**

- ම.රා.ජා.ගු. ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, රජය විසින් ම.රා.ජා.ගු හිදී ගුවන් සමාගම් සඳහා ලබා ගත හැකි ගුවන්සේවා නව වැදෑරුම් නිදහස සහිත පූර්ණ "විවෘත අහස ප්‍රතිපත්තියක්" ප්‍රකාශයට පත් කිරීම.

**2017**

- A 380 ගුවන්යානාවන්ට ඉඩපහසුකම් සලසමින් බ.ජා.ගු. හි ධාවන පථයේ පළල මීටර් 60 සිට මීටර් 75 දක්වා පුළුල් කිරීමෙන් "එෆ් කේත" අනුකූලතාවයට උසස් කිරීම.

**2018**

- මඩකලපුව ගුවන්තොටුපළ, සිවිල් මෙහෙයුම් සඳහා නැවත විවෘත කිරීම.

**2019**

- යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (යා.ජා.ගු.) නැවත විවෘත කිරීම.

**2020**

- බ.ජා.ගු. 2 වන පර්යන්තය හි මුල් ගල තැබීම.

**2021**

- නවීකරණය කරන ලද "අරලිය විවේකාගාරය" ව්‍යාපාරික පන්තියේ මගීන් සඳහා විවෘත කිරීම.
- **ගූගල්** ගෘහස්ථ සිතියම් පහසුකම බ.ජා.ගු හි ආරම්භ කරමින්, ශ්‍රී ලංකාවේ මෙම විශේෂාංගය සක්‍රීය කළ පළමු ආයතනය ලෙස ඉතිහාසගත වීම.

# මූල්‍ය සුවිශේෂිතා

| | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන | 2023/2022<br>+/- % | 2021<br>රු. මිලියන | 2022/2021<br>+/- % |
|---|---|---|---|---|---|
| **ලාභය සහ අලාභය** | | | | | |
| පිරිවැටුම | 38,376 | 27,577 | 39% | 7,879 | +100% |
| ක්ෂය කිරීම් වලට පෙර මෙහෙයුම් වියදම් | 16,940 | 12,575 | 35% | 9,006 | 40% |
| **පොළී, බදු සහ ක්ෂය කිරීම් වලට පෙර ඉපයුම්** | 21,382 | 14,953 | 43% | (1,176) | +100% |
| ස්ථාවර වත්කම් ක්ෂය | 2,121 | 2,367 | -10% | 2,648 | -11% |
| ශුද්ධ මූල්‍ය පිරිවැය / (ආදායම) | (14,324) | 6,202 | +100% | (2,815) | -100% |
| බදු පෙර ලාභය | 33,639 | 6,433 | +100% | (961) | +100% |
| ආදායම් බදු | 5,517 | 1,630 | +100% | 1,123 | 45% |
| බදු පසු ලාභය | 28,122 | 4,803 | +100% | (2,084) | +100% |
| කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය / (අලාභය) | 28,122 | 4,803 | +100% | (2,084) | +100% |
| **මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ | 5,500 | 500 | +100% | - | +100% |
| දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමාන දෑ | 3,171 | 642 | +100% | 413 | 56% |
| වසර සඳහා මුළු ප්‍රාග්ධන වියදම | 5,032 | 7,032 | -28% | 22,960 | -100% |
| **මූල්‍ය තත්ත්වය** | | | | | |
| දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ අරමුදල් | 67,611 | 45,257 | 49% | 41,314 | 10% |
| දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් හි මුළු ධාරන වටිනාකම | 84,533 | 88,491 | -4% | 79,414 | 11% |
| දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වත්කම් | 107,010 | 91,039 | 18% | 47,430 | 92% |
| දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වගකීම් | 32,348 | 21,195 | 53% | 7,927 | +100% |

වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය විටෙක පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.
-100% හෝ +100%, 100% ට වඩා වැඩි විචලනයන් දක්වයි.
සියලුම සංඛ්‍යා වැටයීමේ වෙනස්කම් වලට යටත් වේ.



# කාර්යසාධන සුවිශේෂිතා



| | | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් සුවිශේෂිතා** | | | | | | |
| ජාත්‍යන්තර ගුවන්යානා සංචලන | සංඛ්‍යාව | 46,639 | 37,641 | 21,204 | 20,881 | 62,195 |
| මගී සංචලන* | සංඛ්‍යාව | 7,548,646 | 5,503,198 | 1,505,479 | 2,375,056 | 9,958,688 |
| භාණ්ඩ සංචලන** | මෙ.ටො | 158,911 | 173,597 | 200,179 | 150,075 | 259,089 |
| හරහා පියාසර සංචලන | සංඛ්‍යාව | 35,506 | 23,846 | 9,339 | 16,370 | 45,674 |
| දෙසැම්බර් 31 දිනට මුළු සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 3,940 | 3,854 | 3,985 | 4,098 | 4,182 |
| **අනුපාත සුවිශේෂිතා** | | | | | | |
| හිමිකම් මත ප්‍රතිලාභ | % | 42 | 11 | (5) | (7) | 28 |
| බදු පෙර ශුද්ධ ලාභය, මුළු ශුද්ධ ආදායමට | % | 88 | 23 | (12) | (47) | 59 |
| බදු පෙර ශුද්ධ ලාභය, කොටස් හිමියන්ගේ අරමුදලට | % | 50 | 14 | (2) | (10) | 39 |
| මුළු ආදායම මුළු වත්කම්වලට | වාර | 0.20 | 0.15 | 0.06 | 0.08 | 0.24 |
| එක් සේවකයෙකු සඳහා වන මුළු වත්කම් | රු. 000 | 48,615 | 46,583 | 31,830 | 25,187 | 25,891 |
| එක් සේවකයෙකු සඳහා මුළු කාර්ය මණ්ඩල පිරිවැය- වසරකට | රු. 000 | 2,789 | 2,594 | 1,881 | 1,811 | 1,944 |
| එක් ගුවන්යානාවක් හැසිරවීම සඳහා වන මුළු පිරිවැය | රු. 000 | 325 | 727 | 574 | 738 | 235 |
| එක් මගියෙකුගේ සංචලන ආදායම | රු. | 5,084 | 5,011 | 5,234 | 3,373 | 2,580 |
| එක් මගී සංචලන සඳහා බදු පසු ලාභය | රු. | 3,725 | 873 | (1,384) | (1,054) | 1,104 |
| එක් සේවකයකු සඳහා වන ගුවන් යානා සංචලන | සංඛ්‍යාව | 12 | 10 | 5 | 5 | 15 |
| එක් ගුවන් යානයකට මගීන් | සංඛ්‍යාව | 162 | 146 | 71 | 114 | 160 |
| එක් සේවකයෙකුට මගීන් | සංඛ්‍යාව | 1,916 | 1,428 | 378 | 580 | 2,381 |
| තෝලන අනුපාතය | % | 3 | 40 | 39 | 19 | 13 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ | % | 15 | 3 | (2) | (2) | 10 |
| ශුද්ධ ලාභ අනුපාතය | % | 73 | 17 | (26) | (31) | 43 |
| ප්‍රාග්ධන ඵලදායිතා දර්ශකය | වාර | 0.22 | 0.17 | 0.08 | 0.10 | 0.25 |
| කොටසක ඉපැයුම් | රු. | 140,607 | 24,013 | (10,417) | (12,522) | 54,979 |
| ජංගම අනුපාතය | වාර | 3.31 | 4.30 | 5.98 | 7.68 | 7.23 |
| මුළු ආදායමට මුළු වියදම | වාර | 3.22 | 1.24 | 0.92 | 0.76 | 2.04 |

* මගී සංචලනයන්හි ඇතුළත් වන්නේ පැමිණීම, පිටවීම, මාරු වීම සහ මාර්ගස්ථ මගීන් වන අතර අභ්‍යන්තර ගුවන් මගීන් ඇතුලත් නොවේ.
** ගුවන් භාණ්ඩ සංචලයන්ට ඇතුළත් වන්නේ අපනයන, ආනයන සහ ප්‍රති පැටවීම් වන අතර අභ්‍යන්තර භාණ්ඩ සහ ගුවන් ලිපි ඇතුලත් නොවේ.



# ආයතනික ව්‍යුහය

- **අධ්‍යක්ෂ මණ්ඩලය**
  - **විධායක සභාපතිතුමා**
    - සැපයුම් දාම කළමනාකරණ අංශය
    - තොරතුරු තාක්ෂණ අංශය
    - මුදල් අංශය
    - අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික කිරීමේ අංශය
    - ආරක්ෂක සේවා අංශය
    - වාණිජ සහ දේපල අංශය
    - නීති අංශය
    - ගුවන් සංතරණ සේවා අංශය
    - ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් සංතරණ ඉංජිනේරු අංශය
    - සිවිල් ඉංජිනේරු (සැලසුම් සහ නිර්මාණ) අංශය
    - ව්‍යාපෘති අංශය
    - විදුලි ඉංජිනේරු අංශය
    - ගෘහ නිර්මාණ, භූමි අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ අංශය
    - යාන්ත්‍රික ඉංජිනේරු අංශය
    - සිවිල් ඉංජිනේරු (නඩත්තු) අංශය
    - බුද්ධි සහ ආරක්ෂක මෙහෙයුම් අංශය
    - ගඟන නාවික තොරතුරු කළමනාකරණ ඒකකය
    - ආරක්ෂණ ඒකකය
    - **උප සභාපතිතුමා**
      - ගුවන්තොටුපළ කළමනාකරණ අංශය
      - මානව සම්පත් අංශය
      - ගිනි සහ මුදවා ගැනීමේ සේවා අංශය
      - භාණ්ඩ සහ ගුවන් භාණ්ඩ කළමනාකරණ අංශය
      - සිවිල් ගුවන්සේවා පුහුණු අංශය
      - උපායමාර්ගික කළමනාකරණ අංශය
      - අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන අංශය
      - කලාපීය ගුවන්තොටුපළ සහ භූමි මෙහෙයුම් අංශය

*"වෛද්‍ය සේවා ඒකකය" ගුවන්තොටුපළ කළමනාකරණ අංශය යටතට පත් කර ඇත.*

# වසරේ සාරාංශය

ජාත්‍යන්තර ගුවන්යානා සංචලන

**46,639**

ජාත්‍යන්තර මගී සංචලන

**7,548,646**

ගුවන් භාණ්ඩ සංචලන

**මෙ.ටො. 158,911**

හරහා පියාසර සංචලන

**35,506**

පිරිවැටුම

**රු. මිලියන 38,376**

බදු පසු ශුද්ධ ලාභය

**රු. මිලියන 28,122**

මුළු වත්කම්

**රු. මිලියන 191,542**

සේවක සංඛ්‍යාව

**3,940**

# සභාපතිතුමාගේ පණිවුඩය



**"අප කණ්ඩායම විසින් ගන්නා ලද විශිෂ්ට උත්සාහයන් සහ උපායමාර්ගික තීරණයන් සඳහා සාක්ෂියක් වශයෙන් මෙම වසර සඳහා රුපියල් බිලියන 19ක ප්‍රශංසනීය මෙහෙයුම් ලාභයක් ප්‍රකාශයට පත් කිරීමට හැකි වීම පිළිබඳ අපි සතුටු වන්නෙමු. ඩොලරයේ අගය ඉහළ යාමද අපගේ මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් කිරීම සඳහා ධනාත්මක බලපෑමක්ව තිබේ."**

2023 වාර්ෂික වාර්තාව සඳහා වන මෙම සමාලෝචනය කෙටුම්පත් කිරීමේ දී දැකගත හැකි වූ මා සතුටට පත් කළ කරුණ නම් බොහෝ දෙනෙකු විසින් බලා සිටි ආර්ථික ප්‍රගමනයේ ආරම්භය මේ වන විට ඉස්මතුව තිබීමයි. අපගේ ඉතිහාසය තුළ අප විසින් මුහුණ දුන් දරුණුතම ආර්ථික පසුබෑමෙන් පසු යථා තත්ත්වයට පත් වීමේ ලකුණු අපි දැන් අත්විඳිමින් සිටින්නෙමු. විශේෂයෙන්ම අපගේ කටයුතුවල දියුණුව සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරමින් සංචාරක ක්ෂේත්‍රයේ පිබිදීමක් ඇතිව තිබේ.

සමාලෝචිත වර්ෂය දෙස නැවත හැරී බලන විට එය ඉතාමත් ව්‍යාකූල මෙන්ම බලවත් අභියෝග සනිටුහන් වූ කාල පරිච්ඡේදයක් බව පැහැදිලි වේ. මෙම ව්‍යාකූලතාව ගුවන් සේවා කර්මාන්තයට හුරු පුරුදු වූ දෙයක් වුවත් එවැනි අවස්ථාවන්හි දී ස්ථාවරත්වය මෙන්ම පැහැදිලි දැක්මක් තිබීම අත්‍යවශ්‍ය වේ. එවැනි ගුණාංගවලින් හෙබි පිරිසක් අප සමාගමේ ඉහළ කළමනාකාරිත්වයේ සිට නවක සාමාජිකයින් දක්වා සිටීම පිළිබඳ මම ආඩම්බර වෙමි. අපි ඉතා ශක්තිමත්ව අභියෝග සඳහා මුහුණ දුන් අතර ඒ සියලු උත්සාහයන් සඳහා නායකත්වය සැපයීමට හැකි වීම පිළිබඳ මම අවංකව ආඩම්බර වෙමි.

අන් සියල්ලටම වඩා අප කළ යුත්තේ මගීන්ගේ සුවපහසුව මෙන්ම ඔවුන්ගේ තෘප්තිය සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් කැපවී කටයුතු කිරීමට අවධානය යොමු කිරීමයි. ඉන් ඔබ්බට ගොස් මගී අපේක්ෂාවන් සාක්ෂාත් වන පරිදි උපරිම සුවපහසුව සහිතව මෙන්ම ආරක්ෂාවද සහිතව විශිෂ්ට සංචාරක අත්දැකීමක් ඇති කිරීම සඳහා කටයුතු කිරීමට සංවිධානයක් වශයෙන් අවධානය යොමු කර තිබේ.

2022 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මගී සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් දැක ගැනීමට හැකි විය. 2022 වර්ෂයේ දී අපගේ සේවාවන් සැපයීමට හැකි වූයේ මිලියන හයකටත් වඩා අඩු පිරිසකටය. එසේ වුවත්, ඊළඟ වසර තුළ එහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණු අතර එය සියළුම ගුවන්තොටුපළවල මිලියන 7.5ක් දක්වා ඉහළ ගොස් තිබුණි. මෙය ගුවන් ගමන් සඳහා වන ඉල්ලුමේ වර්ධනයක් පමණක් නොව අපගේ කාර්ය ශක්තිය ද පිළිබිඹු කරයි. මගී සංඛ්‍යාව ඉහළ යාම සමාගමේ ආදායමට පමණක් නොව සමස්ත සංචාරක කර්මාන්තයට ද බලපෑමක් ඇති කර තිබෙන අතර දියුණුව හා සමෘද්ධිය කරා රැගෙන යමින් කර්මාන්තයේ ආර්ථික පිබිදීම සඳහා සැලකියයුතු ලෙස දායකත්වය සපයා දී ඇත.

තවද, මෙම ආර්ථික දියුණුවේ වර්ධනය අපගේ මෙහෙයුම්වල ශක්තිමත්භාවය අවධාරණය කර පෙන්වයි. මගී සංචලනයන්හි සීඝ්‍ර වර්ධනය නිසා එල්ලවන අභියෝග නොතකමින් විශිෂ්ට සේවා සැපයීමක් හා පාරිභෝගික තෘප්තිමත්භාවය උසස් මට්ටමක පවත්වාගෙන යාම මගින් අප සතුව පවතින කාර්යක්ෂම බව හා අනුවර්තනය වීමේ සුවිශේෂී හැකියාව පෙන්නුම් කරයි. ගුවන් සේවා ක්ෂේත්‍රයේ එකම සේවා සපයන්නා ලෙස අපගේ කාර්යභාරය හුදු ගුවන් තොටුපළ මෙහෙයුම් වලින් ඔබ්බට විහිදෙයි. ජනතාව සහ ස්ථාන සම්බන්ධ කරමින් ද, සංචාරක අංශයේ සමස්ත සංවර්ධනයට දායක වෙමින් ද අපි ආර්ථික කටයුතු සඳහා පහසුකම් සපයන්නන් වශයෙන් සේවය සපයන්නෙමු. විශිෂ්ටත්වය සඳහා  අපගේ කැපවීම මෙන්ම සංචාරක අවශ්‍යතා සපුරාලීමට අප සතුව ඇති හැකියාව සංචාරක කර්මාන්තයේ වර්ධනය හා සාර්ථකත්වය පිටුපස ගාමක බලවේගයක් වශයෙන් ස්ථානගත කර තිබේ.

මගී සංඛ්‍යාවේ මෙකී කැපී පෙනෙන ඉහළ යාමට අමතරව යටිතල පහසුකම්වල දියුණුව ද ඉස්මතු කර දැක්වීමට අවශ්‍යය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි පළමු පර්යන්තයට හැසිරවිය හැකි මිලියන හයකින් යුතු වූ මගී ධාරිතාව ඉක්මවා සංචාරකයින් මිලියන 7.4 ක ප්‍රමාණයක් හැසිරවීමට හැකිවීම අප විසින් මුහුණ දුන් අභියෝගයකි. සෑම මගියෙක් වෙනුවෙන්ම සුවපහසු අත්දැකීමක් ලබාදීම සඳහා අප කාර්ය මණ්ඩලය දැඩි කැපවීමෙන් යුතුව වෙහෙස නොබලා කටයුතු කළහ. අපගේ සේවා විශිෂ්ටතාවයේ ප්‍රමිතීන් ආරක්ෂා කරමින් වගකීම් සහගත ලෙස සහ කැපවීමෙන් යුක්තව සේවය සැපයීමට ඔවුන්ට හැකිවීම ඉහළ ගිය මගී ධාරිතාව කළමනාකරණය කර ගැනීමට මනා පිටිවහලක් විය. පාරිභෝගික තෘප්තිය වෙනුවෙන් අප දරන අපරිමිත කැපවීම සහ අප කණ්ඩායමේ දරාගැනීමේ ශක්තිය මෙසේ ඉස්මතු වීම අපගේ ඉදිරි මෙහෙයුම් කටයුතුවලදී ඇතිවිය හැකි අභියෝග වුවද ජයගත හැකි බවට කදිම නිදසුනකි.

අප කණ්ඩායම විසින් ගන්නා ලද විශිෂ්ට උත්සාහයන් සහ උපායමාර්ගික තීරණයන් සඳහා සාක්ෂියක් වශයෙන් මෙම වසර සඳහා රුපියල් බිලියන 19ක ප්‍රශංසනීය මෙහෙයුම් ලාභයක් ප්‍රකාශයට පත් කිරීමට හැකි වීම පිළිබඳ අපි සතුටු වන්නෙමු. ඩොලරයේ අගය ඉහළ යාමද අපගේ මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් කිරීම සඳහා ධනාත්මක බලපෑමක් බවට පත්ව තිබේ. මීට අමතරව අප කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාවට නංවා තිබෙන ආරක්ෂක ක්‍රියා පිළිවෙත් මෙන්ම ඔවුන්ගේ නොසැලෙන කැපවීම වසර තුලදී වාර්තා වූ ඉතා අඩු සිදුවීම් සංඛ්‍යාව තුළින් මනාව පිළිබිඹු වෙයි.

මූල්‍ය සාර්ථකත්වයේ සහ මෙහෙයුම් විශ්වාසනීයත්වයේ මෙකී හිතකර සුසංයෝගය අපගේ මෙහෙයුම්වල සෑම සියලු අංශයකම කැපවීම අවධාරණය කරයි. එය අඛණ්ඩ වර්ධනය සඳහා අප සෑම සියලු දෙනාම සූදානම් කරන අතර කර්මාන්තයේ එකම නියමුවා වශයෙන් අපගේ ස්ථාවරත්වය නැවත නැවතත් තහවුරු කරයි. විශිෂ්ටත්වය කරා යන ගමනේදී ඉදිරියේදී මතුවිය හැකි අභියෝග සඳහා නොසැලී මුහුණ දීමේ හැකියාව පිළිබඳ අපට විශ්වාසයක් ඇත. වසරක් තුළ අප මුහුණ දෙන අභියෝග සඳහා විසඳුම් සෙවීම අත්‍යවශ්‍ය කරුණකි. විශේෂයෙන්ම රට තුළ පවතින සේවක හිඟතාවයට හේතු වූ "බුද්ධි ගලනය" සඳහා විසඳුම් සෙවිය යුතුය. විශේෂයෙන්ම ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පනවන ලද රෙගුලාසි සපුරාලීමේ නිපුණතා සපිරි වෘත්තිකයින්ගේ

# සභාපතිතුමාගේ පණිවුඩය

නික්මයාම සැලකිය යුතු බාධාවක් ඇති කළ බව පෙනී යයි. කෙසේ වුවද මේ බාධා මධ්‍යයේ වුව ද සේවක බඳවා ගැනීම් ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇති බව සතුටින් ප්‍රකාශ කර සිටිමි. අප විසින් ඉහළ ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට සහතික වෙමින් අපගේ මෙහෙයුම්වල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාවය තහවුරු කරමින් කාර්යමණ්ඩලය තුළ පවතින ගැටළු විසඳීමට ගත් ක්‍රියාශීලි පියවර අපගේ කැපවීම පෙන්වා දෙයි.

දෙවැනි පර්යන්තයේ මෑත කාලීන වර්ධනය පිළිබඳ කථිකා කිරීම අත්‍යවශ්‍යය. අවාසනාවන්ත ලෙස මේ සඳහා අනුග්‍රහකත්වය සපයන ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය සිය සහාය ලබාදීම මේ වන විට අත්හැර දමා තිබීම සැලකිය යුතු පසුබෑමක් ඇති කිරීමට හේතු වී තිබේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡාව අවසන් වන තෙක් ව්‍යාපෘතියේ වැඩ නැවත ආරම්භ කිරීමට ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනය විසින් සිය අකමැත්ත ප්‍රකාශ කර තිබේ. මීට අමතරව ඉදිරි කටයුතු පවත්වාගෙන යාමට නම් අප විසින් ඔවුන් වෙත ගෙවිය යුතු ණය පියවා දැමිය යුතුය. මූල්‍ය කරුණු නිරාකරණය කරගනිමින් දෙවන පර්යන්තයේ කටයුතු කාලෝචිත ලෙස අවසන් කිරීම සඳහා මෙම තත්ත්වය කඩිනමින් විසඳීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතර අපගේ හවුල්කරුවන් වෙනුවෙන් අපගේ යුතුකම් ඉටු කිරීමට කැපවී කටයුතු කළ යුතුය. මීට අමතරව දෙවන පර්යන්තයේ මෑත කාලීන සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් තවත් වැදගත් අභියෝගයකට මුහුණ දීමට සිදුව තිබේ. දෙවන පර්යන්තයේ අඩිතාලමේ අස්ථායිතාවක් මේ වන විට හඳුනාගෙන ඇති අතර ගුවන්තොටුපළ හා ගුවන්සේවා සමාගම විසින් එහි ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම අවශ්‍ය වේ. ව්‍යාපෘතියේ වැඩ කටයුතු නැවත ආරම්භ කිරීමට නම් මෙම කාර්ය නිම කළ යුතුවේ. අමතර කාර්යභාරය හා පවතින ව්‍යාකූලතාවන් මධ්‍යය වුවද දෙවන පර්යන්තයේ ආරක්ෂාව සහ චිරස්ථිතිය සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට අප සම්පූර්ණයෙන්ම කැපවී සිටින අතර අපගේ හවුල්කරුවන් සහ පාර්ශ්වකරුවන් සඳහා උසස් තත්ත්වය යටිතල පහසුකම් සහිත ව්‍යාපෘතියක් දියත් කරදීම සඳහා අපගේ කැපවීම මෙයින් අවධාරණය කෙරේ.

අපගේ යටිතල පහසුකම්වල අපේක්ෂිත වර්ධනය ඉස්මතු කර දැක්වීම අවශ්‍ය වේ. නුදුරු අනාගතයේදී මිලියන 9ක හෝ ඊට වැඩි අමතර මගී සංඛ්‍යාවක් සඳහා අවශ්‍ය යටතල පහසුකම් සැපයීමට අපි අපේක්ෂා කරන්නෙමු. වර්ධනය වන ගුවන් ගමන් සඳහා වන ඉල්ලුම සපුරාලීමට සහ ගුවන් මගින් සඳහා පරිපූර්ණ සංචාරක අත්දැකීමක් ලබාදීම වෙනුවෙන් අප විසින් සිදු කරන කැපවීම මෙම ව්‍යාපෘතිය කෙරෙන් ගම්‍ය වේ. ගුවන්තොටුපළ සේවාවන් හි එකම නියමුවා වශයෙන් කර්මාන්තයේ ප්‍රවණතාවන්ට අනුගත වීම තුළින් මෙන් ම අපගේ තත්ත්වය ශක්තිමත් කරමින් මෙය, අපගේ ක්‍රියාශීලී ස්ථාවරත්වය පිළිබිඹු කරයි. අපි අපගේ මගීන් සහ පාර්ශ්වකරුවන් සඳහා ගෝලීය මට්ටමේ පහසුකම් සහ සේවාවන් සැපයීම සහතික කිරීම වෙනුවෙන් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමට නොසැලී කැපවන්නෙමු.

එපමණක් නොව අපගේ පර්යන්තයේ සංවර්ධන සැලසුම් වල ප්‍රගතිය පිළිබඳ අවධාරණය කිරීම අත්‍යවශ්‍ය ය. නවතම කර්මාන්ත ප්‍රමිතීන් සහ මගී අපේක්ෂාවන් සමඟ යමින් නව පර්යන්තයේ කටයුතු වැඩිදියුණු කිරීමට අපි මහත් පරිශ්‍රමයක් දරා තිබේ. මෙම සංවර්ධන කටයුතුවල සන්ධිස්ථානයක් ලෙස 2024 වර්ෂයේ නොවැම්බර් මස සැලසුම්කර තිබෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම පිළිබඳ සුබවාදීව සිටින්නෙමු. 2026 වර්ෂය වන විට අවසන් කිරීමට අපේක්ෂිත මෙම ව්‍යාපෘතිය අති නවීන පහසුකම් සහිතව කාලෝචිත ලෙස නිම කිරීමට සැලසුම්කර ඇති අතර මෙය අපගේ කැපවීම යළි යළිත් තහවුරු කරයි.

නව පර්යන්තයේ කටයුතු අවසන් කිරීමේ කාලසීමාව දක්වා වූ අතුරු කාලසීමාවේ දී අපගේ මගීන්ට බාධාවකින් තොරව සේවය සැපයීමේ වැදගත්කම අපි හඳුනාගතිමු. මේ සඳහා දැනට පවතින පර්යන්තයේ පිරික්සුම් ප්‍රදේශය පිටත් වීමේ කවුළු තිහකින් සමන්විත, ගමන්මලු හැසිරවීමේ පහසුකම් ද සහිතව පුළුල් කිරීම් සඳහා ඉඩකඩ සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් මේ වන විට සකස් කරමින් පවතී. මීට අමතරව නවීන පහසුකම් ද ඇතුළත් කරමින් දැනට පවතින කවුළු 60 යාවත්කාලීන කරන්නෙමු. මෙම උපායමාර්ගික මුල පිරීමේ අරමුණ වන්නේ පිටත්ව යන මගීන්ගේ සියලු අත්දැකීම් ගමනාන්තය දක්වාම වැඩිදියුණු කරමින් කාර්යක්ෂමතාවය හා සුවපහසුව සහතික කරමින් පවත්වාගෙන යාමත් මගීන්ගේ ගතික අවශ්‍යතා සපුරාලමින් ඒ සඳහා කැපවී කටයුතු කිරීමත්ය.

අපගේ න්‍යාය පත්‍රයේ තවත් සැලකිය යුතු කරුණක් වන්නේ රුපියල් බිලියන 4.6ක් ලෙස ඇස්තමේන්තු ගත කර තිබෙන ආනයනික භාණ්ඩ ගබඩාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමයි. විශේෂයෙන්ම මෙහිදී සිදු කෙරෙන්නේ ආනයනික භාණ්ඩ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීමයි. මෙය අවසන් වූ පසු, ජාතික ගුවන් සේවය සමඟ පවතින අපගේ හවුල්කාරිත්වය තවදුරටත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙත කුලී පදනම මත ලබා දීමට කටයුතු කෙරේ. මෙම උපාය මාර්ගික මුල පිරීම අපගේ භාණ්ඩ හැසිරවීමේ හැකියාව වැඩිදියුණු කරනවා පමණක් නොව සමස්ත කාර්යක්ෂමතාවය සහ තරගකාරීතවය සඳහා ද දායකත්වය ලබා දේ. විශිෂ්ට සේවාවක් සහ විශ්වාසනීයත්වයේ ඉහළම ප්‍රමිතීන් සාක්ෂාත් කර ගනිමින් උසස් ව්‍යාපෘතියක් දියත් කිරීමට අපි කැපවී සිටින්නෙමු.

මගීන්ට ඇතිවන තැති ගැන්වීම අවම කිරීම අපගේ ප්‍රමුඛතම කාර්යයක් වන අතර මෙම ගැටළුව ඵලදායී ලෙස විසඳීම සඳහා අපගේ දෛනික මෙහෙයුම් කටයුතු වලදී නව ක්‍රම ක්‍රියාවට නැංවේ. මගීන්ගේ සුවපහසුව සහ ඔවුන්ට ආරක්ෂාව සැපයීම පමණක් නොව එයින් ඔබ්බට ගොස් විශිෂ්ට සේවාවක් සැපයීමට අපි උත්සහ කරන්නෙමු. සියලුම සංචාරකයින් සඳහා අනුග්‍රහය ලබා දෙමින් ගෞරවනීය වටපිටාවක් නිර්මාණය කිරීමද මෙයට ඇතුළත් වේ. මගී අයිතිවාසිකම් මෙන්ම උචිත හැසිරීම පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම පිළිබඳ පරිපූර්ණ පුහුණු වැඩසටහනක් අප කාර්ය මණ්ඩලය සඳහා හඳුන්වා දී තිබේ. මීට අමතරව දියුණු පරීක්‍ෂණ පද්ධති සහ නිර්ණාමික වාර්තා කරන නාලිකා මෙන්ම තැති ගැන්වීම් ආදිය ක්ෂණිකව හඳුනා ගැනීමට හැකි වැඩිදියුණු කරනු ලැබූ උසස් තාක්ෂණික විසඳුම් අපි ක්‍රියාත්මක කරන්නෙමු. මෙම ගැටලුව දෙස පූර්ව විනිශ්චයකින් යුක්තව විමසීම තුළින් ද අන්‍යෝන්‍ය සංස්කෘතික ගෞරවය ලබාදීමෙන් ද අප අරමුණු කරන්නේ සෑම මගියෙකුටම ඔවුන්ගේ ගමන පුරාවටම සුරක්ෂිත බවක් සහ වටිනාකමක් සහතික කිරීමට කටයුතු කිරීමයි.

පවතින මං තීරු දෙකේ මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කරමින් ගුවන්තොටුපළ වෙත ප්‍රවේශ විය හැකි ලෙස මාර්ග සම්බන්ධ කිරීමට සැලසුම් සකස් කර තිබේ. ගුවන්තොටුපළ සහ ගුවන්සේවා සමාගමේ අනුග්‍රහයෙන් මගීන් , අමුත්තන් සහ සේවක සේවිකාවන් සඳහා මාර්ග තදබදය අවම කිරීමට සහ ගුවන්තොටුපළ ප්‍රවේශය විධිමත් කරමින් මෙම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදුකෙරේ. මාර්ග ධාරිතාවය දෙගුණ කිරීම මගින් ගමනාගමන ප්‍රවාහයේ සැලකිය යුතු වර්ධනයක් ඇතිකිරීමටත් ගමන් කාලය අඩු කිරීමටත් සියලුම මාර්ග භාවිත කරන්නන්ගේ ආරක්ෂාව ඉහළ නැංවීමට කටයුතු කිරීමටත් අප විසින් අපේක්ෂා කෙරේ. මෙම මුල පිරීම පරිපූර්ණ සංචාරක අත්දැකීමක් පිරිනැමීම සඳහා අපගේ වගකීම අවධාරණය කරන අතර ගුවන්තොටුපළක අභ්‍යන්තරයේදී සහ ඉන් පිටතට වුවද බාධාවකින්

තොරව සබඳතා තහවුරු කර ගනිමින් සමස්ත ගුවන්තොටුපොළ ප්‍රජාවට ප්‍රතිලාභ සැලසෙන පරිදි කාර්යක්ෂම සහ ඵලදායි ලෙස කාරයන් ඉටු කිරීමට අපි කැප වී සිටින්නෙමු.

2023 වර්ෂය පිළිබඳ ආවර්ජනය කරන විට එය අභියෝග රාශියකින් සපිරි කාලපරිච්ඡේදයක් වුවද අපගේ ස්ථාවරත්වය නැවත තහවුරු කරමින් මෙහෙයුම් පුළුල් කිරීම සඳහා එය හැරවුම් ලක්‍ෂයකි. රජයේ විශ්වාසවන්ත ආදායම් දායකයෙකු ලෙස අපි නැවත වරක් අපගේ ස්ථාවරත්වය තහවුරු කර ඇත්තෙමු. අපගේ නායකත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දුන් විශිෂ්ට සහයෝගය සහ විශ්වාසය සඳහා ගරු අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යංශ ලේකම්තුමාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමි. මීට අමතරව අපගේ හවුල් අරමුණු ඉටුකර ගැනීම සඳහා ලබා දෙන සහයෝගය වෙනුවෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවටත්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවටත්, සෞඛ්‍ය අධිකාරියට මෙන් ම අපගේ සේවයේ අනෙකුත් ඒකාබද්ධ ආයතන වෙත මාගේ කෘතඥතාවය පළ කර සිටිමි.

අපගේ සමාගමේ මෙහෙවර ඉටු කිරීමේදී නිරතුරුවම ලබාදුන් ශුභවාදීත්වය  සහ උද්යෝගය වෙනුවෙන් උප සභාපතිතුමාටත්, ඇප කැප වී කටයුතු කළ අධ්‍යක්ෂ  මණ්ඩලයේ සියලු සාමාජිකයින්ටත් මම ස්තූතිවන්ත වෙමි. තව ද, අභියෝගාත්මක කාල වකවානුවේදී යළි නැගී සිටීමට ලබාදුන් සුවිශේෂී දායකත්වය සහ විශිෂ්ට කැපවීම වෙනුවෙන් අංශ ප්‍රධානීන්ගේ පටන් ඉදිරි කර්ය මණ්ඩල දක්වා වූ  සියලුම සේවකයින් සඳහා මාගේ අවංක ප්‍රණාමය පුද කර සිටිමි. ආපදාවන්ට එක්ව මුහුණ දෙමින් ශක්තිමත්ව බැඳී සිට එක්සත්ව කටයුතු කරමු.



**ඉංජිනේරු ඒ ගල්කැටිය**

*සභාපති*

2024 මැයි 16

# නායකත්ව කණ්ඩායම




**වමේ සිට දකුණට:**

1. ජී ඒ ඒ  ප්‍රියන්ත - විධායක නොවන අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත
2. එස් එන් සුමනසේකර - විධායක නොවන අධ්‍යක්ෂ
3. ඉංජිනේරු ඒ ගල්කැටිය - සභාපති
4. එම් එස් ඒ සේනාරත්න මිය - උප සභාපතිනිය
5. ඒ එස් සී වරුෂහෙන්නැදිගේ - විධායක නොවන අධ්‍යක්ෂ
6. ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය - විධායක නොවන අධ්‍යක්ෂ




**වමේ සිට දකුණට:**

7. නන්දන සෝමතිලක - විධායක නොවන අධ්‍යක්ෂ/අමාත්‍යාංශ නිරීක්ෂක
8. ඩබ්ලිව් එස් ඩී ද සිල්වා - විධායක නොවන අධ්‍යක්ෂ
9. ඒ ඒ රන්දෙණිය - විධායක නොවන අධ්‍යක්ෂ
10. ජී යු කේ අල්ගෙවත්තගේ - විධායක නොවන අධ්‍යක්ෂ
11. කපිතාන් මිලින්ද රත්නායක - විධායක නොවන අධ්‍යක්ෂ
12. එම් එම් රේණුකා පී ගුණසේකර මිය - සමාගම් ලේකම්

# නායකත්ව කණ්ඩායම

## ඉංජිනේරු අතුල ගල්කැටිය
සභාපති

ඉංජිනේරු අතුල ගල්කැටිය මහතා 2023 දෙසැම්බර් මාසයේදී ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර ඔහු ඉංජිනේරු සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සම්භාරයක් සහ කීර්තිමත් වෘත්තියක් සමාගමට රැගෙන එන ලදී.

පළපුරුදු ඉංජිනේරු වෘත්තිකයෙකු වන ඔහු 1987 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ගත්තේය. ඉංජිනේරු ගල්කැටිය මහතා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකු වන අතර 1991 සිට "වරලත් ඉංජිනේරු" යන ගෞරවනීය පදවිය දරයි.

වසර 34ක් පුරා විහිදුණු කීර්තිමත් වෘත්තියක් සමඟින්, ඉංජිනේරු ගල්කැටිය මහතා ශ්‍රී ලංකාව තුළ සහ ජාත්‍යන්තර තලයේ ඉංජිනේරු සහ ඉදිකිරීම් ක්ෂේත්‍ර සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. 1987 දී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයෙන් ආරම්භ වූ ඔහුගේ ගමන, අභ්‍යාසලාභී ඉංජිනේරුවෙකු ලෙස ආරම්භ වී වැඩමුර ඉංජිනේරු, මධ්‍යස්ථාන ඉංජිනේරු, නේවාසික ඉංජිනේරු, ප්‍රධාන නේවාසික ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ආදී විවිධ ප්‍රධාන තනතුරු දරමින් සහ අතිරේක සාමාන්‍යාධිකාරී දක්වා ක්‍රමක්‍රමයෙන් ඉහළට ගමන් කරන ලදී. ඔහුගේ කැපී පෙනෙන සේවා කාලය අවසන් වූයේ 2021 දී විශ්‍රාම යන තෙක් ඔහු දැරූ ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරෙනි.

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ - උපදේශක අංශයේ ඉංජිනේරු, ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශය සහ ජාත්‍යන්තර අංශය යන අංශ තුන තුලම ඉංජිනේරු ගල්කැටිය මහතාගේ දායකත්වය ව්‍යාප්ත විය. 2011 දී ඔහු සිය නායකත්ව හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ ඉදිකිරීම් අංශය වන මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගමෙහි ආරම්භක ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාව භාර ගන්නා ලදී.

ව්‍යාපෘති කළමනාකරණයේ විශිෂ්ටත්වය සඳහා වූ ඔහුගේ කැපවීම පෙන්නුම් කරමින්, ඉංජිනේරු ගල්කැටිය මහතා 2021 ඔක්තෝබර් සිට 2022 අගෝස්තු දක්වා කොළඹ වරාය නගරයේ ව්‍යාපෘති යටිතල පහසුකම් සහ භූමි අලංකරණ සංවර්ධනය සඳහා ඒකාබද්ධව පත් කරන ලද සේවා යෝජකයින්ගේ තත්ත්ව නියෝජිත (JAEQR) කණ්ඩායම් නායකයා ලෙස කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරන ලදී.

ඔහුගේ නායකත්ව කුසලතා සහ උපායමාර්ගික දැක්ම පිළිබඳ සාක්ෂි සපයමින් 2022 අගෝස්තු මාසයේදී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සහ මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමෙහි 10 වැනි සභාපතිවරයා ලෙස පත් වීමත් සමඟම ඔහුගේ කැපී පෙනෙන ගමන ඉදිරියටම ගියේය.

2023 අගෝස්තු මාසයේදී, ඉංජිනේරු අතුල ගල්කැටිය මහතා ගු.ගු.සේ.ස හි උප සභාපතිවරයා ලෙස සිය භූමිකාවට සංක්‍රමණය වූයේ ඔහුගේ කීර්තිමත් වෘත්තීය දිවියේ නව පරිච්ඡේදයක් සනිටුහන් කරමිනි. වර්තමානයේ, ආයතනයේ සභාපතිවරයා ලෙස, ඔහු ගතික ගුවන්සේවා කර්මාන්තයේ සාර්ථකත්වයේ නව තලයන් කරා සමාගම මෙහෙයවීම සඳහා අත්දැකීම්, නායකත්වය සහ ඉංජිනේරු ඥානයේ අද්විතීය සම්මිශ්‍රණයක් රැගෙන එයි. ගල්කැටිය මහතා මූල්‍ය කළමනාකරණය සහ ආදායම් උත්පාදනය මෙන්ම සියලුම ගුවන්තොටුපළෙහි ඉදිරි ගමන් මග සම්බන්ධ මණ්ඩල හි අනු කමිටුවල මුලසුන දැරූ අතර 2023 වර්ෂයේදී ගු.ගු.සේ.ස හි ව්‍යාපෘති කළමනාකරණ අනු කමිටුවේ ද සාමාජිකයෙකු විය.

## අවන්ති සේනාරත්න මහත්මිය
උප සභාපති

අවන්ති සේනාරත්න දැනට සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ උප සභාපතිනිය ලෙස කටයුතු කරයි. වසර 26කට වැඩි පළපුරුද්දක් ඇති ඇය ගුවන් සේවා, රාජ්‍ය පරිපාලනය සහ ජාත්‍යන්තර ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රවීණයෙකි. අවන්ති ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ පරිපාලන චරිතයක් වන අතර, රාජ්‍ය ව්‍යාපාර, අර්ධ රාජ්‍ය ආයතන සහ ජාත්‍යන්තර ආයතන තුළ බිම් මට්ටමේ, දෙපාර්තමේන්තු සහ අමාත්‍යංශ මට්ටමින් පුළුල් ලෙස සේවය කර ඇත. ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (ශ්‍රී. ල. ප. සේ.) ගතික, ක්‍රියාශීලී, පාර්ශ්වහෝගික කේන්ද්‍රීය ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක් වන අතර, ඇයගේ සදාචාරාත්මක ප්‍රමිතීන් පිළිපැදීම උදෙසා පිළිගැනීමට ලක්ව ඇත.

2024 ජනවාරි මාසයේදී ඇයගේ වත්මන් තනතුරට පත් වූ අවන්ති, ගු.ගු.සේ.ස. යටතේ ඇති ජාත්‍යන්තර ගුවන්තොටුපළ පහේම පරිපාලන සහ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කරයි. ඇයගේ උපායමාර්ගික අවධානය යොමු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය සඳහා වන දිගුකාලීන දැක්ම කෙරෙහි ය. මීට අමතරව, ගුවන්තොටුපළ සේවා විශිෂ්ටත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් පාර්භෝගික කේන්ද්‍රීය සංස්කෘතියක් ඇති කිරීම උදෙසා ඇය ප්‍රධාන කර්මාන්ත පාර්ශවකරුවන් සහ අභ්‍යන්තර සමාගම් දෙපාර්තමේන්තු සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරයි.

ගු.ගු.සේ.ස. හි ඇයගේ භූමිකාවට පෙර, අවන්ති 2018 සිට 2022 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ගුවන්සේවා) ලෙස සේවය කළාය. මෙම ධූර කාලය තුළ ඇය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළ අතර නීතිමය ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත් සම්බන්ධ තීරණාත්මක ප්‍රතිපත්ති තීරණ බොහොමයකට සම්බන්ධ වූවාය. එපමණක් නොව, ඇය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ජා.සි.ගු.සේ.සං.) සාමාජික රටවල් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා කළමනාකරණය කිරීමේ නිරත වූවාය. තවද, ඇය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම සමඟ අමාත්‍ය මට්ටමින් සම්බන්ධ වෙමින් සිවිල් ගුවන්සේවා නියාමන කාර්යයන් ක්‍රියාත්මක කළාය. 2022 දී ඇය ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ හි ජාතික සම්බන්ධීකාරක සහ නියෝජ්‍ය මහලේකම් ලෙස ද කටයුතු කළාය.

අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රීඩකයින් සමඟ ඇයගේ පුළුල් උපායමාර්ගික සබඳතා ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රය නව තලයකට ගෙන යාමට ගු.ගු.සේ.ස. සහ අදාළ පාර්ශ්වකරුවන් අතර සමීප සහයෝගීතාව සහ සහයෝගීතාව වර්ධනය කිරීමට උපකාරී වී ඇත. ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රය නව තලයකට ගෙන යාමට ගු.ගු.සේ.ස. සහ අදාළ පාර්ශ්වකරුවන් අතර සමීප සහයෝගීතාව සහ සම්බන්ධතාවය වර්ධනය කිරීමට අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රධානයන් සමඟ ඇයගේ පුළුල් උපායමාර්ගික සබඳතා උපකාරී වී ඇත.

**කපිතාන් මිලින්ද රත්නායක මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

හිටපු ගුවන් නියමුවෙකු වන කපිතාන් මිලින්ද රත්නායක මහතා, පැය 15,000කට අධික මගී ප්‍රවාහන ගුවන්යානා පියාසර කරමින්, අවුරුදු 40කට අධික කාලයක් එයාර් සිලෝන්, එයාර් ලංකා සහ ශ්‍රී ලංකන් ගුවන්සේවයෙහි මෙහෙයුම් පිළිබඳ ප්‍රවීණයෙකි. පියාසැරි වෘත්තිය හැරණු කොට, ගුවන් යානා මෙහෙයුම් සහ සේවා සම්පාදනය අධීක්ෂණය පිළිබඳ කළමනාකරණ අත්දැකීම් පිරි අයෙකි (ආරක්ෂාව සැලැස්වීම, මැදිරි කාර්ය මණ්ඩලය සහ බිම් හැසිරවීම). එමෙන්ම ඔහු 2018 වර්ෂයේදී ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ උප සභාපති ලෙස කටයුතු කළේය.

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය සමඟ පියාසැරි මෙහෙයුම් කණ්ඩායම නියෝජනය කරනු ලබන එකම ශ්‍රී ලාංකිකයා ඔහු වේ. ගෝල්ෆ් ක්‍රීඩා ලෝලියෙකු වන කපිතාන් රත්නායක මහතා ගුවන්සේවා කර්මාන්තයේ ධනාත්මක වෙනසක් සහ සංවර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඔහු ඕස්ට්‍රේලියාව, ඈත පෙරදිග, යුරෝපය සහ උතුරු සහ දකුණු ඇමරිකාව වෙත සංචාරය කර ඇත.

ඔහු 2022 ජූනි මාසයේ සිට ගු.ගු.සේ.ස හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු විය. ඔහු විගණන සහ කළමනාකාරිත්වය සහ සියලුම ගුවන්තොටුපළ ඉදිරි ගමන් මග සම්බන්ධ අනුකමිටුවල සාමාජිකයෙකු වන අතර අවදානම් කළමනාකරණ අනු කමිටුවෙහි මුලසුන දරයි.

**ඒ එස් සී වරුෂහෙන්නැදිගේ මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

අරුණ වරුෂහෙන්නැදිගේ මහතා 2019 දෙසැම්බර් මස පටන් ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වන අතර ඔහු අවදානම් කළමනාකරණ, සියළුම ගුවන්තොටුපළහි ඉදිරි ගමන් මග සහ ව්‍යාපෘති කළමනාකරණ අනුකමිටුන් හි සාමාජිකයෙකි. ඔහු ප්‍රාග්ධන වෙළඳපොළ කර්මාන්තයේ, ගුවන්තොටුපළ මෙහෙයුම්, ජාත්‍යන්තර ගුවන්යානා කළමනාකරණ, වෙළඳපොළ සැලසුම්, සන්නාමකරණය සහ ගුවන්සේවා උපායමාර්ග සංවර්ධන පිළිබඳ පුළුල අත්දැකීම් ඇති පළපුරුදු සභාපතිවරයෙකු/විධායක අධ්‍යක්ෂවරයෙකු වේ. වරුෂහැන්නැදිගේ මහතා ලන්ඩන් සවුත් බෑන්ක් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MSc) දරයි.

**එස් එන් සුමනසේකර මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

ශෙහාන් සුමනසේකර මහතා 2019 දෙසැම්බර් මස පටන් ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකි. වාණිජමය වශයෙන් ශ්‍රේණිගත කරන ලද ගුවන් නියමුවෙකු ලෙස ඔහු, ගුවන්සේවා කර්මාන්තයේ අවකාශයන් සහ පවත්නා ඉල්ලුම හඳුනාගැනීමට අවශ්‍ය ශක්‍යතාවයන් රැසක් සහ තාක්ෂණික දැනුම් සම්භාරයක් ඇති අයෙකි. ඔහුගේ විවිධාකාර වූ අත්දැකීම් අතරට ගුවන්සේවය, තෙල් සහ ගෑස්, නැව්ගත කිරීම් සහ සැපයුම්, ගල් අඟුරු, රසායනික සහ තාර ආශ්‍රිත නිෂ්පාදන වැනි කර්මාන්තයන් ඇතුළත් වේ.

එමෙන්ම ඔහු මැක්ලොයිඩ් හෝල්ඩිංග්ස් හි කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීතුමා වන අතර, වෙනස් ආකාරයේ ආයතන තුනක අධ්‍යක්ෂ තනතුර දරනු ලබයි. සුමනසේකර මහතා වේල්ස් විශ්වවිද්‍යාලයෙන් (එංගලන්තය) ව්‍යාපාර පරිපාලනවේදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් දරන අතර, ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් ගුවන්සේවා අධිකාරියේ වාණිජ නියමු බලපත්‍රයක් ද (FAA) දරයි.

තවද ඔහු, 40%ක් ජාතික විදුලිය සඳහා විදුලිය උත්පාදනය කරනු ලබන, ලක්විජය ගල් අඟුරු බලාගාරය වෙත බලය ලබාදෙනු ලබන සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ සභාපති ලෙස 2022 වසරේදී පත් විය.

වසර ගණනක් පුරා ඔහු පාලනය සහ නියෝජනය කරනු ලබන සමාගම් සමූහයක් සඳහා ව්‍යාපාරහි අනපේක්ෂිත වර්ධනයක් ලබා දෙමින්, සේවයේ පළපුරුද්ද සහ සැපයුම් දාමය කළමනාකරණය කරමින් දායකත්වය ලබා දී ඇත

එමෙන්ම සුමනසේකර මහතා විසින්, ජීවන තත්ත්වය නඟා සිටුවන්නට ජනතාව වෙත සහය ලබා දෙමින්, අධ්‍යාපනයේ සමානාත්මතාවය දරන්නට විවිධාකාරයේ අභිලාසයන් ඔස්සේ ශ්‍රී ලංකාවේ සිටින බොහෝමයක දරුවන්ගේ ජීවිත වෙනස් කරලීමට ලාභ නොලබන සංවිධානයක් වන "ජන සහන පදනම" හි මුලසුන දරනු ලබයි.

එමෙන්ම ඔහු ගු.ගු.සේ.ස. හි මූල්‍ය කළමනාකරණ සහ ආදායම් උත්පාදන අනු කමිටුවේ ද සාමාජිකයෙකි.

**ජී ඩී ඩී ප්‍රියන්ත මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත

ජී ඩී ඩී ප්‍රියන්ත මහතා, 2021 ජූනි සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තේරී පත් විය. සමාගමේ විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපති ලෙස කටයුතු කරනු ලබයි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව යන ආයතන දෙකෙහිම සහකාර අධ්‍යක්ෂ ඇතුලු තනතුරු බොහෝමයක සේවය කිරීමෙන්, මූල්‍ය අමාත්‍යාංශයේ වසර 18කට අධික අත්දැකීම් ඔහු සතුය. ප්‍රියන්ත මහතා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සහ මුදල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස සේවය කර ඇත. වර්තමානයේ ඔහු මුදල් අමාත්‍යාංශය සඳහා අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස (වැඩ බලන) කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු 2005 වසර පටන් බොහෝමයක් රාජ්‍ය ව්‍යවසායන් සහ රජයේ සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩල වල කටයුතු කර ඇත. ප්‍රියන්ත මහතා, කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද (B.Sc.) දරනු ලබයි.

**ඒ ඩී රන්දෙණිය මහතා LL.M (UK)**
විධායක නොවන අධ්‍යක්ෂ

රන්දෙණිය මහතා 2022 නොවැම්බර් සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තේරී පත්වන අතර සියලුම ගුවන්තොටුපළ ඉදිරි ගමන් මග සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවේ සාමාජිකයෙකු ද වේ. ඔහු අපරාධ සහ රේගු නීතිය යන ක්ෂේත්‍ර හි විශේෂඥ නීතීඥවරයෙකි. ඔහු විසින් එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර ව්‍යාපාර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (LL.M) ලබා ගෙන ඇත. ඔහු වර්තමානයේ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු, කාර්මික අධිකරණවල බේරුම්කරුවෙකු සහ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයින්ට එරෙහි විනය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික අධ්‍යාපන ආයතනයෙහි

# නායකත්ව කණ්ඩායම

නීති සම්පාදකයෙකි. ඔහු අධිකරණ අමාත්‍යාංශයේ විවිධ කමිටු හි සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලබයි. ඒ සඳහා රටේ අධිකරණ බල ප්‍රදේශ සීමා කිරීම සඳහා වූ කමිටුව, දේපළ බැහැර කිරීම පිළිබඳ විශේෂ නීතිය සංවර්ධනය කිරීම සහ නව නිෂ්පාදන බැහැර කිරීමේ යාන්ත්‍රණයක් යෝජනා කිරීම පිළිබඳ වූ කමිටුව, හිරභාරයේ තබාගැනීමට විකල්පයක් ලෙස නිවාස අඩස්සියේ තබා ගැනීම හඳුන්වාදීමේ කමිටුව සහ විනිමය පනත් කෙටුම්පත සංශෝධනය කිරීමේ කමිටුව ආදිය ඇතුළත් වේ. ඔහු 2016 සිට 2018 දක්වා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ලේකම්වරයා ලෙසත්, 2013/15 කාලය තුළ කොළඹ නීති සංගමයේ සභාපතිවරයා ලෙසත් කටයුතු කර ඇත.

## ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

අමිත විජයසූරිය මහතා එවක ජාතික ගමන් සහකරු වූ එයාර් ලංකා සමාගම සමඟින් 1981 වර්ෂයේදී සම්බන්ධ විය. වසර 38ක දුර කාලය තුළ ශ්‍රී ලංකාව සහ විදේශයේ පදනම් වූ ශ්‍රීලංකන් ගුවන්සේවයෙහි ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයක් ඔහු විසින් දරා ඇත.

ඔහුගේ මෙහෙයුම් වපසරියේ ප්‍රධාන සුවිශේෂිතා වූයේ ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ, සියලුම කැබිනට් අමාත්‍යවරුන්ගේ සහ පාර්ලිමේන්තු සාමාජිකයින්ගේ VVIP සංචාර අධීක්ෂණය කිරීමයි. එමෙන්ම ඔහු පොලිස්පති ඇතුලු හමුදා බලකායේ ප්‍රධානීන්, අමාත්‍යංශ ලේකම්වරුන්ගේ විදෙස් සංචාරයන් පිළිබඳ වැඩභාරව සිටියේය.

විජේසූරිය මහතා විකුණුම් සහ අලෙවිකරණය, මහජන සබඳතා, ප්‍රවර්ධන, රජයේ සහ මහජන කටයුතු වැනි විවිධාකාර වූ ගුවන්සේවා අංශයේ බෙහෝමයක් අත්දැකීම් ඇති අයෙකි. විශ්‍රාම ගැනීමෙන් පසුව, ශ්‍රීලංකන් ගුවන්සේවයෙහි මහජන සහ රාජ්‍ය කටයුතු පිළිබඳ උපදේශකවරයෙකු ලෙස ඔහුව නැවත පත් කරන ලදී.

ඔහු, 2019 දෙසැම්බර් 31 සිට 2022 අගෝස්තු 12 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උප සභාපති ලෙස කටයුතු කරන ලදී.

ඔහු, 2022 සැප්තැම්බර් සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කරන ලද අතර ව්‍යාපෘති කළමනාකරණ අනු කමිටුවේ හි මුලසුන දරන අතර මානව සම්පත් සහ වැටුප් අනු කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

## ඩබ්ලිව් එස් ඩී ද සිල්වා මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

සුනිල් දි සිල්වා මහතා, ආයතනික බැංකුකරණය, ප්‍රාදේශීය බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍ය, ණය කළමනාකරණය සහ අයකිරීම් යන ක්ෂේත්‍රයන් හි අවුරුදු 41ක පමණ කාලයක පළපුරුද්ද ඇති බැංකුකරුවෙකි. ඔහු සිය බැංකුකරණ වෘත්තිය ලංකා බැංකුවෙන් ආරම්භ කළ අතර, ලන්ඩනයේ ලංකා බැංකු ශාඛාවෙහි අවුරුදු තුනක සේවා කාලය ඇතුළුව ලංකා බැංකුව හි අවුරුදු 26ක පමණ කාලයක් සේවය කොට ඇත. එමෙන්ම ඔහු සෙලාන් බැංකුව පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කළමනාකරු ලෙසත්, පෑන් ඒෂියා බැංකුව පීඑල්සී හි නියෝජිත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙසත් සේවයකොට ඇත.

ශ්‍රී ලංකා බැංකුකරණ ආයතනයේ සාමාජිකයෙකු වන ඔහු, දශක දෙකකට වැඩි කාලයක් එහි බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කොට ඇත. IBSL බැංකුකරණ විභාගයේ අත්පොත සඳහා නිර්දේශ කරන ලද, "ණය කළමනාකරණය" පිළිබඳ ශ්‍රී ලංකාවේ එකම ග්‍රන්ථය හි කර්තෘ ද සිල්වා මහතා වේ. සිල්වා මහතා ශ්‍රී ලංකාවේ පළපුරුදු බැංකුකරුවන්ගේ සංගමයේ (APB) යාවජීව සාමාජිකයෙකු වන අතර, වර්තමානයේ ශ්‍රී ලංකාවේ පළපුරුදු බැංකුකරුවන්ගේ සංගමයේ උපදේශනාත්මක කමිටුවේ සහ ණය කළමනාකරණ කමිටුවේ සේවය කරනු ලබයි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වෙළඳ සංගමයේ යාවජීව සාමාජිකයෙකි.

ද සිල්වා මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත.

ඔහු 2005-2010 දක්වා කාලය තුළ මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, 2020-2022 දක්වා කාලය තුළ සර්වෝදය ෆයිනෑන්ස් පීඑල්සී හි ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය

සුනිල් ද සිල්වා මහතා, 2015-2018 දක්වා කාලය තුළ දකුණු අප්‍රිකාව වෙත ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙස කටයුතු කරන ලද අතර, 2018-2019 කාලය තුළ කෙන්යාවේ මහ කොමසාරිස් ලෙස කටයුතු කර ඇත.

සුනිල් ද සිල්වා මහතා, 2018-2019 කාලය තුළ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සහ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN HABITAT) හි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා ලෙස කටයුතු කර ඇත.

ඔහු, 2022 නොවැම්බර් මස පටන් ගු.ගු.සේ.ස හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් වූ අතර, විගණන සහ කළමනාකරණ කමිටුවෙ හි සහ මූල්‍ය කළමනාකරණය සහ ආදායම් උත්පාදන අනු කමිටුන් හි සාමාජිකත්වය දරයි.

## ජී යූ කේ අල්ගෙවත්තගේ මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

ගයාන් උදාර කෞෂල්‍ය අල්ගෙවත්තගේ මහතා වර්තමානයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති ලෙස කටයුතු කරනු ලබයි. එමෙන්ම සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (පෞද්ගලික) සමාගම (SAGT), කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT), සීමාසහිත කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය (පෞද්ගලික) සමාගම, සීමාසහිත හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ (පෞද්ගලික) සමාගම (HIPG) සීමාසහිත හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා (පෞද්ගලික) සමාගම (HIPS) සහ සීමාසහිත ලංකා නාවික කටයුතු සංස්ථාව වැනි ප්‍රසිද්ධියේ ලැයිස්තුගත කර ඇති සහ පෞද්ගලික සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරනු ලබයි.

අල්ගෙවත්තගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත්, නාවල විවෘත විශ්වවිද්‍යාලයෙන් LLB උපාධියත් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජෛව විද්‍යාව පිළිබඳ උපාධියත් ලබා ගෙන ඇත.

බහුශ්‍රැත, කැපවූ, උද්යෝගී මෙන්ම අත්දැකීම් වලින් බහුල ජ්‍යේෂ්ඨ පරිපාලන නිලධාරියකු වන ඔහු, සුවිශේෂී නායකත්ව සහ විපුල කළමනාකරණ දැනුමෙන් පිරි අයෙකි. ඔහු සමාගම තුළ ඉහළ නිලධාරීන් සහ පහළ

නිලධාරීන් සමඟ අන්තර් ක්‍රියා කිරීමට බොහෝ වශයෙන් නවෝත්පාදන සහ කාල කළමනාකරණය යොදා ගනු ලබන ශක්තිමත් සහ නිසැක සන්නිවේදකයෙකි.

ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලයෙහි අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ඔහු, 2018 ඔක්තෝම්බර් - ජුනි 2022 දක්වා කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ඵලදායිතා වෘත්තිකයෙකු වී ආසියානු ඵලදායිතා සංවිධානයේ විකල්ප අධ්‍යක්ෂ ලෙස ද සේවය කර ඇත. ඔහු 2006 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයෙන් රැකියා කටයුතු ආරම්භ කළ අතර, වර්තමානයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ තනතුරු දරනු ලබයි. වසර 16ක කැපී පෙනෙන වෘත්තීය ජීවිතයක් ඔහු සතුය. පරිපාලන සේවා ක්ෂේත්‍රයේ විවිධ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ප්‍රාදේශීය ලේකම් ලෙස ඔහු ලබා ගත් අත්දැකීම් වසර දහයකට වඩා වැඩි වේ.

ඔහු, 2022 ජුනි මස පටන් ගු.ගු.සේ.ස හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් වූ අතර, මානව සම්පත් සහ වැටුප් අනුකමිටුවෙහි සාමාජිකත්වය දරයි.

**නන්දන සෝමතිලක මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ/අමාත්‍යංශ නිරීක්ෂක

නන්දන සෝමතිලක මහතා වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ලෙස කටයුතු කරමින් අධ්‍යක්ෂවරයකුගේ කාර්යභාරය ඉටු කරයි. ජ්‍යෙෂ්ඨ පරිපාලන තනතුරුවල අත්දැකීම් සම්භාරයක් සමඟින්, නන්දන මහතා ප්‍රාදේශීය පරිපාලනය සහ පළාත් පාලනය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඔහුගේ වර්තමාන භූමිකාවට රැගෙන එයි. ඔහුගේ වත්මන් තනතුරට පෙර, දශකයකට වැඩි කාලයක් ඔහු පුත්තලම දිස්ත්‍රික්කයේ විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශීය ලේකම්වරයෙකු ලෙස සේවය කිරීමට කැපවී සිටියේය. ඔහුගේ පරිපාලන ඥානය සහ සංවර්ධනය ඉලක්ක කරගත් මුලපිරීම් සඳහා ඔහුගේ හැකියාව යන දෙකම වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නන්දන මහතා සිය වසර 15ක සේවා කාලය තුළ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයෙකු සහ පුත්තලම නගර සභාවේ ලේකම්වරයෙකු ලෙස සිය කුසලතා ඔප් නංවාගෙන ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති නන්දන මහතා සිය කාර්යයට ශක්තිමත් ශාස්ත්‍රීය පදනමක් එමගින් අත්කරගෙන ඇත. වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍යාංශය තුළ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස නන්දන මහතාගේ වගකීම්වලට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය, ගු.ගු.සේ.ස. සහ සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි ගුවන්සේවා අංශයේ අධීක්ෂණය ඇතුළත් වේ. මීට අමතරව, ගුවන්සේවා ක්ෂේත්‍රය පිළිබඳ ඔහුගේ සවිස්තරාත්මක ග්‍රහණය තවදුරටත් ප්‍රදර්ශනය කරමින් ඔහුට ශ්‍රීලංකන් කේටරින් සම්බන්ධ රාජකාරි පැවරී ඇත. ඔහු 2024 ජනවාරි සිට ගු.ගු.සේ.ස.හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**එච් එස් හෙට්ටිආරච්චි**
*ගුවන්තොටුපළ කළමනාකරණ ප්‍රධානී*



**ජේ ඒ එම් ඩී එස් එස් අබේවර්ධන**
*මුදල් ප්‍රධානී*



**ඒ අයි බී කරුණාරත්න**
*ව්‍යාපෘති ප්‍රධානී*



**එම් රත්නසිංහ (මිය)**
*නීති ප්‍රධානී*



**එච් පී එල් සිරිමාන්න**
*සැපයුම් දාම කළමනාකරණ ප්‍රධානී*



**කේ ඩී වයි චාන්දනී (මිය)**
*උපායමාර්ගික කළමනාකරණ ප්‍රධානී*



**යූ එම් වීරවර්ධන**
*විදුලි ඉංජිනේරු ප්‍රධානී*



**ජේ එම් ද කෲස් රුබින්**
*ගෘහ නිර්මාණ, භූමි අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ ප්‍රධානී*



**යූ ජේ ලොකුආරච්චි**
*තොරතුරු තාක්ෂණ ප්‍රධානී*



**යූ එස් ජාගොඩ**
*සිවිල් ඉංජිනේරු (නඩත්තු) ප්‍රධානී*



**වින්ග් කොමාන්ඩර් (විශ්‍රාමික) එස් එම් ඩී විජේසූරිය**
*බුද්ධි සහ ආරක්ෂක මෙහෙයුම් ප්‍රධානී - සියලුම ගුවන්තොටුපළ*



**එස් එස් ද සිල්වා**
*අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන ප්‍රධානී*



**එම් කේ පී තැන්නගේ (මිය)**
*අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික කිරීමේ ප්‍රධානී*



**ජේ කේ රත්නින්ද**
*ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් සංතරණ ඉංජිනේරු ප්‍රධානී*



**ආර් ඩබ්ලිව් එල් බී මැදවැව**
*භාණ්ඩ සහ ගුවන් භාණ්ඩ කළමනාකරණ ප්‍රධානී*



**ඩී ජේ යූ පුරසිංහ**
*වාණිජ සහ දේපල ප්‍රධානී*



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ඒ පී පල්ලාවෙල RWP RSP**
*ආරක්ෂක සේවා ප්‍රධානී*



**ලුතිනන් කර්නල් (විශ්‍රාමික) කේ එච් සී කුමාරසිංහ**
*ගිනි සහ මුදවාගැනීමේ සේවා ප්‍රධානී*

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**එස් පී පාලගම**
*යාන්ත්‍රික ඉංජිනේරු ප්‍රධානී*



**ආර් වීරශ්‍රී (මිය)**
*සිවිල් ඉංජිනේරු (සැලසුම් සහ නිර්මාණ) ප්‍රධානී*



**කේ ඒ ආර් කොඩිකාර**
*මානව සම්පත් ප්‍රධානී*



**ඒ රාජපක්ෂ**
*කලාපීය ගුවන්තොටුපළ සහ භූමි මෙහෙයුම් ප්‍රධානී*



**ජේ ඒ කේ නිමලරත්න**
*සිවිල් ගුවන්සේවා පුහුණු ප්‍රධානී*



**එස් ඩී ඒ එස් නිශාන්ත**
*සමාගමේ වෛද්‍ය නිලධාරී*



**එස් දිසාපතිගේ**
*වැඩබලන ගුවන් සංතරණ සේවා ප්‍රධානී*

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු. මෙහි දක්වා ඇති තොරතුරු, 2007 අංක 7 දරන සමාගම් පනතට අවශ්‍ය අදාළ තොරතුරු සපයන අතර, හොඳම ගිණුම්කරණ පිළිවෙත් අනුව කටයුතු කර ඇත. මෙම වාර්තාවේ සංක්ෂිප්ත ඉදිරිපත් කිරීම හරහා, සමාගමේ කටයුතුවල තත්ත්වය සහ ගිණුම්කරණ කාලසීමාව තුළ සිදුවන යම් යම් වෙනස්කම් අගය කිරීමක් සඳහා කොටස් හිමියන්ට තොරතුරු හෙළිදරව් කිරීම් මනාව සිදු කර ඇති බවට අපි සහතික කර ඇත්තෙමු.

## 1. සමාගම පිළිබඳ

සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස) යනු, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්තොටුපළ කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ව්‍යවස්ථාපිත බලතල සහිත, සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

## 2. ප්‍රධාන ක්‍රියාකාරකම්

ගු.ගු.සේ.ස හි ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම්, 2010 නොවැම්බර් 04 වැනි දින ගැසට් පත්‍රය, 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත හරහා පැවරී ඇති බලතල යටතේ, පහත සඳහන් ගුවන් සේවාවල එකම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස එහි කාර්යභාරය අඛණ්ඩව ඉටු කරන ලදී.

2.1 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.ජා.ගු), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (ම.රා.ජා.ගු), කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලාන (කො.ර.ජා.ගු), මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපළ (ම.ජා.ගු), සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ (යා.ජා.ගු), සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

2.2 ඉහත ගුවන් යානාවල සොයා බැලීම්, ගලවාගැනීම් සහ ගිනි නිවීමේ සේවා සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම් සහ නඩත්තු කිරීම්.

2.3 කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය තුළ ඇති සියලුම ගුවන් යානා සහ මගීන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සහතික කරමින්, ගුවන් ගමනාගමන සේවා, ගුවන් ගමන් පිළිබඳ තොරතුරු සේවා, ගුවන් සන්නිවේදන සේවා සහ සන්නිවේදනය, නාවික කටයුතු, නිරීක්ෂණ සඳහා ගුවන් යානා ආධාර ආදිය සැපයීම.

## 3. මෙහෙයුම් සමාලෝචනය

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් සහ ගු.ගු.සේ.ස හි අනාගත ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ වාර්ෂික වාර්තාවේ, සභාපතිතුමාගේ පණිවුඩය (12 සිට 15 දක්වා පිටු), කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය (35 සිට 49 දක්වා පිටු) සහ මූල්‍ය සමාලෝචනය (52 සිට 56 දක්වා පිටු) මඟින් නිරූපණය කෙරේ. මෙම වාර්තා සහ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයක් වන අදාළ කටයුතුවල තත්ත්වයන් පිළිබිඹු කරයි.

"තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම" නම් වූ ගු.ගු.සේ.ස හි දැක්ම සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කාර්යසාධන දර්ශක හරහා මෙහෙයුම් කාර්යසාධනය අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි.

## 4. මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන 88 සිට 120 දක්වා පිටු වල දක්වා ඇත.

## 5. වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKAS) අනුකූලව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති, 92 සිට 101 දක්වා පිටු වල ඇත. සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලබයි.

## 6. මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 7 දරන සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් එහි තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්ම පිළිබිඹු කිරීම සඳහා එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, සමාගම් පනත, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ අනෙකුත් මූල්‍ය වාර්තාකරණ නියාමන අවශ්‍යතාවලට අනුකූලව, 88 සිට 120 දක්වා පිටු වල ඇති මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන් සඳහන් කරයි.

## 7. ස්වාධීන විගණකවරුන්, විගණක වාර්තාව සහ වේතන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ, 2015 මැයි 15 වැනි දින පනවන ලද 19 වැනි සංශෝධනයට අනුව, ඕනෑම ලිඛිත නීතියක් යටතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රජයේ ව්‍යවසායන් පිළිබඳ විගණනය කිරීමට විගණකාධිපතිවරයාට බලය ඇත. ඒ අනුව, 2023 වසර සඳහා ගු.ගු.සේ.ස විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව, මෙම වාර්තාවේ 75 සිට 87 දක්වා පිටුවල ඉදිරිපත් කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තුව රුපියල් 1,254,000 (2022 වසර: රුපියල් 1,096,500) වූ අතර, විගණනයට අදාළ සේවා සහ විගණන නොවන සේවා සඳහා විගණකවරුන්ට ගෙවන ලද වෙනත් ගාස්තු නොවීය. අධ්‍යක්ෂවරුන්ගේ දැනුම පරිදි, සමාගමේ විගණකවරයෙකුගේ සම්බන්ධතාවයක් හැර, සමාගම වෙනත් කිසිදු සම්බන්ධයක් විගණකවරුන් සමඟ නොමැත.

## 8. අභ්‍යන්තර පාලන සහ ප්‍රධාන අභ්‍යන්තර පාලන ක්‍රියාවලි

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වංචා සහ වෙනත් අක්‍රමිකතා වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා එහි වත්කම් ආරක්ෂා කර ගැනීමට සාධාරණ පියවර ගෙන ඇත. මෙම කාර්යය සඳහා, වසර පුරාවට සමාගම විසින් මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, පටිගත කිරීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් ඵලදායී සහ පුළුල් අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කර ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

මෙය අභ්‍යන්තර සමාලෝචන, අභ්‍යන්තර විගණනය සහ මෙහෙයුම් ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට, වත්කම් ආරක්ෂා කර ගැනීමට, වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට සහ සුරක්ෂිතව, ප්‍රායෝගික සහ වාර්තා වල විශ්වසනීයත්වය සඳහා අවශ්‍ය සමස්ත මූල්‍ය සහ වෙනත් පාලන පද්ධතියකින් සමන්විත වේ. විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) විසින් සමාගමේ අභ්‍යන්තර විගණකවරුන්, රජයේ විගණකවරුන් සහ නියාමන බලධාරීන් විසින් හඳුනාගෙන ඇති අභ්‍යන්තර පාලන ගැටලු නිතිපතා සමාලෝචනය කරයි. අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව කළමනාකරණය විසින් ඇගයීමට ලක් කරයි.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

## 9. ආදායම් ප්‍රකාශනය සහ සමාගමේ මූල්‍ය තත්ත්වය

### 9.1 ආදායම

2023 වර්ෂය සඳහා සමාගම විසින් ජනනය කරන ලද ආදායම රුපියල් බිලියන 38.4 (2022 වසර: රුපියල් බිලියන 27.6) වන අතර පෙර වසරට සාපේක්ෂව 39%ක සැලකිය යුතු වැඩි වීමකි. ව්‍යාපාර කොටස් මත පදනම් වූ සමාගම් ආදායම පිළිබඳ විශ්ලේෂණයක් 102 පිටුවේ, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5 හි අනාවරණය කර ඇත.

### 9.2 මෙහෙයුම් ප්‍රතිඵල

සමාගම විසින් 2023 වසරෙන් අවසන් වූ වසර සඳහා රුපියල් බිලියන 19.3 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 12.6 ක මෙහෙයුම් ලාභය සමඟ සසඳන විට, මෙය 53% ක වර්ධනයකි.

සමාගම, 2022 දී ලැබූ රුපියල් බිලියන 4.8ක ශුද්ධ ලාභයට සාපේක්ෂව, 2023 වසර සඳහා රුපියල් බිලියන 28.1 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

### 9.3 සංචිත

කොටස් ප්‍රාග්ධනය, අනෙකුත් සංචිත සහ රඳවා ගත් ඉපැයීම් වලින් සමාගමේ සංචිත සමන්විත වේ. වාර්ෂික ලාභයේ වැඩිවීම හේතුවෙන් සමාගමේ සංචිතවල වැඩිවීමක් වාර්තා විය. ඒ අනුව, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 45.3 ට සාපේක්ෂව, 2023 දෙසැම්බර් 31 වන විට වාර්තා වූ මුළු සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 67.6 කි. සමාගමේ සංචිත වල චලනය පිළිබඳ 90 පිටුවේ හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ දැක්වේ.

### 9.4 ලාභාංශ

සමාගම රුපියල් බිලියන 5 ක ලාභාංශයක් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රකාශ කරමින් ගෙවා ඇත. එය 2022 වර්ෂයේ දී රුපියල් බිලියන 1ක ලාභාංශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර ප්‍රකාශිත මුදලින් රුපියල් මිලියන 500 ක් 2023 වර්ෂයේදී ගෙවා ඇත.

### 9.5 පරිත්‍යාග

2023 වර්ෂයේදී, සමාගම විසින් රුපියල් 228,000 ක් (2022 වසරේදී: රුපියල් 510,000) වටිනා පරිත්‍යාග සිදු කරන ලදී.

### 9.6 ප්‍රාග්ධන වියදම

සමාලෝචිත වර්ෂය තුළ, සමාගම විසින් ප්‍රාග්ධන වියදම් ලෙස 2022 වසරේ රුපියල් බිලියන 7 ට සාපේක්ෂව, රුපියල් බිලියන 5 ක් දරන ලදී. දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ආයෝජනය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 11 සහ 12 හි දක්වා ඇත.

### 9.7 රජය වෙත දායකත්වය

ගු.ගු.සේ.ස විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකන් ගුවන් සේවය වැනි අනෙකුත් රජයේ අධිකාරීන්ට ගුවන්තොටුපළ තුළ අදාළ සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සම්පාදනය කරන ලදී. මෙම ගනුදෙනු සහ හිණුම් ශේෂයන් 119 පිටුවේ මූල්‍ය ප්‍රකාශන වෙත සටහන් අංක 32 හි අදාළ පාර්ශ්ව ගනුදෙනු යටතේ අනාවරණය කර ඇත.

පසුගිය වසර 4 තුළ බදු ගෙවීම හරහා රජයට වක්‍ර දායකත්වය ලබා දීම පිළිබඳ පහත වගුවේ දක්වා ඇත.

| වසර | ශ්‍රී ලංකා රු. මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | ලාභාංශ | එකතු කළ අගය මත බදු | ආදායම් බදු | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | උපයන විට ගෙවීම |
| 2020 | - | 207 | - | - | 7 |
| 2021 | - | 117 | 15 | - | 6 |
| 2022 | 1,000 | 1,281 | 117 | 70 | 15 |
| 2023 | 5,000 | 2,216 | 3,772 | 800 | 430 |

### 9.8 ආයෝජන

වසර අවසානයේදී ආයෝජන කළඹේ, වටිනාකම රුපියල් බිලියන 2.4 කින් වැඩි වී ඇති අතර, එහි විස්තර පහත වගුවේ දක්වා ඇත.

| ආයෝජන | ශ්‍රී ලංකා රු. මිලියන | |
|---|---|---|
| | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
| භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර | 24 | 22 |
| කෙටි කාලීන බැංකු තැන්පතු | 87,717 | 78,025 |
| ණයකර සඳහා ආයෝජන | 2,999 | 3,298 |
| දිගු කාලීන බැංකු තැන්පතු | - | 6,963 |
| **එකතුව** | 90,740 | 88,308 |

### 9.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ කොටස් ප්‍රාග්ධනය රුපියල් 100/- බැගින් වූ සාමාන්‍ය කොටස් වලින් සමන්විතව මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. 2023 දෙසැම්බර් 31 දිනට කොටස් හිමිකම පහත පරිදි විය.

| දරනු ලබන්නේ | කොටස් ගණන | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම් | 200,000 | 20,000,000 |
| ලේකම් - වරාය, නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යාංශය | 1 | 100 |
| සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් | 1 | 100 |
| **එකතුව** | 200,002 | 20,000,200 |

### 9.10 වාර්තා කිරීමේ කාලයෙන් පසු සිදුවීම්

120 පිටුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි 33 සටහනේ සඳහන් කර ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් හෝ හෙළිදරව් කිරීම සඳහා අවශ්‍ය වන කිසිදු ද්‍රව්‍යමය සිදුවීමක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවී නොමැත.

### 9.11 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ විමසීම් වලින් පසු, සාමාන්‍ය පුරෝකථන ක්‍රියාවලිය අනුමත කිරීමෙන් සහ අනාගත අපේක්ෂාවන් සහ අවදානම් විභවයන් සලකා බැලීමෙන් පසු, ගු.ගු.සේ.ස සතුව ප්‍රමාණවත්

සම්පත් සහ අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා ක්‍රියාකාරී පැවැත්ම සඳහා කැපවී සිටින ණය ගැනීමේ පහසුකම් ඇති බව අධ්‍යක්ෂවරු විසින් සලකනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සියලු මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

### 9.12 හදිසි අවස්ථා සහ වගකීම්

අවිනිශ්චිත වගකීම් පිළිබඳ විස්තර 116 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 29 හි අනාවරණය කර ඇත.

## 10. අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මණ්ඩල අනුකමිටු පිළිබඳ තොරතුරු

### 10.1 අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිතුමා (79 වැනි වගන්තිය) සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් (82 වැනි වගන්තිය) පත් කිරීම ගු.ගු.සේ.ස හි සාංගමික ව්‍යවස්ථාවලියෙහි වගන්තිවල, අදාළ වගන්ති අනුව සිදු කර ඇත.

### 10.2 31.12.2023 මූල්‍ය වර්ෂය අවසානයේ නිලතල දැරූ වත්මන් අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර

| අධ්‍යක්ෂ මණ්ඩලය | තනතුර | පත්වීම් ලබාදුන් දිනය | ස්වාධීන |
|---|---|---|---|
| ඉංජිනේරු ඒ ගල්කැටිය | සභාපති | 11.12.2023 | නැත |
| ජී යූ කේ අල්ගෙවත්තගේ | වැඩ බලන උප සභාපති | 11.12.2023 | නැත |
| ඒ එස් සී වරුෂහෙන්නැදිගේ | විධායක නොවන අධ්‍යක්ෂ | 12.12.2019 | ඔව් |
| එස් එන් සුමනසේකර | විධායක නොවන අධ්‍යක්ෂ | 12.12.2019 | ඔව් |
| කපිතාන් මිලින්ද රත්නායක | විධායක නොවන අධ්‍යක්ෂ | 20.06.2022 | ඔව් |
| ඒ ඒ රන්දෙණිය | විධායක නොවන අධ්‍යක්ෂ | 30.11.2022 | ඔව් |
| ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය | විධායක නොවන අධ්‍යක්ෂ | 13.09.2022 | ඔව් |
| ඩබ්ලිව් එස් ඩී ද සිල්වා | විධායක නොවන අධ්‍යක්ෂ | 30.11.2022 | ඔව් |
| ඒ එච් එස් ගුණවර්ධන | විධායක නොවන අධ්‍යක්ෂ / වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශ නිරීක්ෂක | 31.12.2019 | නැත |
| ජී ඒ ඒ ප්‍රියන්ත | විධායක නොවන අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත | 11.06.2021 | නැත |

ඉංජිනේරු ඒ ගල්කැටිය ගු.ගු.සේ.ස හි උප සභාපති ලෙස 2023 අගෝස්තු 18 දින වැඩ භාරගන්නා ලදී.
එම් එස් ඒ සේනාරත්න මිය ගු.ගු.සේ.ස හි උප සභාපතිනිය ලෙස 2024 ජනවාරි 10 දින පත්කරන ලදී.

### 10.3 2023 වසර තුළ ඉල්ලා අස්වූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර

| අධ්‍යක්ෂ මණ්ඩලය | තනතුර | පත්වීම් ලබාදුන් දිනය | ඉල්ලා අස් වූ දිනය |
|---|---|---|---|
| මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී. ඒ. චන්ද්‍රසිරි මහතා RWP USP VSV ndc psc | සභාපති | 12.12.2019 | 10.12.2023 |
| වෛද්‍ය යූ ඒ මෙන්ඩිස් | උප සභාපති | 15.06.2022 | 16.08.2023 |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

## 10.4 අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය දැක්වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අනු කමිටු හයක් පත් කොට ඇත. 2023 දෙසැම්බර් 31 දිනට එම කමිටුහි සංයුතිය පහත පරිදි වේ.

| අනුකමිටුව | 2023 දෙසැම්බර් 31 දිනට සංයුතිය |
|---|---|
| විගණන සහ කළමනාකරණ අනුකමිටුව | ජී ඒ ඒ ප්‍රියන්ත - සභාපති |
| | කපිතාන් මිලින්ද රත්නායක- සාමාජික |
| | ඩබ්ලිව් එස් ඩී ද සිල්වා - සාමාජික |
| | එම් කේ පී තැන්නගේ (මිය)- කැඳවුම්කරු |
| | එම් එම් රේනුක පී ගුණසේකර (මිය)- ලේකම් |
| | කේ ඒ ඒ කුලතුංග (හිටපු එස් ඒ ඩී ඩිල්රුක්ෂි - (මිය)) - නිරීක්ෂක - රජයේ විගණන අධිකාරී |
| මානව සම්පත් සහ වැටුප් කමිටුව | ජී යු කේ අල්ගෙවත්තගේ -සභාපති |
| | ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය- සාමාජික |
| | කේ ඒ ආර් කොඩිකාර - කැඳවුම්කරු සහ/හෝ ලේකම් |
| මූල්‍ය කළමනාකරණ සහ ආදායම් උත්පාදන කමිටුව | ඉංජිනේරු ඒ ගල්කැටිය - සභාපති |
| | එම් එස් ඒ සේනාරත්න (මිය) - සාමාජික |
| | එස් එන් සුමනසේකර - සාමාජික |
| | ඩබ්ලිව් එස් ඩී ද සිල්වා- සාමාජික |
| | ජේ ඒ එම් ඩී එස් එස් අබේවර්ධන - කැඳවුම්කරු සහ/හෝ ලේකම් |
| අවදානම් කළමනාකරණ කමිටුව | කපිතාන් මිලින්ද රත්නායක - සභාපති |
| | ඒ එස් සී වරුෂහැන්නැදිගේ - සාමාජික |
| | කේ ඩී වයි චාන්දනී (මිය) - කැඳවුම්කරු සහ/හෝ ලේකම් |
| සියලුම ගුවන්තොටුපළ හි ඉදිරි ගමන්මග කමිටුව | ඉංජිනේරු ඒ ගල්කැටිය - සභාපති |
| | කපිතාන් මිලින්ද රත්නායක- සාමාජික |
| | ඒ එස් සී වරුෂහැන්නැදිගේ - සාමාජික |
| | ඒ ඒ රන්දෙණිය- සාමාජික |
| | එච් එස් හෙට්ටිආරච්චි - කැඳවුම්කරු සහ/හෝ ලේකම් |
| ව්‍යාපෘති කළමනාකරණ අනුකමිටුව | ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය - සභාපති |
| | ඒ එස් සී වරුෂහැන්නැදිගේ - සාමාජික |
| | ඉංජිනේරු ඒ ගල්කැටිය - සාමාජික |
| | ඒ අයි බී කරුණාරත්න - කැඳවුම්කරු සහ/හෝ ලේකම් |

## 10.5 කොටස් හෝ ණයකර ගනුදෙනු කරනු ලබන අධ්‍යක්ෂවරුන් පිළිබඳ අනාවරණය

කිසිදු අධ්‍යක්ෂකවරයෙකු සතුව කොටස් හෝ ණයකර නොමැත.

## 10.6 ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ව්‍යාපාරයට සම්බන්ධ ගිවිසුම් හෝ යෝජිත ගිවිසුම් පිළිබඳව කිසිදු අධ්‍යක්ෂවරයකු සෘජුව හෝ වක්‍රව උනන්දු වී නොමැත.

## 10.7 අධ්‍යක්ෂවරුන්ගේ වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ

සමාගම විසින් 2023 වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ දීමනා ලෙස, රුපියල් මිලියන 12.4ක් ගෙවා ඇත (2022 - රුපියල් මිලියන 8.4). වසර අවසානයේ දී විධායක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සඳහා වේතන වශයෙන් රුපියල් මිලියන 2.1ක් ගෙවා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දීමනා, සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, ප්‍රසාද දීමනා, සංග්‍රහ වියදම් ප්‍රතිපූරණය කිරීම, දුරකථන සහ අනෙකුත් දීමනා වැනි සියලුම මූල්‍ය ප්‍රතිලාභ මේ සඳහා ඇතුළත් විය. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට වසර තුළදී රුපියල් මිලියන 10.3 ක මුදලක් ගෙවා ඇති අතර, එය ගමන් වියදම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වීම සඳහා වූ ගාස්තු වේ.

## 11. ආයතනික පාලනය

එලදායී ආයතනික පාලන රාමුවක් පවත්වා ගැනීම සහ ආයතනික පාලනයේ හොඳම භාවිතයන් සහ ඒවා එලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට අවශ්‍ය පද්ධති සහ ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීමට, අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටිති.

## 12. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන්ගේ දැනුවත්භාවය අනුව, සමාගම විසින් ගෙවිය යුතු සියලුම බදු, තීරුබදු සහ බදු, සමාගමේ සේවකයින්ට අදාළ සහ ඔවුන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම සම්ප්‍රදාන, බදු සහ අයබදු සහ අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී සමාගම විසින් අයවිය යුතු සහ ගෙවිය යුතු දෑ එම දිනට ගෙවා ඇති බව හෝ අදාළ ප්‍රතිපාදන සපයා ඇති බවට සහතික කරුනු ලබයි.

## 13. නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ විශ්වාසය අනුව, සමාගම රටේ නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

## 14. වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම ගු.ගු.සේ.ස හි මණ්ඩල රැස්වීම් පවත්වන ශාලාවේදී, 2024 මැයි 31 වැනි දින පෙ.ව. 9:30 ට පවත්වනු ලැබේ.

## 15. ස්තුතිය

අභියෝග මධ්‍යයේ සමාගමේ තවත් මූල්‍ය වර්ෂයක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් කළමනාකාරීත්ව කණ්ඩායම වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය ස්තුතිය පුද කරනු ලබයි. පසුකාලීන කොවිඩ් වසංගත තත්වය සහ ලොව පුරා සංචාරක සීමා කිරීම් හේතුවෙන්, ගුවන් සේවා අංශය සඳහා අභියෝගාත්මක වසරක් විය. වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයට සහ අනෙකුත් ආයතන සහ සමාගමේ පාර්ශවකරුවන් සහ නියාමකයා ලෙස මෙම අවස්ථාවේදී සමාගමට අඛණ්ඩව සහය වීම පිළිබඳ අපි විශේෂ කෘතඥතාව පළකර සිටිමු.

තවද, අප කෙරෙහි තබා ඇති අඛණ්ඩ විශ්වාසය සඳහා අපගේ ගනුදෙනුකරුවන් ඇතුළු සමාගමේ අඛණ්ඩ මෙහෙයුම් සඳහා සම්බන්ධ වූ සහ දායක වූ සියලුම පාර්ශවකරුවන්ට අපගේ අවංක ඇගයුම සහ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමු. අවසාන වශයෙන්, මෙම අනපේක්ෂිත, අභියෝගාත්මක වසර තුළ ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම, අඛණ්ඩතාව සහ වෙහෙස මහන්සි වී කටයුතු කිරීම වෙනුවෙන් සියලුම ගු.ගු.සේ.ස කාර්ය මණ්ඩලයට අපගේ ස්තුතිය පළ කර සිටිමු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,



ඉංජිනේරු ඒ ගල්කැටිය
සභාපති

2024 මැයි 16





# පුනර්ජීවනය

## නව වෙළඳ පොළ

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව (AMC)

## කමිටුවේ කාර්යභාරය

විගණන සහ කළමනාකරණ කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත් ලෙස පත් කරන ලද අනු කමිටුවකි. එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කටයුතු සිදු කිරීම සහ වාර්තාකරණය කිරීම සඳහා වගකීමෙන් බැඳේ.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ බාහිර විගණනය සහ නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකීම් සහ කාර්යභාරයන් ඉටු කරලීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දැක්වීම විගණන හා කළමනාකරණ කමිටුවේ මූලික කාර්යභාරය වේ.

## සංයුතිය

විගණන සහ කළමනාකණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වේ. කමිටුවේ යොමු කිරීමේ අනුදේශවල පැහැදිලි කර ඇති පරිදි විගණන කමිටු මාර්ගෝපදේශයන් අනුව කමිටු ක්‍රියාපටිපාටින් ඔවුන් විසින් ක්‍රියාත්මක කරයි. සමාලෝචිත වර්ෂය සඳහා විගණන සහ කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

| විගණන සහ කළමනාකරණ කමිටුවේ සංයුතිය | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂතුමාගේ නම | ධූර කාලය (සිට - දක්වා) | | තනතුර |
| ජී ඒ ඒ ප්‍රියන්ත මහතා | 29.06.2021 | මේ දක්වා | සභාපති |
| කපිතාන් මිලින්ද රත්නායක | 20.06.2022 | මේ දක්වා | සාමාජික |
| ඩබ්ලිව් එස් ඩී ද සිල්වා මහතා | 30.11.2022 | මේ දක්වා | සාමාජික |

ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී සහ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කරන කේ.ඒ.ඒ. කුලතුංග මහතා ස්වාධීන නිරීක්ෂකයින් ලෙස විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගි විය.

## රැස්වීම්

2023 වර්ෂය තුළදී විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් දහයක් පැවැත්වුණි. ඒ සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත වගුවේ දැක්වේ.

| අධ්‍යක්ෂතුමාගේ නම | පවත්වන ලද කමිටු රැස්වීම් වාර ගණන | සහභාගී වූ රැස්වීම් වාර ගණන |
|---|---|---|
| ජී ඒ ඒ ප්‍රියන්ත මහතා | 10 | 10 |
| කපිතාන් මිලින්ද රත්නායක | 10 | 09 |
| ඩබ්ලිව් එස් ඩී ද සිල්වා මහතා | 10 | 10 |

විගණන සහ කළමනාකරණ කමිටුව සඳහා ලේකම් ලෙස කටයුතු කරනු ලබන සමාගම් ලේකම්වරයා විසින් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වල ක්‍රියාපටිපාටිය වාර්තා කරන ලද අතර, විගණන සහ කළමනාකරණ කමිටු වාර්තා ආසන්නතම රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බෙදා හරින ලදී.

## කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ විගණන සහ කළමනාකරණ කමිටුවේ ප්‍රඥප්තිය මඟින් කමිටුවේ අනුමත නිර්දේශිත නියමයන් (TOR) පැහැදිලිව නිර්වචනය කරයි. එමෙන්ම එය විගණන සහ කළමනාකරණ කමිටුවේ අරමුණ, සංයුතිය, විෂය පථය, යුතුකම් සහ වගකීම් නියාමනය කරයි.

## කමිටුවේ ප්‍රධාන වගකීම්

කමිටුවේ ප්‍රධාන වගකීම් සඳහා පහත දෑ ඇතුළත් වේ;

- සංකීර්ණ හෝ අසාමාන්‍ය ගනුදෙනු, අතිශය තීරණාත්මක ක්ෂේත්‍ර සහ මෑතකාලීන වෘත්තීය සහ නියාමන ප්‍රකාශ ඇතුළුව සැලකිය යුතු ගිණුම්කරණ සහ වාර්තාකරණ ගැටලු සමාලෝචනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඒවායේ බලපෑම අවබෝධ කර ගැනීම.
- කළමනාකාරිත්වය සහ බාහිර විගණකවරුන් සමඟ විගණනයේ ප්‍රතිඵල පරීක්ෂා කිරීම, මුහුණදීමට සිදුවන අභියෝගය හමුවේ කටයුතු කිරීම.
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ ඒවා කමිටු සාමාජිකයින් දැනුවත් තොරතුරු බවද, සම්පූර්ණ සහ අනුකූල බවද, සලකා බැලීම සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ප්‍රතිපත්තිවලට අනුකූලව තොරතුරු ඉදිරිපත් කර ඇති බවට සහතික වීම.
- නිකුත් කිරීමට පෙර වාර්ෂික වාර්තාවේ අනෙකුත් කොටස් සහ අදාළ නියාමන ගොනු කිරීම් සමාලෝචනය සහ තොරතුරුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සලකා බැලීම.
- විගණන කමිටුව සමඟ සන්නිවේදනය කිරීමට අවශ්‍ය සියලුම අදාළ කරුණු කළමනාකරණයට සහ බාහිර විගණකවරුන්ට ඵලදායී ලෙස ලබා දී ඇති බවට සහතික කිරීම.
- නියාමකයින් වෙත ගොනු කිරීමට පෙර කළමනාකරණය සමඟ, අවශ්‍ය නම් බාහිර විගණකවරයා සමඟ අතුරු මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සහ ඒවා කමිටු සාමාජිකයින් දන්නා තොරතුරුවලට සම්පූර්ණ සහ අනුකූල වන්නේද යන්න සලකා බැලීම.
- මූල්‍ය වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ ගැටලු, සිදු කරන ලද විනිශ්චයන් සහ ප්‍රධාන විගණන කරුණු පැහැදිලිව නිර්වචනය කරමින් කළමනාකරණය සහ/හෝ ස්වාධීන විගණක විසින් සකස් කරන ලද වාර්තා සමාලෝචනය කිරීම.

- වාර්ෂික විගණන සැලැස්ම සහ එහි කිසියම් සැලකිය යුතු වෙනස් කිරීම් අනුමත කිරීම සහ එහි සැලැස්මට සාපේක්ෂව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම්වල කාර්යසාධනය තක්සේරු කිරීම.
- බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය කිරීම සහ කළමනාකරණයේ අදාළ ක්‍රියාමාර්ග සමඟින් විගණකාධිපතිගේ (AG) කළමනාකරණ ලිපියට ප්‍රතිචාර දැක්වීම නිරීක්ෂණය කිරීම.
- අභ්‍යන්තර විගණකවරුන් සහ බාහිර විගණකවරුන් සමඟ කටයුතු කිරීම.
- නීති, රෙගුලාසි සහ නියෝගවලට අනුකූල වීම අධීක්ෂණය කිරීමේදී පද්ධතියේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම සහ අනුකූල නොවන අවස්ථා සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ විමර්ශන සහ පසුකාලීන ක්‍රියාමාර්ගවල (විනය පියවර ඇතුළුව) ප්‍රතිඵල සමාලෝචනය කිරීම.

## 2023 වසරේ ක්‍රියාකාරකම්

වසර පුරා, විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ඔබ්බට සිය වගකීම් කැපවීමෙන් ඉටු කරලනු ලැබිණි. එහිදී සියලුම අංශ හරහා ක්‍රියාත්මක වන ක්‍රියා පටිපාටි සහ ඒ ආශ්‍රිත පාලනයන් නිතිපතා සමාලෝචනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය පුළුල් ලෙස සමාලෝචනය කරන ලදී. එමෙන්ම නවතම ආයතනික සම්පත් කළමනාකරණ පද්ධතිය (ERP) සමඟ අනුගත කරමින්, ආයතනයේ මූල්‍ය ක්‍රියා පටිපාටි පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදු කරන ලදී.

එමෙන්ම, විගණන සහ කළමනාකරණ කමිටුව වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සාධාරණීය ලෙස සමාලෝචනය කරන ලද අතස්ථාවර වත්කම් ප්‍රධාන වාර්තා (FAMR) සම්බන්ධ ගැටලු නිසි ලෙස නිරාකරණය කරන ලදී. මෙකී පුළුල් සමාලෝචනය ඵලදායී වත්කම් කළමනාකරණ පද්ධතියක් සකස් කිරීමට උපකාරී වූ අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ස්ථාවර වත්කම් ප්‍රධාන වාර්තා ආශ්‍රිත අභියෝග ජය ගැනීම අරමුණු කර ගෙන ඇත.

2023 වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සිදු කරන ලද අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

## මූල්‍ය වාර්තාකරණය

වාර්තාකරණ කාලසීමාව තුළ පාර්ශ්වකරුවන්ට සපයනු ලබන තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ ඵලදායීතාවය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ සමාගමේ ගිණුම් පොත්වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම ඉටුකිරීම උදෙසා කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය දක්වන ලදී. එමඟින් සියලුම ගනුදෙනු නිවැරදිව සහ සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල සටහන් කර ඇති බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය තක්සේරු කරන ලදී. එමෙන්ම, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී අදාළ වන සැලකිය යුතු උපකල්පන සහ විනිශ්චයන් ඇතුළු අදාළ උපකාරක තොරතුරු සමඟ මාසික අතුරු මූල්‍ය ප්‍රකාශන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. එය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් සහ 2024 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත සමාලෝචනය කරන ලදී.

පවතින අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියා පටිපාටි තක්සේරු කිරීමෙන් පසු, සමාගමේ මූල්‍ය තත්ත්වය හොඳින් නිරීක්ෂණය කර නිවැරදිව වාර්තා කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීමට ප්‍රමාණවත් පාලන සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක බව කමිටුව විසින් තහවුරු කරයි.

## අභ්‍යන්තර පාලනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාවය විගණන සහ කළමනාකරණ කමිටුව මඟින් තක්සේරු කරනු ලැබුණි. මෙම ක්‍රියාවලිය මඟින් විවිධ අවදානම් අවම කිරීම සහ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය තක්සේරු කරන ලදී. ගු.ගු.සේ.ස හි අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික (IA&QA) ප්‍රධානියාගේ නිර්දේශ මත කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට විගණන සහ කළමනාකරණ කමිටු විසින් තහවුරු කරනු ලබයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම අධ්‍යක්ෂ මණ්ඩලයට එහි කාර්යයන් පවත්වා ගැනීමටත් සහ අවශ්‍ය පියවර ගැනීමටත් හැකියාව ලබා දෙයි.

## අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණනය (IA) ස්වාධීන සහ සාධාරණ සහතික කිරීමේ කාර්යයක් වන අතර, එය ගු.ගු.සේ.ස හට එහි සමස්ත පාලන රාමුව වැඩිදියුණු කිරීමට උපකාරී වේ. අවදානම් කළමනාකරණය, පාලනය සහ යහපාලන ක්‍රියාවලීන්හි සැලසුම් සහ කාර්යක්ෂමතාව ඇගයීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමානුකූල සහ විෂය ක්ෂේත්‍ර ප්‍රවේශයක් පවත්වා ගැනීමට අභ්‍යන්තර විගණන කාර්යය දායක වේ.

ගු.ගු.සේ.ස හි මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් සත්‍ය වශයෙන්ම සිදු කිරීම සඳහා වගකිව යුතු පිරිස මෙන්ම යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පිරිසගෙන් හෝ යහපත් ආයතනික පාලන භාවිතයන්ට අනුකූලව සහ අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් සහ නිසි වෘත්තීය සැලකිල්ලෙන් සිදු කරනු ලබන ගු.ගු.සේ.ස හි කාර්යභාරයේ කාර්යසාධනය සහ පිරිනමන සේවාවලින් අභ්‍යන්තර විගණන ක්‍රියාකාරීත්වය ස්වාධීන බවට විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සහතික කරයි. විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, ප්‍රමාණය සහ ඵලදායීතාවය අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් 2024 වර්ෂය සඳහා වන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර, තක්සේරු කර අනුමත කරන ලදී. එමෙන්ම

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව (AMC)

එමඟින් අභ්‍යන්තර විගණනයේ වැදගත් විගණන සොයාගැනීම් සහ නිර්දේශ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.

## බාහිර විගණනය

රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තිය අනුව, ගු.ගු.සේ.ස හි බාහිර විගණනය සිදු කිරීමට විගණකාධිපති (AG) වෙත බලය පවරා ඇත. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණකවරයා ලෙස විගණකාධිපති කටයුතු කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ මූල්‍ය ප්‍රකාශනවල අනුකූලතාව පිළිබඳ මතය ප්‍රකාශ කිරීමේ වගකීම දරන බාහිර විගණකවරයා සමඟ විගණන සහ කළමනාකරණ කමිටුව සමීපව කටයුතු කරයි.

සියලුම විගණන සහ කළමනාකරණ කමිටුව රැස්වීම් සඳහා ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස බාහිර විගණකවරයාට ආරාධනා කරන ලද අතර, එමඟින් නියාමන සහ අනුකූලතා අවශ්‍යතා සහ පාලනය හෝ ක්‍රියාපටිපාටි දුර්වලතා ඇත්නම් ඒ පිළිබඳ ඔවුන්ගේ අදහස් සාකච්ඡා කිරීමට කමිටුවට අවස්ථාව ලබා දේ.

## යහපාලනය

රජයේ චක්‍රලේඛ ඇතුළුව නියාමන අවශ්‍යතා පිළිපැදීමේ වැදගත්කම සහ අවශ්‍යතාවය අවධාරණය කරමින් ගු.ගු.සේ.ස තුළ යහපාලනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමේ සහ ක්‍රියාශීලී සංස්කෘතියක් පෝෂණය කරලීමේ හැකියාව විගණන සහ කළමනාකරණ කමිටුව සතු වේ.

## නිගමනය

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන්, අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය, බාහිර විගණනය සහ ගු.ගු.සේ.ස හි අනුකූලතා අධීක්ෂණ ක්‍රියාවලි හා සම්බන්ධ වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය සහ මගපෙන්වීම ලබා දෙන අතරම, ගු.ගු.සේ.ස හි මෙහෙයුම් ස්වාධීනව අධීක්ෂණය සම්බන්ධයෙන් සමතුලිතතාවයක් ඇති කර ගැනීමට විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සිය ප්‍රයත්නයන් තුළින් ඉලක්ක කර ඇත. වසර පුරාවට එහි යුතුකම් ඵලදායි ලෙස හා උසස් ප්‍රමිතියකින් ඉටු කර ඇති බවට කමිටුව තහවුරු කරයි.

**ජී ඒ ඒ ප්‍රියන්ත**
*සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව* (AMC)

2024 මැයි 16

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

## ගෝලීය සහ දේශීය ගුවන් සේවා කර්මාන්තයේ සමාලෝචනය සහ තත්ත්වය

කොවිඩ්-19 වසංගතය පහව යාමත් සමග, ගෝලීය ගුවන් ගමන් ජව සම්පන්නව සීග්‍රයෙන් නැවත ආරම්භ විය. 2022 පුරාවට, කලාප ක්‍රමයෙන් සංචාරක සීමාවන් ලිහිල් කිරීම හෝ ඉවත් කිරීම කරන ලද අතර චීනය එසේ කළ අවසාන ප්‍රධාන වෙළඳපොළ විය. සෑම නව සංචාරක සීමාවන් ලිහිල් කිරීමක් සමඟම සංචාරක සංඛ්‍යාව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමෙන් නැවත ගමන් ආරම්භ කිරීමට මගීන් තුළ තිබූ උනන්දුව පැහැදිලිව දක්නට ලැබුණි. 2024 වන තෙක් ලෝක ව්‍යාප්ත මගී ඉල්ලුම සම්පූර්ණයෙන්ම පූර්ව වසංගත මට්ටම දක්වා යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා නොකරන නමුත්, 2023 අවසන් වන විට සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබිණි

අනෙක් අතට ගුවනින් භාණ්ඩ යැවීමේ සේවාව වෙනත් මගක් ගන්නා ලදී. කොවිඩ්-19 අර්බුදය තුළ ජීවන උපකාරකයක් ලෙස සේවය සලසමින්, ධාරිතාව සහ ලාභය පූර්ව වසංගත මට්ටම් ඉක්මවා යමින් මෙම අංශය 2021 දී උපරිම කාර්ය සාධනයක් අත්විඳින ලදී. කෙසේ වෙතත්, මූල්‍ය අවිනිශ්චිතතාවයන් සහ මිල ඉහළ යාම අවම කිරීම සඳහා රජයේ මැදිහත්වීම් එහි උපරිමයට ළඟා වීම වළක්වාලීමට හේතු විය. ජාත්‍යන්තර වෙළඳාම පහත වැටීමත් සමඟ, ලාභය ශක්තිමත්ව පැවතුනද, ගුවනින් භාණ්ඩ යැවීමේ ප්‍රමාණය 2019 මට්ටමට වඩා අඩු විය. 2022 දී, ගුවන් සේවා ආදායමට 17% දායකත්වයක් ගුවනින් භාණ්ඩ යැවීමේ සේවාවෙන් ලැබුණු අතර, එය 2019 දී ලද 12% ට වඩා සැලකිය යුතු වැඩි වීමකි. 2024 සඳහා වූ අපේක්ෂාවන් වඩාත් ඉහළ සහ වඩාත් ශුභවාදී කරමින් මෙම ධනාත්මක ප්‍රවණතාවය 2023 දක්වා අඛණ්ඩව පැවතුණි.

2020-2022 කාලපරිච්ඡේදය පුරාවට ඩොලර් බිලියන 180 ඉක්මවන සමුච්චිත පාඩුවක් විඳදරාගැනීමෙන් පසුව, ගුවන් සේවා කර්මාන්තය 2023 දී සාමූහික ලාභයක් ලබා ගැනීමට සූදානමින් සිටී. 2022 තුළ, විශේෂයෙන් තිරසාරභාවය පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රධාන අභියෝගවලට මුහුණ දීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ 41 වැනි සමුළුවේදී දිගු කාලීන අභිලාෂී ඉලක්කය, එනම් 2050 වන විට ශුද්ධ ශූන්‍ය කාබන් විමෝචනය සාක්ෂාත් කර ගැනීම සඳහා කර්මාන්තයේ කැපවීම සමඟ රාජ්‍ය ආයතන පෙළගස්වා ඇත. මීට අමතරව, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා වන කාබන් අඩුකිරීම් සහ අඩු කිරීමේ යෝජනා ක්‍රමය 2019 විමෝචනයෙන් 85% දක්වා සංශෝධනය කරන ලද අතර එය ගෝලීය මෙහෙයුම් වලින් සිදුවන විමෝචනය විසඳීමේ මූලික මූල්‍ය යාන්ත්‍රණය ලෙස ස්ථානගත කරන ලදී. ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා වන කාබන් අඩුකිරීම් සහ අඩු කිරීමේ යෝජනා ක්‍රමය හි අඛණ්ඩතාව සහතික කරමින් පිරිසිදු බලශක්ති ප්‍රභවයන් වෙත ගුවන් සේවා සංක්‍රමණය කිරීමට පහසුකම් සපයන ප්‍රතිපත්ති සම්පාදනය කරනතුරු කර්මාන්තය රජය දෙස විමසිලෙන් බලා සිටියි.

2022 පෙබරවාරි මාසයේදී රුසියාව යුක්රේනය ආක්‍රමණය කිරීමෙන් පසුව, බොරතෙල් බැරලයක මිල ඩොලර් 120 ඉක්මවා ගොස් දශකයක ඉහළම වාර්තාවක් සනිටුහන් කළේය. ඊට සමගාමීව, ගුවන් ගමන් ඉල්ලුම එහි ඉහළ අගයක පැවති බැවින් ජෙට් ඉන්ධන මත යැපීම වැඩි විය. කෙසේ වෙතත්, සීමිත පිරිපහදු ධාරිතා, තත්ත්වය තවත් උග්‍ර කළ අතර, බොරතෙල් සහ ජෙට් ඉන්ධන මිල අතර පෙර නොවූ විරූ වෙනස්කම්වලට එය තුඩු දුන් අතර, පහත රූප සටහන් 01 හි දැක්වෙන පරිදි 2023 ගිම්හානයේදී බැරලයකට ඩොලර් 60 කට වඩා ඉහළ අගයක් වාර්තා විය. උච්චතම අවස්ථාවට සාපේක්ෂව තෙල් මිලෙහි සුළු මධ්‍යස්ථතාවයක් පෙන්නුම් කලද, මිල දැඩි ඉහළ අගයක පවතී. එයට ප්‍රතිචාර වශයෙන්, ගුවන් සමාගම් ඔවුන්ගේ මෙහෙයුම් ප්‍රවේශයන් ක්‍රියාකාරීව නැවත ක්‍රමාංකනය කරමින් පිරිවැය කළමනාකරණය කිරීමට සහ පාරිසරික බලපෑම අවම කිරීමට නව, වඩා ඉන්ධන කාර්යක්ෂම ගුවන් යානා සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදු කරයි. මෙම ප්‍රයත්නයන් නොතකා, ඉහළ පොලී අනුපාත මගින් සංකලනය වූ ශ්‍රම සහ යෙදවුම් වියදම් උත්සන්න වීම ඇතුළු ප්‍රබල අභියෝගවලට කර්මාන්තය මුහුණ දෙයි. ගෝලීය ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීමේ හැකියාව තෙල් ඉල්ලුම සමනය කිරීමට යම් පීඩනයක් ඇති කළ හැකි වුවද, අවදානම් සහ අවිනිශ්චිතතාවයන්ගෙන් යුත් සංකීර්ණ ජාලයක් මධ්‍යයේ ගුවන් සේවා අංශය සියුම් ලෙස සකස් වී ඇත.

**රූප සටහන 01: කර්මාන්තයේ පිරිවැය පීඩනය ඉහළ මට්ටමක පවතී**




*මූලාශ්‍රය : ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (2024)*

පැවති සංචාරක සීමාවන් හේතුවෙන් 2022 මුල් භාගයේදී ජාත්‍යන්තර මගී ගමනාගමනය පසුබෑමකට ලක් වුවත්, සංචාරක සීමාවන් ඉවත් කරන ඕනෑම වෙලාවක, ඕනෑම ස්ථානයක ජාත්‍යන්තර ආදායම් මගී කිලෝමීටර් සීඝ්‍රයෙන් ඉහළ යාම හරහා ගමන් කිරීමට ඇති ගෝලීය උනන්දුව පැහැදිලි වේ. 2023 සලකා බලන විට, ජාත්‍යන්තර ගමනාගමනය දේශීය ගමනාගමනය සමඟ ඇති පරතරය වසා දැමීමට පටන් ගත් අතර, 2021 දී පූර්ව වසංගත මට්ටම්වල සාමාන්‍ය 24.6% සිට 2022 දී 62.1% දක්වා ඉහළ ගොස් 2023 දී එම අගය ද ඉක්මවා ගියේය.

ජාත්‍යන්තර ගමනාගමනය 2023 මාර්තු මාසයේ කැපී පෙනෙන සන්ධිස්ථානයක් අත්විඳිමින් 2019 මාර්තු මට්ටම මෙන් 81.6% දක්වා ළඟා වීමත් සමඟ ජාත්‍යන්තර ගමනාගමනය ප්‍රකෘති තත්ත්වයට පැමිණීම 2023 පළමු කාර්තුව තුළ ආරම්භ විය.

### ගුවන් භාණ්ඩ වෙළෙඳපොළ

පහත රූප සටහන 02 හි පෙන්වා ඇති පරිදි පූර්ව වසංගත කාලපරිච්ඡේදය හා සසඳන විට, 2023 දී කර්මාන්තයේ භාණ්ඩ ටොන් කිලෝමීටර් පූර්ව වසංගත මට්ටමට ආසන්න බව නිරීක්ෂණය කරන ලදී. ලතින් ඇමරිකානු ගුවන් සමාගම් 2021 දී දීර්ඝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලීන්ගෙන් පසුව යථා තත්ත්වයට පත් වූ අතර ඔවුන්ගේ භාණ්ඩ ප්‍රවාහනය පූර්ව වසංගත මට්ටමට ආසන්න වේ. ලෝක ව්‍යාප්ත වෙළඳ වර්ධනය, ගුවන් භාණ්ඩ ඉල්ලුම අභිබවා ගොස් 2021 ට වඩා මන්දගාමී වේගයකින් වුවද ගෝලීය භාණ්ඩ වෙළඳාම 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා අඛණ්ඩව ඉහළ ගියේය. ඊට හාත්පසින්ම වෙනස්ව, ගෝලීය වෙළඳාමේ වර්ධනය ගුවන් ප්‍රවාහනයට වඩා සමුද්‍රීය ප්‍රවාහනයට වාසිදායක බව පෙන්නුම් කරමින් ගුවන් භාණ්ඩ ටොන් කිලෝමීටර් 2022 මාර්තු මාසයේ සිට අඛණ්ඩව මාස දොළහක පසුබෑමක් අත්විඳියි. පෙර වසර හා සසඳන විට භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම අඩුවීමත් සමඟ, ව්‍යාපාරවලට ඇණවුම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොග පීඩනය අවම බැවින්, ඉක්මනින් තොග නැවත

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

පිරවීම සඳහා ගුවන් ප්‍රවාහනය භාවිතා කිරීමේ අවශ්‍යතාවයද අවම විය. ධාරිතාව වැඩි වීම සහ අඩු ඉල්ලුම හේතුවෙන් අඩුවන වැඩ ප්‍රමාණය ගුවන් භාණ්ඩ අදායම අඩු වීමට පීඩනයක් ඇති කරන අතර, ගුවන් භාණ්ඩ භාරය පූර්ව-කොවිඩ් පරාසයට පහත වැටී ඇත. 2021 මැයි මාසයේ සිට ගුවන් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව ඉහළ යාමට බොහෝ දුරට මගී ගුවන් යානා වල බඳධාරිතාව ප්‍රතිෂ්ඨාපනය කිරීම හේතු වී ඇති අතර, 2021 දෙසැම්බර් මාසයේ සිට භාණ්ඩ ප්‍රවාහනය සඳහා කැපවූ යාත්‍රා වල ධාරිතාව අඩුවෙමින් පවතී. ගුවන් භාණ්ඩ ප්‍රවාහනය 2021 දෙසැම්බරයේ දී සර්වකාලීන ඉහළ මට්ටමකට ළඟා වුවද, ඒවා 2022 වසරෙන් වැඩි කාලයක් තුල පහත වැටීමට පටන් ගත්තේය. අදායම තවමත් පූර්ව කොවිඩ් මට්ටමට වඩා වැඩිය. නමුත් වැඩ ප්‍රමාණය ඔවුන්ගේ සාමාන්‍ය පරාසයට නැවත පැමිණ ඇති බැවින්, ආදායම පහත වැටීමේ ප්‍රවණතාවය 2023 දක්වා අඛණ්ඩව පවතිනු ඇත.

**රූප සටහන 02: මාර්ගය අනුව ජාත්‍යන්තර භාණ්ඩ ටොන් කිලෝමීටර් වර්ධනය (වසරින් වසර)**




ඒ අතරම, ප්‍රධාන කාණ්ඩ 2ක් අනුව ගෝලීය ගුවන් සේවා ආදායම විශ්ලේෂණය කරන විට, මගී සහ භාණ්ඩ ප්‍රවාහනය, 2023 වර්ෂය තුළ, පහත රූප සටහන් 03හි පෙන්වා ඇති පරිදි පිළිවෙලින් ඇමරිකානු ඩොලර් බිලියන 580 සහ ඇමරිකානු ඩොලර් බිලියන 120 ලෙස වාර්තා විය.

**රූප සටහන 03 ගෝලීය ගුවන් සේවා ආදායම, කාණ්ඩය අනුව**




## ගුවන් සමාගම් මූල්‍ය කාර්ය සාධනය (2000-2023)

මගී සහ භාණ්ඩ සඳහා මිශ්‍ර කාර්ය සාධනය 2022/2023

2023 වසරේ මගී සහ භාණ්ඩ ප්‍රවාහන වෙළඳපොලවල ක්‍රියාකාරීත්වය මිශ්‍ර ප්‍රවණතාවයක් පෙන්නුම් කළද, 2020 වසරේ ඇති වූ සැලකිය යුතු පසුබෑම් වලින් පසුව ගුවන් සමාගම්වල මූල්‍ය තත්ත්වය වේගයෙන් යථා තත්ත්වයට පත් විය. ඉහළ ආදායම සහ ජාත්‍යන්තර මගීන්ගේ පුනර්ජීවනය හේතුවෙන් ඇස්තමේන්තුගත මගී ආදායම 80% කින් ඉහළ ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව, භාණ්ඩ ප්‍රවාහන ආදායමේ ඉහළ යාමක් තිබියදීත් භාණ්ඩ ප්‍රමාණයේ අඩුවීමක් හේතුවෙන් භාණ්ඩ අයභාරය පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මගී සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහන සේවා යන දෙඅංශයෙන්ම, සාක්ෂාත් කර ගත් වැඩ ප්‍රමාණය සහ ලාභ සමච්ඡේදන ලක්ෂය සඳහා අවශ්‍ය වැඩ ප්‍රමාණය අතර පරතරය අඩු වෙමින් පවතින අතර, ලාභදායිත්වය කරා යන මාවතක් සංඥා කරයි.

**රූප සටහන 04: කර්මාන්තයේ ආදායම් සහ පිරිවැයේ උච්චතම අවස්ථාව**




2022 දී, ගුවන් සමාගම් ඔවුන්ගේ වියදම්වල සැලකිය යුතු වැඩිවීමකට මුහුණ දුන් අතර, යුක්රේනයේ ගැටුම බොහෝ දුරට මෙයට බලපෑම් ඇති කල අතර, එය ගෝලීය භාණ්ඩ මිලෙහි තියුනු වැඩිවීමක් ඇති කිරීමට හේතු විය. මීට අමතරව, එක්සත් ජනපද ඩොලරයේ අගය ඉහළ යාම සහ ඉහළ පොලී අනුපාත ගුවන් සේවා පිරිවැය ඉහළ යාම තවදුරටත් උද්දීපනය කළේය. එපමනක් නොව, ඇතැම් වෙළඳපොළවල ශ්‍රම සහ අනෙකුත් යෙදවුම් වියදම් ඉහල යාම කර්මාන්තයේ ලාභදායිතාවයට අමතර බාධාවක් විය.

බොර තෙල් මිල සහ වෙළඳපොළ ඉන්ධන මිල අතර පරතරය ඒවායේ 2022 මට්ටම්වලට වඩා ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කළද, ඒවා 2023 දී ද ඉහළ මට්ටමක පැවතුනි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉන්ධන කාර්යක්ෂමතාවය අඛණ්ඩව ඉහළ නැංවීම අරමුණු කරගත් උපාය මාර්ග ඇතුළු පිරිවැය සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී ප්‍රවේශයක් පවත්වා ගැනීම කර්මාන්තයට අත්‍යවශ්‍ය වේ.

2021 අවසන් වන විට, මගී සහ භාණ්ඩ ප්‍රවාහකයන් සඳහා වන මුළු ආදායම පූර්ව වසංගත මට්ටමින් 60% දක්වා ළඟා වූ අතර, එය 2022 අවසානය වන විට 87% දක්වා ඉහළ ගිය අතර මෙම ප්‍රවණතාවය 2023 දක්වා පැවතිණි. මුළු ආදායම ඇමරිකානු ඩොලර් බිලියනය 780 ක් පමණ වන අතර මෙය එක් මගියෙකු එක ඩොලරයකට සමාන වන 0.6% ක ඉතා කුඩා ආන්තිකයක් පෙන්නුම් කරයි.

## ගුවන් සේවා කර්මාන්තයේ ඉදිරි දැක්ම 2023 - 2024

2023 දී, ගුවන් සේවා කර්මාන්තයේ ගුවන් මෙහෙයුම්වල සැලකිය යුතු පුනර්ජීවනයක් අත්විඳින අතර, පෙර වසරවලට සාපේක්ෂව පියාසර පරිමාවේ කැපී පෙනෙන වැඩිවීමක් සංලක්ෂිත විය. මෙම පුනර්ජීවනයට

හේතු වූයේ සංචාරක සීමා ලිහිල් කිරීම සහ සංචාරය කිරීමට මගීන්ගේ ඇති ඉල්ලුම ඉහළ යාම, මෙන්ම නැගීම සපුරාලීම සඳහා තම පිරිනැමීම් කඩිනමින් පුළුල් කිරීමට ගුවන් සමාගම් පෙළඹීමය. අත්‍යවශ්‍ය ප්‍රමිතික සොයා බැලීම් වලින් හෙළි වන්නේ ගුවන් ගමන් වල හදවත පිහිටා ඇත්තේ අසල්වැසි ප්‍රදේශ අතර ඇති සංකීර්ණ සම්බන්ධතා ජාලය තුළ බවයි.

මගී සහ භාණ්ඩ ප්‍රවාහන දත්ත, මාර්ග සහ ගුවන් යානා භාවිතය පිළිබඳ දැඩි විශ්ලේෂණයක් සිදු කල යුතු අතර, මෙම සමාලෝචනය අතීතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පමණක් නොව, කර්මාන්තයේ අනාගතය සඳහා උපාය මාර්ගික මාර්ග සිතියමක් ලෙසද ක්‍රියා කරනු ඇත. එය අවිනිශ්චිතතාවයන් නිසි ලෙස හසුරුවා ගැනීමට, නැගී එන අභියෝගවලට විසඳුම් සෙවීමට සහ දිනෙන් දින විකාශනය වන ගුවන් සේවා දර්ශන පථයේ තිරසාර වර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය මෙවලම් වලින් පාර්ශවකරුවන් සන්නද්ධ කරනු ඇත.

## 2023 දී දැඩි සහ උපායශීලී අයුරින් විසන්ධි කරන ලද ගුවන් යානා ගමන් මාර්ග

ගුවන් ඝණත්වය පිළිබඳ විශ්ලේෂණයක් මගින් මගී සහ භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් අතර විශාල වෙනසක්, එනම් මගී ගුවන් ගමන් සැලකිය යුතු ලෙස භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් අභිබවා, නැතිනම් එහි ප්‍රමාණය දෙගුණය දක්වා ළඟා වීමට ආසන්න බව හෙළි කර ඇත. කලාපීය මෙහෙයුම් තුළ, උතුරු ඇමරිකාව ගුවන් ගමන් 704,000 ක් සමඟ භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන්වල පෙරමුණ ගෙන ඇති අතර, එය අනුගමනය කරමින් ආසියාවේ ගුවන් ගමන් 282,000 ක් සහ යුරෝපයේ ගුවන් ගමන් 210,000 ක් සිදුව ඇත. මේ අතර, ගුවන් ගමන් 98,000 ක් සමගින් ආසියාව අන්තර් මහද්වීපික ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ප්‍රමුඛ ස්ථානයට පත්විය.

මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ගත් කල, උතුරු ඇමරිකාව ගුවන් ගමන් මිලියන 11.3 ක් සමග් කාර්යබහුලම කලාපය ලෙස ඉස්මතු වූ අතර, ගුවන් ගමන් මිලියන 10.5 ක් සමඟ ආසියාව එයට සමගාමී වන අතර, යුරෝපය ගුවන් ගමන් වලින් අඩක් සමඟ තුන්වන ස්ථානය ස්ථානයට පත් විය. අන්තර් මහද්වීපික සංචාර සම්බන්ධයෙන්, ආසියාව සහ යුරෝපය වඩාත් ජනප්‍රිය ගමනාන්ත අතරට පැමිණ ඇත.

**රූප සටහන 05: 2023 දී ගුවන් යානා ඝනත්වය සහ උපාය මාර්ගික මාර්ග හෙළිදරව් කිරීම**




*මූලාශ්‍රය : ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (2023)*

## 2023 දී භාණ්ඩ හා මගී ගමනාගමනයේ ආධිපත්‍ය දැරූ ගුවන් යානා වර්ග 5

ගුවන් යානා ක්ෂේත්‍රය ගවේෂණ තුළ, බොයින්ග් භාණ්ඩ ප්‍රවාහනයේ ඉදිරියෙන්ම සිටින අතර, එයාර්බස් මගී ගමන් ක්ෂේත්‍රයේ ප්‍රධාන ස්ථානය ගනු ලබයි. බොයින්ග් 767-300F ගුවන් යානා 315,000 භාණ්ඩ ප්‍රවාහනය සමගින් කාණ්ඩයට නායකත්වය දුන් අතර, බොයින්ග් 777-200F 179,000 භාණ්ඩ ගුවන් ගමන් සමඟ එයට සමගාමී වෙයි. එයාර්බස් ප්‍රමුඛතම ගුවන් යානා 5 හි ආධිපත්‍යය දරන අතර, ක්‍රියාත්මක කරන ලද ගුවන් ගමන් සංඛ්‍යාව අනුව ඉහළම ස්ථානය බොයින්ග් 737-800 වෙත වන අතර එය ගුවන් ගමන් මිලියන 6.4 කට වඩා වැඩිය. ප්‍රමුඛතම එයාර්බස් ගුවන් යානය වන A320-200 එහි අඩක් එනම් ගුවන් ගමන් මිලියන 3.7 ක් සමඟ ඉතා සමීපව පසුපසින් සිටියි. මෙම ආධිපත්‍ය බෙදීම, කාර්යක්ෂම ලෙස භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ දිනෙන් දින වර්ධනය වන මගීන් සංඛ්‍යාව සඳහා සුවපහසු, ඉන්ධන-කාර්යක්ෂම විකල්ප සැපයීම යන ද්විත්ව ඉල්ලීම්වලට කර්මාන්තයේ ප්‍රතිචාරය අවධාරනය කරයි.

**රූප සටහන 06: ක්‍රියාත්මක කළ ගුවන් ගමන් සංඛ්‍යාව අනුව ප්‍රමුඛතම ගුවන් යානා වර්ග 5**






කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

**මගී ගමනාගමන පුරෝකථනය 2023-2024: උපාය මාර්ගික ක්‍රියා මාර්ග**

- කොවිඩ්-19 වසංගතයට පෙර, ගෝලීය මගී ප්‍රමාණය 2023 දී මගීන් බිලියන 10.5 දක්වා ළඟා වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වෙතත්, 2023 දී ගෝලීය මගී පරිමාවේ වර්තමාන ප්‍රක්ෂේපනය ආසන්න වශයෙන් මගීන් බිලියන 8.6 ක් වන අතර එය 2019 මට්ටමෙන් 94.2% කි.

- ඉදිරිය දෙස බලන විට, මගීන් බිලියන 9.2 ක් වූ 2019 වසර අභිබවා යමින් 2024 වසරේ මගීන් බිලියන 9.4 ක් (2019 මට්ටමෙන් 102.5%) කරා ළඟා වන විට එය ගෝලීය මගී ගමනාගමන ප්‍රකෘතියේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරනු අතැයි අපේක්ෂා කෙරේ. 2024 දී මගීන් බිලියන 10.9 ක් පුරෝකථනය කළ පූර්ව-කොවිඩ් පුරෝකථනය හා සසඳන විට, වසංගතයේ බලපෑම් 13.9% ක විභව පාඩුවක් නියෝජනය කරයි.

- අප්‍රිකානු කලාපය ඉදිරි වසර සඳහා ක්‍රමානුකූලව වැඩිවන රටාවක් අපේක්ෂා කරන අතර එය 2023 වසරේ මගීන් මිලියන 221 ක් හෝ 2019 මට්ටමෙන් 96.3% ක් කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 අවසානය වන විට කලාපය මගීන් මිලියන 253 ක් හෝ 2019 මට්ටමෙන් 110.6% ක් කරා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම ස්ථාවර වර්ධනය ඊජිප්තුව, මොරොක්කෝව සහ ටියුනීසියාව වැනි නැගී එන වෙළඳපොළවල් විසින් මෙහෙයවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ආසියා පැසිෆික් කලාපය 2023 පළමු භාගයේදී චීන වෙළඳපොළ විවෘත කිරීමත් සමඟ මගී ගමනාගමනයේ සැලකිය යුතු පිම්මක් අපේක්ෂා කළ අතර, එතෙර සංචාරක ව්‍යාපාරය සහ ඉදිරි ආර්ථික ගැටළු වැනි අභියෝග හේතුවෙන් එහි ප්‍රකෘතිය වසරේ දෙවන භාගයේදී සැලකිය යුතු ලෙස මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වසර අවසන් වන විට, කලාපය මගීන් බිලියන 2.9 ක් හෝ 2019 මට්ටමෙන් 87.3% ක් කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වාසිදායක සහ අවාසිදායක යන සාධක දෙකෙන්ම ඇති අවිනිශ්චිතතාවයන් සමඟ, කලාපය 2024 දී ආසන්න වශයෙන් මගීන් බිලියන 3.4 ක් හෝ 2019 මට්ටමෙන් 99.5% ක් කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- යුරෝපයේ, 2022 ගිම්හාන සමය තුළ දක්නට ලැබුණු තියුනු වැඩිවීමට සාපේක්ෂව 2023 සහ 2024 දී මගී ගමනාගමනය යථා තත්ත්වයට පත් කිරීමේ වේගය අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2023 අවසන් වන විට, කලාපය 2019 මට්ටමෙන් 95.5% නියෝජනය කරමින්, මගීන් බිලියන 2.3 ක් පමණ වෙත සත්කාරකත්වය සපයනු ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇත. 2024 වන විට ආසන්න වශයෙන් මගීන් බිලියන 2.5ක් සමඟින්, 2019 මට්ටමෙන් 101.4% දක්වා ළඟා වෙමින්, මන්දගාමී වේගයකින් වුවද, මෙම වර්ධනය දිගටම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ලතින් ඇමරිකානු-කැරිබියන් කලාපය එහි 2019 මට්ටම ඉක්මවා ගිය පළමු කලාපය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2023 දී, කලාපය මගීන් මිලියන 707 ක් හෝ 2019 මට්ටමෙන් 102.9% ක් කරා ළඟා වනු ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇත. 2024 දී, කලාපය මගීන් මිලියන 759 ක් හෝ 2019 මට්ටමෙන් 110.5% ක් පිළිගැනීමට අපේක්ෂා කෙරේ. අප්‍රිකානු කලාපය මෙන්, කොලොම්බියාව සහ මෙක්සිකෝව වැනි නැගී එන වෙළඳපොළවල් 2019 මට්ටමෙන් ඔබ්බට කලාපය ගෙන යනු ඇතැයි පුරෝකථනය කර ඇත.

- මැදපෙරදිග කලාපය 2022 වර්ෂයේ වේගයෙන්ම ප්‍රකෘතිමත් ව වෙළඳපොළ විය. 2023 වර්ෂයේදී, කලාපය එහි යථා තත්ත්වයට පත්වෙමින් මගීන් මිලියන 394 ක් හෝ 2019 මට්ටමේ 96.8% වෙත ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2024 දී මගීන් සංඛ්‍යාව මිලියන 429 ක් හෝ 2019 මට්ටමෙන් 105.4% ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම පුරෝකථනයට අසල්වැසි වෙළඳපොළවල ආර්ථික තත්වයන් මගින් බලපෑම් ඇති කල හැකිය.

- 2023 අවසානය වන විට, උතුරු ඇමරිකානු කලාපය මගීන් බිලියන 2.0 ක් හෝ 2019 මට්ටමෙන් 99.8% ක් සමඟ 2019 මට්ටමට ළඟා වනු ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇත. 2021 සහ 2022 කාලය තුළ කලාපය දේශීය සංචාර මගින් ප්‍රබල ප්‍රකෘතියක් පෙන්නුම් කළ අතර, ඉදිරි වසර කිහිපය සඳහා එහි වර්ධනය මන්දගාමී වේගයකින් ඉදිරියට යනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වර්ෂයේදී, කලාපයේ මගී ගමනාගමනය මගීන් බිලියන 2.1ක් හෝ 2019 මට්ටමෙන් 103.7%ක් කරා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

**රූප සටහන 07: 2019 මට්ටමට සාපේක්ෂව ප්‍රක්ෂේපිත ගෝලීය කාර්තුමය මගී ප්‍රවාහනය (2020-2024, කාර්තුමය දර්ශකය, 2019 මට්ටම = 100%)**




*මූලාශ්‍රය: ජාත්‍යන්තර ගුවන්තොටුපොළ කවුන්සිලය - ගෝලීය 2024*

**රූප සටහන 08: මධ්‍යම කාලීන ගෝලීය මගී ගමනාගමන ප්‍රක්ෂේපණය (සුචිගත කළ, 2019 = 100)**




*මූලාශ්‍රය: ජාත්‍යන්තර ගුවන්තොටුපොළ කවුන්සිලය - ගෝලීය 2024*

**රූප සටහන 09: ගෝලීය මගී ගමනාගමනය - ඇස්තමේන්තුගත පාඩු සහ ප්‍රකෘතිය (මගීන් බිලියන ගණනින්)**




*මූලාශ්‍රය: ජාත්‍යන්තර ගුවන්තොටුපොළ කවුන්සිලය - ගෝලීය 2024*

## ආර් 10 න් පිටුබල ගැන්වූ පුනර්ජීවනය

**1) ගුවන්තොටුපළ මෙහෙයුම් හි පුනරුදය**

කොවිඩ්-19 වසංගතය විසින් එල්ල කරන ලද අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, ලොව පුරා ගුවන් තොටුපළ නවෝත්පාදනය, අනුවර්තනය වීමේ හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැනි සංලක්ෂ මගින් පරිවර්තනීය අවධියකට යොමු වෙමින් පවතී. ගුවන් සේවා කර්මාන්තය යථා තත්ත්වයට පත් වන විට, ගුවන්තොටුපළවල ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ මගීන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා නව උපාය මාර්ග, තාක්ෂණයන් සහ මෙහෙයුම් ප්‍රවේශයන් ක්‍රියාත්මක කරයි. ගුවන්ගමන් සඳහා දීප්තිමත් අනාගතයක් සැකසීමට කර්මාන්තයේ කැපවීම අවධාරණය කරමින්, ගුවන් තොටුපළ මෙහෙයුම්වල පුනරුදයට තුඩු දෙන ප්‍රධාන මූලාරම්භයන්, වර්ධනයන් සහ සන්දිස්ථාන මෙම සංක්ෂිප්ත ලැයිස්තුවෙන් ඉස්මතු කරයි.

**රූප සටහන 10: ජාත්‍යන්තර සංචලන - සියළු ගුවන්තොටුපළ**



# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

**ස්මාර්ට්වින්ග්ස් ශ්‍රී ලංකාවට මෙහෙයුම් දියත් කිරීම.**
ස්මාර්ට්වින්ග්ස් හංගරි, හංගේරියාවේ බුඩාපෙස්ට් සිට බ.ජා.ගු. වෙත වරලත් ගුවන් ගමන් දියත් කළේය. දෙසැම්බර් මාසයේදී ආරම්භක ස්මාර්ට්වින්ග්ස් වරලත් ගුවන්යානය මගීන් 183 දෙනෙකු සමඟ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත පැමිණියේය. පැමිණීමත් සමඟම ගුවන් යානයට උත්සවාකාරයෙන් ජල ප්‍රහාරක ආචාරයක් පිරිනැමුණු අතර, උඩරට සම්ප්‍රදායික නර්තනයකින් මගීන් පිළිගනු ලැබුවේ ඔවුන් ගමනාන්තය වෙත උණුසුම් පිළිගැනීමක් ලබා දෙමිනි.


*ස්මාර්ට්වින්ග්ස් මෙහෙයුම් ඇරඹීම*

**එයාර් සීෂෙල්ස් ශ්‍රී ලංකාවට මෙහෙයුම් දියත් කිරීම**
සීෂෙල්ස් ජනරජයේ ජාතික ගුවන් සේවය වන එයාර් සීෂෙල්ස් තම රටේ සිට ශ්‍රී ලංකාවේ කොළඹ දක්වා සතිපතා ගුවන් ගමන් වාර දෙකක් සමඟ නව සේවාවක් දියත් කොට ඇත.

මෙම දූපත් දෙක යා කරමින් පැය හතරක කෙටි ගමනකින් පසු ප්‍රථමගුවන් යානය ජුනි මාසයේදී කොළඹට ගොඩ බස්සවන ලදී.

ගුවන් සේවයේ එයාර්බස් A320 නියෝ ගුවන්යානය ව්‍යාපාරික පන්ති මගීන් 12 දෙනෙකු සහ සාමාන්‍ය පන්තියේ මගීන් 156 දෙනෙකු වින්‍යාසය යටතේ පියාසැරි සේවය සිදු කරනු ලබයි.

කොළඹ සේවාව ශ්‍රී ලංකන් ගුවන්සේවය සමඟ අන්තර් සම්බන්ධිත හවුල්කාරිත්වයක් හරහා සම්බන්ධතා 20 කට වඩා ලබා දෙනු ඇත. මෙය ඉන්දියාවේ, බංග්ලාදේශයේ ගමනාන්ත ගණනාවකට සහ බැංකොක්, ක්වාලාලම්පූර් සහ සිංගප්පූරුව වැනි ඉහළම සංචාරක ස්ථාන වෙත පහසුවෙන් ළඟා විය හැකි එක්-නැවතුම් සම්බන්ධතාවයක් සඳහා ඉඩ සලසයි.



*එයාර් සීෂෙල්ස් මෙහෙයුම් දියත් කිරීම*

**එලයන්ස් ගුවන්සේවය යා.ජා.ගු. වෙත සිය 100 වැනි ගුවන් ගමන සම්පූර්ණ කිරීම .**
ගෝලීය වසංගතයෙන් පසුව යාපනය සහ චෙන්නායි අතර ජාත්‍යන්තර කාලසටහන්ගත ගුවන් ගමන් මෙහෙයුම් නැවත ආරම්භ කිරීමෙන් පසු, එලයන්ස් ගුවන්සේවය 2023 ජුනි මාසයේදී යා.ජා.ගු. වෙත සිය 100 වැනි ගුවන් ගමන සම්පූර්ණ කළේය.

AIAHL හි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන එලයන්ස් ගුවන්සේවය , 2022 දෙසැම්බර් මාසයේදී චෙන්නායි ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත වාණිජ ගුවන් ගමන් මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදී. දැනට, ගුවන් සමාගම සතියකට නියමිත ජාත්‍යන්තර ගුවන් ගමන් හතරක් ක්‍රියාත්මක කරන අතර, යාපනය අතර දෛනික මෙහෙයුම් දක්වා එහි වාර ගණන වැඩි කිරීමට සැලසුම් කරයි. 2023 වසරේ මේ දක්වා ගුවන් සමාගම උතුරු දොරටුව හරහා මගීන් 12,000ක් පමණ හසුරුවා ඇත. අපගේ ගු.ගු.සේ.ස බිම් හැසිරවීමේ කණ්ඩායම මෙම ගුවන් ගමන් සඳහා සියලුම බිම් හැසිරවීමේ සේවාවන් සපයා ඇති අතර එමඟින් සියලුම මගීන්ට සුමට හා කාර්යක්ෂම අත්දැකීමක් සහතික කොට ඇත.

රටේ උතුරු ප්‍රදේශයෙන් ගුවන් ගමන් සඳහා වැඩිවන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, *එලායන්ස් ගුවන්සේවය* එම විභවය ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන්ගේ සහයෝගය ඇතිව ලබා ගත්තේය. යාපනය සහ චෙන්නායි අතර මෙම සෘජු ගුවන් ගමන් මෙහෙයුම දකුණු ඉන්දීය ගමනාන්ත සියල්ලටම වඩා හොඳ සම්බන්ධතාවක් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ, විශේෂයෙන් උතුරු පළාතේ සංචාරක කර්මාන්තයට විශාල ලෙස ප්‍රබෝධයක් ලබා දෙනු ඇත.



*එලායන්ස් ගුවන්සේවය සිය 100 වැනි ගුවන් ගමන යා.ජා.ගු හි සම්පූර්ණ කිරීම*

**සිංගප්පූරු ගුවන් සේවය කොළඹ සහ සිංගප්පූරුව අතර B787-10 ගුවන් යානා දියත් කිරීම.**
සිංගප්පූරු ගුවන් සේවයට අයත් SQ 468/469, B787-10 සමාරම්භක ගුවන් යානය ශ්‍රී ලංකාව වෙත 2023 මාර්තු මාසයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල වෙත ගොඩ බස්වනු ලැබිය. මෙම නව ගුවන් යානය වැඩි දියුණු කළ වාතාවරණයක් සහ වැඩිදියුණු කළ ගුවන් ගමන් අත්දැකීමක් ලබා දෙමින් ව්‍යාපාරික පන්තියේ ආසන 36 ක් සහ සාමාන්‍ය පන්තියේ ආසන 301 ක් සමඟ ශ්‍රී ලංකාවට සහ ඉන් පිටතට මගී ධාරිතාව වැඩි දියුණු කර ඇත.

සිංගප්පූරු ගුවන් සේවය B787-10 තිරසාර ගමනාගමන හැකියාවක් ලබා දීම උදෙසා තිරසාර ඉන්ධන කාර්යක්ෂමතාවයක් සහිත බාධාවකින් තොර ගමන් අත්දැකීමක් ලබා දෙනු ඇත.



*සිංගප්පූරු ගුවන් සේවයේ මංගල B787-10 ගුවන් යානය පැමිණීම*

**බ.ජා.ගු. හි ගුවන් භාණ්ඩ හැසිරවීමේ ධාරිතාව වැඩි කිරීමට ගු.ගු.සේ. හි උපාය මාර්ගය**

ගු.ගු.සේ.ස, බ.ජා.ගු. හි ගුවන් භාණ්ඩ මෙහෙයුම්වල වැඩි ධාරිතාවක් සඳහා පහසුකම් සැලසීමේදී පෙරමුණ ගෙන කටයුතු කිරීම සතුටට කරුණකි. මෙම දැක්ම සාක්ෂාත් කර ගනිමින්, මෙසානින් තට්ටුව සහිත වෙර ගැන්වූ ශක්තිමත් තෙමහල් කොන්ක්‍රීට් ගොඩනැගිල්ලක් ඉදිකිරීම (ආසන්න ප්‍රදේශයː වර්ග මීටර 18,715), ව්‍යුහාත්මක පෙර සැකසූ වානේ වලින් සාදන ගොඩනැගිල්ලක් ඉදි කිරීම (ආසන්න ප්‍රදේශයː වර්ග මීටර 1,567), මාර්ග පුළුල් කිරීම (ආසන්න වශයෙන්ː වර්ග මීටර 555) සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශයක් ඉදි කිරීම (ආසන්න ප්‍රදේශයː වර්ග මීටර 1,620) සහ යාන්ත්‍රික, විද්‍යුත් සහ තොරතුරු තාක්ෂණ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. මෙය නව ආනයන ගුවන් භාණ්ඩ ගොඩනැගිල්ලක් ලෙස බ.ජා.ගු. වෙත එක් කරන 6 වන ගුවන් භාණ්ඩ ප්‍රවාහන පර්යන්තය වන අතර, දැනට පවතින ආනයන පර්යන්ත පහසුකම අපනයන මෙහෙයුම් සඳහා උපායශීලී ලෙස පරිවර්තනය කිරීමෙන් පරිශීලකයින් සඳහා 250,000 මෙ.ටො. සිට 400,000 මෙ.ටො. දක්වා සමස්ත ධාරිතාව වැඩි දියුණු කිරීමක් ලබා දෙනු ඇත.

වර්තමාන ව්‍යාපාරික පරිසරය තුළ, දේශීය නිෂ්පාදනය සඳහා නව වෙළඳපොළවල් සොයා ගැනීමට පහසුකම් සැලසීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ අපගේ අපනයන ප්‍රවර්ධනය කරමින් රටට විදේශ ආදායමක් උපයා ගැනීම ජාතික අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. ගුවන්තොටුපළ ක්‍රියාකරු සහ ගුවන් සේවා සපයන්නා වශයෙන්, ගු.ගු.සේ.ස හි උපාය මාර්ගය වන්නේ, ශ්‍රී ලංකාවේ සෑම අස්සක් මුල්ලක් නෑර ආරම්භ වන කාර්මික, සාමාන්‍ය සහ ඉක්මනින් නරක් විය හැකි අපනයනවල අනාගත වර්ධනය සඳහා බෙහෙවින් අවශ්‍ය කරන ලද ජාතික අවශ්‍යතාවය වන වේගවත් ගුවන් ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීමයි. සමස්ත උපාය මාර්ගයේ කොටසක් ලෙස, 2023 ජනවාරි මාසයේදී මහජනතාව සඳහා විවෘත කරන ලද නව පිවිසුම් ගොඩනැගිල්ල, බ.ජා.ගු. ගුවන් භාණ්ඩ ප්‍රවාහන පරිශ්‍රයේ සියලුම පරිශීලකයින් සඳහා වැඩි දියුණු කරන ලද එක් නැවතුම් පහසුකමක් පිරිනැමීමට ආයතනය තුලම සංවර්ධිත ස්වයංක්‍රීය වාහන කළමණාකරණ පද්ධතියක අමතර කාර්යක්ෂමතාව ද ඇතුළත් ය.

දැනට ක්‍රියාත්මක වන සංවර්ධන සැලසුම් සමඟින්, යෝජිත නව ගුවන් භාණ්ඩ ප්‍රවාහන පර්යන්තය කර්මාන්තයේ අනාගත අවශ්‍යතා සහ ඉල්ලීම් සඳහා සහාය වීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු නොඅනුමානය.

## 2) පොලී ආදායම නැවත ශක්තිමත් කිරීම

ගු.ගු.සේ.ස සිය පොලී ආදායම පුනර්ජීවනය කිරීම ඉලක්ක කරගත් උපායමාර්ගික මුලපිරීමක් ආරම්භ කළේය. සැලසුම් සහගත මූල්‍ය කළමනාකරණය සහ නව්‍ය ආයෝජන උපාය මාර්ග හරහා, ගු.ගු.සේ.ස සිය පොලී ඉපැයීම්වලට නව ජීවයක් ලබා දීමට උත්සාහ කළ අතර එමඟින් ආදායම් මාර්ග උපරිම කර ගනිමින් තිරසාර මූල්‍ය වර්ධනයක් සහතික කරනු ඇත. සිය වත්කම් උත්තේජනය කිරීම සහ මුදල් ප්‍රවාහය ප්‍රශස්ත කිරීම මගින්, ගු.ගු.සේ.ස සිය මූල්‍ය ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම සහ ගුවන් සේවා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ක්‍රීඩකයෙකු ලෙස තම ස්ථානය ශක්තිමත් කිරීම අරමුණු කර ගෙන ඇත. මෙම පුනර්ජීවන ප්‍රයත්නය හරහා, වැඩි ලාභදායිත්වය සහ දිගු කාලීන මූල්‍ය ප්‍රත්‍යස්ථික හැකියාව සඳහා ඇති අවස්ථා ප්‍රයෝජනයට ගැනීම ගු.ගු.සේ.ස හි අරමුණ විය.

ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 14 දක්වා ඉහළ ගිය අතර, පෙර වසරේ වාර්තා කරන ලද ශුද්ධ මූල්‍ය ගාස්තු වලින් රුපියල් බිලියන 21 ක සැලකිය යුතු පෙරළියක් සනිටුහන් කළේය. දැනට පවතින රුපියල් සහ ඇමරිකානු ඩොලර් ස්ථාවර තැන්පතු සඳහා ඉහළ පොලී අනුපාත යටතේ දීර්ඝ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඉහළ පොලී ආදායමක් ලැබීම මෙම වැඩිවීමට මූලික වශයෙන් හේතු විය. මීට අමතරව, මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රියල් 12 දිනැති විශේෂ ලිපියේ දක්වා ඇති පරිදි ම.රා.ජා.ගු. ඉදිකිරීම දෙවන අවධිය දෙවන අදියර - පළමු ණය සහ ධාවන පථය ආවරණය කිරීම සඳහා ලබාගත් විදේශ ණය ආපසු ගෙවීම නැවැත්වීම මගින් ආයෝජන වර්ධනය විය. ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් සඳහා අරමුදල් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහතික කරමින් ගු.ගු.සේ.ස විසින් සම්පත් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම මෙම උපායමාර්ගික මූල්‍ය උපාමාරු මගින් අවධාරනය කරයි. ඉහළ පොලී අනුපාත ප්‍රාග්ධනය කිරීමෙන් සහ සම්පත් විචක්ෂණශීලීව නැවත වෙන්කිරීමෙන්, ගු.ගු.සේ.ස සිය පොලී ආදායම ඉහළ නංවා ගත්තා පමණක් නොව එහි මූල්‍ය තත්ත්වය ද ශක්තිමත් කර ගෙන ඇත. මෙම නව මූල්‍ය ස්ථායීතාවය ගු.ගු.සේ.ස හි අනාගත වර්ධන අවස්ථා විශ්වාසයෙන් යුතුව හඹා යාමට, ගුවන් යටිතල පහසුකම් සහ සේවා සැපයීමේ විශිෂ්ටත්වය සඳහා එහි කැපවීම ස්ථානගත කිරීම ශක්තිමත් කරයි. ගු.ගු.සේ.ස සිය මූල්‍ය පුනර්ජීවන මාවතේ අඛණ්ඩව ගමන් කරන බැවින්, එය ප්‍රත්‍යස්ති හැකියාවෙන් සහ දූරදර්ශීව ගුවන්සේවා කර්මාන්තයේ ගතික දර්ශන පථයේ සැරිසැරීමට සූදානමින් සිටීයි.

## 3) ප්‍රතිෂ්ඨාපනය

ගු.ගු.සේ.ස ප්‍රතිසංස්කරණය සහ පුනර්ජීවනය සඳහා වූ සිය කැපවීමෙහි නොසැලී සිටින අතර, රටේ ගුවන් සේවා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ව්‍යාපෘති රාශියක් සිදු කරයි. උපායමාර්ගික සැලසුම් සහ කඩිසරව ක්‍රියාත්මක කිරීම් තුළින්, ශ්‍රී ලංකාව පුරා ඇති ප්‍රධාන ගුවන්තොටුපළවල් ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීම සඳහා ගු.ගු.සේ.ස බහුවිධ ප්‍රවේශයක් ආරම්භ කර ඇත. පර්යන්ත පහසුකම් සහ ධාවන පථ වැඩිදියුණු කිරීමේ සිට උසස් ආරක්ෂණ පියවරයන් සහ තාක්ෂණය මත පදනම් වූ විසඳුම් ක්‍රියාත්මක කිරීම දක්වා, ගු.ගු.සේ.ස ගුවන්තොටුපළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීමට සහ මගීන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට කැපවී සිටී. එපමනක් නොව, ගු.ගු.සේ.ස හි ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් භෞතික යටිතල පහසුකම්වලින් ඔබ්බට විහිදෙන අතර, පාරිසරික තිරසාරත්වය සහ ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ මුල පිරීම් ඇතුළත් වේ. විවිධ ව්‍යාපෘති හරහා ප්‍රතිෂ්ඨාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය දීමෙන්, ගු.ගු.සේ.ස සියළුම පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාවේ ගුවන් සේවා දර්ශන පථය වැඩිදියුණු කිරීමට සිය නොසැලෙන කැපවීම පෙන්නුම් කරයි.

සමාලෝචිත වර්ෂය තුළ ගු.ගු.සේ.ස විසින් සිදු කරන ලද ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් පහත දක්වා ඇත

**බ.ජා.ගු. මෙහෙයුම් සඳහා නව ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.**

යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් බ.ජා.ගු. හි ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතිය නවීන තාක්ෂණික අංගයන්ගෙන් ප්‍රතිස්ථාපනය කර 2023 නොවැම්බර් මාසයේදී විවෘත කරන ලදී.

බ.ජා.ගු. විසින් ගුවන් යානා දහස් ගණනක් හසුරුවන අතර, සංචාරකයින් සහ රටේ පුරවැසියන් සඳහා ප්‍රධාන දොරටුව ලෙස සේවය කරයි. මෙම සියලුම ගුවන් යානා බ.ජා.ගු. ගුවන් අවකාශය තුළ ආරක්ෂිතව සහ කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතිය ලෙස හඳුන්වන මධ්‍යම පද්ධතියක සහාය භාවිතා කරමින් ගුවන් ගමනාගමන පාලකවරුන් විසින් පාලනය කරනු ලබයි.

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

මෙම මධ්‍යම පද්ධතිය අනෙකුත් ජාත්‍යන්තර සහ දේශීය ගුවන්තොටුපළ සමඟ සන්නිවේදනය කරන රේඩාර් පද්ධති සහ ගුවන් ගමනාගමන සේවා පණිවිඩ වැනි සියලුම ගුවන් නිරීක්ෂණ දත්ත ඒකාබද්ධ කරයි. මෙම සියලු දත්ත සැකසීමෙන් පසු, පද්ධතිය විසින් අවශ්‍ය සියලුම ස්වයංක්‍රීය ඇඟවීම්, අනතුරු ඇඟවීම් සහ සම්පූර්ණ වායු තත්ව සමස්තය සමඟ පාලකයන්ට ඉදිරිපත් කරන අතර, විශේෂිත පද්ධති මෙවලම් විශාල ප්‍රමාණයකින් ගුවන් ගමනාගමන කළමනාකරණය සඳහා භාවිතා කරනු ලැබේ. බ.ජා.ගු. ගුවන් සීමාව තුළ ගුවන් ගමනාගමනය බාධාවකින් තොරව, ආරක්ෂිත සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා නව ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතිය බ.ජා.ගු. හි ක්‍රියාත්මක කර ඇත.

මෙම නව ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතිය විශාල තාක්ෂණික වෙනස්කම් රැසක් හඳුන්වා දුන්නේය. උදාහරණයක් ලෙස, කඩදාසි මත පදනම් වූ පියාසැරි ප්‍රගති දත්ත තීරු සම්පූර්ණයෙන්ම ඉලෙක්ට්‍රොනික පියාසැරි තීරු සමඟ ප්‍රතිස්ථාපනය කර ඇති අතර ඒවා සියලුම පාලක ස්ථාන අතර සම්පූර්ණයෙන්ම සමමුහුර්ත කර ඇත. එබැවින්, බිල්පත් කාර්යයන් වැනි භෞතිකව කරන ලද කාලය ගතවන ක්‍රියාවලීන් සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කර ඇති අතර, පාලකයන්ට ආරක්ෂිත ගුවන් ගමනාගමන පාලන ක්‍රියාවලියකට තම අවධානය යොමු කිරීමට ඉඩ සලසයි.

ඒ හා සමානව, නව පද්ධතිය පෙර පද්ධතියේ නොතිබූ ලෙස, ගුවන් ගමන් දත්ත විශාල ප්‍රමාණයක් ඒකාබද්ධ කර, සකස් කර සහ අන්තර්ක්‍රියාකාරීව ගුවන් ගමනාගමන පාලකයන්ට ඉදිරිපත් කරයි. නියාමන සංවර්ධනයන් මත පදනම්ව අවම වශයෙන් වසර 10 ක් හෝ ඉන් ඔබ්බට සේවය කිරීමට නව පද්ධතිය සැලසුම් කර ඇත.



*නව ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතිය විවෘත කිරීම*

**බ.ජා.ගු. හි මගී පර්යන්තයට වෙන්වූ ප්‍රවේශ මාර්ගය විවෘත කිරීම.**
ගු.ගු.සේ.ස මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් බ.ජා.ගු. වෙත ප්‍රවේශ වන අභ්‍යන්තර හා බාහිර මාර්ග සංවර්ධනය කිරීම අරමුණු කර ගෙන 2023 නොවැම්බර් මාසයේදී සාර්ථකව නිම කර විවෘත කරන ලදී.

සංවර්ධිත බාහිර හා අභ්‍යන්තර මාර්ග ජාල පද්ධතියක් නොමැතිකම හේතුවෙන් බොහෝ දුෂ්කරතා ඇති කරමින් කාර්යබහුල වේලාවන්හිදී බ.ජා.ගු. අධික වාහන තදබදයක් අත්දකිමින් සිටී. ඒ අනුව, අසල්වැසි ඉඩම් හිමි ආයෝජන මණ්ඩලය සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ගුවන්තොටුපළට ප්‍රවේශ වීමට මාර්ග වෙන් කිරීමේ හැකියාව බ.ජා.ගු. ගවේෂණය කරන ලදී.

මෙම සන්දර්භය තුළ, ගු.ගු.සේ.ස අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගු.ගු.සේ.ස අරමුදල් රු. මිලියන 600 ක් වැය කරමින්, පහත දැක්වෙන පරිදි අදියර 3 ක් යටතේ කිලෝමීටර 1.71 ක් දිග මාර්ගයක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

- **පළමු වන අදියර** - ඇවරිවත්ත මංසන්දියේ සිට ආයෝජන මණ්ඩල පිවිසුම දක්වා මීටර් 660 දිග මංතීරු 04 ද්විත්ව මාර්ගයක් ඉදිකිරීම, මංසන්දිය වැඩිදියුණු කිරීම සහ මාර්ග සංඥා ආලෝක පද්ධතිය ස්ථාපනය කිරීම.
- **දෙවන අදියර** - මාර්ගය ඉදිකිරීමට යොදා ගන්නා ඉඩම් ජලයෙන් යට වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ජලාපවහන සංවර්ධන නළ පද්ධතිය ඉදිකිරීම.
- **තුන්වන අදියර** - ආයෝජන මණ්ඩල පිවිසුමේ සිට මිනුවන්ගොඩ දෙසට මීටර් 1,050 දිග මංතීරු 04 කින් යුත් ද්විත්ව මාර්ගයක් ඉදිකිරීම, මංසන්දිය වැඩිදියුණු කිරීම, බෝක්කු සහ මාර්ග සංඥා ආලෝක පද්ධති සවි කිරීම.

ඊට සමගාමීව, ගු.ගු.සේ.ස විසින් රටින් පිටවන සහ රට තුළට පැමිණෙන මගීන් වෙන් කිරීම සඳහා අභ්‍යන්තර මාර්ග පද්ධතියක් සංවර්ධනය කර ඇති අතර මගීන්ගේ සහ අමුත්තන්ගේ පහසුව වැඩි දියුණු කරමින් වැඩි වාහන ප්‍රමාණයක් නැවැත්වීමේ පහසුකම් එක් කර ඇත.




*බ.ජා.ගු. වෙත වෙන්වූ ප්‍රවේශ මාර්ග විවෘත කිරීම*

**ශ්‍රී ලංකන් ගුවන් සේවය බ.ජා.ගු. හි ස්වයං පැමිණීම සටහන් කිරීම සහ ස්වයං ගමන් මලු පරීක්ෂා සේවා පුළුල් කරයි**
ශ්‍රී ලංකන් ගුවන් සමාගම බ.ජා.ගු. හි ඔවුන්ගේ මගී සේවා දියුණු කිරීමට ස්වයං පැමිණීම සටහන් කිරීම සහ ස්වයං ගමන් මලු පරීක්ෂා සේවා හඳුන්වා දෙන ලදී. මෙම මුලපිරීම සංචාරක අත්දැකීම නැවත නිර්වචනය කිරීමට සකසා ඇති අතර, පහසුව සහ කාර්යක්ෂමතාවය ප්‍රමුඛස්ථානයේ තබා ඇත.

මගී තදබදය වැඩි වේලාවන් හිදී ගුවන්තොටුපොළ තුල රැඳී සිටීමේ කාලය අවම කිරීම අරමුණු කර ගෙන, මගීන්ට පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය හරහා බාධාවකින් තොරව ඉක්මනින් විගමනයට ඉඩ සැලසීම සඳහා නව ස්වයං සේවා ලබා දෙන ස්ථාන පිහිටුවා ඇත. බ.ජා.ගු.හි පිටත්වීමේ පර්යන්තයේ පිහිටා ඇති ස්වයං ගමන් මලු පරීක්ෂා සේවා සහිත පරිශීලක-හිතකාමී ස්වයං-සේවා ලබා දෙන ස්ථාන මඟින් පහසුකම් සපයන විධිමත් පිරික්සුම් ක්‍රියා පටිපාටිය නිරන්තරයෙන් සංචාරය කරන්නන් අගය කරනු ඇත.

මගීන්ට තම ගුවන් ගමන් පරීක්ෂාව, ආසන තෝරා ගැනීම සහ ගුවන් යානා පිවිසුම්පත සහ ගමන්මලු සඳහා ලේබල මුද්‍රණය කිරීම ඇතුළුව සම්පූර්ණ ඇතුළුවීමේ ක්‍රියාවලිය ස්වයංව සම්පූර්ණ කළ හැකිය. මෙයින් පසු, ඔවුන්ට පහසුවෙන් තම ගමන් මලු ස්වයං-බෑග්-ඩ්‍රොප් පහසුකමෙහි දමා විගමන නිෂ්කාශනයෙන් පසු සෘජුවම ගුවන් යානා පිවිසුම් දොරටුව වෙත යා හැකිය.

මෙම වාණිජමය සම්ප්‍රේෂණය ශ්‍රීලංකන් ගුවන්සමාගමෙ හි පුළුල් ඩිජිටල්කරණ ක්‍රමෝපාය සමඟ සමපාත වන අතර, සමස්ත සංචාරක අත්දැකීම වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයෙහි ෆාස්ට් ට්‍රැවල් වැඩසටහනටද සහාය වේ. මෙය ක්‍රියාවට නැංවීමත් සමඟ ශ්‍රීලංකන් ගුවන් සමාගම ජාත්‍යන්තර සංචාර සඳහා ස්වයං සේවා තාක්ෂණයන් අනුගමනය කිරීමේ කලාපීය පුරෝගාමියෙකුගේ තත්ත්වය සාඩම්බරයෙන් සතු කර ගනු ලබයි.

ජෛවමිතික මුහුණු හඳුනාගැනීම, විද්‍යුත් ගුවන් යානා පිවිසුම් දොරටු, අතථ්‍ය සහ වැඩි දියුණු කළ යථාර්ථය ඇතුළු ඩිජිටල් වැඩිදියුණු කිරීම් වැනි තියුණු සන්නිවේදන මාධ්‍යයන් ක්‍රියාත්මක කිරීම තුලින් සිය මගීන් සඳහා බාධාවකින් තොරව සහ තාක්ෂණිකව උසස් සංචාරක අත්දැකීමක් ලබා දීමට ශ්‍රීලංකන් ගුවන් සමාගම කැපවී සිටියි.

**"නව පැමිණීමේ ඉලෙක්ට්‍රොනික සාප්පු සංකීර්ණය" මගීන්ට නවමු අත්දැකීමක් ලබා දීම සඳහා බ.ජා.ගු.හි විවෘත කර ඇත.**
බ.ජා.ගු. හි පැමිණීමේ තීරුබදු රහිත ප්‍රදේශය තුල මගීන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීමේ අරමුණින්, තීරුබදු රහිත සියලුම ඉලෙක්ට්‍රොනික වෙළඳසැල් 2023 ජනවාරි මාසයේදී පැමිණීමේ පර්යන්ත ගොඩනැගිල්ලේ දෙවන මහලට ගෙන යන ලදී.

මගී පර්යන්ත ගොඩනැගිල්ලේ දෙවන මහලේ නව ඉලෙක්ට්‍රොනික වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම, පළමු මහලේ සිට දෙවන මහලට පැමිණීමේ තීරුබදු රහිත වෙළඳසැල් 31ක් ප්‍රවේශ කිරීම, විදුලි පියගැටපෙළ (එස්කලේටර්) දෙකක් සහ වීදුරු සෝපාන දෙකක් සවි කිරීම, ව්‍යුහාත්මක වානේ පඩිපෙළක් ඉදිකිරීම, පවතින විදුලි සෝපාන තුනක් දීර්ඝ කිරීම සහ වැසිකිළි පද්ධති හතරක් ඉදිකිරීම යනාදිය මෙම කාර්යයේ විෂය පථයට ඇතුලත්ය. මෙම මගී පහසුකම් පුළුල් කිරීම සහ තීරුබදු රහිත වෙළඳසැල් පළමු මහලේ සිට දෙවන මහලට ප්‍රවේශ කිරීම සෑම අංශයකින්ම ගුවන්තොටුපලේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීමට හේතු විය. ගු.ගු.සේ.ස විසින් නැවත ස්ථානගත කිරීම සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 225 ක් වැය කර ඇති අතර, එකතු කල මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 1,900 ක් වේ. මෙම නැවත ස්ථානගත කිරීම තුලින් මගීන්ට පාරිභෝගික ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා තීරුබදු රහිත දීමනාව භාවිතා කිරීමට පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ.

"නව පැමිණීමේ ඉලෙක්ට්‍රොනික සාප්පු සංකීර්ණය" පිහිටුවීම මගින් ගුවන්තොටුපළ සහ ගුවන් සේවාවේ සමස්ත අපේක්ෂාව වන්නේ මගීන්ගේ පැමිණීමේ තීරුබදු රහිත සාප්පු සවාරි අත්දැකීම වැඩිදියුණු කිරීම සහ ගුවන්තොටුපලේ සේවා ගුණාත්මක භාවය ඉහළ නැංවීම වන අතර පැමිණීමේ තීරුබදු රහිත භාණ්ඩවල වෙනස් සහ වැඩිදියුණු කළ පාරිභෝගික අත්දැකීමක් සැපයීමට බ.ජා.ගු.හි ඒවැන්නක් සිදු කිරීමට දැඩි අවශ්‍යතාවයක් තිබුණි.



*බ.ජා.ගු.හි නව පැමිණීමේ ඉලෙක්ට්‍රොනික සාප්පු සංකීර්ණය*

## 4) පුනර්ග්‍රහණය

ගු.ගු.සේ.ස විසින් වෙළඳපල කොටස නැවත අත්පත් කර ගැනීම සහ ගුවන් සේවා කර්මාන්තයේ ප්‍රධාන සම්පාදකයා ලෙස සිය ස්ථාවරය තහවුරු කර ගැනීම ඉලක්ක කරගත් උපාය මාර්ගික ව්‍යාපෘති මාලාවක් ආරම්භ කර ඇත. මගීන්ගේ ක්‍රමයෙන් වර්ධනය වන අවශ්‍යතා සහ වෙළඳපොළේ තරඟකාරී අවස්ථා හඳුනා ගනිමින්, ගු.ගු.සේ.ස සිය යටිතල පහසුකම්, සේවා සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා පුළුල් ප්‍රවේශයක් ආරම්භ කර ඇත. ගුවන්තොටුපළ පහසුකම් නවීකරණය කිරීම, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ නව්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජනය කිරීම තුළින්, ගු.ගු.සේ.ස වෙළඳපල ඉල්ලීම් කල්තියා ආමන්ත්‍රණය කරමින් තිරසාර වර්ධනයක් සඳහා ස්ථානගත වේ. වෙළඳපල ප්‍රවණතා සහ පාරිභෝගික මනාපයන් සමඟ සමපාත වන මුලපිරීම් කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, ගතික ගුවන් සේවා අංශයේ අදාළත්වය සහ තරඟකාරීත්වය සහතික කරමින්, එහි වෙළඳපල කොටස නැවත ලබා ගැනීමට සහ පුළුල් කිරීමට ගු.ගු.සේ.ස කැපවී සිටී.

සිදු කරන ලද මූලික පියවර ලැයිස්තුවක් පහත දැක්වේ
**පිටතට යාමේ සංචාරක සීමාවන් ලිහිල් කිරීමෙන් පසු චයිනා ඊස්ටර්න් ගුවන්සේවය මගින් ෂැංහයි සිට පැමිණි පළමු සංචාරකයින් කණ්ඩායම උණුසුම් ලෙස පිළිගැනීම**

ෂැංහයි සිට මගීන් 180 කින් සමන්විත පළමු චීන කණ්ඩායම 2023 මාර්තු මාසයේදී බ.ජා.ගු. වෙත පැමිණියේය.

චයිනා ඊස්ටර්න් ගුවන්සේවය 2004 වසරේ සිට නොබැඳි ගුවන් සේවයක් ලෙස සිය මෙහෙයුම් ආරම්භ කළ අතර චීනයේ සිට සතිපතා ගුවන් ගමන් හයක් ක්‍රියාත්මක කරන අතරතුර මගී සහ භාණ්ඩ යන දෙකටම ඔවුන්ගේ සාමාන්‍ය විකුණුම් නියෝජිතයා ලෙස ඩාර්ට් ඒවියේෂන් පත් කළේය.

චයිනා ඊස්ටර්න් ගුවන්සේවය දෙරට අතර කිසිදු බාධාවකින් තොරව නියමිත ගුවන් ගමන් ක්‍රියාත්මක කළ අතර ගෝලීය වසංගතය අතරතුර 2019 - 2023 අතර රටෙහි සහ ගුවන් සේවා ක්ෂේත්‍රයේ වඩාත්ම අභියෝගාත්මක කාලවලදී ශ්‍රී ලංකාවට / ශ්‍රී ලංකාවේ සිට ක්‍රියාත්මක වූ එකම චීන ගුවන් සේවයයි.

චයිනා ඊස්ටර්න් ගුවන්සේවය මෙරට වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා කුන්මිං සහ ෂැංහයි සිට ගුවන් ගමන් වාර තුන බැගින් ක්‍රියාත්මක කරනු ඇත.




*ෂැංහයි සිට පැමිණි චීන ඊස්ටන් ගුවන්සමාගමේ පළමු සංචාරක කණ්ඩායම පිළිගැනීම*

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

**ගු.ගු.සේ.ස කටුනායක බ.ජා.ගු. පරිශ්‍රයේ ගුවන් යානා ඉන්ධන සැපයීම සහ ගබඩා කිරීමේ පහසුකම ස්ථාපිත කිරීමට ගිවිසුම් අත්සන් කිරීම.**
ගු.ගු.සේ.ස සහ කැනල් පුද්ගලික සමාගම විසින් ගුවන් යානා ඉන්ධන ආනයනය, ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය, සේවා සපයන්නන් සහ ගුවන් යානා සඳහා  විකිණීම සහ සැපයීම සඳහා බ.ජා.ගු. හි ගුවන් යානා ඉන්ධන සැපයුම් සහ ගබඩා පහසුකමක් ස්ථාපිත කිරීම සඳහා දිගුකාලීන බදු ගිවිසුමකට එළඹ ඇත.

කැනල් පුද්ගලික සමාගම හට තවත් ජෙට් ඉන්ධන ගබඩා කිරීමේ පහසුකමක් ස්ථාපිත කිරීමට අවස්ථාව ලබා දීමට හැකි වීම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස ගු.ගු.සේ.ස හි සුවිශේෂී ජයග්‍රහණයක් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් යානා A-1 ඉන්ධන අනාගතයේදී  හිඟයකින් තොරව සැපයීම සඳහා වෙළඳපල පුළුල් වනු ඇත.

ගුවන් සමාගම් සඳහා ගුවන් යානා A-1 ඉන්ධන සැපයීම සඳහා වෙළඳපල අවස්ථා පුළුල් කිරීමට අමාත්‍ය මණ්ඩලය මීට පෙර අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ගු.ගු.සේ.ස හට ගිවිසුමකට එළැඹීම සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ඉල්ලා ඇත.

**අසුර් ගුවන්සේවය ශ්‍රී ලංකාවට නැවත මෙහෙයුම් ඇරඹීම**
අසුර් ගුවන්සේවය ශ්‍රී ලංකාව වෙත සෘජු වරලත් ගුවන් ගමන් නැවත ආරම්භ කළ අතර පළමු ගුවන් යානය මගීන් 332 දෙනෙකු සමඟ නොවැම්බර් මාසයේදී බ.ජා.ගු. වෙත ළඟා විය. ගුවන් යානය බ.ජා.ගු. වෙත පැමිණීමෙන් පසු උත්සවාකාර ජල ප්‍රහාරක ආචාරයක් මගින් පිළිගන්නා ලදී.

අසුර් ගුවන්සේවය රුසියාවේ වෙනුකොව්, ටොල්මොකෙව්, ක්‍රනොයාර්ස්ක් සහ ශාන්ත පීටර්ස්බර්ග්  සිට සතියකට ගුවන් ගමන් වාර හතරක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.



*අසුර් ගුවන්සේවය, නැවත මෙහෙයුම් ඇරඹීම*

**තුර්කි ගුවන් සේවය ශ්‍රී ලංකාවට සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීම.**
ශ්‍රී ලංකාවේ වසර 10 ක මෙහෙයුම් වලින් පසු, මාලේ හි එක් නැවතුමක් සහිතව, ගුවන් සමාගම 2023 ඔක්තෝම්බර් මාසයේදී  තුර්කියේ ඉස්තාන්බුල් සිට කොළඹ දක්වා සතිපතා ගුවන් ගමන් වාර හතරක් සමඟ සෘජු ගුවන් ගමන් ආරම්භ කළේය.

සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීම මඟින් ශ්‍රී ලංකාවට කෙටි ගුවන් ගමන් කාලයකින් යුරෝපය සහ ඇමරිකාව සමඟ සම්බන්ධ වීමට මෙන්ම අතිවිශාල ඉස්තාන්බුල් ගුවන්තොටුපළේ කෙටි කාලයන් සඳහා සම්බන්ධ වීමට හැකි වේ.

අභිනව  සෘජු ගුවන් යානය TK 730 මගීන් 261 දෙනෙකු සමඟ බ.ජා.ගු. වෙත ගොඩ බසින ලදී.



*තුර්කි ගුවන්සේවය ඉස්තාන්බුල් හි සිට සෘජු ගුවන්ගමන් ඇරඹීම*

**තායි එයාර් ඒෂියා යළි ශ්‍රී ලංකාවට මෙහෙයුම් ඇරඹීම.**
බැංකොක් සහ කොළඹ අතර සතිපතා ගුවන් ගමන් වාර හතරක් සහිතව තායි එයාර් ඒෂියා බ.ජා.ගු. හි නැවත ක්‍රියාත්මක වන අතර එහි මෙහෙයුම් නැවත ආරම්භ කරමින් පළමු ගුවන් යානය මගීන් 137 දෙනෙකු සමඟ 2023 ජූලි මාසයේදී බ.ජා.ගු. වෙත පැමිණියේය.




*තායි එයාර් ඒෂියා නැවත මෙහෙයුම් ඇරඹීම*

**එයාර් චයිනා ශ්‍රී ලංකාවට යළි මෙහෙයුම් ඇරඹීම**
එයාර් චයිනා බ.ජා.ගු. සහ චෙන්ග්ඩු ටියාන්ෆු  ජාත්‍යන්තර ගුවන්තොටුපළ අතර 2023 ජූලි මාසයේ සිට සතියකට ගුවන් ගමන් තුනක් සමඟ නැවත සේවා ආරම්භ කළ අතර අභිනව ගුවන් යානය මගීන් 142ක් සමඟ පැමිණියේය.




*එයාර් චයිනා ගුවන් ගමන් නැවත ඇරඹීම*

### 5) පුනර්ජනනය

ගු.ගු.සේ.ස යටිතල පහසුකම්, සේවා සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය පුනර්ජීවනය කිරීමේ අරමුණින් පුනර්ජනනය ඉලක්ක කරගත් උපාය මාර්ග මාලාවක් ආරම්භ කර ඇත. මෙම පුනර්ජනන උපාය මාර්ගයන්ට නවීකරණ ව්‍යාපෘති, පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම් සහ තිරසාර උත්සාහයන් ඇතුළු විවිධ මුලික පියවරයන් ඇතුළත් වේ. ගුවන්තොටුපළ පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ පුළුල් කිරීම සඳහා ආයෝජනය කිරීමෙන්, සංචාරකයින්ගේ වැඩිවෙන වන අවශ්‍යතා සපුරාලන වඩාත් නවීන සහ මගීන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම ගු.ගු.සේ.ස හි අරමුණයි. මීට අමතරව, නව්‍ය තාක්ෂණයන් සහ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමෙන්, ගු.ගු.සේ.ස මෙහෙයුම් විධිමත් කිරීමට සහ සමස්ත කාර්යක්ෂමතාව වැඩි කිරීමට උත්සාහ කරයි. තවද ගු.ගු.සේ.ස තිරසාරභාවය සහ පාරිසරික භාරකාරත්වය සඳහා කැපවී සිටින අතර, හරිත භාවිතයන් සහ මුලපිරීම් එහි පුනර්ජනන ප්‍රයත්නයන් සමඟ ඒකාබද්ධ කරයි. මෙම සවිස්තරාත්මක උපාය මාර්ග හරහා, ගු.ගු.සේ.ස සිය ගුවන්තොටුපළ පුනර්ජීවනය කිරීම, මගීන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ ගුවන් සේවා අංශයේ දිගුකාලීන ශක්‍යතාව සහ වර්ධනය සහතික කිරීම අරමුණු කරයි.

සමාලෝචිත වර්ෂය තුළ ගු.ගු.සේ.ස විසින් ආරම්භ කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන් දෙක පහත දැක්වේ.

**ගු.ගු.සේ.ස විසින් බ.ජා.ගු. හි සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය දියත් කිරීම.**

තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ ඉදිරියට යමින් බලය සහ බලශක්ති ක්ෂේත්‍රයේ වර්ධනය වන අභියෝගවලට මුහුණ දීම සඳහා පුනර්ජනනීය බලශක්ති කොටස වැඩි දියුණු කිරීමට ගු.ගු.සේ.ස පියවර ගෙන ඇත. 2023 නොවැම්බර් මාසයේදී, ගු.ගු.සේ.ස විසින් රුපියල් මිලියන 19ක් ආයෝජනය කරමින් බ.ජා.ගු. හි මගී පර්යන්ත ගොඩනැගිල්ලේ වහලය මත කිලෝවොට් 100 ක ධාරිතාවයකින් යුත් සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එය දෛනිකව බලශක්ති ඒකක කිලෝවොට් පැය 600 ක් හෝ මසකට බලශක්ති ඒකක කිලෝවොට් පැය 18,000 ක බලශක්ති උත්පාදනයක් සිදු කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර ජනනය කරන බලශක්තිය ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නිවාස 200 ක් බල ගැන්වීමට ප්‍රමාණවත් වනු ඇත.

**ගු.ගු.සේ.ස ජාත්‍යන්තර ගුවන් මෙහෙයුම් සඳහා බිම් හැසිරවීමේ සේවා පුහුණු අංශයක් ම.රා.ජා.ගු. හි දියත් කිරීම.**

2023 මැයි මාසයේදී, ජාත්‍යන්තර ගුවන් ගමන් මෙහෙයුම් සඳහා ගොඩබිම් හැසිරවීමේ සේවා සැපයීමේ අරමුණින් ම.රා.ජා.ගු හි තමන්ගේම බිම් හැසිරවීමේ සේවා පුහුණු අංශයක් දියත් කරමින් ගු.ගු.සේ.ස තවත් ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.

බිම් හැසිරවීම ගුවන්තොටුපළක තීරණාත්මක ක්‍රියාකාරකමක් වන අතර එය ගුවන්තොටුපළ සහ ගුවන් සේවා අතර සම්භන්ධකයන් ලෙස ක්‍රියා කරයි. ගුවන්තොටුපළේ කාර්යක්ෂමතාව සහ සුමටව හැසිරවීම් කළමනාකරණය කිරීමට බිම් හැසිරවීම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ම.රා.ජා.ගු. හි ගු.ගු.සේ.ස බිම් හැසිරවීමේ සේවාව දියත් කරන ලද්දේ මගීන් සමඟ පැමිණෙන අභ්‍යන්තර ගුවන් සේවා සඳහා එහි බිම් හැසිරවීමේ සේවා සැපයීමටය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සියලුම නියාමන අවශ්‍යතා සපුරාලමින් බිම් හැසිරවීමේ කාර්ය මණ්ඩලය විසින් බිම් මෙහෙයුම් සාර්ථකව හසුරුවන ලද අතර අවශ්‍ය පරිදි සියලුම සේවාවන් සපයන ලදී. මෙම නව බිම් හැසිරවීමේ කණ්ඩායම අදාළ බිම් හැසිරවීමේ පළපුරුද්ද ඇති සේවකයින්ගෙන් සමන්විත වන අතර, ගොඩබිමේදී ගුවන් යානා හැසිරවීමේ ඉහළම කාර්ය සාධනයක් ලබා ගැනීම සඳහා කණ්ඩායමට අවශ්‍ය නිපුණතා පුහුණුව සහ අනෙකුත් අනිවාර්ය පුහුණුව ලබා දී ඇත. ගු.ගු.සේ.ස හි අංගසම්පූර්ණ බිම් හැසිරවීමේ සේවා අංශයක් පිහිටුවීමේ දිගුකාලීන අරමුණ ඇතිව මත්තල දී ආරම්භ කරන ලද ඒ සඳහා කැපවූ බිම් හැසිරවීමේ කණ්ඩායම අවශ්‍ය අදාළ මානව ප්‍රාග්ධනය බඳවා ගැනීමට සහ වැඩිදුර පුහුණුව ලබා දීමට ගු.ගු.සේ.ස මූලිකත්වය ගෙන ඇත. මෙය දියත් කිරීම මගින් ගු.ගු.සේ.ස හි ගගන නාවික ආදායම් සංරචකය ඉහළ නැංවීමට දායක වීමට ගු.ගු.සේ.ස හට හැකි වන අතර මෙම අභියෝගාත්මක සහ වෙනස්වන ව්‍යාපාරික පරිසරය තුළ මෙය කාලෝචිත පියවරකි.

දැනට, ගු.ගු.සේ.ස අභ්‍යන්තර සහ ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා කො.ර.ජා.ගු. සහ යා.ජා.ගු. හි බිම් හැසිරවීමේ සේවා සපයයි. මෙම පියවරත් සමඟ ගු.ගු.සේ.ස හට ඉදිරියේදී මත්තල බිම් හැසිරවීමේ සේවා සැපයීමට හැකි වනු ඇති අතර ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා බ.ජා.ගු. වෙතද මෙම සේවාව ව්‍යාප්ත කිරීමට නියමිතය.

### 6) ශක්තිමත් කිරීම.

ගු.ගු.සේ.ස විසින් සිය ගුවන්තොටුපළ යටිතල ව්‍යුහයේ ප්‍රත්‍යස්තිය හැකියාව සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘති මාලාවක් ආරම්භ කර ඇත. නවීන ගුවන් සේවා මෙහෙයුම් ඉල්ලීම්වලට ඔරොත්තු දෙන බව සහතික කිරීම අවශ්‍ය ධාවන පථ, පිවිසුම් පථ, පර්යන්ත සහ ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධති වැනි ගුවන්තොටුපළ පහසුකම්වල තීරණාත්මක සංරචක ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. මීට අමතරව, ගු.ගු.සේ.ස විසින් උසස් නිරීක්ෂණ සහ අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම ඇතුළුව ආරක්ෂාව සහ ආරක්ෂක ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා පියවර ගනු ලබයි. මෙම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමෙන්, විභව අවදානම් සහ අභියෝගවලට එරෙහිව තම ගුවන්තොටුපළ ශක්තිමත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සමස්ත මගී අත්දැකීම වැඩිදියුණු කිරීම ගු.ගු.සේ.ස අරමුණු කරයි. උපායමාර්ගික සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම තුළින්, ගුවන් සේවා යටිතල පහසුකම් සහ සේවාවන්හි ප්‍රමුඛතම සංවිධානය ලෙස සිය ස්ථාවරය පවත්වා ගැනීමට ගු.ගු.සේ.ස කැපවී සිටියි.

මෙම අංශය තුළ ආරම්භ කර ඇති මුලපිරීම් කිහිපයක් පහත දැක්වේ.

**මැග්ස්ටර්, බ.ජා.ගු. සහ යා.ජා.ගු. දකුණු ආසියාවේ පළමු ස්මාර්ට් කියවීමේ ගුවන්තොටුපළවල් බවට පරිවර්තනය කිරීම.**

උද්වේගකර වර්ධනයක් තුළ, ලොව විශාලතම ඩිජිටල් ප්‍රවෘත්ති පත්‍රිකාව (www.magzter.com) වන මැග්ස්ටර්, ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ මගීන්ගේ අත්දැකීම විප්ලවීය වෙනසක් කිරීමට සූදානම් වේ. මගීන්ට ගුවන්තොටුපළේ සිටින විට අති නවීන, සම්පූර්ණ සම්බන්ධතා රහිත සහ කඩදාසි රහිත සම්පූර්ණ ඩිජිටල් කියවීමේ අත්දැකීමක් ලබා දෙමින් ඔවුන්ගේ ප්‍රියතම සඟරා සහ පුවත්පත් කියවීමට අවස්ථාව සලසමින් බ.ජා.ගු. සහ යා.ජා.ගු. දකුණු ආසියාවේ ප්‍රථම ස්මාර්ට් කියවීමේ ගුවන්තොටුපළවල් බවට පත්වීමට මැග්ස්ටර් සමඟ අත්වැල් බැඳගත්තේය.

ගු.ගු.සේ.ස සමඟ මැග්ස්ටර්හි හවුල්කාරිත්වය මගීන්ට ගුවන්තොටුපළ තුළ සිටින අතරතුර විවිධ ප්‍රමුඛ පෙළේ සඟරා, පුවත්පත්, ජර්නල සහ විකට චිත්‍රකතා 8,000ක ට අධික ප්‍රමාණයක එකතුවකට නොමිලේ ප්‍රවේශ වීමට හැකියාව ලබා දෙනු ලබයි. මෙම භූමි ප්‍රදේශය තුළ නොමිලේ සාමාජික ගාස්තු ගෙවීමකින් තොරව අසීමිත කියවීම් ප්‍රවේශය ලබා ගැනීමට මගීන්ට ඇපල් ස්ටෝර් හෝ ගූගල් ප්ලේ වෙතින් මැග්ස්ටර් යෙදුම බාගත කළ හැක. ඔවුන් ගුවන්තොටුපළේ සිටින විට, මැග්ස්ටර් යෙදුම විවෘත කර, “SRZ” ටැබයට ගොස්, යෙදුම සඳහා

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

ස්ථාන අවසරය ලබා ගැනීමට සහ නොමිලේ අසීමිත කියවීම් ප්‍රවේශය ලබා ගැනීමට හැකිය.

සාමාන්‍යයෙන් ගුවන් මගීන් තම ගුවන් යානාවලට ගොඩවීමට පෙර පිවිසුම් දොරටු අසල සැලකිය යුතු කාලයක් රැඳී සිටින බැවින්, ඔවුන් සෑම විටම ඔවුන්ගේ රැඳී සිටීමේ කාලය ඵලදායී ලෙස ගත කිරීමට සිත්ගන්නා ක්‍රම ගැන විමසිල්ලෙන් සිටිති. මෙම නව්‍ය මුලපිරීම මෝටර් රථ, ව්‍යාපාර, ක්‍රිකට්, විනෝදාස්වාදය, විලාසිතා, සෞඛ්‍ය, ජීවන රටාව, ප්‍රවෘත්ති, දේශපාලනය, විද්‍යාව, ක්‍රීඩා, තාක්ෂණය සහ සංචාරක ඇතුළු කාණ්ඩ 40කට අධික ප්‍රමාණයක් පුරා පැතිර ඇති ජනප්‍රිය සඟරා සහ පුවත්පත් දහස් ගණනකට ප්‍රවේශය ලබා දීමෙන් මගීන්ගේ අත්දැකීම වැඩි දියුණු කිරීමට උපකාරී වනු නිසැක ය. ගුවන්තොටුපළේදී මගීන්ට ඔවුන්ගේ ප්‍රියතම මාතෘකා බාගත කර පියාසර කරන අතරතුර මාර්ග අපගතව ප්‍රවේශ විය හැක.

මැග්ස්ටර්හි විස්තීර්ණ නාමාවලියෙහි බිස්නස් ටුඩෙයි, ලංකා වුමන්, එක්ස්ප්ලෝර් ශ්‍රී ලංකා, සිරිකත, ලංකාදීප, දිවයින, ඩේලි මිරර් සහ ද අයිලන්ඩ් වැනි කලාපීය ශ්‍රී ලාංකික ප්‍රියතම පුවත්පත් සහ සඟරා කිහිපයක් ඇතුළත් වන අතරම, එය ප්‍රධාන සංචාරකයින් ගලා එන රටවල එනම් ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, මැලේසියාව සහ තායිලන්තය වැනි රටවලින් පැමිණෙන සංචාරකයින් සඳහාද ආකර්ෂණීය අන්තර්ගත මාලාවක් සපයයි. මැග්ස්ටර්හි වඩාත්ම අලෙවි වන ගෝලීය මාතෘකා අතර ටයිම් සඟරාව, නිව්ස්වීක්, කාර් ඇන්ඩ් ඩ්‍රයිව්, ඉන්ඩියා ටුඩේ, ෆිල්ම්ෆෙයාර්, බිස්නස් ස්ටෑන්ඩර්ඩ්, හෙලෝ, ද ගාර්ඩියන්, කොස්මොපොලිටන්, එලී, වෝග්, ජීකියු, හර් වර්ල්ඩ්, ෆෝර්බ්ස්ල බැංකොක් පෝස්ට් සහ තවත් දහසකට වඩා අන්තර්ගත වේ.

ලොව පුරා මිලියන සංඛ්‍යාත ජනතාවක් ඩිජිටල් කියවීමට දිරිගන්වමින්, මැග්ස්ටර් මේ වන විට දස දහස් ගණනක් ශාක සහ අනෙකුත් ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමට උපකාරී වී අතර එමගින් "හරිත සංකල්පය" වැඩසටහන පෝෂණය කිරීමේ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි. මෙම හවුල්කාරිත්වය ඩිජිටල් කියවීමේ විප්ලවයේ සැලකිය යුතු ඉදිරි පියවරක් සනිටුහන් කරයි, ස්පර්ශයෙන් තොර සහ පරිසර හිතකාමී කියවීමේ අත්දැකීමක් ලබා දීම සඳහා මැග්ස්ටර්හි කැපවීම සමඟ සමපාත වේ. මැග්ස්ටර් සිය ගෝලීය පිය සටහන් තවදුරටත් ව්‍යාප්ත කරමින් සිටින බැවින්, ස්මාර්ට් කියවීමේ ගුවන්තොටුපළ සංකල්පය ලොව පුරා සිටින මිලියන සංඛ්‍යාත මගීන් සඳහා සංචාරක අත්දැකීම නැවත අර්ථ දැක්වීමක් වනු ඇත.

**බ.ජා.ගු.හි නවීකරණය කරන ලද "ගගන තොරතුරු කළමනාකරණ පද්ධතිය" විවෘත කරන ලදී. තත්ත්ව සහතිකයක් ලබා ගැනීමෙහිලා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයෙහි අනිවාර්ය අවශ්‍යතාවය සපුරාලීමේ ප්‍රතිඵලයක් ලෙස, ගු.ගු.සේ.ස ISO 9001:2018 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය ලබා ගැනීමට සාර්ථකව සමත් විය.** මෙම ව්‍යාපෘතිය ගුවන් සේවා තොරතුරු කළමනාකරණය වැඩිදියුණු කිරීමට සහ රට තුළ ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ කාර්යක්ෂම ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීමට ගු.ගු.සේ.ස දරන උත්සාහයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන අතර, එය ගුවන් නියමුවන්ට, ගුවන් සේවා ක්‍රියාකරුවන්ට, ගුවන් ගමනාගමන පාලකවරුන්ට සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට නවතම ගුවන් ගමන් තොරතුරු වෙත ප්‍රවේශ වීමට, ගුවන් යානා සිතියම් සහ ප්‍රස්ථාර, විද්‍යුත් පියාසැරි සැලසුම් ඉදිරිපත් කිරීමට මෙන්ම ගුවන් මෙහෙයුම් වෙත දැනුම් දීම් (නෝටෑම්ස්) බෙදා ගැනීමටද ඉඩ සලසයි.

වැඩි වැඩියෙන් දත්ත මත රඳා පවතින ස්වයංක්‍රීය පරිසරයක් තුළ, ගුවන් සේවා ක්‍රියාකාරීන් අතර නිවැරදි, උසස් තත්ත්වයේ ඩිජිටල් තොරතුරු සුමට හා කාලෝචිත ලෙස ගලා යාම ඉතා වැදගත් වේ. පියාසැරි සැලසුම්, ගුවන් මෙහෙයුම් වෙත දැනුම් දීම් (නෝටෑම්ස්), සහ නවතම පියාසැරි තොරතුරු සියලු ගුවන් අවකාශය භාවිතා කරන්නන් අතර බෙදා ගත යුතුය. උසස් තත්ත්වයේ ගුවන් දත්ත යනු ආරක්ෂිත ගුවන් සංචලන සහතික කිරීම සඳහා පළමු සහ තීරණාත්මක අවශ්‍යතාවයයි. දත්තවල සත්‍යතාව සහ ඒකාග්‍රතාවය ආරක්ෂා කරන අතරම, සම්පූර්ණයෙන් විගණනය කළ හැකි දත්ත එකම ගුවන් යානා දත්ත සමුදායක් හරහා ලබා දෙමින් මෙය සාක්ෂාත් කරගත හැකිය. ද්විගනන දත්ත ඉවත් කරනු ලබන අතර, දත්ත ඇතුළත් කිරීමේ දෝෂ ඇතිවීමේ අවදානම පැහැදිලිවම අවම වේ.

මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා ගු.ගු.සේ.ස විසින් 2018 වසරේදී තේල්ස් ටොප් ස්කයි ගගන තොරතුරු කළමනාකරණ පද්ධතිය මිලදී ගන්නා ලදී. මෙම අත්පත් කර ගැනීම සඳහා යුරෝ මිලියන 3.3ක් සහ රුපියල් මිලියන 74ක් (වර්තමානයේ වටිනාකමින් රුපියල් බිලියන 1.2කට සමාන) වැය විය. තේල්ස් ටොප් ස්කයි ගගන තොරතුරු කළමනාකරණ පද්ධතිය යනු නවතම ප්‍රමිතීන්ට අනුකූලව සහ මානව මැදිහත්වීමේ අවශ්‍යතාවය අඩු කරන, සියල්ලන්ටම ප්‍රවේශ විය හැකි, වඩාත් සම්පූර්ණ, විශ්වාසදායක සහ ගෝලීය වශයෙන් විශ්වාසය තහවුරු කර ඇති ගගන තොරතුරු කළමනාකරණ කට්ටලවලින් එකකි. ගගන තොරතුරු කළමනාකරණ ක්‍රියාකාරකම්වල සම්පූර්ණ පරාසය ආවරණය වන අන්තර් ක්‍රියාකාරී සංරචක මොඩියුලර් කට්ටලයක් එයට ඇතුළත් වේ.

මෙම ප්‍රයත්නය ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයෙහි අවශ්‍යතා සහ කර්මාන්ත ප්‍රමිතීන් සමඟ රාජ්‍යය පෙළගස්වනු ඇති අතර, ගු.ගු.සේ.ස ආසියා පැසිෆික් කලාපයේ අසල්වැසි රාජ්‍යයන් හා සම තත්ත්වයට ගෙන එනු ඇත.

ගගනගාමී තොරතුරු, සිතියම් සහ ප්‍රස්ථාරවල කාර්යභාරය ගෝලීය ගුවන් සංචාලන පද්ධතියකට සාර්ථක ලෙස සංක්‍රමණය වීම සඳහා පදනම් කොටස් වන අතර, මෙම කොටස්වල හරය තත්ත්ව කළමනාකරණ පද්ධතිය මත පවතින අතර එමගින් ගුණාත්මක ගුවන් තොරතුරු කාලෝචිත ලෙස ගුවන් ප්‍රජාව වෙත සැපයීම සහතික කෙරේ.

තත්ත්ව සහතිකයක් ලබා ගැනීමේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයෙහි අනිවාර්ය අවශ්‍යතාවය සපුරාලීමේ ප්‍රතිඵලයක් ලෙස ගු.ගු.සේ.ස ගගන තොරතුරු කළමනාකරණ පද්ධතිය ඉතා නියමිත කාල රාමුවක් තුළ ISO 9001:2018 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය ලබා ගැනීමට සාර්ථකව සමත් විය.



*බ.ජා.ගු හි ගගන තොරතුරු කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම*

**බ.ජා.ගු.හි නව "සංඛ්‍යාංක හඬ සන්නිවේදන මාරු කිරීමේ පද්ධතිය" (DVCS පද්ධතිය) විවෘත කරන ලදී.**
බ.ජා.ගු.හි නව "සංඛ්‍යාංක හඬ සන්නිවේදන මාරු කිරීමේ පද්ධතිය" (DVCS පද්ධතිය) 2023 අගෝස්තු මාසයේදී විවෘත කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 670ක අරමුදල් මුලුමනින්ම ගු.ගු.සේ.ස විසින් සපයා ඇති අතර, මෙම නව DVCS පද්ධතිය මගින් ගොඩබිම් මාධ්‍යස්ථාන හරහා ගුවන් යානා වෙත ස්වයංක්‍රීයව ගුවන් ගමනාගමන පාලකවරුන්ගේ සන්නිවේදනය සම්ප්‍රේෂණය කිරීම තුලින් සියලුම තාක්ෂණික පොදු කාර්ය කළමනාකරණය කරයි. එය ගුවන් ගමනාගමන පාලකයන් ඉදිරිපිට තනි ස්පර්ශ සංදර්ශකයක් හරහා සියලු සන්නිවේදනයන්ට ප්‍රවේශය ලබා දෙන බැවින් එය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

**එලායන්ස් ගුවන්සේවය යාපනය සහ චෙන්නායි අතර දෛනික ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම.**
ඉන්දියාවේ කලාපීය ගුවන් සේවය වන එලායන්ස් ගුවන්සේවය දකුණු ඉන්දියාවේ චෙන්නායි නගරය සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ යාපනය අතර සෘජු ගුවන් ගමන් වැඩි කරන බව නිවේදනය කර ඇත. ජූලි මාසයේ සිට එලායන්ස් ගුවන්සේවය චෙන්නායි සිට යාපනයට දිනපතා සෘජු ගුවන් ගමන් ක්‍රියාත්මක කරනු ඇත.

යාපනය සිට චෙන්නායි දක්වා එලායන්ස් ගුවන්සේවය සෘජු ගුවන් ගමන් මෙහෙයුම 2019 දී ආරම්භ කරන ලද නමුත් කොවිඩ් වසංගතය ආරම්භ වීම හේතුවෙන් අත්හිටුවීමට සිදු වූ අතර 2022 දෙසැම්බර් මාසයේදී නැවත ආරම්භ විය.

මෙම සේවය ඇරඹීමට පෙර, උතුරු ප්‍රදේශයේ සිටින ශ්‍රී ලාංකිකයින්ට රටින් පිටතට ගුවන් ගමනක් යෑම සඳහා දුම්රියෙන් හෝ පැය අටකට ආසන්න මාර්ග ගමනකින් කටුනායකට ළඟා වීමට සිදු විය.

චෙන්නායි සහ යාපනය අතර ගුවන් ගමන් මෙහෙයුම් වැඩිවීම උතුරු පළාතේ වෙසෙන ජනතාවට කදිම පුවතකි. යාපනය සහ චෙන්නායි අතර දෛනික සෘජු ගුවන් ගමන් උතුරු ප්‍රදේශයේ වෙසෙන කර්මාන්ත ප්‍රජාවට විශිෂ්ට ප්‍රවෘත්තියක් වනු ඇත, මන්ද මෙමගින් වෙළඳ සහ ව්‍යාපාරික අවශ්‍යතා, සංචාරක සහ පුද්ගලික සංචාරයන් සඳහා ඉන්දියාව සමඟ වැඩි සම්බන්ධතාවක් ලබා දෙනු ඇත.

**කටාර් ගුවන්සේවය සිය දෛනික 5 වන ගුවන්ගමන් වාරය කොළඹටත් / කොළඹ සිටත් හඳුන්වා දීම.**
කටාර් ගුවන්සේවය 2023 ජුනි මස සිට බලපැවැත්වෙන පරිදි කොළඹටත් / කොළඹ සිටත් එහි පස්වන දෛනික ගුවන්ගමන් වාර හඳුන්වා දෙනු ලැබිය. අමතර ගුවන් ගමන් ලොව පුරා ගමනාන්ත 160 කට අධික සංඛ්‍යාවකට සම්බන්ධතා ලබා දෙනු ඇත. දැනට, කටාර් ගුවන්සේවය බ.ජා.ගු.හි සතියකට ආසන්න වශයෙන් මගීන් 21,000ක් පමණ හසුරුවයි. රටේ සංවර්ධනයට දායක වන කටාර් ගුවන්සේවය හි ගුවන්ගමන් වාර වැඩි කිරීමට පහසුකම් සැලසීමට හැකි වීම පිලිබඳව ගු.ගු.සේ.ස සතුටු වේ.

**පැමිණීමේ කාඩ්පත් (විදේශිකයන් සඳහා) සහ පිටත්වීමේ කාඩ්පත් (ශ්‍රී ලාංකිකයන් සඳහා) අන්තර්ජාලය ඔස්සේ පිරවීම**
2023 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණීමේ කාඩ්පත් (ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා) සහ පිටවීමේ කාඩ්පත් (රටින් පිටවන ශ්‍රී ලාංකිකයන් සඳහා) අන්තර්ජාලය හරහා සම්පූර්ණ කිරීමට පහසුකම් සපයා ඇත.

ඒ අනුව, ගුවන් මගීන්ට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.immigration.gov.lk වෙත පිවිසීමෙන් හෝ https://eservices.immigration හරහා, ගමන් කිරීමට දින තුනකට පෙර අන්තර්ජාලය හරහා මෙම කාඩ්පත් පිරවීමට පහසුකම් සලසා ඇත. එමගින් මගීන්ට කිසිදු අපහසුතාවයකින් තොරව ආගමන විගමන විධිවිධාන සම්පූර්ණ කිරීමට හැකියාව ලැබේ.

## 7) ප්‍රදාන

ගු.ගු.සේ.ස ගුවන්තොටුපළ කළමනාකාරිත්වයේ සහ මෙහෙයුම්වල විවිධ අංශවල විශිෂ්ටත්වය හඹා යාමට සහ සම්මාන ලබා ගැනීමට කැපවී සිටී. අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ මූලපිරීම් සහ උපාය මාර්ගික සැලසුම් තුළින්, ගුවන්තොටුපළ සේවා, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීම සහ ඉක්මවා යාම ගු.ගු.සේ.ස අරමුණු කරයි. කර්මාන්ත සම්මාන සහ පිළිගැනීමේ වැඩසටහන් සඳහා සක්‍රියව සහභාගී වීමෙන්, ගු.ගු.සේ.ස සිය ජයග්‍රහණ සහ නවෝත්පාදන ප්‍රදර්ශනය කිරීමට උත්සාහ කරන අතරම ගෝලීය හොඳම නිර්දේශකයන් හා සසඳමින් එහි ක්‍රියාකාරිත්වය ප්‍රමිතිගත කිරීමට ක්‍රියාකරනු ලබයි. මීට අමතරව, සම්මාන සඳහා ලුහුබැඳීම ගු.ගු.සේ.ස කාර්ය මණ්ඩලයට සංවිධානය පුරා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ විශිෂ්ටත්වයේ සංස්කෘතියක් පෝෂණය කරමින් ඔවුන්ගේ කාර්යභාරයන්හි විශිෂ්ටත්වය සඳහා කැපවීමට පෙළඹවීමක් ලෙස කටයුතු කරනු ඇත. අවසාන වශයෙන්, ගු.ගු.සේ.ස හි සම්මාන ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම ලෝක මට්ටමේ ගුවන්තොටුපළ සේවා සැපයීමට සහ ශ්‍රී ලංකාවේ ගුවන් සේවා ක්ෂේත්‍රයේ සමස්ත සංවර්ධනයට දායක වීමට ඇති කැපවීම අවධාරණය කරයි.

ගු.ගු.සේ.ස විසින් ලබා ඇති ඇගයීම් පහත දැක්වේ.

**ගු.ගු.සේ.ස 2023 ජාතික ව්‍යාපෘති කළමනාකරණ විශිෂ්ටතා සම්මාන උළෙලේදී "හොඳම කළමනාකරණය කළ ව්‍යාපෘතිය" සඳහා අනුශූරතාව දිනා ගත්තේය.**

බ.ජා.ගු.හි අරලිය විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගු.ගු.සේ.ස විසින් සිදු කරන ලද ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනය විසින් මෑතකදී පවත්වන ලද 2023 ජාතික ව්‍යාපෘති කළමනාකරණ විශිෂ්ටතා සම්මාන උළෙලේ ප්‍රවාහන හා සැපයුම් අංශයේ කාණ්ඩය යටතේ "හොඳම කළමනාකරණය කළ ව්‍යාපෘතිය" සඳහා වන අනුශූරතාව දිනාගත් බව අපි ගෞරවයෙන් හා ආඩම්බරයෙන් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු.



*ගු.ගු.සේ.ස හොඳම කළමනාකරණය කළ ව්‍යාපෘතිය සඳහා අනුශූරතා සම්මානය දිනා ගැනීම*

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

## 8) පර්යේෂණ

ගු.ගු.සේ.ස විසින් ගුවන් තොටුපළ කළමනාකරණයේ සහ මෙහෙයුම්වල විවිධ පැතිකඩයන් පිළිබඳ සිය තීක්ෂ්ණ බුද්ධිය තියුණු කිරීමට පර්යේෂණ ප්‍රයත්නයන් ආරම්භ කර ඇත. මෙම උපායමාර්ගික පර්යේෂණ මුලපිරීම් මගීන්ගේ හැසිරීම් සහ ආරක්ෂණ නියාමාවලිය මගින් පාරිසරික තිරසාරභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව දක්වා පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරයි. මෙම ක්ෂේත්‍ර පිළිබඳව සොයා බැලීමෙන්, ගු.ගු.සේ.ස සිය තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම, සේවා සැපයීම පිරිපහදු කිරීම සහ සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීම අරමුණු කරයි. එපමනක් නොව, පර්යේෂණ ගු.ගු.සේ.ස තුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහ ගෝලීය ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ සංවිධානයේ තරඟකාරිත්වය ශක්තිමත් කිරීමට අවශ්‍ය නවෝත්පාදන බිහි කිරීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස සේවය කරනු ඇත.

වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපෘතිය පහත දැක්වේ.

**තිරසාර සහ ඩිජිටල්කරණය වූ ලෝකයක් සඳහා ගුවන්සේවා පරිවර්තනය කිරීම: ගුවන් සේවා පර්යේෂණ පිළිබඳ පළමු ජාත්‍යන්තර සමුළුව (ICAR) 2023**

ප්‍රගතිය සහ නවෝත්පාදනයන් සඳහා වන සිය කැපවීම ප්‍රබල ලෙස සනාථ කරමින්, ගු.ගු.සේ.ස විසින් 2023 අගෝස්තු මාසයේදී බ.ජා.ගු.හිදී ගුවන්සේවා කර්මාන්තයේ පරිවර්තනීය අවස්ථාවක් සනිටුහන් කරමින් ගුවන්සේවා ප්‍රජාවේ විශේෂඥයින් සහ වෘත්තිකයන්ගේ අවධානය යොමු කරගනිමින් ගුවන් සේවා පර්යේෂණ පිළිබඳ පළමුවන ජාත්‍යන්තර සමුළුව (ICAR) 2023 සමාරම්භක අවස්ථාවට සත්කාරකත්වය සපයන ලදී.

'තිරසාර සහ ඩිජිටල්කරණය වූ ලෝකයක් උදෙසා ගුවන් සේවාවේ පරිණාමය' යන ප්‍රබල තේමාව යටතේ, ගුවන් සේවා ක්ෂේත්‍රයේ වෘත්තිකයින්, ශාස්ත්‍රාලිකයින්, පර්යේෂකයන් සහ ශිෂ්‍යයින්ට වඩාත් දැවෙනි සමකාලීන ගුවන්සේවා අභියෝගවලට මුහුණ දෙන ආකාරය පිළිබඳ ඔවුන්ගේ බුද්ධිමය දායකත්වය එක්රැස් කිරීමට සහ බෙදා ගැනීමට, ගුවන් සේවා පර්යේෂණ සමුළුව ගෝලීය වේදිකාවක් ලෙස කටයුතු කළේය. ගු.ගු.සේ.ස විසින් මෙම සමුළුව සංවිධානය කරන ලද්දේ සහයෝගීතාව, දැනුම හුවමාරු කර ගැනීම සහ ගුවන් සේවයේ අනාගතය හැඩගැස්වීම සඳහා නව්‍යකරණයන් පෝෂණය කිරීමේ මූලික අරමුණ ඇතිවය.

යෝජිත සමුළුව ගුවන්තොටුපළ මෙහෙයුම් සහ කළමනාකරණය, ගුවන් සේවා කළමනාකරණය සහ ආර්ථික විද්‍යාව, ගුවන් ගමනාගමන කළමනාකරණය සහ පාලනය, ගුවන් සේවා ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය, තිරසාර ගුවන් සේවා සහ පාරිසරික බලපෑම, ගුවන් සේවයේ නැගී එන තාක්ෂණයන්, ගුවන් සේවා අධ්‍යාපනය සහ පුහුණුව, ගුවන් සේවා ආර්ථික විද්‍යාව සහ ප්‍රතිපත්ති, සංචාරක හා ආගන්තුක සත්කාරය, සහ ගුවන් සේවා මානව සාධක සහ ශ්‍රමක්ෂමතා වැනි පර්යේෂණ ක්ෂේත්‍ර ආවරණය කිරීමට අපේක්ෂා කෙරේ.

ගුවන්සේවා පර්යේෂණ පිළිබඳ පළවන ජාත්‍යන්තර සමුළුව (ICAR) 2023 සමගින්, ගු.ගු.සේ.ස විසින් ශාස්ත්‍රීය, කර්මාන්ත සහ පර්යේෂණ අතර පරතරය පියවීමට වේදිකාවක් තැනීමට සාර්ථකව පුරෝගාමී වී තිරසාර සහ සංඛ්‍යාංක ලෙස වැඩිදියුණු කළ ගුවන් සේවා භූමි දර්ශනයක් කරා ගමන් කරයි.

ගුවන් සේවා කර්මාන්තය පරිවර්තනීය වෙනස්කම්වලට භාජනය වෙමින් පවතින ලෝකයක, ගුවන් සේවා පර්යේෂණ පිළිබඳ පළමුවන ජාත්‍යන්තර සමුළුව (ICAR) 2023 ගුවන් සේවා සඳහා නව අරුණැල්ලක් සනිටුහන් කරමින් ඥානාලෝකය සහ නවෝත්පාදනයේ ආලෝකයක් ලබා දෙනු ඇත.

## 9) විශ්වාසය

**ස්ථාපිත මාර්ගෝපදේශ සහ රෙගුලාසි සමඟ ශක්තිමත් අනුකූලතාවයක් සහතික කරමින් ගු.ගු.සේ.ස විශ්වාසනීය ප්‍රමිතීන්ට අනුකූල වේ. පහත දැක්වෙන්නේ වසර තුළ අත්පත් කරගත් එක් සන්ධිස්ථානයකි.**

ගු.ගු.සේ.ස සිවිල් ගුවන් තොටුපළ ක්‍රියාකරු සහ ගුවන් සේවා සපයන්නා ලෙස, බ.ජා.ගු. සහ අනෙකුත් ගුවන්තොටුපළවල ගුවන් ආරක්ෂක පද්ධති සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතා සපුරාලීමට සමත් වී ඇති අතර, ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළවල සහ ගුවනේ ආරක්ෂිත බව සහතික කර ඇත.

2023 මැයි මාසය තුළ, ICAO හි ජාත්‍යන්තර විගණන කණ්ඩායමේ විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩායමක් විශ්ව ආරක්ෂක විගණන වැඩසටහන අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USAP-CMA) යටතේ ශ්‍රී ලංකාවේ ගුවන් ආරක්ෂක පද්ධති පිළිබඳ විගණනය සිදු කරන ලදී. විගණනය යටතේ, ජාතික ගුවන්සේවා ආරක්ෂක පද්ධතියේ නියාමන රාමුව, ගුවන් ආරක්ෂක නිලධාරීන් පුහුණු කිරීම, තත්ත්ව පාලන කාර්යයන්, ගුවන්තොටුපළ මෙහෙයුම්, මගී සහ ගමන් මලු ආරක්ෂාව යනාදී තීරණාත්මක ක්ෂේත්‍ර අටක් සහ තවත් කිහිපයක් පිළිබද සිව් දෙනෙකුගෙන් හෙබි විශේෂඥ විගණන කණ්ඩායමක් විසින් අපක්ෂපාතීව විගණනය කරන ලදී. දින 11 ක කාලයක් බ.ජා.ගු.හි සිදු කරන ලද විගණන ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකාව සිය කාර්ය සාධනය අතින් ඉහළ මට්ටමකට ළඟා කර ඇති බව ගුවන්සේවා ආරක්ෂක පද්ධති පරීක්ෂා කිරීමේදී අනාවරණය විය.

සමාප්ති උත්සවයේදී ICAO විගණන කණ්ඩායම් නායක - ඔරෙලියන් ලාවයිස්සියර් (Aurelien Lavayssiere) මහතා විසින් පශ්චාත්-විගණන විමර්ශනයේදී අතුරු වාර්තාව ඉදිරිපත් කර ශ්‍රී ලංකාව ලකුණු 92%ක් ලබාගෙන ඇති බව ප්‍රකාශ කිරීම ඉස්මතු කලයුතු වැදගත් කරුණකි. 2012 වසරේ සිදු කරන ලද පෙර විගණනයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය 85.6% කි. එබැවින් ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්තොටුපළවල ක්‍රියාකරු ලෙස ගු.ගු.සේ.ස ගුවන් සේවා ආරක්ෂාව, ගුවන්තොටුපළ කළමනාකාරිත්වය, අනෙකුත් අදාළ ආයතන සහ අනෙකුත් සියලුම ආයතනවල දැඩි උත්සාහය සහ කැපවීම හේතුවෙන් මෙවර ලකුණු 92% ලබා ගැනීමට හැකිවීම විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සලකනු ලබයි.

## 10) සම්ප්‍රාප්ත වීම

ගු.ගු.සේ.ස සිය මෙහෙයුම්වල සෑම අංශයකම විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා උත්සාහ කරමින්, සැලකිය යුතු සන්ධිස්ථාන කරා ළඟා වීමට කැපවී සිටියි. නවෝත්පාදනය, කාර්යක්ෂමතාව සහ සේවා ගුණාත්මකභාවය කෙරෙහි පැහැදිලි අවධානයක් යොමු කරමින්, ගු.ගු.සේ.ස ගුවන්තොටුපළ කළමනාකාරිත්වය සහ ගුවන්සේවා සේවාවන්හි නව උසස් මට්ටමකට ළඟා වීමට අඛණ්ඩව උත්සාහ කරයි. උපාය මාර්ගික සැලසුම්කරණය, දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සහ කැපවූ ශ්‍රම බලකායක් තුළින්, ගු.ගු.සේ.ස සිය දැක්ම සාක්ෂාත් කර ගැනීමට සහ ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දායක වීමට සූදානමින් සිටියි. අභිලාෂකාමී ඉලක්ක තැබීමෙන් සහ අධිෂ්ඨානශීලීව ඒවා හඹා යෑමෙන්, කල්පවත්නා බලපෑමක් ඇති කිරීමට සහ ගෝලීය ගුවන් සේවා කර්මාන්තයේ ප්‍රමුඛයා ලෙස තහවුරු කර ගැනීමට ගු.ගු.සේ.ස අරමුණු කරයි.

**ගු.ගු.සේ.ස හි 40 වන සංවත්සරය සැමරීම**

ගු.ගු.සේ.ස සිය 40 වන සංවත්සරය සමරනු ලැබුවේ 2023 මාර්තු මාසයේදී බ.ජා.ගු. හි සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් සහ පසුදින සංඝයා වහන්සේ 14 දෙනෙකු උදෙසා උදෑසන දානමය පිංකමක් සංවිධානය කරමිනි.



*ගු.ගු.සේ.ස හි 40 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් පැවැත්වූ පිරිත් සජ්ඣායනාව*

**ම.රා.ජා.ගු. සිය 10 වැනි සංවත්සරය සැමරීම**

ම.රා.ජා.ගු. අභියෝග මධ්‍යයේ බලාපොරොත්තුව මතුවෙන අතර 2013 මාර්තු 18 වැනි දින විවෘත කරන ලද ශ්‍රී ලංකාවේ දෙවැනි ජාත්‍යන්තර ගුවන්තොටුපළ වන ම.රා.ජා.ගු., 2023 මාර්තු 18 වැනි දින සිය 10 වැනි සංවත්සරය සමරන ලදී. අභියෝග රැසක් සමග දශකයක් පසුකර ඇති ගුවන්තොටුපළ වර්තමානයේ ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය පුළුල් කිරීමේ අභිලාෂයන් සමඟින් ඉස්මතුවෙමින් පවතී.

ගුවන්තොටුපළ එහි ආරම්භයේ සිට 2015 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, 2015 සිට 2020 දක්වා කාලය තුළ, නියමිත ජාත්‍යන්තර ගුවන්සේවා මෙහෙයුම් නතර කරන ලදී. කෙසේ වෙතත්, 2020 දී නැවතත්, ගු.ගු.සේ.ස ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙහෙයුම් පුනර්ජීවනය කිරීමට සිය උපාය මාර්ග දියත් කළේය.

කෙසේ වෙතත්, ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් ගුවන්තොටුපළට නැවතත් අනපේක්ෂිත අභියෝගවලට මුහුණ දීමට සිදු විය. ගෝලීය වසංගතය තුළ නැවත මෙරටට ගෙන්වා ගැනීමේ ගුවන් මෙහෙයුම් සඳහා සේවය ලබා දීමට ගුවන්තොටුපළ සමත් වූ අතර 2020 දී මගීන් 17,421 ක් සහ 2021 දී මගීන් 32,945 ක් සඳහා පහසුකම් සැලසීය. කෙසේ වෙතත්, 2022 වසර තුළ රට තුළ පැවති දේශපාලන හා ආර්ථික අර්බුදය එහි වරලත් ගුවන් ගමන් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට බලපෑ අතර ඒ වනවිට ගුවන්තොටුපළ පහසුකම් සපයනු ලැබුවේ කසකස්තානය, රුසියාව, යුක්රේනය, උස්බෙකිස්තානය වැනි නව සංචාරක ගමනාන්ත වෙතය. යුක්රේනය, රුසියාව වැනි ගමනාන්තවලින් පැමිණෙන ගුවන් සමාගම් සහ සංචාරකයින් ද යුද තත්ත්වයෙන් පීඩාවට පත් විය.

2023 වර්ෂයේදී රටේ ආර්ථික තත්ත්වය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීමත් සමඟ අභ්‍යගත වාහල්කඩ හරහා පැමිණෙන ජාත්‍යන්තර සංචාරකයින්ගේ සංඛ්‍යාවේ සතුටුදායක වර්ධනයක් ඇති විය. උදාහරණයක් වශයෙන්, ම.රා.ජා.ගු. විසින් 2023 වර්ෂයේදී ජාත්‍යන්තර මගීන් 125,623 දෙනෙකුට පහසුකම් සැලසූ අතර, එය 2022 වසරට සාපේක්ෂව 100% කට වඩා වැඩි වර්ධනයක් නියෝජනය කරයි. තවද, වසර තුළ ම.රා.ජා.ගු. ජාත්‍යන්තර ගුවන් යානා 548 ක් සඳහා පහසුකම් සැලසීය.

සතියකට ගුවන් ගමන් වාර හතරක් ක්‍රියාත්මක වන රුසියාවේ රෙඩ් වින්ග්ස් ගුවන්සේවයෙහි වරලත් ගුවන් ගමන් මෙහෙයුම් හරහා රුසියානු සංචාරකයින් වැඩි ප්‍රමාණයක් මෙරටට ගෙන්වා ගැනීමට ම.රා.ජා.ගු. සමත් වී ඇත. තවද, වරලත් මෙහෙයුම් නැවත ආරම්භ කරමින්, 2023 මාර්තු මාසයේදී කසකස්තානයේ ස්කැට් ගුවන්සේවයෙහි පළමු වරලත් ගුවන් ගමනට පහසුකම් සැලසීමට ම.රා.ජා.ගු. සමත් විය. පසුගිය මාස කිහිපය තුළ, එහි ප්‍රයෝජනයට නොගත් විභවය හෙළිදරව් කරමින්, කලාපයේ සමාජ-ආර්ථික සංවර්ධනයට දායක වන වනජීවී, වෙරළ තීරයන් සහ සංස්කෘතික හා ආගමික ස්ථාන වැනි සුප්‍රසිද්ධ සංචාරක ආකර්ෂණයන්ගෙන් වට වූ වඩාත් ප්‍රසිද්ධ ගමනාන්ත වෙත ජාත්‍යන්තර සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට ම.රා.ජා.ගු. සමත් විය. මීට අමතරව,ම.රා.ජා.ගු. ජාත්‍යන්තර ගුවන් සමාගම් කිහිපයක් සඳහා තාක්ෂණික නැවතුම් සඳහා ප්‍රධාන උපායමාර්ගික ගුවන් තොටුපළක් වී ඇති අතර, පසුගිය වසර කිහිපය තුළ ම.රා.ජා.ගු. එම ජාත්‍යන්තර ගුවන් සමාගම් සඳහා තාක්ෂණික නැවතුම් සඳහා වඩාත් කැමති තේරීමක් වී ඇති බව ඉස්මතු කිරීම කැපී පෙනේ.

ම.රා.ජා.ගු. හි ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීමටත්, ගුවන්සමාගම් ආකර්ෂණය කර ගනිමින් සම්බන්ධතා වැඩිදියුණු කිරීමටත්, ම.රා.ජා.ගු. වෙතට සහ සිට තවත් ගුවන් ගමන් මෙහෙයුම් සිදු කරමින් ගුවන්ගමන් හා සංචාරක කර්මාන්තයට පහසුකම් සැලසීමටත් උත්සාහ කරන අතරම, ගුවන්තොටුපළින් රටේ සමාජ-ආර්ථික දායකත්වය ඉහළ නැංවීමට ගත හැකි සෑම පියවරක්ම ගු.ගු.සේ.ස ආයතනය විසින් ගනිමින් සිටියි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාර්ලිමේන්තු කැබිනට් අනුමැතිය ඇතිව, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, සහ ගු.ගු.සේ.ස විසින් නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම, මෙහෙයුම් පහසුකම්, අභ්‍යවකාශ ඉංජිනේරු සහ නිෂ්පාදන, ස්ථාවර පාදක මෙහෙයුම් (Fixed Based Operations) ස්ථාපිත කිරීම, ගුවන්-මුහුදු භාණ්ඩ සැකසීම, ගුවන්යානා කොටස් වලට වෙන් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය, ආගන්තුක සත්කාරය, සංචාරක, විනෝදය සහ විවේකය, ත්‍රාසජනක ක්‍රියා, භාණ්ඩ ප්‍රවාහනය, කුරියර් සේවා, නිවාඩු නිකේතන, සහ විලා, සන්නාමගත සාප්පු සංකීර්ණ, කාර්මික උද්‍යාන (නිෂ්පාදනය, ඇසුරුම්, ගබඩා) සහ පුනර්ජනනීය බලශක්ති කර්මාන්තය ආදිය සඳහා ආයෝජන යෝජනා කැඳවීමට කටයුතු කරමින් සිටියි.

ගු.ගු.සේ.ස විසින් ම.රා.ජා.ගු. හි උපායමාර්ගික වැදගත්කම හඳුනාගෙන ඇති අතර රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ගුවන්තොටුපළේ දායකත්වය වැඩි කිරීමට අවශ්‍ය උත්සාහයන් අඛණ්ඩව සිදුකිරීමට අපේක්ෂා කරයි.



*ම.රා.ජා.ගු. හි මගීන්ගේ සතුටුදායක වර්ධනයක්*





# පුනර්ජීවනය

## නව්‍යකරණය හා යාවත්කාලීනත්වය

# මූල්‍ය සමාලෝචනය

සලකා බලනු ලබන කාල සීමාව සඳහා සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම හි (ගු.ගු.සේ.ස) මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව මෙම මූල්‍ය සමාලෝචනය තුළින් අපි සලකා බලන්නෙමු. ගුවන් සේවා අංශයේ ප්‍රමුඛයෙකු ලෙස ගු.ගු.සේ.ස විසින් ශ්‍රී ලංකාව තුළ ගුවන් ගමන් සඳහා පහසුකම් සැලසීම සහ ගුවන්තොටුපළ මෙහෙයුම් සඳහා සහය වීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම විශ්ලේෂණය මඟින් සමාලෝචන කාල සීමාව තුළ ගු.ගු.සේ.ස විසින් සිදු කරන ලද ප්‍රධාන මූල්‍ය ප්‍රමිතික, මෙහෙයුම් ඉස්මතු කිරීම් සහ උපාය මාර්ගික මුලපිරීම් පිළිබඳ අවබෝධයක් මෙන්ම, පාර්ශවකරුවන්ට ආයතනයේ මූල්‍ය යහපත්භාවය සහ කාර්යසාධනය පිළිබඳ පුළුල් දැනුවත්භාවයක් ලබා දෙනු ඇත.

රු. මිලියන **38,376**
(2022 රු. මිලියන 27,577)
**ආදායම**

රු. මිලියන **14,324**
(2022 රු. මිලියන -6,202 )
**ශුද්ධ මූල්‍ය ආදායම**

රු. මිලියන **19,315**
(2022 රු. මිලියන 12,635)
**මෙහෙයුම් ලාභය**

රු. මිලියන **28,122**
(2022 රු. මිලියන 4,803)
**බදු ගෙවීමෙන් පසු ලාභය**

රු. මිලියන **191,542**
(2022 රු. මිලියන 179,530)
**වත්කම්**

## ආදායම්



## ගුවන්ගමන් සංචලන හි හැසිරීම

| විස්තරය | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර මගී සංචලන | 9,958,688 | 2,375,056 | 1,505,479 | 5,503,198 | 7,548,646 |
| ජාත්‍යන්තර ගුවන් ගමන් සංචලන | 62,195 | 20,881 | 21,204 | 37,641 | 46,639 |
| හරහා පියාසර සංචලන | 45,674 | 16,370 | 9,339 | 23,846 | 35,506 |
| ගුවන් භාණ්ඩ ප්‍රවාහනය | 259,089මෙ.ටො | 150,075මෙ.ටො | 200,179මෙ.ටො | 173,597මෙ.ටො | 158,911මෙ.ටො |







ගුවන් යානා සංචලන සහ මගී සංචලන යනු ගු.ගු.සේ.ස ආදායම් මාර්ගවලට බලපාන මූලික සාධක වේ. ජාත්‍යන්තර මගී ප්‍රවාහනය පෙර වසරට සාපේක්ෂව 37%ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර ජාත්‍යන්තර ගුවන් යානා සංචලනය 24%ක වර්ධනයක් අත්විඳ ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, වත්මන් මූල්‍ය වර්ෂයේදී, ගු.ගු.සේ.ස විසින් පෙර වසරට සාපේක්ෂව 39%ක සැලකිය යුතු වර්ධනයක් සනිටුහන් කරමින්, රුපියල් මිලියන 38,376ක සමස්ත ආදායමක් ලබා ගෙන ඇත.

ගු.ගු.සේ.ස හි ආදායම් මාර්ග මූලික වශයෙන් ගගන නාවික මෙහෙයුම් සහ ගගන නාවික නොවන ක්‍රියාකාරකම්වලින් උපයන ආදායමෙන් සමන්විත වේ. පහත පරිදි මෙම ක්‍රියාකාරකම්වල ප්‍රධාන ආදායම් මූලාශ්‍ර තවදුරටත් වර්ගීකරණය කළ හැකිය.

### ප්‍රධාන ගගන නාවික ආදායම්

- ගොඩබෑසීමේ සහ නැවතුම් ආදායම්
- හරහා පියාසැරි ආදායම්
- ගුවන් පාලම් ආදායම්
- අභ්‍යන්තර ගොඩබෑසීමේ සහ නැවතුම් ආදායම්

### ප්‍රධාන ගගන නාවික නොවන ආදායම

- අනුග්‍රාහක ගාස්තු
- ගුවන් යානාවට නැගීමේ ගාස්තු
- බදුකුලී
- වෙනත් ගගන නාවික නොවන ආදායම්

# මූල්‍ය සමාලෝචනය







## ලාභදායිත්වය

2023 මූල්‍ය වර්ෂයේදී, ගු.ගු.සේ.ස විසින් ශක්තිමත් ලාභයක් පෙන්නුම් කළ අතර, මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 19,315 වේ. මෙම අගය පෙර වසරට සාපේක්ෂව 53% ක කැපී පෙනෙන වර්ධනයක් වේ. මේ තුළින් මෙහෙයුම් පිරිවැය සහ ආදායම් ප්‍රශස්ත කිරීමේ උපාය මාර්ග සමාගම විසින් ඵලදායී ලෙස කළමනාකරණය කර ඇති ආකාරය අවධාරණය කරයි. මෙහෙයුම් ලාභයේ එවැනි සැලකිය යුතු වර්ධනයක් තුළින් තිරසාර වර්ධනයක් සඳහා පවතින අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් ගුවන් සේවා කර්මාන්තයේ අභියෝගවලට මුහුණදීමට ගු.ගු.සේ.ස සතු ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව පෙන්නුම් කරයි. මෙම ජයග්‍රහණය තුළින් තම පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දීමට සමාගම දක්වන කැපවීම අවධාරණය කරන අතර, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් ඔබ්බට ගුවන් සේවා ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු ලෙස කටයුතු කිරීමේ එහි ස්ථාවරය ශක්තිමත් කරයි.




## මෙහෙයුම් වියදම්

මෙහෙයුම් වියදම් යනු ඕනෑම ආයතනයක මූල්‍ය කාර්ය සාධනයේ තීරණාත්මක අංගයකි. ඊට පුද්ගල පිරිවැය, පරිපාලනය සහ ආයතනික වියදම්, අළුත්වැඩියා සහ නඩත්තු වියදම් සහ ක්ෂයවීම් වියදම් වැනි විවිධ කාණ්ඩ ඇතුළත් වේ. සමාලෝචිත මුදල් වර්ෂය තුළදී ගු.ගු.සේ.ස විසින් මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 19,061 ක් ලෙස වාර්තා කරන ලදී. මෙහෙයුම් යටිතල පහසුකම් සහ සේවා පවත්වාගෙන යාමට සහ වැඩි දියුණු කිරීමට සමාගම දරන උත්සාහය පෙන්නුම් කරමින් එය පෙර වසරට සාපේක්ෂව 28%ක කැපී පෙනෙන වර්ධනයක් නිරූපණය කරයි. මෙහෙයුම් පිරිවැය ඉහළ යාම අභියෝගයක් වන අතර, එතුළින් සමාගමේ වර්ධන අරමුණු සහ සේවා විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍රවල සිදු කරන ලද ආයෝජන ද පිළිබිඹු කරයි. වෙනස්වන ගුවන් සේවා ක්ෂේත්‍රයේ තිරසාර ලාභදායිත්වය සහ දිගු කාලීන සාර්ථකත්වය සහතික කිරීම සඳහා මෙම වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම ගු.ගු.සේ.ස සඳහා ඉතා වැදගත් වේ.

## ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම

පොලී වියදම් සහ ආදායම මඟින් ශුද්ධ ලාභය හෝ අලාභයට ඇති කරන බලපෑම පිළිබිඹු කරමින් සකසන ශුද්ධ මූල්‍ය පිරිවැය/ආදායම සමාගමක මූල්‍ය ක්‍රියාකාරිත්වයේ සැලකිය යුතු අංගයක් වේ. සමාලෝචිත මූල්‍ය වර්ෂය සඳහා, ගු.ගු.සේ.ස හි ශුද්ධ මූල්‍ය පිරිවැය/ආදායම එහි සමස්ත මූල්‍ය සැකසුම නිර්මාණයේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ණය සඳහා පොලී වියදම්, ආයෝජනවලින් ලැබෙන පොලී ආදායම සහ වෙනත් මූල්‍ය ගනුදෙනු වැනි විවිධ මූල්‍ය ක්‍රියාකාරකම් මේ සඳහා ඇතුළත් වේ. අදාළ කාලපරිච්ඡේදය සඳහා ගු.ගු.සේ.ස හි ශුද්ධ මූල්‍ය පිරිවැය/ආදායම එහි සමස්ත ලාභදායිතාවයට සහ මූල්‍ය ස්ථාවරත්වයට දායක වී ඇත. සමාගමේ මූල්‍යයේ මෙම අංගය අවබෝධ කර ගැනීම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහය ප්‍රශස්ත කිරීම සහ දිගුකාලීන තිරසාර වර්ධනයක් සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ. විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය සහ උපාය
මාර්ගික තීරණ ගැනීම තුළින්, ගු.ගු.සේ.ස සිය මෙහෙයුම් අරමුණු සඳහා සහය වීම සහ කොටස් හිමියන්ගේ වටිනාකම ඉහළ නැංවීම සඳහා සිය ශුද්ධ මූල්‍ය පිරිවැය/ආදායම ප්‍රයෝජනයට ගැනීම අරමුණු කරයි.




## විනිමය අනුපාත ලාභ




වසරේ මුල් භාගයේදී, එක්සත් ජනපද ඩොලරය, ජපන් යෙන් සහ යුරෝ ඇතුළු ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල (SLR) අවප්‍රමාණය විය. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලැබීමෙන් පසුව, ශ්‍රී ලංකා රුපියලේ අගය ක්‍රමයෙන් වර්ධනය වන්නට පටන් ගත්තේය. 2022 වසරට සාපේක්ෂව රුපියලේ වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය ජපාන යෙන්වලට සාපේක්ෂව 17%කින්, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 12%කින් සහ යුරෝවට සාපේක්ෂව 8%කින් වර්ධනය වී ඇත.

උච්චාවචනය වන විනිමය අනුපාතවලට විසඳුම් සෙවීමට සහ හිතකර පොලී අනුපාතවලින් වාසි ලබාගැනීමට, ගු.ගු.සේ.ස විසින් ඇමරිකානු ඩොලර් මිලියන 208 සිට ඇමරිකානු ඩොලර් මිලියන 267 දක්වා වූ ඇමරිකානු ඩොලර් ස්ථාවර තැන්පතු සඳහා සිය ආයෝජන 28%කින් වැඩි කරන ලදී. ශ්‍රී ලංකානු රුපියලේ ස්ථාවර තැන්පතු හා සසඳන කල ඇමරිකානු ඩොලර් තැන්පතු සඳහා ලබා දෙන ඉහළ පොලී අනුපාතවල වාසිය ලබා ගැනීම සහ විභව විනිමය අනුපාත අවදානම් අවම කිරීම මෙම උපායමාර්ගික පියවරේ අරමුණ විය.

## මූල්‍ය තත්ත්වය

### වත්කම්

2023 දෙසැම්බර් 31 අවසානය වන විට, සමාගමේ මූල්‍ය තත්ත්වය එම කාලපරිච්ඡේදය ආරම්භයේදී පැවති රුපියල් මිලියන 179,530 සිට කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 191,542 ලෙස සනිටුහන් විය. සමාගමේ මූල්‍ය තත්ත්වයෙහි වර්ධනය තුළින් වෙනස්වන වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ එහි ඔරොත්තු දීමේ හැකියාව සහ උපාය මාර්ගික මූල්‍ය කළමනාකරණය පවත්වා ගැනීමට සමාගම සතු හැකියාව පිළිබඳ පිළිබිඹු කරයි. සමාගම විසින් ක්ෂේත්‍රය තුළ සිය ස්ථාවරය අඛණ්ඩව ශක්තිමත් කිරීමට කටයුතු කරන බැවින්, මෙකී වර්ධිත මූල්‍ය තත්ත්වය මඟින් මෙම වැඩිදියුණු කළ මූල්‍ය තත්ත්වය අනාගත ප්‍රයත්නයන් සඳහා ශක්තිමත් පදනමක් සපයන අතර, පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබා දීමට දක්වන කැපවීම වෙනුවෙන් ශක්තියක් සපයයි.







### කාරක ප්‍රාග්ධනය

2023 වසර අවසානයේදී, සමාගමේ ශුද්ධ කාරක ප්‍රාග්ධනය පෙර වසරට සාපේක්ෂව 6% ක වර්ධනයක් පිළිබිඹු කරමින් රුපියල් මිලියන 74,662ක් විය. මෙම වර්ධනය සමාගමේ ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වය සහ එහි වත්මන් වත්කම් සහ වගකීම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව අවධාරණය කරයි. සමාගම එහි මූල්‍ය ස්ථාවරත්වය ඉස්මතු කරමින් 3.31ක ජංගම අනුපාතය සමඟ, ජංගම වගකීම් සපුරාලීම සඳහා ජංගම වත්කම් ප්‍රමාණවත් ලෙස ලබා ගත හැකි බව පෙන්නුම් කරයි. එමෙන්ම ද්‍රවශීලතා තත්ත්වය තවදුරටත් ශක්තිමත් කරමින් භාණ්ඩ තොග මත රඳා නොසිට ජංගම වගකීම් ආවරණය කිරීමට සමාගම සතු හැකියාව 3.20ක ක්ෂණික අනුපාතය මඟින් පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම, සමස්ත වත්කම් පදනමට සාපේක්ෂව කාරක ප්‍රාග්ධනය පිළිබඳ සමාගම තුළ පවතින විචක්ෂණශීලී කළමනාකරණය පෙන්නුම් කරමින් 2023 වර්ෂයේ දී මුළු වත්කම් අනුපාතයට සාපේක්ෂව කාරක ප්‍රාග්ධනය 39% ක් විය.

### ණය

විදේශීය ණයවල කෙටි කාලීන සහ දිගු කාලීන අනුපාතයන් සහ දේශීය වාණිජ බැංකුවකින් ලබාගත් ණයකර යන දෙවර්ගයෙන් ගු.ගු.සේ.ස හි ණය සමන්විත වේ. මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශන දිනය වන විට මුළු ණය රුපියල් මිලියන 93,914ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 15%ක අඩුවීමකි. මේ සඳහා රුපියල් මිලියන 73,992ක දිගුකාලීන ණය සහ රුපියල් මිලියන 19,922ක කෙටි කාලීන ණය ඇතුළත් වේ. කෙටි කාලීන ණය යනු දිගු

කාලීන ණයවලට අදාළව වසරක කාලයක් තුළ ගෙවිය යුතු ණය කොටසයි. 2023 වර්ෂය තුළ ලබාගත් ණය ප්‍රමාණය 87%කින් මෙන්ම ණය ආපසු ගෙවීම 69%කින් අඩු වී ඇත. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 12 දිනැති විශේෂ ලිපිය අනුව ම.රා.ජා.ගු ඉදිකිරීම, ධාවන පථය ආවරණය කිරීම සහ බ.ජා.ගු දෙවන අවධිය දෙවන අදියර ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා ලබාගත් විදේශ ණය ආපසු ගෙවීම නතර කළ අතර 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ලෙස එය දැක්වේ. කෙටි කාලීන බැංකු තැන්පතු වැඩි වීම සහ විදේශ ණය ගෙවිය යුතු මුදල්වලට සාපේක්ෂව වාසිදායක විනිමය වෙනසක් සමඟ ගු.ගු.සේ.ස හි තෝලන මට්ටම 40% සිට 3% දක්වා පහත වැටුණි.

## අගය එකතු කිරීමේ ප්‍රකාශනය

| | | 2023<br>රුපියල් '000 | | 2022<br>රුපියල් '000 | |
|---|---|---|---|---|---|
| ආදායම | | 38,245,784 | | 25,936,399 | |
| වෙනත් ආදායම් | | 130,045 | | 1,640,401 | |
| මූල්‍ය ආදායම | | 10,428,196 | | 6,206,671 | |
| ආයුගණක උපකල්පනයේ වෙනස්කම් මත ඇතිවන ලාභය/(අලාභය) | | (207,575) | | (278,211) | |
| | | **48,596,450** | | **33,505,260** | |
| | | | | | |
| පරිපාලන සහ ආයතනික වියදම් | | (5,949,949) | | (2,579,345) | |
| | | | | | |
| | | | | | |
| **අගය එකතු කිරීම** | | **42,646,501** | | **30,925,915** | |
| | | | | | |
| **එකතු කළ අගයේ ව්‍යාප්තිය** | | | | | |
| සේවකයින් හට | වැටුප් සහ ප්‍රතිලාභ | 10,989,966 | 26% | 9,995,360 | 32% |
| රජයට | බදු | 5,886,761 | 14% | 877,224 | 3% |
| කොටස් හිමියන්ට | ලාභාංශ | 5,500,000 | 13% | 500,000 | 2% |
| ණය ප්‍රාග්ධනය සපයන්නන්ට | පොලී | 2,225,201 | 5% | 1,854,365 | 6% |
| ව්‍යාපාරය තුළ රඳවා ගැනීම් | ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | 2,121,243 | 5% | 2,366,794 | 8% |
| ව්‍යාපාරය තුළ රඳවා ගැනීම් | සංචිත | 15,923,329 | 37% | 15,332,172 | 49% |
| | | **42,646,501** | **100%** | **30,925,915** | **100%** |

**එකතු කළ අගයේ ව්‍යාප්තිය 2023**




**එකතු කළ අගයේ ව්‍යාප්තිය 2022**



# මානව සම්පත් කළමනාකරණය



## මානව සම්පත් සංවර්ධනය

ආයතනයක් තුළ ඉගෙනුම් සංස්කෘතියක් පෝෂණය කිරීමේදී මානව සම්පත් සංවර්ධනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එමෙන්ම එය ආයෝජන අංශයේ ද්විත්ව කාර්යභාරයක් ඉටු කරමින් ව්‍යාපාරය සඳහා ආයෝජනයක් බවට පත්වන සේවකයින් සංවර්ධනය කරන අතර, එමඟින් වඩාත් ශක්තිමත් සහ ඵලදායී ශ්‍රම බලකායක් නිර්මාණය කරයි. ශ්‍රම බලකායේ හැකියාවන් වර්ධනය කරලීම සහ ඔවුන්ව අනාගතය වෙත සූදානම් කිරීමේ ඉහළ අවශ්‍යතාව සපුරාලීම සඳහා පුහුණුව සහ සංවර්ධනය ලබා දීම වෙනුවෙන් නිරන්තරයෙන් ආයෝජන සිදු කිරීමට ගු.ගු.සේ.ස හි අපි බොහෝ ආර්ථික බාධක මධ්‍යයේ වුවද කටයුතු කළෙමු. අපගේ ඉගෙනුම් උපායමාර්ගය 70:20:10 මූලධර්මය මත පදනම් වේ. එය සම්පූර්ණ දියුණුවක් කරා ළඟා වීමට ඉගෙනුම් මැදිහත්වීම් වර්ධනය කිරීමේ පදනම ලෙස භාවිත කරයි. 2023 වර්ෂය තුළදී අපගේ සේවකයින්ගේ දැනුම, කුසලතා සහ හැකියාවන් (KSA) අඛණ්ඩව වර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සමාගම ඉගෙනුම් ක්ෂේත්‍රය සඳහා රුපියල් මිලියන 36ක් ආයෝජනය කළේය. එහිදී දේශීය වශයෙන් සේවකයින් 1,856 දෙනෙකු සහ ජාත්‍යන්තර වශයෙන් සේවකයින් 132 දෙනෙකු පුහුණු කර ඇත. 2022 වර්ෂයට (2022: 874 දෙනෙකු) සාපේක්ෂව 127.45% ක වැඩි සේවකයින් පුහුණු කිරීමට අපට හැකි වූ බැවින් මෙය සුවිශේෂී ජයග්‍රහණයක් විය. තවද, අපි රත්මලානේ පිහිටි ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය (SLAAA) සමඟ සම්බන්ධීකරණය වෙමින් සේවකයින් 256 දෙනෙකු පුහුණු කිරීමට අපට හැකි විය. සමාගමේ ආයතනික සමාජ වගකීමේ කාර්යභාරයක් ලෙස, විවිධ විශ්වවිද්‍යාල සහ පුහුණු ආයතනවල සිසුන් සඳහා කාර්මික පුහුණු අවස්ථා 139ක් ලබා දෙන ලදී. මෙම මුලපිරීම රටේ ප්‍රධාන රාජ්‍ය හා පුද්ගලික විශ්ව විද්‍යාල සමඟ දිගුකාලීන සබඳතා වර්ධනය කර ගැනීමට මූලික අඩිතාලමක් ලබා දුන්නේය.

ජාතික වශයෙන් බලපාන ආර්ථික හා මූල්‍ය අර්බුදය මධ්‍යයේ බොහෝ සේවකයින් අත්විඳි ඉහළ ආතති මට්ටම්වලට විසඳුම් සෙවීමේ කාලෝචිත වැදගත්කම අවබෝධ කර ගනිමින්, ගු.ගු.සේ.ස සිය ශ්‍රම බලකායට සහය වීමට ක්‍රියාශීලී පියවර ගත්තේය. තෝරාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් පිරිසක් 'ක්‍රියාකාරී සවන්දෙන්නන්' ලෙස සන්නද්ධ කිරීම අරමුණු කරමින් අපි සමාගම් සේවක උපදේශකයින් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ එකමුතුව උපදේශන වැඩසටහන් ආරම්භ කළෙමු. සහය අවශ්‍ය පිරිස හඳුනා ගැනීම සහ පුද්ගලයින්ට අදාළ වූ උපදේශන සැසි වෙත ඔවුන්ව යොමු කිරීම ඔවුන්ගේ කාර්යභාරය වේ. මීට අමතරව, අපගේ ඉදිරිපෙළ කාර්ය මණ්ඩලයේ පාරිභෝගික සේවා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අපි අතිරේක සම්පත් වෙන් කළෙමු. අපගේ ව්‍යාපාර තිරසාරභාවය සහජයෙන්ම පාරිභෝගික තෘප්තිය සමඟ බැඳී පවතින බැවින්, සේවා මට්ටම් ඉහළ නැංවීම සහ පවත්වාගෙන යාම සඳහා මෙම ආයෝජනය ඉතා වැදගත් වේ.

වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය සඳහා තම සේවා ක්ෂේත්‍රයට අදාළ එක් වෘත්තීය දායකත්වයට සඳහා වූ වියදම් ප්‍රතිපූර්ණ වගකීම අප විසින් දරන ලදී. අපි සේවකයින්ට ඔවුන්ගේ වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීමට නිතැනින් සහය දක්වන්නෙමු. එය ඔවුන්ගේ කාර්යයට සහ දැනුමට වටිනාකමක් එක් කරන්නා සේම, ඔවුන්ට පැවරී ඇති රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීමටද උපකාරී වේ. මීට අමතරව, අපි අපගේ සේවකයින්ට ඔවුන්ගේ වෘත්තීමය හෝ සේවා ක්ෂේත්‍රවලට අදාළ ජාතික සම්මන්ත්‍රණවලට සහභාගී වීමට හැකි වන පරිදි අනුග්‍රාහක වැඩසටහන් ආරම්භ කර

ඇත. ඔවුන්ගේ දැනුම පදනම වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල නවීන වර්ධනයන් පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙම මුලපිරීම් මගින් අරමුණු කරයි.

### මානව සම්පත් තොරතුරු සහ කාර්යසාධන කළමනාකරණය

ගු.ගු.සේ.ස. හි කාර්යසාධන කළමනාකරණ පද්ධතිය සමාගමේ ව්‍යාපාර අරමුණුවලට අනුකූල වේ. සමාගමේ ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගනිමින්, ගු.ගු.සේ.ස. හි සියලු සේවකයින්ගේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම ගු.ගු.සේ.ස. හි කාර්යසාධන කළමනාකරණ පද්ධතියේ අරමුණ වේ. කාර්යසාධන පරතරයන්, පුහුණු අවශ්‍යතා, ප්‍රවර්ධන සහ පාරිතෝෂික හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලබන පුහුණු සහ සංවර්ධන අවස්ථා, රැකියා සංවර්ධන අවස්ථා සහ සාර්ථකත්ව සැලසුම් ප්‍රතිපාදනය සමඟ කාර්යසාධන ප්‍රතිඵල සබැඳේ.

ගු.ගු.සේ.ස. හි සේවකයින්ගේ කාර්යසාධනය මැනීම සඳහා දැනට කාර්යසාධන කළමනාකරණ පද්ධති ද්විත්වයක් යොදා ගනු ලබයි.

කාර්යසාධන කළමනාකරණ සහ සංවර්ධන පද්ධතිය (PMDS) – විධායක කාර්ය මණ්ඩලය
180⁰ තක්සේරු පද්ධතිය - විධායක නොවන කාර්ය මණ්ඩලය

කාර්යසාධන කළමනාකරණ සහ සංවර්ධන පද්ධතිය යටතේ, රැකියාවේ අරමුණු සහ චර්යාත්මක නිපුණතා පිළිබඳ ප්‍රමිතීන් සපුරාලීම මත ජ්‍යේෂ්ඨ කළමනාකරණ සහ කළමනාකරණ මට්ටම යටතේ වර්ගීකරණය කරන ලද නිලධාරීන් ඇගයීමට ලක් කෙරේ. අරමුණු සහ කාර්යසාධන ප්‍රමිති සකස් කිරීම (තනි පුද්ගල සංවර්ධන අරමුණු), මධ්‍ය වාර්ෂික සමාලෝචනය සිදු කිරීම, කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම්, කාර්යසාධනය මුල් කර ගත් ක්‍රියා සහ කාර්ය මණ්ඩලය ඇගයීම ආදියෙන් මෙය සැදුම්ලත් වේ.

180⁰ තක්සේරු පද්ධතිය භාවිතයෙන් අනෙකුත් සියලුම විධායක නොවන කාර්ය මණ්ඩලය ඇගයීමට ලක් කරනු ලබයි. මෙම කාර්යසාධන කළමනාකරණ පද්ධතිය යටතේ සේවකයින්ගේ රැකියා දැනුම, කුසලතා සහ ආකල්ප ඇගයීමට ලක් කරනු ලබයි. ඒ අනුව, ස්වයං ඇගයීම් සම්පූර්ණ කරනු ලබන අතර, ආසන්නතම අධීක්ෂක විසින් ලබා දෙන කාර්ය සාධන ඇගයීම් වාර්තාව සමඟ ඇගයීම් සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන අතර අංශ ප්‍රධානියා විසින් අවසාන සමාලෝචනය සිදුකරනු ලබයි.

### වාර්ෂික වර්ධක පිරිනැමීම

සේවක කණ්ඩායම් සතුටුදායක ලෙස සිය රාජකාරි ඉටු කළ අතර, ඔවුන්ගේ සමස්ත කාර්ය සාධනය මත වාර්ෂික වැටුප් වර්ධක උපයා ඇත.

ඇගයීමේ ක්‍රමය පහත කාණ්ඩ දෙකට අයත් වේ:-







සේවාව සතුටුදායක ලෙස ඉටු කළ සේවකයින් ඔවුන්ගේ සමස්ත කාර්ය සාධනය මත පදනම්ව වාර්ෂික වැටුප් වර්ධක උපයා ඇත. පෙර සඳහන් කළ කාර්ය සාධන කළමනාකරණ පද්ධති ද්විත්වය ක්‍රියාවට නැංවීමෙන් පසු 2023 වර්ෂයේදී සේවකයින් 3,801 දෙනෙකුට වාර්ෂික වැටුප් වර්ධක ලැබිණි.

## මානව සම්පත් සැලසුම් කිරීම සහ කාර්ය මණ්ඩලය

සෑම අංශයකම ශ්‍රම බල අවශ්‍යතා සපුරාලීමට සහ සියලුම ගුවන්තොටුපළවල කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා ස්ථාවර ශ්‍රම බලකායක් පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩල උසස්වීම්වලට පහසුකම් සැලසීම වෙනුවෙන් මානව සම්පත් අංශය කැපවී සිටියි.

2023 වසර පුරාවට, කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා රජය විසින් පනවන ලද සීමා කිරීම්, සේවක ඉල්ලා අස්වීම් සහ රජයේ තීරණ මගින් නියම කරන ලද විශ්‍රාම යන වයස්වල වෙනස්කම් ඇතුළු විවිධ අභියෝගවලට අංශය මුහුණ දුන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙස, බාහිර බඳවා ගැනීමේ ප්‍රයත්නයන් සීමා වූ අතර, 2023 වර්ෂය තුළ වූ මුළු සේවක හැරයාම් ප්‍රමාණයට සාපේක්ෂව නව සේවකයින් 299ක් පමණක් කුළී පදනම මත බඳවා ගැනීමට හැකි විය.

එසේ වුවද, මෙම අභියෝග මධ්‍යයේ වුවද, මානව සම්පත් අංශය පහත දක්වා ඇති පරිදි සමාලෝචිත කාලසීමාව තුළ විවිධ මූලාශ්‍ර ඔස්සේ දක්ෂතා සාර්ථකව උකහා ගන්නා ලදී.

**සේවක සංඛ්‍යාවට අනුව උසස්වීම් සහ බඳවා ගැනීම් - 2023**




සේවක වර්ගීකරණයට අනුව සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් ව්‍යාප්තිය පහත පරිදි වේ;

**සේවකයින් වර්ගීකරණයට අනුව බඳවා ගැනීම සහ උසස් කිරීම**




සේවක කාණ්ඩවල බාහිර බඳවා ගැනීම් ව්‍යාප්තිය පහත දැක්වේ;

**බාහිර බඳවා ගැනීම් වර්ගීකරණය**



# මානව සම්පත් කළමනාකරණය

## සේවා නියුක්තිය අත්හිටුවීම

ගු.ගු.සේ.ස තුළ 2022 ට සාපේක්ෂව 2023 වසර තුළදී සේවා නියුක්තියෙන් බැහැරවීමෙහි කැපී පෙනෙන වර්ධනයක් දැකගත හැකි විය. තවද, රට තුළ පැවති අයහපත් සමාජ හා ආර්ථික තත්ත්වයන් හේතුවෙන් පෙර වසරවලට සාපේක්ෂව ඉල්ලා අස්වීම් සහ කලින් විශ්‍රාම ගැනීම් ඉහළ ගියේය.

**සේවා නියුක්තියෙන් බැහැරවීම - 2023**




2023 දෙසැම්බර් 31 දිනට සමස්ත පිරිස් බලය පහත පරිදි වේ;

**සේවක වර්ගීකරණයට අනුව මුළු සේවක සංඛ්‍යාව**




**ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවකයින් වර්ගීකරණය**




**වයස අනුව සේවකයින් වර්ගීකරණය**



## නිපුණතා සංවර්ධන වැඩසටහන

ඉහත සඳහන් කළ පරිදි, නව පත්වීම් සීමා කිරීමේ රජයේ ප්‍රතිපත්තිය හේතුවෙන් ගු.ගු.සේ.ස හි බඳවා ගැනීම් සහ කුලියට ගැනීමේ කාර්යයන් සඳහා 2023 වර්ෂය අතිශය අභියෝගාත්මක විය. වසර තුළදී සේවක විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම් ඉහළ යාම හේතුවෙන් සමාගමේ ඇති වූ තීරණාත්මක පුරප්පාඩු පිරවීම සඳහා ගු.ගු.සේ.ස හට නව උපායමාර්ග සොයා ගැනීමට සිදු විය. එම අභියෝගයට මුහුණ දීම සඳහා මානව සම්පත් අංශය විසින් "නිපුණතා සංවර්ධන වැඩසටහන" නමින් නව මෙවලමක් හඳුන්වා දෙන ලදී.

මෙම වැඩසටහන ඔස්සේ උසස් තනතුරු සඳහා විභව සුදුසුකම් සහ කුසලතා ඇති නමුත් පළපුරුද්ද නොමැතිකම හේතුවෙන් විවිධ තනතුරුවල සේවය යෙදෙන්නන් හඳුනා ගැනීමට සමාගමට හැකි විය. පුරප්පාඩු සහිත තනතුරු සඳහා ඔවුන් බඳවා ගැනීමටත්, අවශ්‍ය පළපුරුද්ද ලබා ගැනීම වෙනුවෙන් නිශ්චිත කාලයකට රැකියා පුහුණුව සඳහා ඔවුන්ව යොමු කිරීමට අපට හැකි විය. 2023 වර්ෂය තුළදී සමාගම විසින් සේවකයින් 37 දෙනෙකු සඳහා පුහුණුවන කළමණාකරණ සහකාර, පක්ෂි/සත්ව උපද්‍රව පාලන පුහුණුවන නිලධාරීන් සහ රියදුරන් ලෙස ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට මෙම අවස්ථාව සලසා දී ඇත.

## කාර්ය මණ්ඩල සුභසාධන න්‍යාය පත්‍රය

ගු.ගු.සේ.ස සිය සේවකයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම සහ උපරිම ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කරගත් සුභසාධන පහසුකම් සැපයීම තුළින් ඔවුන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීමට කැපවී සිටියි. එවැනි සුබසාධන ක්‍රියාමාර්ගවලට ප්‍රමුඛත්වය දීමේදී යම් පිරිවැයක් දැරීමට සිදු වුවද, ඉන් කැපී පෙනෙන දිගුකාලීන ප්‍රතිලාභ අත්කර දේ. එමඟින් දිගු කාලයක් පුරා දක්ෂ හා පුහුණු සේවකයින් රඳවා තබා ගැනීමට සමාගම වෙත අවස්ථාව උදා කර දේ.

සේවක සුභසාධනයේ වැදගත්කම හඳුනා ගනිමින්, ගු.ගු.සේ.ස විසින් සමාගම් වෛද්‍ය යෝජනා ක්‍රමයක්, මරණ සඳහා පරිත්‍යාග යෝජනා ක්‍රමයක්, කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමයක්, කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවාවක්, නිවාඩු බංගලා පහසුකම්, නිවාස ණය සඳහා 5% පොලී ආපසු ගෙවීම සහ විදේශීය වන්දනාගමන් සඳහා මූල්‍ය ආධාර ලබාදීම ඇතුළු පුළුල් පහසුකම් රැසක් පිරිනමයි. මෙම මුලපිරීම් තුළින් සේවකයින් දිරිමත් කිරීම සහ අභිප්‍රේරණය කිරීම සිදුකරන අතර එමඟින් ව්‍යාපාර වර්ධනය කිරීම සහ ගු.ගු.සේ.ස හි තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සිදු කරයි.

**සමාගම් වෛද්‍ය යෝජනා ක්‍රමය** - ගෘහස්ත පහසුකම්වලින් හෝ බාහිර සෞඛ්‍ය සේවා සපයන්නන්ගෙන් ප්‍රතිකාර ලබා ගැනීමට ඉඩ සලසමින් ගු.ගු.සේ.ස විසින් සේවකයින්ට සුවිශේෂී සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයක් පිරිනමයි. පුළුල් සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් සේවකයන් වෙත පිරිනැමීම සඳහා, සමාලෝචිත වර්ෂය සඳහා ගු.ගු.සේ.ස විසින් රුපියල් මිලියන 247ක් වැය කර ඇත. ස්ථිර කරන ලද සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා පමණක් මෙම යෝජනා ක්‍රමය ලබා ගත හැකි අතර, මෙහිදී සේවකයින්ට ඔවුන්ගේ අවශ්‍යතාවලට වඩාත් ගැළපෙන යෝජනා ක්‍රමය තෝරා ගැනීමේ හැකියාව පවතී. එමෙන්ම, දිවයින පුරා පිහිටි ලියාපදිංචි රෝහල් 48කින් ණය පදනම මත ගෘහස්ථ ප්‍රතිකාර ලබා ගත හැකිය. සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් පවත්වාගෙන යාමේ ඉලක්කයට අනුකූලව, සමාගම විසින් ප්‍රමුඛ පෙළේ පෞද්ගලික රෝහල් පහක් සමඟ එක්ව 2023 නොවැම්බර් 28 සහ 29 යන දෙදින වෛද්‍ය කඳවුරක් සංවිධානය කරනු ලැබුණි. එහිදී සෞඛ්‍ය සම්බන්ධ විවිධ මාතෘකා ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගී වීමට සේවකයන්ට අවස්ථාව හිමි විය. තවද, සේවකයින්හට ඔවුන්ගේ කාලය ඉතිරි කර ගැනීමට සහ සෞඛ්‍යයට ප්‍රමුඛත්වය දීමට ඉඩ සලසමින් කාර්යාල පරිශ්‍රයේදී වෛද්‍ය පරීක්ෂණ පැකේජ ලබා ගැනීමේ පහසුව පිරිනමන ලදී.

**මරණ සඳහා පරිත්‍යාග යෝජනා ක්‍රමය**
- සාමාජිකත්ව ක්‍රමවේදය වසර 15කට වැඩි කාලයක් ගු.ගු.සේ.ස හි ක්‍රියාත්මක වේ. සියලුම ස්ථිර සේවකයින් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබයි. එහි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් ද ඇතුළත් කර ගත හැකිය. සාමාජිකයින් 297 දෙනෙකු සඳහා ගු.ගු.සේ.ස විසින් රුපියල් මිලියන 15ක් ගෙවා ඇත.

**කාර්යමණ්ඩල ණය යෝජනා ක්‍රමය**
සහන පොලී මත ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලනු වස් ආපසු ගෙවිය යුතු කාලය වසර හතරක උපරිම කාල සීමාවකට යටත්ව ගු.ගු.සේ.ස හි ස්ථිර සේවකයින්ට ණයක් ලබාගැනීමේ අවස්ථාව සලසා ඇත. 2023 වර්ෂයේදී කාර්ය මණ්ඩල ණය සේවකයින් 725 දෙනෙකුට ලබා දෙන ලදී. එහි ආරම්භයේ සිට සමාගම විසින් ලබා දී ඇති මුළු මුදල, රුපියල් මිලියන 285 ක් වේ.

**කාර්යමණ්ඩල ප්‍රවාහන සේවය** - විවිධ ප්‍රදේශවලින් පැමිණෙන සේවකයින් මුහුණ දෙන දුෂ්කරතා හඳුනා ගනිමින්, ඔවුන්ගේ ප්‍රවාහන ගැටලු අවම කිරීමට සමාගම විසින් කාර්යමණ්ඩල ප්‍රවාහන සේවයක් ක්‍රියාත්මක කර ඇත. සැලකිය යුතු ප්‍රවාහන වියදම් දැරිය යුතු වුවත්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ - කටුනායක, කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ - රත්මලාන, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ හි සේවකයින්ගේ ගමනාගමන කටයුතු පහසු කිරීම සඳහා පුළුල් මාර්ග ජාලයක් ආවරණය වන පරිදි බස් රථ විසි හතක් සමාගම විසින් යොදවා ඇත.

**නිවාඩු නිකේතන පහසුකම්** - පිදුරුතලාගල, නුවරඑළිය පිහිටි නිවාඩු බංගලා නවාතැන් සහ කතරගම වන්දනාකරුවන්ගේ විවේක පහසුකම් සහන මිලට පිරිනමනු ලබයි. පිදුරුතලාගල හි බංගලා පහක් සහ කතරගම නවාතැන් සඳහා මහල් නිවාස දෙකක් මේ සඳහා පිරිනමනු ලබන අතර, ඒවා සම්පූර්ණයෙන්ම අපගේ සේවකයින් විසින් භාවිත කරනු ලබයි.

**නිවාස ණය සඳහා 5%ක පොලී ආපසු ගෙවීම**
- සමාගමේ වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින්ට මෙම පහසුකම ලබා ගත හැකිය.

## සේවක ඇගයීමේ වැඩසටහන්

ගු.ගු.සේ.ස විසින් සමාගමේ සාර්ථකත්වය උදෙසා එහි සේවකයන් විසින් ලබාදෙන අගනා දායකත්වය නිරන්තරයෙන් අගයනු ලබයි. ඒ අනුව, ඔවුන්ගේ කැපවීමට ගෞරව දැක්වීම සඳහා ගු.ගු.සේ.ස විසින් සේවා අභිමාන සහ සභාපති කුසලතා සම්මාන යන උත්සව දෙකක් සංවිධානය කරනු ලැබීය.

### සේවා අභිමාන

ගු.ගු.සේ.ස සේවා අභිමාන උත්සවය 2023 ජුනි 15 වන දින මානව සම්පත් අංශයේ ප්‍රධානත්වයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියේ ශ්‍රවණාගාරයේ දී අති උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. මෙම උත්සවය සඳහා කැබිනට් අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා ඇතුළු ගෞරවනීය ආරාධිත අමුත්තන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. මෙම උත්සවයේදී සේවක සේවිකාවන් 100කට අධික පිරිසක් සඳහා උපහාර පිරිනැමිණි. සාමූහික ප්‍රයත්න, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදන, නායකත්වය, පාරිභෝගික සත්කාර සහ විවෘත යන කාණ්ඩ යටතේ සේවකයින් ඇගයීමට ලක් විය.

### "බ්‍රේන් චැම්ප්ස්" සම්මාන

"ගු.ගු.සේ.ස හි බ්‍රේන් චැම්ප්ස් ප්‍රශ්න විචාර" තරඟයෙහි සම්මාන ප්‍රදානෝත්සවය බ.ජා.ගු හි පැමිණීමේ සේද මාවත විවේකාගාරය දී

# මානව සම්පත් කළමනාකරණය

අඛණ්ඩව දෙවන වසරටත් පැවැත්විණි. මෙම සම්මාන ප්‍රදානෝත්සවයේදී ජයග්‍රහකයින් 36 දෙනෙකු විසින් ඔවුන්ගේ ජයග්‍රාහී සහ ඉහළම සාක්ෂාත් කර ගැනීම් වෙනුවෙන් අගයනු ලැබීය.

**සභාපති කුසලතා සම්මාන**

සභාපති කුසලතා සම්මාන උළෙල 2023 දෙසැම්බර් 8 වන දින ගෞරවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් පැමිණීමේ සේද මාවත විවේකාගාරය හිදී පැවැත්විණි. සමාගමේ සාර්ථකත්වයට දායක වෙමින් සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කළ සේවකයින් පනස් එක් දෙනෙකු මෙහිදී ඇගයීමට ලක් කෙරිණි.

**ගෙවතු වගා තරඟය**

කළමනාකරණ මගපෙන්වීම සහ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ජාතික මුලපිරීම සමඟ සමගාමීව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව මානව සම්පත් අංශය විසින් විවිධ ස්ථානවල සිටින සියලුම සේවකයින් එක් කරගනිමින් "ගෙවතු වගා තරඟයක්" පවත්වන ලදී. මෙම තරගය 2022 සැප්තැම්බර් 2 වැනිදා සිට 2023 පෙබරවාරි 24 වැනිදා දක්වා ක්‍රියාත්මක විය. දිස්ත්‍රික්ක 13කින් සහභාගිවන්නන් 181 දෙනෙක් මෙම තරගයට සහභාගි වූ අතර, 2023 පෙබරවාරි 24 වැනිදා පැවැති සම්මාන උළෙලින් අවසන් විය. සමාගමේ මූලික සාරධර්මයක් වන, "හරිත සංකල්පය" ශක්තිමත් කරලීමට මෙම ව්‍යාපෘතිය උපකාරී වූ අතර, එතුළින් සංවිධානාත්මක නියැලීමක් දිරිමත් කරනු ලැබුණි.

**සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව**

සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (OSH) කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කරමින් මෙහෙයුම් වර්ධනය කරලීමට මානව සම්පත් අංශය කැපවී කටයුතු කරනු ලබයි. වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව ක්‍රියාවලි නැවත සකස් කිරීම ආරම්භ කර ඇති අතර, සමාගම තුළ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂකගේ සහභාගීත්වයෙන් කාර්තුමය පරීක්ෂණ සිදු කරන ලද අතර, සේවකයින් සඳහා අවශ්‍ය ආරක්ෂක පියවරයන් හඳුනා ගැනීම නිරන්තරයෙන් සිදු කරන ලදී.

**සේවක සබඳතා**

සේවක තෘප්තිය පෝෂණය කිරීම මානව සම්පත් අංශයේ මූලික අරමුණක් වන අතර, එතුළින් කාර්ය මණ්ඩලයට සහය වීම දැක්වීමට නව ප්‍රතිපත්ති සහ ලිහිල් කිරීමේ උපාය මාර්ග නිරන්තරයෙන් හඳුන්වා දෙයි. සේවා ස්ථාන හිරිහැර පිටුදැකීමේ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම මඟින් හිරිහැරවලින් තොර සේවා පරිසරයක් පවත්වාගෙන යාම සහ සේවක ගෞරවයට හානි වන තත්ත්වයන් වළක්වා ගැනීම අරමුණු කරයි. එමෙන්ම, පරිශීලක-හිතකාමීත්වය වැඩි දියුණු කිරීමට මෙන්ම එමඟින් සේවකයින්ට ඔවුන්ගේ පැමිණිලි සාර්ථක ආකාරයෙන් ප්‍රකාශ කිරීමට ඉඩ සැලසීම සඳහා දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සංශෝධනය කර ඇත. එමෙන්ම සේවක සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් උපදේශන කණ්ඩායමක් පුහුණු කර ඇති අතර, එතුළින් ඔවුන් සේවයේ යෙදෙන අංශයේ සහය අවශ්‍ය සේවකයින් හඳුනා ගැනීමට සහ අදාළ සහය ලබා දීම අරමුණු කරයි.

සේවකයින්ට මූලිකත්වයක් ලබා දෙන ආයතනයක් ලෙස ප්‍රතිසාධනය කරා යන ගමනේදී ගු.ගු.සේ.ස විසින් බොහෝ අභියෝග සහ ආර්ථික පසුබෑම්වලට මුහුණ දෙන අතර නියමිත කාලසීමාවකට අනුගතව කටයුතු කිරීමට ගු.ගු.සේ.ස හට සිදු වේ. නමුත් ප්‍රමුඛ පෙළ ආයතනයක් ලෙස ශක්තිමත්ව සහ විශ්වාසයෙන් යුතුව අභියෝගවලට මුහුණ දීමට අපට හැකි විය. ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් සහතික කරමින්, සේවකයින්ට වෘත්තීයමය වශයෙන් වර්ධනය වීමට ඵලදායී පරිසරයක් නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම කෙරෙහි ගු.ගු.සේ.ස හි අපි දැඩි ලෙස කටයුතු කරමු. එබැවින් අපගේ සියලුම ගුවන්තොටුපළවල ධනාත්මක සේවා පරිසරයක් අඛණ්ඩව සංවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු. ඒ අනුව ගු.ගු.සේ.ස හට වඩාත් ඉල්ලුමක් ඇති සේවා යෝජකයා ලෙස තම තත්ත්වය සුරක්ෂිත කර ගැනීමට හැකි වූ අතර, ඉලක්ක සහ අරමුණු ඵලදායීව සහ කාර්යක්ෂමව සාක්ෂාත් කර ගනිමින් සුවිශේෂී ව්‍යාපාරික කාර්ය සාධනයක් පෙන්නුම් කිරීමට හැකි විය.

# අවදානම් කළමනාකරණය



## සමස්ත විග්‍රහය

**සෙසු ව්‍යාපාරවලට මෙන්ම ගු.ගු.සේ.ස සඳහාද අවදානම් කළමනාකරණය යනු අනාගතය සඳහා එහි අරමුණු නිර්වචනය කිරීමේදී වැදගත් වන්නකි. දෛනික පදනම මත අපගේ මඟීන් සඳහා උසස් ආගන්තුක අත්දැකීමක් පිරිනැමීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඵලදායි අවදානම් කළමනාකරණය අත්‍යවශ්‍ය අංගයක් බව අපි තරයේ විශ්වාස කරමු.**

අපි, ශ්‍රී ලංකාවේ එකම ගුවන්තොටුපළ ක්‍රියාකරු ලෙස ජාත්‍යන්තර තලයට නිරාවරණය වෙමින් ඉහළ ක්‍රියාශීලිත්වයකින් යුතු කර්මාන්තයක් තුළ ක්‍රියාත්මක වන්නෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංවිධානයේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්ය සාධනයට පමණක් නොව, රටේ ප්‍රතිරූපයටද තර්ජනයක් වන විවිධ අවදානම්වලට අප නිරාවරණය වේ.

ගු.ගු.සේ.ස හි අවදානම් කළමනාකරණ ප්‍රවේශය මඟින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානයේ හැකියාව වැඩිදියුණු කරලනු ලබයි. ආයතනික පාලන රාමුවේ ප්‍රධාන පදනමක් ලෙස එහි වැදගත්කම ඉස්මතු කරමින් ගු.ගු.සේ.ස හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.

අවදානම් කළමනාකරණය හරහා පහත සඳහන් දෑ සාක්ෂාත් කර ගැනීමට ගු.ගු.සේ.ස අරමුණු කරයි:

- විවිධ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම.
- ආයතනික පරිසරයේ නව අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් අනතුරුදායක තර්ජනයන් අවම කිරීම සහ/හෝ තුරන්කිරීම.
- සමාගමේ සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීමට සහය දැක්වීම.
- සමාගම තුළ අවදානම් සන්නිවේදනය සාර්ථකව කළමනාකරණය කිරීම.
- රටේ ආර්ථිකයට, සමාජයට සහ දිගු කාලීන වර්ධනයට දායක වීම.

### ගුවන් මෙහෙයුම් හි ප්‍රධාන අභියෝග

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, සමස්තයක් ලෙස ව්‍යාපාරය මුහුණ දෙන අභියෝගවලට එරෙහිව සටන් කිරීමට සහ ඒවායින් ඇති අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාව සලසනු ලබන මනා සැලසුමකින් යුතු ක්‍රමවේදයක් ලෙස අපි සලකන්නෙමු. බාහිර සාධක අනුව වෙනස්කම් දක්වමින් පහත අභියෝග මඟින් අපගේ අවදානම් ව්‍යුහය සඳහා බලපෑම් ඇති කරනු ලබයි.

# අවදානම් කළමනාකරණය

- **දේශීය ආර්ථික තත්ත්වයන්ට ඉහළ අවදානමක් ඇති කිරීම**

බහුතරයක් ගුවන්තොටුපළ මෙහෙයුම් සඳහා අවශ්‍ය යෙදවීම් දේශීය ආර්ථිකය මඟින් ලබා ගනී. එබැවින් රටේ සමාජ ආර්ථික පරිසරයේ සිදුවන ඕනෑම වෙනසක් සෘජුවම ගුවන්තොටුපළ මෙහෙයුම් සහ ගුවන්තොටුපළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා බලපානු ලබයි.

- කැපී පෙනෙන ආර්ථික පසුබෑමකින් පසුව, ශ්‍රී ලංකාව මේ වන විට යථා තත්ත්වයට පත්වෙමින් පවතී. එවැනි පසුබිමක වුවද, අක්‍රියව පවතින කලින් නවතා දැමූ ප්‍රධාන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති පශ්චාත් වසංගත තත්ත්වයෙන් පසු වැඩිවන ඉල්ලුමෙන් ප්‍රයෝජන ගැනීම සඳහා විකල්ප උපාය මාර්ග සෙවීමට කළමනාකරණය උනන්දු කරවනු ලබයි. ශ්‍රී ලංකාව, සිත් ඇදගන්නා සංචාරක ගමනාන්තයක් ලෙස කීර්තියක් දැරීම හේතුවෙන් අර්බුදයෙන් පසු වර්ධනය සඳහා වටිනා අවස්ථා පවතී.

- **ඉහළ නඩත්තු පිරිවැය**
  පිරිවැය ව්‍යුහයේ විචල්‍ය පිරිවැයේ අඩු ප්‍රතිශතයට සාපේක්ෂව, ගුවන්තොටුපළ යටිතල පහසුකම් නඩත්තු කිරීමේදී විශාල ස්ථාවර පිරිවැයක් දැරීමට සිදු වීම, ඉහළ නඩත්තු පිරිවැය, රුපියල අපහයනයට ලක්වීම සහ ආර්ථික අර්බුදය හමුවේ ආනයනය සීමා කිරීම මඟින් මෙය තවදුරටත් අයහපත් තත්ත්වයට පත් විය.

- **යාවත්කාලීන පහසුකම් සහතික කිරීම**
  ගුවන්තොටුපළ යටිතල පහසුකම් නඩත්තු මඟින් සැලකිය යුතු ස්ථාවර පිරිවැයක් ඇති කරන අතර, එය වියදම් රාමුව තුළ විචල්‍ය පිරිවැය අවම ප්‍රමාණය මඟින් වැඩි කරනු ලබන අතර, නඩත්තු වියදම් ඉහළ යාම, ශ්‍රී ලංකා රුපියල ක්ෂයවීම් සහ ආර්ථික පසුබෑමෙන් පැන නගින ආනයන බාධාවන් හේතුවෙන් තත්වය තවත් උග්‍ර වේ.

- **සංචාරක කර්මාන්තයේ අස්ථාවරත්වය**
  ගෝලීය ආර්ථික වාතාවරණය සහ සංචාරක ව්‍යාපාරය මත ශ්‍රී ලංකාවේ ගුවන් සේවා ක්ෂේත්‍රය දැඩි ලෙස රඳා පවතී. එය සංචාර මත පදනම් වීම හේතුවෙන් අවදානමට ලක්වීම සාමාන්‍යයෙන් සිදුවීමකි. සීමිත අවස්ථාවන්හිදී, සංචාර සහ සංචාරක ව්‍යාපාරය සඳහා බොහෝ විට අඩු ප්‍රමුඛතාවයක් ලබා දෙන අතර, ඉන් කර්මාන්තයේ අස්ථාවරත්වය තවදුරටත් ඉස්මතු කරයි.

- **ගුවන් ගමන් සඳහා පිරිවැය-තරඟකාරීත්වය සහ ඉල්ලුම මත බලපෑම**
  දේශීය සන්දර්භය තුළ ඉහළ බලශක්ති පිරිවැය හේතුවෙන් පර්යන්ත මෙහෙයුම්, ගුවන්තොටුපළ නඩත්තු කිරීම සහ ගගන නාවික ආධාර සඳහා වියදම් ඉහළ යයි. ඊට අමතරව, මෙම පිරිවැය, පැමිණෙන සැපයුම් සහ ගිවිසුම්ගත ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ඉහළ මිල ගණන් සඳහා බලපාන අතර, එය ගුවන්තොටුපළ මෙහෙයුම්වලට අහිතකර ලෙස බලපෑවැත්වෙමින්, පිරිවැය ව්‍යුහයන් අනුව තරඟකාරීත්වය අඩාල කරයි.

- **සීඝ්‍ර තාක්ෂණික වෙනස් වීම**
  තාක්ෂණයේ පරිණාමය හේතුවෙන් ගුවන්තොටුපළ ක්‍රියාකරුවන් විසින් නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා උපකරණ අඛණ්ඩව යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. විශේෂයෙන්, ගුවන් ගමන්වල ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා ගුවන් සංචාලන පද්ධති සහ ආරක්ෂක ස්කෑනිං යන්ත්‍ර මඟින් ඇතැම් දේශීය (CAASL) සහ ජාත්‍යන්තර (ICAO) අවශ්‍යතා සපුරාලිය යුතුය. තවද, තාක්ෂණයේ නිරන්තර ප්‍රගතිය මඟින් තරඟකාරීත්වය තීව්‍ර කරමින් සහ නව තාක්ෂණය සඳහා වැඩි ආයෝජනයක් දිරිමත් කරමින් ගුවන්තොටුපළට කාර්යක්ෂමවූ විශේෂාංග ඇතුළත් කිරීමට ගුවන්තොටුපළ ක්‍රියාකරුවන්ට බලපෑම් ඇති කරනු ලබයි. මෙකී තත්ත්වය තුළ අවම පුද්ගල මැදිහත්වීමකින්, සම්බන්ධතා රහිත ගුවන්තොටුපළ මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීම අභියෝගාත්මක අරමුණක් බවට පත්ව ඇත.

- **පාරිසරික බලපෑම්**

ගුවන්තොටුපළ මෙහෙයුම් මඟින් පරිසරයට සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කරන අතර, කාබන් විමෝචනය සම්බන්ධයෙන් ගුවන් සමාගම් සහ ගුවන්තොටුපළ විසින් වගකීම දරනු ලබයි. ඒ අනුව, ඉන්ධන පරිභෝජනය අවම කිරීම සහ කාබන් පියසටහන් අඩු කිරීම සඳහා ගුවන් මාර්ග ව්‍යුහයන් ප්‍රශස්ත කිරීම සඳහා ගුවන්තොටුපළ විසින් ප්‍රමුඛත්වය දිය යුතුය. එමෙන්ම, පාරිසරික මාර්ගෝපදේශ හා හොඳම භාවිතයන්ට අනුකූලව නිසි ලෙස බැහැර කිරීමේ වැදගත්කම පිළිබඳ සැලකිල්ලක් දක්මින්, ගුවන්තොටුපළ විසින් අපද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් නිපදවනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරියේ සහ අනෙකුත් නියාමන ආයතනවල සහතික කිරීම් මගින් පෙන්නුම් කරන පරිදි, පරිසර හිතකාමී අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා ගු.ගු.සේ.ස විශාල කැපවීමක් දක්වනු ලබයි.

**දිගුකාලීන අභියෝග සහ ඒවා අවම කිරීමේ පියවර**

දිගුකාලීන අභියෝග අපේක්ෂා කරමින්, වෙනස්වන තාක්ෂණයට අනුගත වීමේ, තිරසාර බව සහතික කිරීමේ, ධාරිතාව ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ සහ දක්ෂ ශ්‍රම බලකායක් ආකර්ෂණය කර ගැනීමේ අවශ්‍යතාවය අපි වැදගත්කොට සලකන්නෙමු.

තාක්ෂණයේ සිදුවන අඛණ්ඩ පරිණාමය හමුවේ අදාළත්වය පවත්වා ගැනීමට නම් ඒ සමඟ යාවත්කාලීන වීම අනිවාර්යය වේ. ජෛවමිතික හඳුනාගැනීමේ පද්ධති, ස්වයං-පරීක්ෂා කිරීම, ගමන් මලු ලබා දීම, ස්වයං ඇතුළුවීමේ ප්‍රවේශ සහ ජංගම ගෙවීම් ආදිය ඇතුළු සම්බන්ධතා රහිත මගී පිරිසැකසුම් කිරීම වැඩි දියුණු කිරීම පෙරදැරි කරගනිමින්, ඉදිරි වසර පහ තුළ අපගේ ගුවන්තොටුපළවල් සඳහා මෙම විශේෂාංග ක්‍රියාත්මක කිරීමට අපි ඉලක්ක කරමු. කෙසේ වෙතත්, එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වන සයිබර් ආරක්ෂණ අවදානම් පිළිබඳවද සැලකිලිමත් විය යුතුය.

පාරිසරික සවිඥානකත්වය පිළිබඳ ගෝලීය අවධාරණය සමඟින්, අනාගතයේදී ගුවන්තොටුපළ සඳහා කාබන් මධ්‍යස්ථභාවය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. අපගේ ආයතනික අරමුණුවල කොටසක් ලෙස, ඉදිරි දශක සඳහා කාබන් විමෝචනය අඩු කිරීමේ ඉලක්ක ඉදිරිපත් කිරීම වෙනුවෙන් අපි කැපවී සිටිමු. ගුවන් මාර්ග නැවත සකස් කිරීම හරහා ගොඩබිම් ක්‍රියාකාරකම්වලින් සහ කොළඹ ගුවන් තොරතුරු කලාපය තුළ කාබන් විමෝචනය අවම කිරීමට උපාය මාර්ග සකස් කෙරේ.

ගෝලීය මගී කිලෝමීටර්වලින් සැලකිය යුතු කොටසක් ආසියානු කලාපය විසින් දරන බැවින්, මගී ගමනාගමනයේ අපේක්ෂිත වර්ධනය මඟින් ශ්‍රී ලංකාව වෙත අවස්ථා උදා කරයි. 2023 වර්ෂයේදී දැකගත හැකි වූ ශක්තිමත් ප්‍රතිසාධන අනුපාත මගින් පෙන්නුම් කරන පරිදි, ගු.ගු.සේ.ස විසින් ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා පර්යන්තය සහ අනෙකුත් පහසුකම් වැඩි දියුණු කරයි.

අපගේ ගුවන්තොටුපළවල සුවිශේෂී ආගන්තුක අත්දැකීම් ලබා දීම, විශේෂයෙන්ම ජනවිකාස සාධක හරහා විවිධත්වයෙන් යුතු පාරිභෝගික මනාපයන් අවබෝධ කර ගැනීම මත රඳා පවතී. මේ වෙනුවෙන්, අපගේ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය (CRM) ක්‍රියාවලියේ නිරන්තරව වැඩිදියුණු කරනු ලැබේ.

තවද, ගු.ගු.සේ.ස හි ආයතනික සැලසුම් සංවර්ධනය කිරීමේදී, ඉහත කී අභියෝග සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

### ගු.ගු.සේ.ස හි අවදානම් කළමනාකරණ රාමුව

අපගේ අවදානම් කළමනාකරණ රාමුව සඳහා අවදානම් හඳුනාගැනීම මගින් උපදව හඳුනා ගැනීම, අසාර්ථක වීම් හඳුනා ගැනීම සහ අහිතකර ප්‍රතිවිපාක හඳුනාගැනීම ඇතුළත් වේ. ඊට අමතරව, බාහිර ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන අවස්ථා අත්පත් කර ගනිමින් ආදායම් වැඩිවීම්, පිරිවැය අඩු කිරීම් හෝ දෙකම බවට පරිවර්තනය කිරීමට අපට හැකියාව ලබා දීම ඇතුළත් වේ.

අපගේ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය හරහා, අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී බලපෑම් ඇතිවන සිදුවීම් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට අපි අරමුණු කරන්නෙමු. අවදානම් හඳුනා ගැනීම සහ ව්‍යාපාරයට ඒවා බලපාන ආකාරය මත පදනම්ව, අපි එක් එක් විශේෂිත අවදානම පිළිගත යුතුද නැතහොත් ප්‍රතිකාර කළ යුතුද යන්න පිළිබඳව ගු.ගු.සේ.ස හි අවදානම් පැතිකඩ සමඟ සංසන්දනය කරමින් තීරණය කරන්නෙමු.

අවදානම් කළමනාකරණ ශිල්පීය ක්‍රම සඳහා අවදානම් වාර්තා කිරීම, අවදානම්වලට පිළියම් යෙදීම, අවශේෂ වාර්තාකරණය සහ අධීක්ෂණය ඇතුළත් වේ. අවදානම පිළිගත හැකි මට්ටමකට අවම කළ පසු, අඛණ්ඩ පාලනය සහතික කිරීම සඳහා ඒ පිළිබඳ නිරීක්ෂණය කළ යුතුය.

### අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම

අවදානම් කළමනාකරණය සෑම කෙනෙකුගේම වගකීමක් ලෙස සලකනු ලබන අතර, ව්‍යාපාරයේ සියලුම ක්ෂේත්‍ර සමඟ සම්බන්ධීකරණය කිරීමෙන් සමස්ත ක්‍රියාවලිය මධ්‍යගතව අධීක්ෂණය කළ යුතුය. ගු.ගු.සේ.ස හි, අවදානම් කළමනාකරණය සඳහා වගකීම උපායමාර්ගික කළමනාකරණ අංශය (SMD) වෙත පැවරී ඇත. උපායමාර්ගික අරමුණු බාධාවකින් තොරව සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා සමාගම තුළ සුදුසු අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ නඩත්තු කිරීම උපායමාර්ගික කළමනාකරණ අංශය වෙත පැවරී ඇත.

අවදානම් හඳුනා ගැනීම සඳහා, සමාගම උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියේදී SWOT විශ්ලේෂණය, PESTEEL විශ්ලේෂණය සහ පෝටර්ගේ පංච බලවේගය වැනි විවිධ මෙවලම් භාවිත කරනු ලබයි. ඉහළ-පහළ සහ පහළ-ඉහළ යන ද්විත්ව ප්‍රවේශය ඔස්සේ සංවිධානයේ සියලුම අංශ සහ මට්ටම් සමඟ උපදේශන පැවැත්වීම මෙම ක්‍රියාවලියට ඇතුළත් වේ.

මීට අමතරව, අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික (IA&QA) අංශය මඟින් එහි කාර්ය විෂය පථය තුළ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. විගණනය සඳහා අවදානමට ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම සඳහා වාර්ෂික විගණන සැලසුම් සකස් කිරීමේදී අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික (IA&QA) අංශය මඟින් අවදානම් පුරෝකථනය කරයි.

### අරමුණු. අවදානම් කළමනාකරණය සමඟ කටයුතු කිරීමට අවදානම් කළමනාකරණ කමිටුව (RMC) සහ වෙනත් විධිමත් යාන්ත්‍රණ

අවදානම් කළමනාකරණ කමිටුව (RMC) ලෙස හැඳින්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීම සඳහා පිහිටුවා ඇත. එහි මූලික අවධානය යොමු කරන ක්ෂේත්‍ර අතරට ව්‍යාපාරික අවදානම්, ආයතනික අවදානම් සහ ක්‍රියාකාරී අවදානම් ඇතුළත් වන අතර, එතුළින් කර්මාන්ත අවදානම් සහ උපායමාර්ගික අවදානම් පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වයි. ගු.ගු.සේ.ස හි උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය හරහා අවදානම් ඇගවීම් සහ නිර්දේශ සාකච්ඡා කිරීම හෝ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් සාකච්ඡා පැවැත්වීමට යෝජනා කිරීම සිදු කරනු ලැබේ.

අවදානම්වල සම්භාවිතාව සහ බරපතලකම හඳුනාගැනීමේ ප්‍රධාන මෙවලමක් ලෙස අවදානම් ලේඛනය ක්‍රියා කරයි. එය යෝජනා කරන ලද අවම කිරීමේ ක්‍රමවේද ඔස්සේ එක් එක් අංශය විසින් නිතිපතා යාවත්කාලීන කරනු ලබන අතර, උපායමාර්ගික කළමනාකරණ අංශය මගින් මධ්‍යගතව අධීක්ෂණය කරනු ලැබේ. පිළියම් නොලද ඕනෑම අවදානම් සහ ඒ ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් සුදුසු තීරණ ගැනීම සඳහා අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කරනු ලැබේ.

ගු.ගු.සේ.ස හි සියලුම අංශවල නියෝජිතයින් සහභාගීවන අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම් මාසික පදනමින් පවත්වනු ලැබේ. ව්‍යාපාරයට බලපෑම් ඇති කරනු ලබන මෙහෙයුම්, උපායශීලී සහ උපායමාර්ගික අවදානම් සාකච්ඡා කිරීම එහිදී සිදු කරනු ලබයි. සවිස්තරාත්මක සාකච්ඡා සඳහා නිශ්චිත අවදානම් ක්ෂේත්‍ර න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අතර, ලැයිස්තුගත කර නොමැති වුවද, කාලීන සහ තීරණාත්මක අවදානම් පිළිබඳ දැනුම්දීමට සහභාගිවන්නන් සඳහා අවස්ථාව ලබා දේ. මීට අමතරව, අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු විසින් ඇතැම් උපාය මාර්ගික අවදානම්, මානව සම්පත් කළමනාකරණ අවදානම් සහ තාක්ෂණය ආශ්‍රිත අවදානම් ඇගයීමට ලක් කරනු ලබන අතර, විවිධ දෘෂ්ටිකෝණයන් සලකා බැලීමෙන් අවම කිරීමේ ක්‍රමවේදයන් ශක්තිමත් කරනු ලබයි.

තවද, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ඇමුණුම 19 හි දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව, ආරක්ෂිත කළමනාකරණ ඒකකය විසින් ගුවන් යානා ආරක්ෂණ කටයුතු අධීක්ෂණය කරනු ලැබේ. සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන පහසුකම් කමිටු රැස්වීම් මඟින් අවදානම් සහ ගැටලු ක්ෂණිකව හඳුනා ගැනීමට සහ සාමූහිකව විසඳීමට අවස්ථාව සලසයි. ගුවන් සේවා ක්‍රියාකරුවන්ගේ කමිටුව (AOC) සහ ගුවන් සේවා ආරක්ෂක කමිටුව බාහිර පාර්ශ්වකරුවන් සමඟ අන්තර්ක්‍රියා කිරීම හරහා පිළිවෙලින් ගුවන් සමාගම්, මගීන් සහ ගුවන්තොටුපළ වත්කම් මඟින් මුහුණ දෙන ගැටලු පිළිබඳ ක්‍රියාමාර්ග ගනු ලබයි. විගණන සහ කළමනාකරණ කමිටුව මඟින් වෙක්පත් සහ ශේෂයන් සම්බන්ධයෙන් මූල්‍ය අවදානම් පිළිබඳව සහතික කරයි.

### අවදානම් පුරෝකථන

පවතින අවදානම් කල්තියා හඳුනා ගැනීම සඳහා අවදානම් පුරෝකථනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. දැනට වසර 3ක කාලයක් වෙනුවෙන් සකසා ඇති සමාගමෙහි අවදානම් පුරෝකථනය සඳහා වන කාල රාමුව ආයතනික සැලැස්මේ කාල සීමාව සමඟ අනුකූල වේ. මෑත වසරවලදී, ප්‍රධාන වශයෙන් ගුවන් සේවා සහ සංචාරක ඉල්ලුමේ ඇති අවිනිශ්චිතතාවයන් විසඳීම සඳහා ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය (ACI) සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) වැනි ගුවන් සේවා වෘත්තීය ආයතනවල අනාවැකි සහ ප්‍රකාශන ගු.ගු.සේ.ස විසින් යොදා ගනු ලබයි.

මෙම අදියර තුළ, පහළ සිට ඉහළට සහ ඉහළ සිට පහළට යන ද්විත්ව සන්නිවේදන ක්‍රම ඔස්සේ සියලුම මට්ටම් හරහා සේවක සහභාගිත්වය පහසු කරනු ලැබේ. සක්‍රීය සේවක දායකත්වයන් දිරිමත් කිරීමත් තුළින් සාමාන්‍ය උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියට අනුව අවදානම් හඳුනාගැනීම සිදු කෙරේ.

# අවදානම් කළමනාකරණය

ගු.ගු.සේ.ස විසින් පහත දෑ ඇතුළුව විවිධ කාණ්ඩ හරහා අවදානම් හඳුනා ගනී :

- උපායමාර්ගික සහ මෙහෙයුම් අවදානම්
- මානව සම්පත් සහ සංවිධානාත්මක අවදානම්
- ආරක්ෂාව, සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය අවදානම්
- මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ අවදානම්
- කීර්තිය සහ සන්නාම අවදානම්
- නීතිමය සහ නියාමන අනුකූලතා අවදානම්

**අවදානම් තක්සේරුව**

ප්‍රධාන සාධක ද්විත්වයක් මත පදනම්ව අවදානම් තක්සේරු කරනු ලැබේ:

- අවදානම් ක්‍රියාත්මක වීමේ වියහැකියාව (හෝ සම්භාවිතාව).
- එම අවදානම්වල ප්‍රතිවිපාක (හෝ බලපෑම).

සෑම සාධකයක්ම 1 සිට 5 දක්වා පරිමාණයකින් ශ්‍රේණිගත කර ඇති අතර, 1 අඩුම සම්භාවිතාව හෝ බරපතලකම පෙන්නුම් කරන අතර, 5 ඉහළම අගය පෙන්නුම් කරයි. නිෂ්පාදනයක් ගණනය කිරීම සඳහා සම්භාවිතාව සහ බලපෑම් ලකුණු එකට ගුණ කරනු ලැබේ, එය 1 සිට 25 දක්වා පරාසයක පවතී. මෙම අගයන් අවදානම් තක්සේරු කිරීමේ න්‍යාසය මත සැලසුම් කර ඇත, 25 දක්වා ලකුණු මඟින් ක්ෂණික අවධානය සහ ශක්තිමත් අවම කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වන තීරණාත්මක අවදානම් නිරූපණය කරයි.

**අවදානම් තක්සේරු අනුකෘතිය**

සම්භාවිතාව සහ බලපෑම යන මිනුම් ද්විත්වය මත පදනම්ව අපගේ අවදානම් ලේඛනයේ ඇති අවදානම් වර්ග 190 ක් සඳහා හඳුනාගෙන ඇති අතර, 2023 වර්ෂය සඳහා අවදානම් පැතිකඩ ලකුණු ගණනය කර ඇත. ඒ අනුව, එක් එක් විශේෂිතයක්ට ගැනෙන අවදානම් වර්ග වගුවේ දක්වා ඇති අතර අඩු අගයන් වරහන් තුළ දක්වා ඇත.

| සම්භාවිතාව / ප්‍රතිවිපාක | කලාතුරකින් සිදුවන | සිදු වියනොහැක | සම්භාවිතාවක් ඇති | සිදු වියහැකි | ස්ථිර ලෙස සිදුවිය හැක |
|---|---|---|---|---|---|
| නොවැදගත් | 1 | 2 | 3 | 4 | 5 |
| අල්ප | 2 (1) | 4 | 6 (3) | 8 (2) | 10 |
| මධ්‍යම | 3 (1) | 6 (1) | 9 (16) | 12 (4) | 15 (3) |
| ඉහළ | 4 (1) | 8 (5) | 12 (51) | 16 (40) | 20 (4) |
| උපරිම | 5 | 10 (8) | 15 (17) | 20 (19) | 25 (14) |

සම්භාවිතාව සහ බලපෑම තක්සේරු කිරීම බොහෝ දුරට ගුණාත්මක විනිශ්චයක් වන අතර එහිදී වෘත්තීය ප්‍රවීණත්වය සහිත අදාළ අංශ සම්බන්ධ වේ. එමෙන්ම, මූල්‍ය අවදානම් වැනි ඇතැම් අවදානම්වල සම්භාවිතාව සහ / හෝ ප්‍රතිවිපාක අතීත රටාවන් සලකා බලා සහ සමාන සිදුවීම් සහ මූල්‍යමය වශයෙන් ප්‍රතිවිපාක ගණනය කිරීමෙන් ප්‍රමාණාත්මකව තක්සේරු කරනු ලැබේ.

අපි හඳුනාගත් සහ ග්‍රහණය කරගත් ඇතැම් අවදානම්වලට අනුව ඇතැම් කාර්යය සාධන දර්ශක නිර්වචනය කර ඇත. මූල්‍ය කාර්ය සාධනය මැනීමට අමතරව, පාරිභෝගික තෘප්තිය, සේවක තෘප්තිය, ගුවන් යානා ආශ්‍රිත අනතුරු සහ සිදුවීම් සම්බන්ධයෙන් අපි සමාගමේ කාර්ය සාධනය මනින්නෙමු. මෙම ප්‍රදේශවල ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීමට සහ ඒවා අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග සඳහා විශ්ලේෂණය කිරීමට මෙය උපකාර වේ.

## 2023 වර්ෂය තුළ අවදානම් කළමනාකරණ කමිටුවේ කටයුතු පිළිබඳ වාර්තාව

### කමිටුවේ කාර්යභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අවදානම් කළමනාකරණ කමිටුව, විධිමත් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස පිහිටුවා ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම් සිදු කරන අතර, වගකීම දරයි.

ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, මූල්‍ය හා මූල්‍ය නොවන යන දෙඅංශයෙන්ම එවැනි අවදානම්වල බලපෑම ගණනය කිරීම කමිටුවේ මූලික කාර්යභාරය වේ.

### 2023 දෙසැම්බර් 31 දිනට සංයුතිය

| අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර |
|---|---|
| කපිතාන් මිලින්ද රත්නායක | සභාපති |
| ඒ එස් සී වරුෂහෙන්නැදිගේ | සාමාජික |
| කේ ඩී වයි චාන්දනී (මිය) | කැඳවුම්කරු සහ/හෝ ලේකම් |

### රැස්වීම්

2023 වර්ෂය තුළ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව 10ක් පවත්වන ලදී. රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම පහත වගුවේ දක්වා ඇත.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගීවීම් |
|---|---|
| කපිතාන් මිලින්ද රත්නායක | 09 / 10 |
| ඒ එස් සී වරුෂහෙන්නැදිගේ | 10 / 10 |
| කේ ඩී වයි චාන්දනී (මිය) | 10 / 10 |

අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වල ක්‍රියාදාමයන් එහි ලේකම් ලෙස කටයුතු කරනු ලබන උපායමාර්ගික කළමනාකරණ ප්‍රධානියා විසින් සටහන් කරන ලදී. සාමාන්‍ය තත්ත්වයන් යටතේ රැස්වීම් දින සිට වැඩ කරන දින පහක් ඇතුළත රැස්වීමේ වාර්තා සාමාජිකයන් අතර බෙදා හරින ලදී.

### යොමු ගත කරුණු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යොමු ගත කරුණු (TOR) අනුව අවදානම් කළමනාකරණ විසින් ක්‍රියාදාමයන් සිදු කරයි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දෑ සඳහා කමිටුවට බලය පවරනු ලැබේ;

1. අවදානම් කළමනාකරණයට අදාළ වගකීම් ඉටු කිරීමට සහ ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම. (මෙය වත්මන් සහ අනාගත සාර්ව ආර්ථික හා මූල්‍ය පරිසරය සැලකිල්ලට ගනිමින් ව්‍යවසායයේ සමස්ත අවදානම් රුචිය, ඉවසීම සහ උපාය මාර්ගය ආවරණය කරයි.)
2. ව්‍යවසායයේ වත්මන් අවදානම් නිරාවරණයන් සහ අනාගත අවදානම් උපාය මාර්ග සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය කිරීම සහ උපදෙස් දීම.
3. විශාල නිරාවරණ සහ ඇතැම් අවදානම් ආකාරයේ තීරණාත්මක වැදගත්කම නිවැරදිව හා කාලෝචිත ලෙස නිරීක්ෂණය කිරීම.
4. අවදානම් සීමාවන් සහ යෝජිත ක්‍රියාවන්හි ප්‍රමාණවත්භාවය පිළිබඳ කිසියම් ප්‍රමාණාත්මක කඩකිරීමක් පිළිබඳ වාර්තා සමාලෝචනය කිරීම.
5. ව්‍යවසාය, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතිවල අභ්‍යන්තර මූල්‍ය පාලනවල සඵලතාවය සමාලෝචනය කිරීම සහ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
6. වංචා හඳුනා ගැනීම සඳහා ව්‍යවසායයේ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.
7. අවදානම් කණ්ඩායමේ සොයාගැනීම් සහ නිර්දේශ සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
8. ගු.ගු.සේ.ස විසින් අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ අනෙකුත් අවදානම් සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ සංවිධානය පුරා අවදානම් කළමනාකරණ රාමුව වරින් වර යාවත්කාලීන කිරීම.
9. සියලුම උපායමාර්ගික, මෙහෙයුම්, වෙළඳපළ, මූල්‍ය අවදානම් හඳුනාගෙන, තක්සේරුකොට, අධීක්ෂණයකොට සහ ප්‍රමාණවත් ලෙස කළමනාකරණයකොට ඇති බවට සහතික වීම.
10. සියලුම තීරණාත්මක අවදානම් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ඉතා සමීපව කටයුතු කිරීම සහ කමිටුවට පවරා ඇති අධිකාරියේ සහ වගකීමේ රාමුව තුළ සුදුසු නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම.

### වර්ෂය තුළ අවදානම් කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

2023 වර්ෂයේදී, අවදානම් කළමනාකරණ කමිටුව විසින් දෛනික ගුවන්තොටුපළ මෙහෙයුම්, මගීන්ට පහසුකම් සැලසීම සහ ව්‍යාපාරයේ දිගුකාලීන තිරසාරභාවය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි කරුණු පිළිබඳව සාකච්ඡා කරන ලදී. අවදානම් කළමනාකරණ කමිටුව විසින් අදාළ අවදානම/අවදානම් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වන පරිදි, අවැසි පරිදි අවදානම් කමිටු රැස්වීම්වලට සහභාගි වන ලෙස අදාළ අංශවල නියෝජිතයින්ට ආරාධනා කරයි. ඒ අනුව, මගීන්ගේ පැමිණිලි හේතුවෙන් කීර්තිනාමයට හානි වීමේ අවදානම, ආයතනික සැලැස්මේ දක්වා ඇති සමාගම් අරමුණුවලින් බැහැර වීමේ අවදානම සහ ඇතැම් සම්පත් සීමාවීම හේතුවෙන් ව්‍යාපාරික ඉලක්ක සපුරා ගැනීම ප්‍රමාද වීමේ අවදානම වැනි ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සමාලෝචිත වර්ෂය තුළ අවදානම් කළමනාකරණ කමිටුව සිය රැස්වීම් පවත්වන ලදී.

අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා පසුකාලීන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සාකච්ඡා කළ අවදානම් පිළිබඳ සිය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

2023 වර්ෂයේදී, නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන් අත්හිටුවන ලද ISO 31000: අවදානම් කළමනාකරණ ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීමට අවදානම් කළමනාකරණ කමිටුව සමත් වූ බව මෙහිදී සඳහන් කළ යුතුය. ගු.ගු.සේ.ස හි සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීමට ISO 31000 උපකාරී වනු ඇත. සම්පූර්ණ ක්‍රියාවලිය දීර්ඝ ක්‍රියාවලියක් වන අතර, ගු.ගු.සේ.ස විසින් ක්‍රියාවලිය ආරම්භ කිරීමට පළමු පියවර කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව පවත්වා දැනට පවතින ක්‍රියාවලියේ පවතින පරතරයන් තේරුම් ගැනීමට සහ ක්‍රියාවලියට අවශ්‍ය වැඩිදියුණු කිරීමට අධ්‍යක්ෂවරුන් සහ ප්‍රාදේශීය නියෝජිතයන් ස්වේච්ඡා උපදේශකවරයා සමඟ සාකච්ඡා/රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

අවසාන වශයෙන්, සමස්ත තීරණ ගැනීමේ ක්‍රියාවලිය, යහපාලනය සහ දිගු කාලීන ව්‍යාපාරික ස්ථාවරත්වය සඳහා ඉහත අවදානම් කළමනාකරණ සමාලෝචන අංශය පුරා විස්තර කර ඇති ගු.ගු.සේ.ස හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය උපකාරී වේ.

**කපිතාන් මිලින්ද රත්නායක**
සභාපති - අවදානම් කළමනාකරණ කමිටුව

2024 මැය 16

# යහපාලනය

## ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි පාලන ව්‍යුහය




* ගු.ගු.සේ.ස. හි සභාපතිතුමා විසින් එහි සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරීතුමා යන ද්විත්ව භූමිකාවක් ඉටු කරයි.

ආයතනික විනය සහ වගකීම් සහගත ව්‍යාපාරික චර්යාවන්ගෙන් පෝෂණය වූ ක්‍රියාශීලි ආයතනික පාලන පද්ධතියක් සමාගම පවත්වා ගෙන යනු ලබයි. අවශ්‍ය මූලික රාමු, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි පිහිටුවීම තුළින් පැහැදිලි සහ ක්‍රමානුකූල තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ගු.ගු.සේ.ස විසින් ක්‍රියාත්මක කර ඇත. මෙමගින් වගකීම් පිළිබඳ පැහැදිලි බවක් සහතික කිරීම, අවශ්‍යතා පිළිබඳ ගැටුම් අවම කිරීම සහ අභ්‍යන්තර පාලනයන්, අවදානම් කළමනාකරණය, විනිවිදභාවය සහ සමස්ත වගවීම සඳහා සතුටුදායක ක්‍රියාවලි සහ පද්ධති පවත්වාගෙන යයි.

සමාගමේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රවීණත්වය, කුසලතා සහිත  පළපුරුද්ද සහිත මනා සමබර සාමාජික සංයුතියකින් සමන්විත වේ. ඔවුහු ක්‍රියාශීලි ආයතනික කළමනාකරණ කණ්ඩායම සමඟ එකමුතුව කටයුතු කරමින් ශක්තිමත් පාලන පද්ධතියක අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වෙහෙසෙති. සාර්ව-ආර්ථික පරිසරයේ වෙනස්වීම් සහ අභියෝග මඟින් ඇතිවන අවදානම් පිළිබඳ මනා අවබෝධයක් පවත්වා ගනිමින්, සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ගු.ගු.සේ.ස මෙහෙයුම් මඟින් සපුරාලන බවට මෙමඟින් සහතික කරයි.

2007 අංක 7 දරන සමාගම් පනත, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ 2017 ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහය සහ මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වන පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ හි දක්වා ඇති යහපාලන මූලධර්ම සමඟ අනුකූලවීම පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම යහපාලන වාර්තාව මඟින් සපයයි. උක්ත මාර්ගෝපදේශ මඟින් "A" වාණිජ පොදු ව්‍යවසායන් යටතේ ගු.ගු.සේ.ස වර්ගීකරණය කොට දක්වයි. සමාගමේ දැක්ම සහ මෙහෙවර සමඟ අනුකූලවන ආයතනික උපායමාර්ග මඟින් එහි ශ්‍රම බලකාය, කොටස් හිමියන් සහ පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීමට එලදායී ක්‍රමවේදයන් පිහිටුවා ඇත. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් වරින් වර පවත්වන රැස්වීම්වලදී අනුකමිටුව ඔස්සේ කළමනාකරණය සමඟ එක්ව ක්‍රියාශීලිව කටයුතු කරමින් උපායමාර්ග සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිරන්තර වැඩිදියුණු කිරීම් සිදු කරමින් අභියෝගවලට මුහුණ දෙනු ලැබිය.

සාධාරණත්වය, වගවීම, වගකීම, සහභාගීත්වය සහ විනිවිදභාවය යන මූලික වටිනාකම් මත ගු.ගු.සේ.ස හි ආයතනික පාලන රාමුව සැදුම් ලත් වේ. අංගසම්පූර්ණ තිරසාර ව්‍යාපාර ආකෘතියක් සංවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා මේ සියල්ල ඉතා වැදගත් වේ.




### සාධාරණත්වය සහ සදාචාරාත්මක සංස්කෘතිය

- කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- සියලුම කොටස් හිමියන්ට, සේවකයින්ට, විකුණුම්කරුවන්ට සහ ප්‍රජාවන්ට සාධාරණව හා සමාන සැලකිල්ලක් දැක්වීම.
- උල්ලංඝන සඳහා එලදායී පිළියම් යෙදීම.
- සෑම විටම මනා වැඩ පරිසරයක් පවත්වා ගෙන යන බවට සහතික වීම.

### භාරකාරත්වය සහ නායකත්වය

- ආයතනික කටයුතු සහ කළමනාකරණ කටයුතු අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
- සමාගමේ සාර්ථක, අඛණ්ඩ කාර්යසාධනය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් විය යුතු අතර සහය විය යුතුය.
- සමාගමක සහ එහි ආයෝජකයින්ගේ යහපත වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කළ යුතුය.

### වගවීම සහ විනිවිදභාවය

- සමාගමක ක්‍රියාකාරකම්වල අරමුණ සහ එහි හැසිරීමේ ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැහැදිලි කළ යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා රජයට (GoSL) වගකීමෙන් බැඳෙන බවට සහතික වීම.
- මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, හිමිකාරිත්වය සහ ආයතනික පාලනය ඇතුළුව සියලුම ද්‍රව්‍යමය කරුණු පිළිබඳව කාලෝචිත, නිවැරදිව හෙළිදරව් කිරීම් සිදුවන බවට සහතික කිරීම.
- සමාගමක ධාරිතාව, විභවය සහ කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ.
- වැදගත් ගැටලු කොටස් හිමියන්ට සන්නිවේදනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වේ.
- සියලුම සම්බන්ධිත පාර්ශවකරුවන් සමඟ සාමූහික වගකීම ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතු වුවද, ඒ වෙනුවෙන් වූ නිශ්චිත වගකීම් ඇත

### ස්වාධීනත්වය

- අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන වන අතර, ගනු ලබන සියලුම තීරණ සෑම විටම සමාගමේ යහපත තකා සිදු කෙරේ.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය තුලිත බව සහතික කිරීම.
- කමිටු වෙත නාම යෝජනා ඉදිරිපත් කිරීමේදී ස්වාධීනත්වය සහතික කිරීම.
- ගනු ලබන තීරණ සහ ස්ථාපිත අභ්‍යන්තර ක්‍රියාවලීන් සඳහා අරමුණක් පවතින බවට සහ, ඒවා බලපෑමට ලක් නොවන බවට සහතික කිරීම.

**අඛණ්ඩ වැඩිදියුණු කිරීම**

- සියලු වර්ගයේ අවදානම් මොනවාද සහ ඒවා පාලනය කරන්නේ කෙසේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් තීරණය කළ යුතුය.
- ඒවා කළමනාකරණය කිරීම සඳහා එකී නිර්දේශ අනුකූලව ඔවුන් ක්‍රියා කළ යුතුය.
- ඔවුන් අවදානම්වල ස්වරූපය සහ තත්ත්වය පිළිබඳව සියලු අදාළ පාර්ශ්වයන් දැනුවත් කළ යුතුය.
- සැලසුම්, හොඳම භාවිතයන් සහ තරඟකරුවන්ගේ වෙනස්වීම් අනුව සැබෑ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරු කළ යුතු අතර, අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පවතින පරතරය පිරවිය යුතුය.

**අධීක්ෂණය සහ උපාය මාර්ගය**

- පැහැදිලි උපාය මාර්ගික දැක්මක් පිහිටුවීම.
- සමාගමෙහි උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියට අධ්‍යක්ෂවරුන් වඩාත් ක්‍රියාකාරීව සම්බන්ධ විය යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයුම් තීරණවලින් උපායමාර්ගික තීරණ වෙන් කොට දැක්වීම සිදු කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ඔස්සේ උපායමාර්ගික තීරණ කෙරෙහි අවධානය යොමු කරයි.

**1. අධ්‍යක්ෂ මණ්ඩලය**

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- සමාගමේ දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් තිරසාර, ඉහළ මට්ටමේ, මධ්‍යම සහ දිගුකාලීන උපාය මාර්ග සැකසීමේදී සමාගම වෙත අධීක්ෂණ සහ මග පෙන්වීමේ පහසුකම් ලබා දීම.
- ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවේ විෂය පථය තුළ මෙහෙයුම් තීරණ ගැනීම සහ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත ප්‍රමාණවත් බලය පැවරීම සහතික කිරීම.
- පාලන සහ අනුකූලතා පද්ධති අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඉටු කිරීමේදී, විවෘතභාවය, ඵලදායී සංවාදය සහ විරුද්ධ මත ඉදිරිපත් කිරීම් වෙනුවෙන් අවස්ථාව ලබා දෙන අතර, සේවක සවිබල ගැන්වීම් සහ නියැලීම උත්සුක කරනු ලබන පරිසරයක් සහතික කරමින්, සියලුම පාර්ශවකරුවන්ට වටිනාකමක් නිර්මාණය කරයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සමාගමේ අනෙකුත් සේවකයන් දක්වා විහිදී යන වෘත්තීය ප්‍රමිති සහ ආයතනික වටිනාකම් ප්‍රවර්ධනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් අවැසි පරිසරය සකසමින් දිරිමත් කරයි.

**2. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම**

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වසර ආරම්භයේදී සැලසුම් කරනු ලබයි. අධ්‍යක්ෂවරුන්ට සහ කළමනාකාරීත්වයට රැස්වීම් සඳහා සාකච්ඡා අවශ්‍ය ප්‍රධාන සහ උපාය මාර්ගික තොරතුරු සකස් කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් දැනුම්දීමක් සකස් කොට ඇත. න්‍යාය පත්‍රය, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අදාළ පත්‍රිකා ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල ලිපිලේඛන ආදිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරිනු ලැබේ. එතුළින් රැස්වීමේදී සාකච්ඡා කළ යුතු දෑ පිළිබඳ ඔවුන්ට අවබෝධයක් ලබා දේ.

යෝග්‍ය තීරණයකට එළැඹීම සඳහා සියලු අංශ සම්බන්ධයෙන් නිසි ලෙස සාකච්ඡා කර, විසඳුම් ඉදිරිපත් කොට ඇති බව සහතික කරලනු පිණිස එක් එක් න්‍යාය පත්‍ර කරුණු වෙනුවෙන් කලින් කාලය වෙන් කරගනිමින් වෘත්තීය සහ ක්‍රමානුකූල ප්‍රවේශයක් ඔස්සේ රැස්වීම් පවත්වනු ලබයි. අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දීමට අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වූ විට අංශ ප්‍රධානීන් මණ්ඩල රැස්වීම්වලට සහභාගී වේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15ක් කැඳවා ඇති අතර, ඉන් එක් රැස්වීමක් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි 55 වැනි වගන්තියේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි සහ සාංගමික සංස්ථා පත්‍රය ප්‍රකාරව පවත්වන කල් තබන ලද රැස්වීමේ කොටසක් වේ. 2023 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|
| ඉංජිනේරු ඒ ගල්කැටිය* | සභාපති* | 08/15 |
| ජේ යූ කේ අල්ගෙවත්තගේ** | වැඩ බලන උප සභාපති | 12/15 |
| ඒ එස් සී වරුෂහෙන්නැදිගේ | විධායක නොවන අධ්‍යක්ෂ | 14/15 |
| එස් එන් සුමනසේකර | විධායක නොවන අධ්‍යක්ෂ | 13/15 |
| කපිතාන් මිලින්ද රත්නායක | විධායක නොවන අධ්‍යක්ෂ | 15/15 |
| ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය | විධායක නොවන අධ්‍යක්ෂ | 15/15 |
| ඩබ්ලිව් එස් ඩී ද සිල්වා | විධායක නොවන අධ්‍යක්ෂ | 13/15 |
| ඒ ඒ රන්දෙණිය | විධායක නොවන අධ්‍යක්ෂ | 13/15 |
| ජී ඒ ඒ ප්‍රියන්ත | විධායක නොවන අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත | 14/15 |
| ඒ එච් එස් ගුණවර්ධන | විධායක නොවන අධ්‍යක්ෂ / වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ නිරීක්ෂක | 13/15 |
| **ඉල්ලා අස්වීම්** | | |
| මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc (2023 දෙසැම්බර් 10 වැනි දින ඉල්ලා අස්විය) | සභාපති | 14/15 |
| වෛද්‍ය යූ ඒ මෙන්ඩිස් (2023 අගෝස්තු 16 වැනි දින ඉල්ලා අස්විය) | උප සභාපති | 07/15 |

සටහන-

** ඉංජිනේරු ඒ ගල්කැටිය 2023 අගෝස්තු මස 18 දින උප සභාපති ලෙස වැඩ භාර ගන්නා ලද අතර, 2023 දෙසැම්බර් 11 වන දින ගු.ගු.සේ.ස හි සභාපතිවරයෙකු ලෙස පත් කරන ලදී.*

*** 2023 දෙසැම්බර් 11 වන දින වැඩබලන උප සභාපති ලෙස ජේ යූ කේ අල්ගෙවත්තගේ පත් කරන ලදී.*

### 3. අපගේ ප්‍රවේශය සහ කැපවීම

ගු.ගු.සේ.ස යනු පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක් වන අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලය යහපාලනය තුළින් සමාගමේ උපාය මාර්ගික මග පෙන්වීම සහ අධීක්ෂණය සඳහා රජයට වගකිව යුතුය. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය විසින් නිර්දේශිත ආයතනික පාලන නියාමන රාමුව මගින් සමාගම මෙහෙයවනු ලැබේ. මෙම පාලන රාමුව මූලික ප්‍රතිපත්ති පහකින් සමන්විත වේ;

අ) නායකත්වය සහ මඟ පෙන්වීම
ආ) විනිවිදභාවය සහ අඛණ්ඩතාව
ඇ) ප්‍රධාන කොටස් හිමියා ලෙස රජයට වගවීම
ඈ) පාර්ශ්වකරුවන්ගේ නීත්‍යානුකූල අවශ්‍යතා හඳුනා ගැනීම
ඉ) කාලෝචිත සහ සමබර අනාවරණය කිරීමේ මූලධර්මය

ඉහත කරුණු හැරුණු විට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දක්වා ඇති අනිවාර්ය අවශ්‍යතා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති ස්වේච්ඡා අනුකූලතා ද අපගේ පාලන රාමුවේ කොටසක් වේ.

ගු.ගු.සේ.ස හි, අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුව යනු පාලන ක්‍රියාවලියේ වැදගත් අංගයක් වේ. පැහැදිලිව නිර්වචනය කරන ලද යොමු නියමයන් සහිත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හයක් පත් කර ඇත. විගණන සහ කළමනාකරණ කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් සහ වැටුප් කමිටුව, මූල්‍ය කළමනාකරණ සහ ආදායම් උත්පාදන කමිටුව, සියලුම ගුවන් තොටුපළෙහි ඉදිරි ගමන්මග කමිටුව සහ ව්‍යාපෘති කළමනාකරණ කමිටුව යනු එකී කමිටු වේ. ඒ අනුව, මෙම එක් එක් ක්ෂේත්‍රයට අදාළ කරුණු මනාව විශ්ලේෂණය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. මේ ආකාරයෙන්, තීරණ ගැනීමේ සාමූහික වගකීම දරමින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ විශේෂඥ දැනුම නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි වී ඇත.

ඒ අනුව, අපගේ පාලන යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කරලීමට සමාගම තුළ විගණන සහ කළමනාකරණ කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් හා වැටුප් කමිටුව, මූල්‍ය කළමනාකරණ සහ ආදායම් උත්පාදන කමිටුව, සියලුම ගුවන්තොටුපළෙහි ඉදිරි ගමන්මග කමිටුව සහ ව්‍යාපෘති කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක වේ.

පහත වගන්තිවල විස්තර කර ඇති පරිදි සමාලෝචිත වර්ෂය තුළදී සමාගම් පනතේ දක්වා ඇති සියලුම අනිවාර්ය ආයතනික පාලන අවශ්‍යතා සහ ස්වේච්ඡා අනුකූලතා අනුව ගු.ගු.සේ.ස කටයුතු කළේය.

### 4. නායකත්වය සහ මඟ පෙන්වීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සමාගමේ ව්‍යාපාර සහ මෙහෙයුම් කළමනාකරණය කරනු ලබයි. එය සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා විසින් පත් කළ ව්‍යාපාර කළමනාකරණය සහ මූල්‍ය පාලනය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ දැනුම ඇති සාමාජිකයින්ගෙන් සමන්විත වේ. අමාත්‍යවරයා විසින් ආයතනයේ පාලන ප්‍රතිපත්ති මෙහෙයවන සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීමේ වගකීම දරන සභාපතිවරයා පත් කරනු ලබයි. සභාපති විසින් යහපාලනය සහ කාර්යක්ෂමභාවය සහතික කරනු ලබයි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක සහ විධායක නොවන සාමාජිකයන් අතර එලදායී කාර්යය සබඳතා පවත්වාගෙන යාමද සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ සහය ඇතිව සභාපතිවරයා විසින් පහත දෑ සහතික කරයි:

අ) අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම
ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නියමිත වේලාවට තොරතුරු ලබාදීම

අධ්‍යක්ෂ මණ්ඩලය රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් සමාගමේ භාරකාරත්වයේ ව්‍යවස්ථාපිත වගකීමක් ඉටු කරයි. ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරයන් වනුයේ:

අ) සමාගම එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවීම.
ඇ) සමස්තයක් ලෙස සමාගමේ කළමනාකරණය, මෙහෙයුම් සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් එකළොස් දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් නව දෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර දෙදෙනෙකු විධායක අධ්‍යක්ෂවරුන්වන අතර, එහිදී සභාපතිවරයා සහ උප සභාපතිවරයා විසින් ඔවුන්ගේ විධායක කාර්යභාරය ඉටු කරලනු ලබයි. ගු.ගු.සේ.ස හි සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස සභාපතිවරයා විසින් ද්විත්ව භූමිකාවක් ඉටු කරලනු ලබයි. ආයතනික පාලන මාර්ගෝපදේශවල අවශ්‍යතා අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඉහළ කීර්තියක් දරන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. සියලුම විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී තනි ඡන්ද අයිතියක් ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය මඟින් කරුණු සහ ස්වරූපය යන දෙඅංශයෙන්ම කළමනාකරණයේ ස්වාධීනත්වය පිළිබිඹු කරයි. එය අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික සම්බන්ධතා, පෞද්ගලිකත්වය, සේවාවේ නියුක්තිය හෝ ව්‍යාපාර පමණක් නොව කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත ආකල්පය අනුව සිදු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යභාරයේ මූලික හරය විෂය මූලික ස්වාධීන විනිශ්චයක් ලබා දීමයි.

සමාගමේ අභ්‍යන්තර හා බාහිර තොරතුරු සම්බන්ධයෙන් සියලුම අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන සහ ඒකාබද්ධ ප්‍රවේශයක් ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන් අනුගමනය කරන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් නෛතික අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ සපයන බවටත් සමාගම් ලේකම්වරයා සහතික කරයි.

එමෙන්ම, ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීමට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැන්වීම්, රැස්වීම් වාර්තා සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අනෙකුත් අදාළ ලියකියවිලි සමඟ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් ද ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

### 5. අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය සඳහා වෙන් කර ඇති කරුණුවලට පහත දෑ ඇතුළත් වේ:

සමාගම විසින් මනා ව්‍යුහගත ආයතනික පාලන රාමුවක් ක්‍රියාත්මක කර ඇති අතර, එය සියලුම ව්‍යාපාරික ඒකක හරහා සම්මත කර ඇත. එය තිරසාර කොටස් හිමියන්ගේ වටිනාකම පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

අ) සමාගම වෙනුවෙන් දැක්ම සහ උපදේශ සැපයීම
ආ) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධානවල විෂය පථය තුළ ගොඩනගා ඇති එහි සුවිශේෂී මෙහෙවර සහ එය රජයේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සඳහා වඩාත් හොඳින් කටයුතු කරන්නේ කෙසේද යන්න මත පදනම් වීම.
ඇ) 2007 අංක 7 දරන සමාගම් පනතේ සහ සාංගමික ව්‍යවස්ථාවලියෙහි විධිවිධානවලට අනුකූලව නෛතික අවශ්‍යතා සපුරාලන බව සහ සමාගම ක්‍රියාත්මක වන බව සහතික කිරීම.

ඈ) රජයට සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන්ට ප්‍රශස්ත ආපසු ගෙවීම් සහ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවදානම් කළමනාකරණය ඇතුළු විවිධ ප්‍රතිපත්ති සැකසීම.

ඉ) රාජ්‍ය ප්‍රතිපත්ති අරමුණු වරින් වර සමාලෝචනය කිරීම සහ අනාගත වර්ධනය සඳහා දිගුකාලීන ඉලක්ක සහ අරමුණු සකස් කිරීම සඳහා උපාය මාර්ගික මඟ පෙන්වීම් සැපයීම.

ඊ) වගකීම පැවරීමෙන් ප්‍රමාණවත් වගවීම සහතික කිරීම.

## 6. අධ්‍යක්ෂ මණ්ඩලයට පමණක් ගත හැකි වැදගත් තීරණවලට පහත දෑ ඇතුළත් වේ:

අධ්‍යක්ෂ මණ්ඩලයේ විෂය පථයට පහත දෑ ඇතුළත් වේ:

අ) සමස්ත නිර්දේශ තක්සේරු කිරීම සහ ව්‍යාපාරයේ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම.

ආ) පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා විශ්වාසනීය යුතුකම්.

ඇ) සමාගම සිය මෙහෙයුම්වල නිවැරදිව සිදු කරන බැව් සහතික කරමින් කළමනාකරණ තොරතුරු වාර්තා ඔස්සේ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්ය සාධනය අධීක්ෂණය සහ ඇගයීම.

ඈ) පාලන භාවිතයන්හි සඵලතාවය සහතික කිරීම.

ඉ) සෙසු පිරිස අතර අභ්‍යන්තර පාලන ඇතුළු අවදානම් තක්සේරුව සහ කළමනාකරණය සඳහා රාමුවක් ක්‍රියාත්මක කිරීම.

ඊ) අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති අරමුණු කළ පරිදි ක්‍රියාත්මක වන බවට සහ පොදුවේ මහජනතාවගේ යහපත වෙනුවෙන් ක්‍රියාත්මකවන බවට සහතික වීම.

උ) ප්‍රතිඵල අපේක්ෂිත මට්ටමට අනුකූල නොවන්නේ නම්, ඉලක්ක සපුරා ඇති බව සහතික කිරීමට ප්‍රමාදයකින් තොරව විසඳුම් ක්‍රියාමාර්ග ගැනීම.

ඌ) කළමනාකරුවන් ලෙස දක්ෂ පුද්ගලයින් පත් කිරීම සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය අතර ප්‍රමාණවත් බලය පැවරීමක් පවතින බැව් සහතික කිරීම.

එ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීම්වලට සහ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා (PCC) රැස්වීම්වලට සහභාගි වීම හෝ අවශ්‍ය අවස්ථාවලදී සහ ඒ සඳහා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඒ සඳහා බලය පැවරීම.

## 7. ආයතනික පාලන අංශයන්හි විගණන සහ කළමනාකරණ කමිටුවේ (AMC) භූමිකාව

### 7.1 විගණන කළමනාකරණ කමිටුව

ගු.ගු.සේ.ස හි කටයුතු අධීක්ෂණය කිරීමේදී පාලක සභාවට සහය වීම මෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සහ ගු.ගු.සේ.ස හි ක්‍රියා පටිපාටිවල අඛණ්ඩතාව සහතික කිරීම අරමුණු කරමින් PED/12 ඡේදය 7:4:1 අනුව විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) පිහිටුවනු ලැබීය.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව, සමාගමේ අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ පද්ධති සහ නෛතික සහ නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් එහි අනුකූලතාව, බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය, සුදුසුකම් සහ ස්වාධීනත්වය සහ සමාගම විසින් සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රමාණවත් බව සහ කාර්යසාධනය සම්බන්ධයෙන් වගකීම් අධීක්ෂණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම, විගණන සහ කළමනාකරණ කමිටුව හි කාර්යභාරයයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන කමිටුවේ යොමු කිරීමේ අනුදේශවල කාර්යයන් සහ වගකීම්වල විෂය පථය නිසි ලෙස දක්වා ඇත. ගිණුම්කරණ සහ මූල්‍ය ක්‍රියාකාරකම්, පරිපාලන රෙගුලාසි (AR), මූල්‍ය රෙගුලාසි (FR) සහ ගු.ගු.සේ.ස රෙගුලාසි ආවරණය වන පරිදි රජයේ රෙගුලාසිවලට යටත්වීම සහ අනුකූල වීම සහතික කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඇත.

විගණනය කරන ලද මූල්‍ය තොරතුරුවල අඛණ්ඩතාවය වෙනුවෙන් බාහිර හා අභ්‍යන්තර විගණන කාර්යයන් මඟින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, ඒවා අවම වශයෙන් කාර්තුමය පදනමින් විගණන කමිටුව විසින් අධීක්ෂණය කර ඵලදායී ලෙස ඇගයීමට ලක් කළ යුතුය. ගු.ගු.සේ.ස හි විගණන කාර්යයන් ඵලදායී වන බවට සහ ශක්තිමත් ලෙස ඇගයීමට ලක් කර ඇති බවට සහතික කිරීම ගු.ගු.සේ.ස හි රේඛීය අමාත්‍යාංශය, වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සඳහා අවශ්‍ය වේ. ඇගයීම්වල විෂය පථය සඳහා පහත දෑ ඇතුළු අදාළ සියලු කරුණු ඇතුළත් විය යුතුය:

- ඇගයීම් කාලය තුළ සිදු කරන ලද කාර්යයේ ගුණාත්මකභාවය.
- විගණන නිලධාරීන්ගේ හැකියාව සහ පළපුරුද්ද.
- රජයේ සහ අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් එහි වාර්තාකරණ ක්‍රියාවලියේ යෝග්‍යතාවය.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් දැනට පවතින පද්ධති සහ ක්‍රියාපටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කර ඇති අතර, යම් අක්‍රමිකතාවයක් නිරීක්ෂණය වුවහොත් වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා ඉදිරිපත් කරනු ලබයි. මෙකී යෝජනා වරින් වර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. අදාළ අවදානම් තුරන් කිරීමේ අරමුණින් විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන් විසින් මතු කරන ලද විමසීම් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික කිරීම සඳහා අදාළ අංශ විසින් ලබා දී ඇති පිළිතුරු ද කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

### 7.2 විනිවිදභාවය සහ අඛණ්ඩතාව

වැඩිදියුණු කළ පාලනය, වගවීම සහ විනිවිදභාවය අවශ්‍ය වන සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුව විසින් ආයතනික සංස්කෘතිය සහ භාවිතයන් නිරන්තරයෙන් අධීක්ෂණය කර සමාලෝචනය කර ඇත. භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සමාගමේ වැදගත් ක්‍රියාකාරකමක් වන අතර, භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමේදී පූර්ණ විනිවිදභාවයෙන් යුතු ක්‍රියා පටිපාටියක් සපයයි.

### 7.3 අභ්‍යන්තර විගණනය

විගණන සහ කළමනාකරණ කමිටුව සඳහා ගු.ගු.සේ.ස හි අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික අංශයේ (IA & QA) සහය ලැබේ. අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික අංශයේ ප්‍රධානියා විගණන සහ කළමනාකරණ කමිටුව හි කැඳවුම්කරුවෙකු ලෙස කටයුතු කරන අතර, සභාපතිවරයා වෙත වාර්තාකරණ කටයුතු සිදු කරයි. අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ ගුවන් තොටුපළ සේවාවන්හි ඇතැම් ක්ෂේත්‍ර සඳහා ගුණාත්මක ප්‍රමිතීන් සතුටුදායක බව සහතික කරමින්, අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව, අඛණ්ඩතාව සහ සඵලතාවය ඇගයීම මගින් පවතින සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් පැවැත්වීම සහ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා කළමනාකාරිත්වය වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම වේ. අභ්‍යන්තර විගණනය විසින් අභ්‍යන්තර පාලනයන්හි

ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය මෙන්ම සමාගමේ නීති සහ රෙගුලාසි සහ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම පිළිබඳව සභාපතිවරයා වෙත නිරන්තරයෙන් වාර්තා කරනු ලබයි. අභ්‍යන්තර විගණනය සඳහා පහත දෑ ඇතුළත් වේ:

අ) පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ සමාලෝචනය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රධාන තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම.

ඇ) ගු.ගු.සේ.ස හි එක් එක් අංශයේ විෂය පථය යටතේ කළමනාකරණ තීරණ සහ ක්‍රියාකාරකම් පිළිබඳ අවදානම් තක්සේරුව සම්බන්ධයෙන් විගණන සහ කළමනාකරණ කමිටුව සහ ගු.ගු.සේ.ස හි සභාපති වෙත ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඈ) පද්ධති සහ පාලන සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් අවදානම් තක්සේරුව පිළිබඳ නිරීක්ෂණ සිදු කිරීම.

ඉ) ආදායම් සහ වියදම් සඳහා තත්ත්වකාලීන සහ කාලානුරූපී මූල්‍ය සමාලෝචනය කිරීම සහ එය හඳුනා ගැනීම සහ වාර්තාකරණය.

ඊ) ව්‍යාපාරයේ තෝරාගත් ක්ෂේත්‍රවල තත්ත්ව විගණන සිදු කිරීම.

උ) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.

## 8. ගු.ගු.සේ.ස හි ප්‍රධාන කොටස් හිමියා ලෙස රජයට වගවීම

පූර්ණ වශයෙන් රජය සතු ව්‍යාපාරයක් ලෙස, රජයට වගවීම රේඛීය අමාත්‍යාංශය හරහා පහත සඳහන් යාන්ත්‍රණය භාවිත කරමින් ගු.ගු.සේ.ස විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 8.1 පාර්ලිමේන්තුව

2002 මැයි 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ PE/PF 21 ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසානයේ සිට දින 150ක් ඇතුළත සමාලෝචනය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

### 8.2 රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව (COPE)

සමාගමේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමට සහ සමාගම කාර්යසාධන ඉලක්ක සපුරාලන සහ සමාජ වගකීම් ඉටු කරන ප්‍රමාණය තක්සේරු කිරීමට රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) බලය ඇත. රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව විසින් කැඳවන විටදී වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා, ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා සමඟ සභාපතිවරයා, අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්, එම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිසියම් විමසීමක් සහ සැලකිලිමත් වන කරුණු සඳහා ප්‍රතිචාර දැක්වීමට සමාලෝචන සඳහා පැමිණ සිටිය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව විසින් ගු.ගු.සේ.ස කැඳවනු නොලැබුණි.

### 8.3 මුදල් / මහා භාණ්ඩාගාර අමාත්‍යවරයා

රාජ්‍ය ව්‍යවසාය ඇතුළු රාජ්‍ය අංශයේ මූල්‍ය විනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරනු ලබන මහා භාණ්ඩාගාරය වගකීමෙන් බැඳේ. කාර්ය සාධනය අධීක්ෂණය කිරීම, ප්‍රඥප්ති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූලව ක්‍රියාකිරීම සහතික කිරීම සහ අමාත්‍යවරයාට අදාළ ඕනෑම කරුණක් පිළිබඳව වාර්තා කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර නියෝජිත ජී වී අජිත් ප්‍රියන්ත මහතා විසින් මෙම කාර්යය ඉටු කරන ලදී.

රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය කළමනාකරණය සහ පාලනය අධීක්ෂණය කිරීමේ වගකීම, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (DPE), මහා භාණ්ඩාගාරය මත පැවරී ඇත.

### 8.4 වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍යාංශය

වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම් සහ ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා සමාගමේ මූල්‍ය පරිපාලනය සහ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් රජයට වගකිව යුතු වේ. එමඟින් වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පහත සඳහන් කරුණු නිතිපතා සමාලෝචනය කරයි.

අ) ආයතනික සැලැස්ම සහ අයවැය

ආ) ප්‍රාග්ධනයේ භෞතික හා මූල්‍ය කාර්ය සාධනය

ඇ) වත්මන් වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපෘති

ඈ) කළමනාකරණ ලිපිය ඇතුළුව විගණන බෙදාහැරීම් සහ

ඉ) සමස්තයක් ලෙස වසරේ මූල්‍ය කාර්ය සාධනය

ඊ) කෝප් කමිටුවේ හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත/නියාමන ආයතනයක රැස්වීම්වලින් මතුවන කරුණු

## 9. පාර්ශවකරුවන්ගේ නීත්‍යානුකූල අවශ්‍යතා හඳුනා ගැනීම

ආයතනයක් පාර්ශ්වකරුවන් වෙනුවෙන් මනා සේවයක් පිරිනැමීමේදී, වර්ධනයේ අපේක්ෂාවන් සපුරාලීමේදී සහ ප්‍රජා වගකීම් සහ නෛතික අනුකූලතාව සම්බන්ධයෙන් කීර්තියක් ඇති විට පාර්ශ්වකරුවන්ගේ වටිනාකම වැඩි දියුණු වේ. සමාගමක පාර්ශවකරුවන්ගේ (කොටස් හිමියන්, ගනුදෙනුකරුවන්, කම්කරුවන් සහ ප්‍රජාව ඇතුළුව) අවශ්‍යතා උපරිම කිරීම කෙරෙහි මූලික ලෙස අවධානය යොමු කරන්නේ නම් පාර්ශ්වකරුවන්ගේ වටිනාකම කළමනාකරණ ක්‍රමයක් ලෙස හැඳින්වේ. මෙකී ක්‍රමවේදයේ අරමුණ වනුයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමෙන් පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම කිරීමයි. එය පිරිවැය පාලනය ශක්තිමත් කරනු ලබන අතර, ආයතනයේ සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නංවමින්, සමාගමේ සේවකයින්ගේ කුසලතා සහ චිත්ත ධෛර්යය වර්ධනය කරලනු ලබයි. එමෙන්ම සමාගම විසින් සම්පත් සහ නඩත්තුව වර්ධනය කරලනු ලබන ප්‍රජාවේ උන්නතිය සුරක්ෂිත කරයි. ඒ අනුව, ගු.ගු.සේ.ස හි කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන රජය සහ අනෙකුත් අනුබද්ධ ඡන්ද කොට්ඨාශ ඇතුළු සියලුම නීත්‍යානුකූල පාර්ශවකරුවන්, සේවකයින්, ගුවන්තොටුපළ භාවිත කරන්නන් (ගුවන්තොටුපළ ඇතුළේ සිය ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරික ප්‍රජාව), සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සහ සමස්ත ප්‍රජාව සඳහා වන නෛතික සහ අනෙකුත් බැඳීම් පිළිබඳ සමාගම දැනුවත්ය. මෙම බැඳීම් පාර්ශවකරුවන්ගේ දිගු කාලීන වටිනාකම් ප්‍රශස්ත කිරීම සඳහා වන මූලික කාර්යභාරයක් ලෙස සැලකීම වැදගත් වේ.

එය පහත ක්ෂේත්‍රවලින් සමන්විත වන අතර, සුදුසු ආයතනික භාවිතයන් වෙනුවෙන් වූ කැපවීම පෙන්නුම් කරයි:

අ) නියාමන රාමුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් නිසි සැලකිල්ලක් දැක්වීම.

ආ) ගුවන් තොටුපළ මෙහෙයුම් ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස කටයුතු කරමින්, රජයේ වගකීම් ඉටු කිරීම.

ඇ) ණයහිමියන් සහ මූල්‍ය ආයතන වෙත වගකීම් නිසි කලට සපුරාලීම.

ඈ) සාධාරණ වෙළඳාමට අදාළ වගකීම් අඛණ්ඩව සපුරාලීම සහ සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සමඟ ගනුදෙනු කිරීමේදී සාධාරණ ක්‍රමවේදයක් සහතික කිරීම.

ඉ) ප්‍රජාව වෙත සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් යොදා ගැනීම.

ඊ) නීතියෙන් නියම කර ඇති ආකාරයට සියලුම මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සුදුසු පරිදි හොඳම භාවිතයන් අනුගමනය කිරීම.

උ) සියලුම ගුවන්තොටුපළ භාවිත කරන්නන්ට සම ලෙස සැලකීම.

ඌ) සේවකයින්ට සාධාරණව, ගෞරවාන්විතව සහ සම ලෙස සැලකීම.

## 10. කාලෝචිත සහ සමබර හෙළිදරව් කිරීම්

විචක්ෂණ තීරණ ගැනීම සඳහා අවැසි පුළුල් පරාසයක සහ මනා දැනුමකින් යුතු කරුණු සමඟින් කාලෝචිත, නිවැරදි තොරතුරු සැපයීම යනු අභ්‍යන්තරව මෙන්ම බාහිරව ද අපගේ තොරතුරු අනාවරණය කිරීමේ මූලික පදනම වේ. සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මඟින් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS/LKASs) හි දක්වා ඇති චක්‍රලේඛ ඇතුළුව, සියලුම නීති සහ රෙගුලාසිවල අනාවරණය කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරයි..

සමාගමෙහි ව්‍යාපාර, අවදානම් පැතිකඩ, මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් කාර්යසාධනය සහ ප්‍රවණතා අවබෝධ කර ගැනීමට කොටස් හිමියන්ට උපකාර කිරීමේ අරමුණින් ගු.ගු.සේ.ස විසින් සිය පාර්ශවකරුවන් සමඟ ඵලදායී සහ අවංක සන්නිවේදනයක් පවත්වාගෙන යයි. ප්‍රතිපත්තියක් ලෙස සහ ඉල්ලුම මත, කලින්කලට සහ අවශ්‍ය අවස්ථාවේදී සිදු කරනු ලබන බොහෝමයක් වාර්තා සහ විශ්ලේෂණය කරන ලද තොරතුරු සපයනු ලැබේ. ආයතනික මෙහෙයුම්වල සැබෑ තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් සේවකයින් දැනුවත් කරනු ලබයි. සමාගමේ ඉන්ට්‍රානෙට් මඟින් සේවකයින් වෙත තොරතුරු ප්‍රචාරය කිරීමේ කටයුතු ඉටු කරයි. අපගේ ව්‍යාපාරයට බලපාන සහ අප ක්‍රියාත්මක වන ප්‍රජාවට බලපාන නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම, බලාත්මක කිරීම සහ සංශෝධනය කිරීම සිදු වන සෑම අවස්ථාවකදීම ගු.ගු.සේ.ස ජන ප්‍රතිපත්ති සංවාදයට දායක වේ.

## 11. සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම සහ නිතිපතා සමාලෝචනය කිරීම සහතික කිරීම සම්බන්ධයෙන් සමාගම් ලේකම්වරයා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සටහන් සහ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යාමට අමතරව, වර්ෂය තුළ ආයතනික පාලන කටයුතු, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි සහ අදාළ නීති රීතිවලට අදාළ උපදෙස්වලට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත වේලාවට සහ නිවැරදි තොරතුරු ලැබෙන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් සහය ලබා දෙයි. මතු කරන ලද සහ වාර්තා කිරීමට බලාපොරොත්තු වන සියලුම ගැටලු ලේකම් විසින් ප්‍රමාණවත් විස්තර සහිතව ලේඛනගත කර ඇත.

අදාළ ව්‍යවස්ථාපිත, නව රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සම්බන්ධයෙන් සමාගම් ලේකම්වරයා මූලික වශයෙන් වගකීමෙන් බැඳේ. එමෙන්ම පාලන කටයුතු සඳහා කළමනාකාරිත්වය සහ නියාමන අධිකාරීන් අතර සම්බන්ධයක් ගොඩනගනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } AACV/A/AASL/01/23/50 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 22 May 2024

සභාපති
ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

**ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

#### 1.2.1 අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් යෙදීමට අසමත් වීම

ව්‍යාපෘතියේ වටිනාකම සහ 2022 සිට 2023 දක්වා කාලය තුළ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ලද ප්‍රසම්පාදන තුනක සමස්ත වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන 4,761ක් සහ රුපියල් මිලියන 1,544ක් විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 7 සහ 55 ඡේදය මගින් අවශ්‍ය වන පරිදි ප්‍රාග්ධනීකරණය සහ ක්ෂය කිරීම වෙනුවට ව්‍යාපෘතියේ සහ ප්‍රසම්පාදනවල පිරිවැය, නොනිමි වැඩ (WIP) සහ මාර්ගස්ථ භාණ්ඩ ගිණුමෙහි ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත.

#### 1.2.2 ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදී.

(අ) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී පනතේ 9 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගය මගින් ඉහත පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගන (කටුනායක ගුවන්තොටුපළ සහ රත්මලාන ගුවන් තොටුපළ) සහ තුන්වන උපලේඛනයේ දක්වා ඇති ගගන යාත්‍රික පහසුකම් හත සහ ඊට අදාළ ඉඩම (එහි ඇති ගොඩනැඟිලි සහ ව්‍යුහයන් සහ ඊට අදාළ ඉඩම) අමාත්‍යවරයා විසින් සමාගමෙන් මාරු කර ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය යටතට පවරා දී ඇත. කෙසේ වෙතත්, සමාගම ව්‍යවස්ථාපිත සේවා සපයන්නෙකු ලෙස 1983 හි සමාගම පිහිටුවන ලද දිනයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා රුපියල් මිලියන 60,141 ක මුදලක් (දේපල, පිරියත සහ උපකරණ සහ නොනිමි වැඩවල ධාරණ වටිනාකම) ගුවන්තොටුපළවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ එකඟතාව ලබා නොගෙන ආයෝජනය කර ඇත. එබැවින් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොඩනැගිලිවල අයිතිය පැහැදිලි නැත.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) 2023 පෙබරවාරි 07 දිනැති අංක අමප/23/0154/604/014 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා රජය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටත්,මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඇමරිකන් ඩොලර් මිලියන 102.4 ට සමාන රුපියල් මිලියන 33,676 විදේශ ණය මුදලට අදාළව ගිණුම් පොත් ගැලපීමත් අවශ්‍ය වේ. තවද රුපියල් මිලියන 2,946 ට සමාන ණය සේවා වාරික මහා භාණ්ඩාගාරයට ගෙවීමට ද අවශ්‍ය වේ. කෙසේ වෙතත්, එම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට සහ ගිණුම් පොත් ගැලපීමට මෙන්ම මහා භාණ්ඩාගාරයට ණය වාරික ගෙවීමට ද සමාගම අපොහොසත් වී ඇත.

(ඇ) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2022 පෙබරවාරි 28 දිනැති ඔවුන්ගේ අංක PMU/BIADP/07(PK/b)/04845/22 ලිපිය මගින් වාහන 19ක් සමාගමට භාර දී ඇත. ඒ අනුව ඉහත වාහනවල මිල තක්සේරු කර සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, ඒවා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) ම.රා.ජා.ගු හි ව්‍යාපාරික විවේකාගාරයට අයත් වත්කම් රුපියල් 25,683,713ක් ගුවන්තොටුපළ ආරම්භයේ සිටම ප්‍රාග්ධනීකරණයකින් තොරව නොනිම් වැඩ ලෙස දක්වා ඇත.

## 1.3 කරුණු අවධාරණය කිරීම

(අ) මම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය (වැය සම්මත අරමුදල) සහ රඳවාගත් ආදායම් අරමුදල සමඟ ඒකාබද්ධ කිරීමේ පදනම පැහැදිලි කරන 2.1.1 සටහන වෙත අවධානය යොමු කරමි. 2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, භාණ්ඩාගාර ලේකම් විසින් 2006 පෙබරවාරි 09 දින අංක PE/GOCO/1/1 ලිපිය මගින් දැනට රජයට අයත් ගුවන්තොටුපළේ ඉඩම සහ ගොඩනැගිල්ල හා සමාගම සතු චංචල සහ නිශ්චල වත්කම් තක්සේරු කරන ලෙස මෙන්ම එවකට ශ්‍රී ලංකා රජය විසින් ගෙවන ලද ගුවන්තොටුපළ සංවර්ධනයට අදාළ ණය පොලී පවරා ගැනීම සහ ශුද්ධ වත්කම් වටිනාකම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීමට සමාගමට නියෝග කර ඇත.

තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාගමේ ඉල්ලීම මත නීතිපතිවරයා විසින් 2010 පෙබරවාරි 08 දිනැති සිය ලිපිය මගින් දැනට පිළිවෙලින් සිවිල් ගුවන්සේවා අධිකාරියට සහ ශ්‍රී ලංකා රජයට අයත් ගුවන්තොටුපළවලට ඉඩම් සහ ගොඩනැගිලි හා අනෙකුත් සියලුම චංචල සහ නිශ්චල වත්කම් පැවරීම සම්බන්ධ බැවින්, නව කැබිනට් අනුමැතියක් ලබා ගන්නා ලෙස උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, මේ දක්වා නව කැබිනට් තීරණයක් ලබා ගැනීමට සමාගම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වසර අවසානයේ ප්‍රමාණාත්මක අනපේක්ෂිත තත්ත්වයන් පැහැදිලි කරන අංක 29 සටහන වෙත මම අවධානය යොමු කරමි. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය පොළී ගෙවීම සම්බන්ධ අතුරු ප්‍රතිපත්තිය" පිළිබඳ 2022 අප්‍රේල් 12 දිනැති චක්‍රලේඛයට අනුව, රජයේ ආයතන විසින් ලබාගෙන ඇති විදේශ ණය පියවීමෙන් වළකින ලෙසට උපදෙස් ලබා දී ඇත. චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) ණය ප්‍රදානය කිරීම නැවැත්වූ බැවින් කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය දිගටම කරගෙන යාම ප්‍රතික්ෂේප කිරීම නිසා මෙය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ II අවධිය අදියර 2 සංවර්ධන ව්‍යාපෘතියේ (A පැකේජය - මගී පර්යන්ත ගොඩනැගිලි සහ ආශ්‍රිත වැඩ ඉදිකිරීම්) සිදුවෙමින් පවතින ඉදිකිරීම්වලට අහිතකර ලෙස බලපෑවේය.

ණය ආපසු ගෙවීම අඛණ්ඩව සිදු කිරීම සම්බන්ධයෙන් ජයිකා ආයතනය මුදල් අමාත්‍යාංශයෙන් සහතිකයක් ද ඉල්ලා ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන හේතුවෙන් එම අනුමැතිය මුදල් අමාත්‍යාංශය විසින් ලබා නොදුන් බැවින්, කොන්ත්‍රාත්කරු වූ තායිසෙයි සමාගම 2022 දෙසැම්බර් 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගු.ගු.සේ.ස සමඟ ගිවිසුම අවසන් කරන ලදී.

වැඩකටයුතු ඉදිරියට ගෙන යාමේ මාර්ගයක් ලෙස, ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, අඩක් නිම කරන ලද ව්‍යුහවල වානේ සවිමත් කිරීම් පිරිහීම පිළිබඳ ගැටළුව විසඳීම සඳහා ඉහත ව්‍යාපෘතියේ හඳුනාගත් වැඩ විෂය පථයක් ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 800 ක ආසන්න පිරිවැය ඇස්තමේන්තුවක් සහිතව ගු.ගු.සේ.ස විසින් සිය අරමුදල් භාවිතා කරමින් කටයුතු ආරම්භ කරන ලදී.

ඊට අමතරව, 2023 මැයි 29 වන දින ජපන් යෙන් 13,608,871,178 සහ රුපියල් 10,045,759,810 ලෙස කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද පරිදි අවසන් කිරීම පිළිබඳ ගෙවීම් ප්‍රකාශය ව්‍යාපෘතිය පිළිබඳ උපදේශකවරයා විසින් ඇගයීමට ලක් කරමින් පවතී. මෙම මුදල කලින් ගෙවන ලද සියලුම අන්තර්කාලීන කාර්ය සාධන සහතිකයන් සහ අත්තිකාරම් ගෙවීම් අඩු කිරීමෙන් පසු වන අතර එයට නොගෙවූ අන්තර්කාලීන කාර්යසාධන සහතිකයන් 5 හා 6 (ජපන් යෙන් 444,498,046 සහ රුපියල් 1,486,804,716 මුදල) ඇතුළු වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඉහත හිමිකම් පෑ මුදලට අමතරව, හිමිකම් අවසන් කිරීම දක්වා කොන්ත්‍රාත්කරුගේ මාසික මෙහෙයුම් පිරිවැය සහ ප්‍රමාද වූ ගෙවීම් සඳහා මූල්‍ය ගාස්තු අවසාන ගෙවීමට ඇති මුදලට උපචිත වේ.

උපදේශකයා විසින් සිදු කරනු ලබන ඉහත හිමිකම් පෑමෙහි දැනට පවතින තක්සේරුව අනුව, හිමිකම් පෑමේ අවසාන තක්සේරු මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 55ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද,විදේශීය ස්ථානවල ද්‍රව්‍ය හා උපකරණ විශාල ප්‍රමාණයක් ඇති අතර ඒවායේ වටිනාකම රු. මිලියන 1,660 ක් වන අතර ඒවායින් බොහොමයක් අර්ධ වශයෙන් නිම කර ඇත. ගු.ගු.සේ.ස හි සභාපතිවරයා විසින් පත් කරන ලද කමිටුවල නිර්දේශය මත සහ උපදේශකයාගේ නිර්දේශය ඇතිව, ඒවා ශ්‍රී ලංකාවට ගෙන ඒම හෝ විදේශයන්හි බැහැර කිරීම පිළිබඳ තීරණය අවසන් වෙමින් පවතී.

අවසන් කරන ලද කොන්ත්‍රාත්කරුට නියමිත ගෙවීම් පියවීමත් සමඟ, A පැකේජයේ වැඩවල ඉතිරිව ඇති සමස්ත විෂය පථය සම්පූර්ණ කිරීමට JICA ණයෙහි ඉතිරි මුදල ප්‍රමාණවත් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස කරගෙන යාමට අමතර අරමුදල් ලබා ගැනීම අවශ්‍ය වේ.

තවද, ව්‍යාපෘතිය අවසන් කිරීමත් සමඟ, සැලසුම් සහ පසු සැලසුම් උපදේශන සේවා සඳහා වන කොන්ත්‍රාත්තුවේ යෝජිත සංශෝධන අංක 3 යටතේ උපදේශකයා විසින් හිමිකම් කියන ලද අතිරේක සේවාවන් වශයෙන් හිමිකම් තක්සේරු කිරීම, නැවත ලංසු තැබීමේ ලේඛන සකස් කිරීම, හඳුනාගත් වැඩ විෂය පථය අධීක්ෂණය කිරීම ඇතුළු අවසන් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා උපදේශකවරයාගේ සේවය රඳවා ගැනීමට සිදු විය.. මෙම හිමිකම් අවසන් කර නොමැති බැවින්, මේ මොහොතේ ප්‍රතිපාදන ලබා නොදීම කළමනාකාරීත්වයේ අදහස වේ.

මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය වෙනස් කර නැත.

## 1.4 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ අඩංගු කර ඇති වෙනත් කරුණු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා විසින් ලබා ගන්නා ලද සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගෙන ඇති අනෙකුත් තොරතුරු මත මා විසින් සිදු කර ඇති කාර්යය මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇති බව මා නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කළ යුතුවේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදක් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### 2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය :

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැර ව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම කළ යුතුයි.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම කළ යුතුයි.

| නීති රීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2015 සහ 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) දරන චක්‍රලේඛයේ 2.3 සහ 3.1 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිලධාරීන් 355 දෙනෙකුට හිමිවිය යුතු සීමාවන් ඉක්මවා ඉන්ධන දීමනා අනුමත කර තිබූ අතර වැඩිපුර ගෙවා ඇති මුදල රුපියල් මිලියන 87.6 කි. |
| (ආ) මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 PFD චක්‍රලේඛයේ 2.6 ඡේදය ("ප්‍රසම්පාදන" ක්‍රියාපටිපාටිය සඳහා e-GP ද්වාරය භාවිතා කිරීම) | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය යටතේ රාජ්‍ය ආයතන විසින් සිදුකිරීමට සැලසුම් කර ඇති සියලුම ප්‍රසම්පාදන ක්‍රමානුකූලව e-GP පද්ධතිය හරහා 2020 ජනවාරි 01 වන දින සිට රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන පටිපාටිය සඳහා e-GP ද්වාරය තවමත් සමාගම විසින් යොදා ගෙන නොමැත. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021 - රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය<br><br>වගන්තිය 2.2.2 (ආ) v | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරීන් පත් කිරීම සහතික කරන අතර 2.1 වගන්තියට අනුව, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO) භූමිකාවන් අදාළ ප්‍රඥප්තිය හෝ සාංගමික ව්‍යවස්ථාවලිය හරහා ඒකාබද්ධ කරන ඕනෑම තැනක, අදාළ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රඥප්තියෙහි හෝ සාංගමික ව්‍යවස්ථාවලියෙ හි සංශෝධනයක් හරහා භූමිකාවන් දෙක බෙදීමට පියවර ගත යුතුය. මෙම පසුබිම මත පදනම්ව, ප්‍රධාන විධායක නිලධාරී සඳහා වැටුප් ව්‍යුහයේ ඉහළ වැටුප් පරිමාණයක් (s-14) වෙන් කළ යුතුය. කෙසේ වෙතත්, අංශ ප්‍රධානියා සඳහා ඉහළ වැටුප් පරිමාණයක් (s-14) වෙන් කරන ලදී. තවද, ප්‍රධාන විධායක නිලධාරියා ඒ වන විටත් පත් කර නොතිබුණි. |
| (ඈ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021 - රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත | |
| (i) 3.2 වගන්තිය (i) | සමාගම විසින් සේවක තනතුරු, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය, වැටුප් ව්‍යුහය සහ දීමනා ඇතුළු සේවක සංඛ්‍යාවට අදාළ ඔවුන්ගේ ඉල්ලීම් අදාළ වන පරිදි රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල් (DGPE) හෝ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් දෙපාර්තමේන්තුව (DGNB) වෙත පිටපත් සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DGMS) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.කෙසේ වෙතත්, සමාගම බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හැර ඉහත අවශ්‍යතා සපුරා නොතිබුණි. පසුව, මුදල්, ආර්ථික, ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2024 ජනවාරි 01 දිනැති අංක PED\S\AASL\1\06(i) ලිපිය මඟින් සම්පූර්ණ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුමත නොකර 2024 ජනවාරි 01 දින සිට වැටුප් ව්‍යුහය සහ දීමනා අනුමත කර ඇත. |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නීති රීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (ii) 3.4 වගන්තිය | බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා යෝජනා ක්‍රම සැකසීමේදී රැකියා විස්තරය, අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද ආදිය ඇතුළත් කිරීම පිළිබඳව සමාගම සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාගම බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට රැකියා විස්තරය සහ බඳවා ගැනීමේ ක්‍රමය ඇතුළත් කර නොතිබුණි. කෙසේ වෙතත්, විගණිතයා විසින් දක්වා ඇති අදහසට අනුව, අලුතින් කෙටුම්පත් කරන ලද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ ඉහත අවශ්‍යතා සපුරා ඇත. |
| (iii) 5.3 වගන්තිය | 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති නුබුන්වත්බව පරීක්ෂාව සෑහීමකට පත් කරමින්, බදු ගෙවීමෙන් පසු ලාභයෙන් අවම වශයෙන් සියයට තිහක් (30) ඒකාබද්ධ අරමුදල/කොටස් හිමියන් වෙත බෙදා හැරිය යුතුය. සමාගම රුපියල් මිලියන 28,121 බදු පසු ලාභයක් වාර්තා කර තිබුණි. 2023 අවසන්වූ වසර සඳහා ඒ අනුව රුපියල් මිලියන 8,436 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට ලබා දිය යුතුය. කෙසේ වෙතත් සමාගම විසින් බෙදාහැර තිබුණේ රු. මිලියන 5,000 ක් වූ අතර ගෙවිය යුතු රුපියල් මිලියන 3,436 බෙදා හැරීම සඳහා ප්‍රතිපාදන සපයා නොතිබුණි. තවද, සමාගම විසින් 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලැබූ ලාභය රු.මිලියන 4,802 ක් වූ අතර ඒ අනුව රුපියල් මිලියන 1,440 ක මුදලක් බෙදා හැරිය යුතුය. නමුත් සමාගම ඒකාබද්ධ අරමුදලට බෙදා දී තිබුණේ රුපියල් මිලියන 1000ක් පමණයි. |
| (iv) 7.1 සහ 7.4 වගන්ති | සියලුම රාජ්‍ය ව්‍යවසායන් හි කාර්යසාධන ඇගයීම් අනිවාර්ය වන අතර ඒවා මඟින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ ඉහත අවශ්‍යතාවලට අනුකූලව ව්‍යාපෘති/කොන්ත්‍රාත්වල භෞතික හා මූල්‍ය ප්‍රගතියට අනුකූලව කාර්ය සාධන ඇගයීම් ස්ථාපිත කිරීමට පහසුකම් සැලසෙන සරල සහ පැහැදිලි යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු අතර මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී පරීක්ෂා කිරීම සඳහා යොමු කළ යුතුය. කෙසේ වෙතත් පවත්වනු ලබන ත්‍රෛමාසික රැස්වීම්වලට , ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාව යොමු කිරීම හැර මාසික මණ්ඩල රැස්වීම් වෙත යොමු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව ප්‍රකාශ කර ඇත.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව ප්‍රකාශ කර ඇත.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 29,593 ක ඇස්තමේන්තුගත වියදමකින් ව්‍යාපෘති 173 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබිණි. එය පවත්නා ව්‍යාපෘති 97 කින්, නව ව්‍යාපෘති 32 කින් සහ නිම කළ ව්‍යාපෘති 44 කින් සමන්විත වේ. සියලුම ව්‍යාපෘති සඳහා සාමාන්‍ය සමුච්චිත ඉලක්කයේ භෞතික ප්‍රගතිය සියයට 67ක් වූ අතර ඉලක්කගත මූල්‍ය ප්‍රගතිය සියයට 67ක් වූ නමුත් සත්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 28ක් සහ සියයට 16ක් විය. තවද, රුපියල් මිලියන 1,842 ක ඇස්තමේන්තුගත වියදමින් යුතු ව්‍යාපෘති 18 ක් කල් දමන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) ඉහත ව්‍යාපෘති/ප්‍රසම්පාදන සඳහා සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

I. අමාත්‍ය මණ්ඩලයේ 2018 ජනවාරි 31 දිනැති අංක අමප/18/0035/709/002ටීබීආර් තීරණය මගින් ගගන යාත්‍රික තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැපයීම සහ ස්ථාපනය කිරීම ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. 2018 මාර්තු 23 වැනි දින යුරෝ 3,367,114 ක් සහ රුපියල් 74,771,034 ක පිරිවැයකට ගිවිසුම අත්සන් කරන ලදී. අංක 10 කොන්ත්‍රාත් කොන්දේසියට අනුව, ණයවර ලිපිය නිකුත් කළ දින සිට තාවකාලික පිළිගැනීමේ සහතිකය නිකුත් කරන දිනය දක්වා කාර්යය සම්පූර්ණ කිරීමේ කාලය මාස 12ක් විය යුතුය, ඒ අනුව, 2018 ජූලි 25 වැනි දින ණයවර ලිපිය විවෘත කරන ලදී. පිළිගැනීමේ සහතිකය 2019 ජූලි 24 දින නිකුත් කළ යුතු වුවත්, එය නිකුත් කර තිබුණේ 2023 ජූනි 23 දින වේ. එම නිසා ව්‍යාපෘතිය වසර 3 යි මාස 10 කට වැඩි කාලයක ප්‍රමාදයක් සහිතව නිම කර ඇත. ඊට අමතරව, කොන්ත්‍රාත් ගිවිසුමේ 11.03 වගන්තියට අනුව ප්‍රමාදයන් සඳහා හිමිකම් පෑමට සමාගම කටයුතු කර නොතිබුණි. කළමනාකාරීත්වය විසින් දක්වන ලද අදහස්වලට අනුව, ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පාස්කු ඉරිදා ප්‍රහාරය සහ කෝවිඩ් වසංගත තත්ත්වය යනාදිය වන බැවින් ඈවර කිරීම සඳහා දඩ පැනවීම ඉතා සදාචාර විරෝධී සහ අසාධාරණ ක්‍රියාවක් වනු ඇති බවයි.

II. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මඟී පර්යන්තයට වෙන් වූ ප්‍රවේශ මාර්ගය
මාර්ග සංවර්ධන අධිකාරියෙන් RDA මාර්ග සංවර්ධන කටයුතු සඳහා ඇස්තමේන්තු ලබා ගැනීමට සහ ඉහත කොන්ත්‍රාත්තුව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ප්‍රදානය කිරීමට බලය පැවරීම සඳහා 2020 පෙබරවාරි 13 දිනැති අංක අමප/20/0184/231/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ගු.ගු.සේ.ස සහ RDA අතර 2020 පෙබරවාරි 10 වන දින රුපියල් 185,819,135 (වැට් බද්ධ සමඟ) ගිවිසුමක් අත්සන් කරන ලදී. කොන්ත්‍රාත් කොන්දේසි අංක 01 අනුව, කොන්ත්‍රාත් කාලය 2019 දෙසැම්බර් 13 සිට මාස හයකි. කොන්ත්‍රාත්තුව අවසන් කර ඇතත්, කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත සකස් කිරීම අවසන් කර නොමැති අතර කාර්ය සාධන සහතිකය නිකුත් කර නොතිබුණි.

III. තාවකාලික පර්යන්ත ගොඩනැගිල්ල
අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 19/1008/105/009 - I, සහ 2019 මාර්තු 18 දිනැති "ප්‍රාදේශීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා පලාලි ගුවන්තොටුපළ සංවර්ධනය කිරීම" පිළිබඳ මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා සංදේශයේ ඇතුළත් යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවලදී, රුපියල් 52,524,271 ක මුදලකට තාවකාලික පර්යන්ත ගොඩනැගිල්ල සඳහා ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියාවලිය යටතේ ලංසු කැඳවන ලෙස සඳහන් කර ඇතත්, කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා කැබිනට් තීරණයට පටහැනිව සීමාසහිත ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය (LNB) අනුගමනය කර තිබුණි.ග

IV. X -කිරණ ගමන් මලු පිරික්සීමේ යන්ත්‍ර සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
2022 මාර්තු 25 දින නිකුත් කරන ලද ප්‍රසම්පාදන අත්පොතෙහි 35 වන අතිරේකයට අනුව, රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) අධිකාරී සීමාවන් රුපියල් මිලියන 200 දක්වා වේ. කෙසේ වෙතත්, X- කිරණ ගමන් මලු පිරික්සීමේ යන්ත්‍ර, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී, රුපියල් මිලියන 240 ක ඇස්තමේන්තුගත මුදලකට යන්ත්‍ර 12 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබූ අතර එම මුදල 2021 අයවැයෙන් වෙන් කරන ලදී. ඒ අනුව ඉහත ප්‍රසම්පාදනයට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) විසින් අවසර දිය යුතුය. අවසාන වශයෙන්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේදී MPC වෙත යොමු නොකර DPC හි අනුමත සීමාව රුපියල් මිලියන 200 ක් වන බැවින් රුපියල් මිලියන 200 ක ඇස්තමේන්තුගත මුදලකට යන්ත්‍ර 10 ක් මිලදී ගැනීමට ආරක්ෂක සේවා අංශය තීරණය කළේය. එබැවින්, ප්‍රසම්පාදනය සිදු කරන ආයතනය විසින් අධිකාරී සීමාවන් උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය විය. කළමනාකාරිත්වය දැක්වූ අදහස් අනුව මෙම ප්‍රසම්පාදනය අනුමැතිය ලබා ගැනීම සඳහා අවසානයේ අමාත්‍යාංශ මට්ටමට යොමු කර ඇති බව සඳහන් වේ.

V. නව චක්‍රීය ගමන් මළු වාහක පද්ධතිය සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
ඉහත ප්‍රසම්පාදනයේ මූලික ප්‍රසම්පාදන කාලසටහනට අනුව 2018 පෙබරවාරි 16 වැනි දින ප්‍රසම්පාදනය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් අවසාන පිළිගැනීමේ සහතිකය 2023 සැප්තැම්බර් 25 දින නිකුත් කර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා ගත වූ කාලය අවුරුදු පහකට වඩා වැඩි බව නිරීක්ෂණය විය. මෙම ප්‍රමාදය හේතුවෙන් රුපියල් මිලියන 70ක් වූ ව්‍යාපෘතියේ මූලික පිරිවැය එය අවසන් වන විට රුපියල් මිලියන 81 දක්වා ඉහළ ගොස් තිබුණි.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

VI. බ.ජා.ගු හි ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

2018 මැයි 16 දිනැති අංක අමප/18/0782/709/027ටිබිආර් අමාත්‍ය මණ්ඩලයේ තීරණය මගින් ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. මූලික කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 14 වන දින අත්සන් කරන ලද්දේ යුරෝ 3,068,000 සහ රුපියල් 127,294,260 ක් සඳහා වේ. කොන්ත්‍රාත් කොන්දේසි අංක 10 අනුව, ණයවර ලිපිය ස්ථාපිත කළ දින සිට තාවකාලික පිළිගැනීමේ සහතිකය නිකුත් කරන දිනය දක්වා සම්පූර්ණ කිරීමේ කාලය මාස 12ක් විය යුතු වුවද, ණයවර ලිපිය විවෘත කරන ලද්දේ 2018 ඔක්තෝබර් 09 වැනිදාය. තාවකාලික පිළිගැනීමේ සහතිකය 2019 ඔක්තෝම්බර් 08 දින නිකුත් කළ යුතුව තිබූ අතර එය තවමත් නිකුත් කර නොමැත. එම නිසා ව්‍යාපෘතිය නිම කිරීම වසර 4කට වැඩි කාලයක් ප්‍රමාද විය. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 11.03 වගන්තිය අනුව ප්‍රමාදය සඳහා හිමිකම් පෑමට සමාගම කටයුතු කර නොතිබුණි. කළමනාකාරිත්වය දැක්වූ අදහස්වලට අනුව පාස්කු ඉරිදා ප්‍රහාරය සහ කොවිඩ් වසංගත තත්ත්වය ආදිය ප්‍රමාද වීමට හේතුවයි.

VII. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි (බ.ජා.ගු) ජාලගත මහජන ඇමතුම් පද්ධතිය සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ඉහත ව්‍යාපෘතියේ මූලික ප්‍රසම්පාදන කාලසටහනට අනුව, ප්‍රසම්පාදනය 2018 නොවැම්බර් 30 දින ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය දක්වා කොන්ත්‍රාත්තුව තවමත් ප්‍රදානය කර නොමැත. මෙම කොන්ත්‍රාත්තුව සඳහා ගත වූ කාලය වසර 05කට වැඩි බව නිරීක්ෂණය විය. මෙම ප්‍රමාදය හේතුවෙන් රුපියල් මිලියන 55ක ප්‍රසම්පාදනයේ මූලික ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 271 දක්වා ඉහළ ගොස් තිබුණි. කළමනාකාරිත්වය විසින් දක්වන ලද අදහස් වලට අනුව, විවිධ හේතු නිසා පෙර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වූ අතර වත්මන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2023 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර තාක්ෂණික ඇගැයීම් කමිටුවේ (TEC) හි අවසන් නිර්දේශ (සාර්ථක ලංසුකරුවෙකු තෝරා ගැනීම) 2024 මාර්තු මාසයේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) වෙත ඉදිරිපත් කරන ලදී.

VIII. ප්‍රසම්පාදන කමිටුවල වගකීම

2006 භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 4.2.3 අදියර 2 (ඇ) ඡේදයට අනුව, ප්‍රසම්පාදන කාලසටහනට එකඟ වූ පසු, ප්‍රසම්පාදන කමිටුව සහ TEC විසින් ප්‍රසම්පාදනය සිදු කරන ආයතන (PE) සමඟ සාකච්ඡා කර ප්‍රගතිය නිරීක්ෂණය කළ යුතුය. විශාල ප්‍රමාදයක් සිදු වූ විට, ප්‍රමාදය සඳහා හේතුව/හේතු පැහැදිලිකොට ඒ සඳහා ප්‍රතිකර්ම යෙදීම ප්‍රසම්පාදන කමිටුවේ වගකීම වේ. කෙසේ වෙතත්, ඉහත ප්‍රසම්පාදන කටයුතුවල විශාල ප්‍රමාදයක් ඇති බව නිරීක්ෂණය විය. එහෙත් අනවශ්‍ය කාල ප්‍රමාදයන් අවම කිරීමට ප්‍රසම්පාදන කමිටුව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

IX. මත්තල ගුවන්තොටුපළේ (ම.රා.ජා.ගු) අඩවි පිරිසිදු කිරීම

ගු.ගු.සේ.ස සහ චයිනා හාබර් ඉන්ජිනියරිං කම්පැනි ලිමිටඩ් අතර අත්සන් කරන ලද කොන්ත්‍රාත්තුවේ II වන වෙළුමේ කොන්ත්‍රාත්තු ලේඛනයේ 11.11 (අඩවි පිරිසිදු කිරීම) වගන්තියට අනුව, “කාර්යසාධන සහතිකය ලැබීමෙන් පසු, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ ඉතිරිව ඇති සියලුම උපකරණ, අතිරික්ත ද්‍රව්‍ය, සුන්බුන්, කසල සහ තාවකාලික වැඩ අඩවියෙන් ඉවත් කළ යුතුය”. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතා මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් භාවිතා කරන පරිශ්‍රවල කුලී ගාස්තු අය කර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

X. බ.ජා.ගු හි ”ආනයන භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල” ඉදිකිරීම

2020 ඔක්තෝබර් 05 වැනි දින කැබිනට් මණ්ඩලයේ තීරණයට අනුව, ඉහත ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්තුව 2020 ඔක්තෝබර් 28 දින ප්‍රදානය කරන ලද අතර, එහි සම්පූර්ණ මුදල රුපියල් 2,367,421,227 + වැට් වූ අතර , ඉදිකිරීම් කාලය දින 730 ක් වන අතර 2021 ජනවාරි 25 වැනි දින වැඩ ආරම්භ කරන ලදී. , මෙම ව්‍යාපෘතිය බ.ජා.ගු හි භාණ්ඩ හැසිරවීමේ වර්ධනය සඳහා ප්‍රමුඛතා ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, කොවිඩ් 19 වසංගතය සහ වෙනත් ආශ්‍රිත ගැටළු හේතුවෙන්, ව්‍යාපෘති පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර, ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මූලික කොන්ත්‍රාත්තු මිල + හදිසි අවස්ථා සඳහා වන 10% තුළ ව්‍යාපෘතිය නිම කළ නොහැක. එබැවින්, ද්‍රව්‍ය මිල ඉහළ යාමේ මෙම ප්‍රවණතාවයත් සමඟ, ව්‍යාපෘතිය අවසන් වන විට ව්‍යාපෘති පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 4,600 දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර එය 2023 ජූලි 05 දිනැති අංක අමප/23/1084/628/050/ටීබීආර් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලදී. කෙසේ වෙතත්, මූලික ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය අවසන් කළ යුත්තේ 2023 ජනවාරි 24 වැනිදාය. පසුව, 2023 අගෝස්තු 29 හෝ ඊට පෙර නිම කිරීමට දෙවතාවක් දීර්ඝ කිරීම් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, භෞතික ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට සියයට 88 ක් වූ අතර 2024 අප්‍රේල් 30 වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නැත.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

## 2.5 වෙනත් කරුණු

(අ) 2023 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 40,104.8 ක (ධාරණ වටිනාකමක් ඇති) දේපළ, පිරියත හා උපකරණවල භෞතික සත්‍යාපනය සිදු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ කමිටු පත් කර ඇති අතර, එහි චංචල වත්කම් රුපියල් මිලියන 3,210.4 ක් සහ රුපියල් මිලියන 36,894.4 ක චංචල නොවන වත්කම් ඇතුළත් වේ. කෙසේ වෙතත්, කමිටු භෞතිකව තහවුරු කර තිබුණේ 2024 මැයි 06 වන විට රු.මිලියන 38.8 කි.

(ආ) සියලුම අංශ සහ අංශ ප්‍රධානීන් විසින් ලබාගත් සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් අදාළ වර්ෂය අවසන් වීමට පෙර පියවිය යුතුය. කෙසේ වෙතත්, වර්ෂය තුළ සහ ඊට පෙර වසර තුළ ලබා ගත් සැපයුම් අත්තිකාරම් රුපියල් මිලියන 37.1 ක් පියවීමකින් තොරව 2024 අප්‍රේල් 30 දිනට ඉතිරිව තිබුණි.

(ඇ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 11 වැනි වගන්තියට අනුව, තක්සේරු වර්ෂය සඳහා ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම ගණනය කිරීමේදී, ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සඳහා කිසිදු අඩු කිරීමකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, ව්‍යාපාරයෙන් බදු ගෙවිය හැකි ආදායම ගණනය කිරීමේදී, සමාලෝචිත වර්ෂය තුළ ණය ආපසු ගෙවීම සඳහා සමාගම විසින් මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රුපියල් මිලියන 1,475 ක මුදලක් IRD වෙතින් විධිමත් අනුමැතියක් ලබා නොගෙන අඩු කර ඇති අතර මෙම ගැලපීම 2011 වසරේ සිට ක්‍රියාත්මක වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022/23 වර්ෂය සඳහා ගෙවන ආදායම් බද්ද රුපියල් මිලියන 442.5 කින් අඩුවෙන් ප්‍රකාශ කර තිබිණි.

(ඈ) 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ රඳවා ගැනීමේ බදු, ගෙවූ ආදායම් බදු සහ සංකල්පීය බදු සම්බන්ධයෙන් 2013/2014 වර්පනම් වර්ෂයේ සිට 2021/2022 දක්වා ලැබිය යුතු ආදායම් බදු ලෙස රුපියල් මිලියන 823.2 ක මුදලක් පෙන්වා ඇත. කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තු අතුරු විගණන වාර්තාවට අනුව, 2023 ජනවාරි 09 දිනැති ප්‍රකාශයේ සවිස්තරාත්මක විගණනයකට යටත්ව මිලියන 571.6 න් රුපියල් මිලියන 321.4 ක මුදලක් ආපසු ලබා දිය හැකි බව තහවුරු කර ඇත. එබැවින් ලැබිය යුතු ආදායම් බදු මිලියන 250ක මුදල අවිනිශ්චිතයි.

(ඉ) බැංකු සැසැඳුම් ප්‍රකාශයේ උපලබ්ධිනොවූ තැන්පතුවක් ලෙස පෙන්වා ඇති රුපියල් මිලියන 14.8 ක මුදලක් ගුවන්තොටුපළ කළමනාකරණ අංශයේ කළමණාකාර සහකාරවරයා ඇතුළුවීමේ බලපත්‍ර නිකුත් කර එකතු කළ මුදලින් සිදු කළ මූල්‍ය වංචාව ට අදාළ වේ. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට මෙම මුදල තවමත් පියවා නැත. කළමනාකාරිත්වයේ අදහසට අනුව, සිදුවීම තවමත් විමර්ශනය වෙමින් පවතින අතර වංචාව සම්බන්ධයෙන් අධිකරණ නඩුවක් විභාග වෙමින් පවතී.

(ඊ) ව්‍යාපෘතිය අත්හිටුවන ලද කාල සීමාව තුළ මගී පර්යන්ත ගොඩනැගිල්ල-II සහ ඒ ආශ්‍රිත වැඩ සඳහා දැරූ රුපියල් මිලියන 184 ක වගකීම් ගාස්තු සහ ව්‍යාපෘති ආශ්‍රිත වියදම් ආර්ථිකමය නොවේ.

(උ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (ම.රා.ජා.ගු) වර්ග අඩි 3,293 ක් වන ස්ථාන හතරක් ම.රා.ජා.ගු ආරම්භයේ සිටම කුලියට දීමෙන් සමාගමට ආදායමක් උපයා ගැනීමට භාවිතා කර නොතිබුණි.

(ඌ) ගුවන් යානා ගොඩබෑම සහ නවත්වා තැබීමේ කටයුතු සඳහා වෙළඳ ණයගැතියන් (ජාත්‍යන්තර) ගෙන් අය විය යුතු වසර 1 සිට 5 දක්වා කාලයක් පුරා හිඟව පවතින රුපියල් 2,077,949,728 ක මුදලක් අයකර ගැනීමට අසමත් ව ඇත. කළමනාකාරීත්වයේ අදහස්වලට අනුව, ශ්‍රීලංකන් ගුවන් සමාගමෙන් පමණක් ගුවන් යානා ගොඩබෑම සහ නැවැත්වීම සඳහා වන පොලී ගාස්තු කපා හැරීමට වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා අනුමැතිය ලබා දී ඇත.

(එ) ගුවන් යානා ගොඩබෑම සහ නවත්වා තැබීමේ කටයුතු සඳහා වෙළඳ ණයගැතියන් (අභ්‍යන්තර) ගෙන් අය විය යුතු වසර 1 සිට 5 දක්වා කාලයක් පුරා හිඟව පවතින රුපියල් 60,317,615ක මුදලක් අයකර ගැනීමට අසමත් ව ඇත. කළමනාකාරීත්වයේ අදහස්වලට අනුව, ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් පමණක් ගුවන් යානා ගොඩබෑම සහ නැවැත්වීම සඳහා වන පොලී ගාස්තු කපා හැරීමට වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා අනුමැතිය ලබා දී ඇත.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඒ) බදු කුලී සඳහා ණයගැතියන් ගෙන් අය විය යුතු වසර 1 සිට 5 දක්වා කාලයක් පුරා හිඟව පවතින රුපියල් 322,831,492 ක මුදලක් අයකර ගැනීමට අසමත් ව ඇත. කළමනාකාරිත්වයේ අදහස්වලට අනුව, ශ්‍රීලංකන් ගුවන් සමාගමෙන් පමණක් කුලී ණයගැතියන් සඳහා පොලී ගාස්තු කපා හැරීමට වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා අනුමැතිය ලබා දී ඇත.

(ඔ) ගුවන් පාලම් සඳහා ණයගැතියන් ගෙන් අය විය යුතු වසර 1 සිට 5 දක්වා කාලයක් පුරා හිඟව පවතින රුපියල් 375,633,848 ක මුදලක් අයකර ගැනීමට අසමත් ව ඇත. කළමනාකාරිත්වයේ අදහස්වලට අනුව, ශ්‍රීලංකන් ගුවන් සමාගමෙන් පමණක් ගුවන් පාලම් සඳහා ණයගැතියන් සඳහා පොලී ගාස්තු කපා හැරීමට වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා අනුමැතිය ලබා දී ඇත.

(ඕ) 2023 වර්ෂය සඳහා එක් සේවකයෙකු සඳහා සියල්ල ඇතුළත් රුපියල් 125,000 ක උපරිම ප්‍රසාද දීමනාවක් 2023 දෙසැම්බර් 11 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද අතර 2023 දෙසැම්බර් 11 දිනැති අංක PED 04/2023 චක්‍රලේඛයේ 2.1 වගන්තියට අනුව, වසර මැද භාගයේදී ඕනෑම ආයතනයක් විසින් තම සේවකයන්ට ගෙවන ඕනෑම දීමනාවක් ප්‍රසාද දීමනාවක් ලෙස සැලකිය හැකි අතර, එය අතිරේක ප්‍රසාද දීමනාවක් සලකා බැලීමට අමාත්‍ය මණ්ඩලය විශේෂ අනුමැතියක් ලබා දී නොමැති නම්, එය වසර අවසානයේ ගෙවන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් ලෙස සැලකිය යුතුය. තවද, සමාගම විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර සටහනේ 4 වන වගන්තියට අනුව, 2023 අප්‍රේල් මාසයේදී සේවකයෙකුට ගෙවන ලද රුපියල් 50,000 ක අතුරු අත්තිකාරම් වැටුපෙන් රුපියල් 5,000 ක වාරිකයක් ලෙස අඩු කිරීමට තීරණය කරන ලදී.(එනම් සේවකයින් 3,569 ක් සඳහා රුපියල් 177,843,750 ක ප්‍රසාද දීමනාවක්). කෙසේ වෙතත්, ඉහත අතුරු දීමනා තවමත් සමාගම විසින් වාර්ෂික ප්‍රසාද දීමනාවෙන් හෝ වැටුපෙන් අඩු කර නොතිබුණි.

(ක) මත්තල මහින්ද රාජපක්ෂ ගුවන්තොටුපළේ (ම.රා.ජා.ගු) කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ ම.රා.ජා.ගු හි මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 2,412.9 ක් වාර්තා කර ඇති අතර එය රුපියල් මිලියන 288 ක් වූ මෙහෙයුම් ආදායමට වඩා 08 ගුණයක් වූ අතර ගුවන්තොටුපළේ මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 2,124.1 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය රුපියල් මිලියන 926.6 ක් වූ අතර එයට ප්‍රධාන වශයෙන් හේතුව වන්නේ විදේශ විනිමය ලාභයේ බලපෑම වේ. 2018 සිට 2023 දක්වා බදු ගෙවීමෙන් පසු සමුච්චිත ශුද්ධ පාඩුව රුපියල් මිලියන 38,489 කි. මත්තල ගුවන්තොටුපළේ අපේක්ෂිත වාර්ෂික මගී ධාරිතාව මිලියනයක් පමණ වුවද, පසුගිය වසර හය තුළ මුළු මගීන් සංඛ්‍යාව 190,750 ක් පමණක් වූ අතර පසුගිය වසර හය තුළ මුළු ගුවන් ගමන් සංඛ්‍යාව 2,182 කි. එබැවින් ගුවන්තොටුපළ ඉදිකිරීම සඳහා දරන ලද ඩොලර් මිලියන 247.7 ට සමාන රුපියල් මිලියන 36,564 ක මුදලක් (මිල ඉහළ යාම සහ වෙනස්වීම් ඇතුළුව) ඵලදායී ලෙස භාවිතා කර නොතිබුණි. තවද, ඉහත ඉදිකිරීම සඳහා මුලින් ලබාගත් ඩොලර් මිලියන 190 ක විදේශ ණය සඳහා වාර්ෂික ණය පොලිය ලෙස ගු.ගු.සේ.ස විසින් රුපියල් මිලියන 1,590 ක මුදලක් ගෙවා තිබුණි.

(ග) කොළඹ රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කාර්යසාධනය, (කො.ර.ජා.ගු)

2018 සිට 2023 දක්වා කො.ර.ජා.ගු - රත්මලාන සමුච්චිත අලාභය රුපියල් මිලියන 2,608 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ පාඩුව රුපියල් මිලියන 38.7 කි. 2020 සිට 2023 දක්වා කාලය තුළ ගුවන් යානා සංචලනයන් ගණන පිළිවෙලින් 13, 13, 38 සහ 86 ක් වූ අතර 2020 සිට 2023 දක්වා කාලය තුළ මගී ගමන් ගණන පිළිවෙළින් 60, 28, 54 සහ 12 විය.

(ජ) යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (යා.ජා.ගු) කාර්යසාධනය

(i) යා.ජා.ගු 2019 ඔක්තෝම්බර් 17 වන දින විවෘත කරන ලදී. කෙසේ වෙතත්, ගුවන්තොටුපළ ආරම්භයේ සිට මගී සංචලන 33,431 ක් සමඟ ගුවන් යානා සංචලනයන් 702 ක් පමණක් සිදු විය. පසුගිය වසර 05 තුළ වාර්තා වූ සමුච්චිත අලාභය ,2023 දී රුපියල් මිලියන 15.4 ක ශුද්ධ ලාභය ඇතුළුව, රුපියල් මිලියන 217.4 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ ආදායම සහ මෙහෙයුම් වියදම් පිළිවෙලින් රුපියල් මිලියන 152.4 ක් සහ රුපියල් මිලියන 137.6 ක් විය.

(ii) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව යාපනය ගුවන් තොටුපළ කලාපීය වශයෙන් ජාත්‍යන්තර ගුවන්තොටුපළක් ලෙස සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ 2019 ජූනි 13 දිනැති අංක AE/1/3/(CA/19/162) ලිපිය මගින් ගු.ගු.සේ.ස වෙත උපදෙස් ලබා දී තිබුණි. එම ලිපියට අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරන ලද කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශ අනුව යාපනය ගුවන්තොටුපළ අදියර 03කින් වහාම ක්‍රියාත්මක වන පරිදි සංවර්ධනය කිරීමට තීරණය විය. ඒ අනුව දෙවන අදියරේ සංවර්ධන කටයුතු වහාම ආරම්භ කර 2019 දෙසැම්බර් 01 දිනෙන් අවසන් කළ යුතුය. කෙසේ වෙතත් සංවර්ධන කටයුතු තවමත් ආරම්භ කර නොතිබුණි.

(iii) අලෙවිකරණ සහ සන්නිවේදන අංශය විසින් 2020-2024 කාලය සඳහා සකස් කරන ලද සමාගමේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට අනුව, නව ගුවන් සමාගම් ආකර්ෂණය කර ගැනීමට සහ යා.ජා.ගු වෙත පැමිණෙන ගුවන් සමාගම්වල ගමන් වාර ගණන වැඩි කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, යා.ජා.ගු හි ක්‍රියාත්මක වන්නේ එක් ගුවන් සමාගමක් පමණි. තවද, යා.ජා.ගු හි දෛනික මගීන්ගේ පැමිණීමේ සහ පිටවීමේ තොරතුරු විශ්ලේෂණය කිරීමේදී, JIA හි ආදායම වැඩි කිරීම සඳහා දැනට පවතින ගුවන් සමාගම්වල ගමන් වාර ගණන වැඩි කිරීමට හෝ නව ගුවන් සමාගම් ආකර්ෂණය කර ගැනීමට සවිස්තරාත්මක අලෙවිකරණ සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

(ට) මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කාර්ය සාධනය ( ම.ජා.ගු)

මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ 2018 මාර්තු 25 වැනි දින සිවිල් වැසියන් සඳහා නැවත විවෘත කර ඇති අතර පසුගිය වසර පහ තුළ ආදායමක් උපයා නොගෙන මෙහෙයුම් වියදම් ලෙස රුපියල් මිලියන 86.6ක් වැය කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ ඉපැයූ ආදායම රු. 585,600 ක් වූ අතර මෙහෙයුම් වියදම් රු.18,997,068 ක් විය.

(ඩ) මත්තල නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ පූර්ණ අලුත්වැඩියාව (MRO)

2013 අගෝස්තු 28 දිනැති අංක CP/13/1254/545/011-I අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සහ 2013 සැප්තැම්බර් 05 දිනැති කැබිනට් තීරණය අනුව ඉහත ව්‍යාපෘතිය සඳහා පරිපූරක ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබා දී ඇත. එහි මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් 122,030,389 කි. ඒ අනුව, සීමාසහිත චයිනා හාබර් ඉංජිනියරින් සමාගම (CHEC) සමඟ ම.රා.ජා.ගු සඳහා අත්සන් කරන ලද ප්‍රධාන ගිවිසුම් වලට පරිපූරක ගිවිසුමකට ගු.ගු.සේ.ස විසින් 2013 සැප්තැම්බර් 06 වැනි දින (හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව 2009 නොවැම්බර් 27 දින අත්සන් කරන ලද) එළඹ ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) පරිපූරක ගිවිසුමේ අංක 01 වගන්තියට අනුව, ගිවිසුම ක්‍රියාත්මක වන්නේ මහජන චීන සමූහාණ්ඩුවේ රජය විසින් එම ගිවිසුම සඳහා ශ්‍රී ලංකා රජයට පිළිගත හැකි ණය ප්‍රතිපාදන ලබා දීමෙන් පසුව සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්කරුට දැනුම් දෙන දිනයක පමණි. කටයුතු. කෙසේ වෙතත්, ගු.ගු.සේ.ස ඉහත පහසුකම ලබාගෙන නොතිබුණි. එබැවින් ඉහත ව්‍යාපෘතිය සඳහා වාණිජ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේදී කොන්දේසියක් ලෙස චීනයේ EXIM බැංකුව සමඟ සහන ණය සමාගම විසින් ලබාගෙන නොතිබූ බැවින් ගිවිසුමේ පාර්ශ්ව ගිවිසුමට බැඳී නොතිබුණි. පසුව, සමාගමේ සභාපතිවරයා විසින් 2013 ඔක්තෝබර් 03 දින CHEC වෙත ආරම්භ කිරීමේ නියෝගයක් නිකුත් කර ඇති අතර, ඒ අනුව, CHEC විසින් ගිවිසුම වලංගු නොකර මගී පර්යන්ත ගොඩනැගිල්ලේ (PTB) නව විවේකාගාරයක් ඉදිකිරීම ආරම්භ කර ඇත.

(ii) CHEC විසින් 2016 සැප්තැම්බර් 04 වැනි දින ඇමෙරිකානු ඩොලර් 4,499,635 සඳහා අංක 01 දරන අතුරු ගෙවීම් අයදුම්පත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් පත් කළ කමිටුව CHEC විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් පෑමේ විෂමතාවයක් ඇති බව සටහන් කර තිබුණි. තවද, CHEC විසින් ප්‍රමාද වූ පොලිය ලෙස ඇමරිකානු ඩොලර් 4,936,069 ක මුදලක් ඉල්ලා තිබුණි. අංක MMEZD/AV/04/AASL-MRIADEV ලිපිය මගින් සංචාරක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුව විසින් ලබා දුන් තීරණයට අනුව සහ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු නැවත තක්සේරු කිරීමේ පරිපූරක වාර්තාව මඟින්, බිල්පත් වටිනාකම රු 565,491,077 ට සමාන ඇමරිකානු ඩොලර් 1,650,378 ක වටිනාකම කමිටුව විසින් නිර්දේශ කරන ලදී. අවසාන වශයෙන්, ගු.ගු.සේ.ස විසින් CHEC වෙත ඉහත මුදල ඉංජිනේරුවරයාගේ සහතිකයකින් තොරව වාරික තුනකින් ගෙවීමට එකඟ වී “ලැබිය යුතු මුදල (Quantum of Merit)” යන පදනම මත ගෙවා ඇති අතර ප්‍රමාද වූ පොලිය නොගෙවීමට ඒකඟ විනි. කෙසේ වෙතත්, ඉහත ඒවා අතරින් රුපියල් 187,603,537 (ඇමරිකානු ඩොලර් 547,524) ක මුදලක් පිරිමැසුම්දායක නොවන බවක් නිරීක්ෂණය විය. මක්නිසාද යත්, බොහෝ සැලසුම් අද සන්දර්භයට නොගැලපෙන අතර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් තවමත් ආරම්භ කර නොතිබුණි.

(iii) 2013 අගෝස්තු 28 දිනැති අංක CMN/13/1254/545/011-1 කැබිනට් තීරණයට අනුව, මෙම අතිරේක වැඩ කොන්ත්‍රාත්තුව ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස අනුමත කිරීම සඳහා ලැයිස්තුගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට සහ නම් කරන ලද කොන්ත්‍රාත්කරු බදු ගෙවීමෙන් නිදහස් කිරීමට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය පැවරීමට කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. තවද එය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් ද ඔහුගේ නිරීක්ෂණය යටතේ යෝජනා කරන ලදී. එසේ වුවද, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තියට අනුව බද්දෙන් නිදහස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එබැවින්, බද්දෙන් නිදහස් කිරීමේ හැකියාව තිබියදීත්, 2023 ජූලි 28 වන දින කොන්ත්‍රාත්කරුට ඇමෙරිකානු ඩොලර් 247,556 ට සමාන රුපියල් 79,386,492 ක මුදලක් ගෙවා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ
විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(iv) මේ සම්බන්ධයෙන් යාන්ත්‍රික ඉංජිනේරු අංශය විසින් කරන ලද පහත සඳහන් නිර්දේශ පිළිබඳව සමාගමේ සභාපතිවරයා 2023 ජූලි 18 දිනැති තම ලිපිය මගින් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයාට දන්වා තිබුණි.

- CHEC විසින් ගිනි නිවීමේ ජාලයේ සියලුම කාන්දුවීම් නිවැරදි කර වසරක කාලයක් සඳහා අවම පිළිගත හැකි කාන්දුවීම් සහිතව ක්‍රියාත්මක වන්නේ නම් වැට් බදු ගෙවීම නිර්දේශ කළ හැක.
- ඉහත අවශ්‍යතාවය සම්පූර්ණ කළ නොහැකි නම්, සම්පූර්ණ ගිනි නිවීමේ ජාලාවම CHEC මගින් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවනු ඇත, ඒ සඳහා පිරිවැය රු. මිලියන 800 කි.

කෙසේ වෙතත්, සමාගම 2023 ජූලි 28 වන දින ඉහත නිර්දේශ නොසලකා රුපියල් 79,386,492 ක වැට් බදු ගෙවීම නිකුත් කර ඇත.

(v) ඉහත බිල්පත් ගෙවීම් සඳහා ඉල්ලීම 2016 දී ඉදිරිපත් කළද, බිල්පත් ගෙවීම සිදු කරන ලද්දේ 2022 සහ 2023 දී. බිල්පත් ගෙවීමට තීරණය කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් 146.03 ක් වූ ඩොලර් 1 ක විනිමය අනුපාතය එය පියවන විට ඇමෙරිකානු ඩොලර් 1කට රුපියල් 360 දක්වා වැඩි වී තිබුණි. එබැවින් එම සමාගමට රුපියල් මිලියන 324.5 ක පාඩුවක් දැරීමට සිදු විය.

(ණ) A පැකේජය - මඟී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ආශ්‍රිත කටයුතු.

ඉහත ඉදිකිරීම් කටයුතු 2020 මාර්තු 04 වන දින ජපානයේ කොන්ත්‍රාත්කරු වෙත ලබා දී ඇති අතර 2020 මාර්තු 12 වන දින ගිවිසුම අත්සන් කර 2020 මාර්තු 25 වන දින කාර්ය සාධන ආරක්ෂාව ලබා දී ඇත. කෙසේ වෙතත්, කළමනාකරණය විසින් ප්‍රකාශ කරන ලද කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ කටයුතු මාස 09 ක ප්‍රමාදයකින් 2020 දෙසැම්බර් 15 වන දින ආරම්භ කරන ලදී. තවද, කොන්ත්‍රාත්කරුගේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සියයට 30ක් විය යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ සැබෑ ප්‍රගතිය වූයේ සියයට 5.38 ක් පමණි. 2022 අප්‍රේල් 12 වැනි දින මුදල් අමාත්‍යාංශය විසින් විදේශ ණය සේවා සැපයීම සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන්, ආධාර දෙන රට විසින් ණය යටතේ සියලුම ගෙවීම් අත්හිටුවන ලදී. ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් ලෙස, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, රුපියල් මිලියන 800 ක දළ ඇස්තමේන්තුවක් සහිතව හඳුනාගත් වැඩ විෂය පථයක් සිදු කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

ව්‍යාපෘතියේ හඳුනාගත් විෂය පථයක් සිදුකිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීමේදී පහත නිරීක්ෂණ සිදු කරනු ලැබිණ.

(i) මුලදී, ගොනුවේ ඇතුළත් තොරතුරු අනුව ඉහත කොන්ත්‍රාත්තුව සකස් කර ජාතික තරඟකාරී ලංසු තැබීමේ පටිපාටිය හරහා ලංසු කැඳවීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම 2023 පෙබරවාරි 03 වැනි දින පැවති සිය රැස්වීමේදී ඉහත ප්‍රසම්පාදනය සඳහා CANC විසින් ගනු ලැබූ තීරණය සඳහන් කරමින් ලංසුකරුවන් දෙදෙනෙකුගෙන් සීමිත ලංසු කැඳවා තිබුණි.10% හදිසි අවස්ථා සඳහා වෙන් කිරීමද ඇතුළුව ඉහත වැඩ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 275 කි.

(ii) ව්‍යාපෘති ප්‍රධානියා 2023 මාර්තු 01 දිනැති ඔහුගේ අංක BIADP/P1152/4307/01 (PK.A) - 1052 ලිපිය මගින් උපදේශකයාගේ ඉංජිනේරුවන් වෙත දන්වා ඇත්තේ එක් කොන්ත්‍රාත්කරුවෙකුගෙන් පමණක් පමණක් රුපියල්. 640,276,768 කට ලංසුවක් ලැබුණු අතර මෙම මිල ඉංජිනේරු ඇස්තමේන්තුව රුපියල් 365,276,768 කින් ඉක්මවා ඇති බවයි. තවද, උපදේශකයාගේ ඉංජිනේරු නියෝජිතයා විසින් ඔහුගේ 2023 මාර්තු 07 දිනැති අංක IAS-NK/PMU/Pk A/23/1557 ලිපිය අනුව ලංසු මිල ඉංජිනේරුගේ ඇස්තමේන්තුවට වඩා සියයට 100කින් වැඩි බව ඉස්මතු කර දක්වයි. කෙසේ වෙතත්, සාකච්ඡාවලින් පසුව, සියයට 2.5ක වට්ටමක්, සියයට 4.7ක හදිසි අවස්ථා සහ වැට් බද්ද ඇතුළුව රුපියල් 475,125,137ක මුළු වියදමක් දක්වමින් 2023 මැයි 31 දින පිළිගැනීමේ ලිපිය නිකුත් කරන ලදී. ඉංජිනේරු ඇස්තමේන්තුව හා සසඳන විට කොන්ත්‍රාත් මිලෙහි විචලනය සියයට 73 කින් වැඩි බව නිරීක්ෂණය විය. අනතුරුව, 2023 ඔක්තෝබර් 11 දිනැති අංක 23/1969/628/096 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව, 2023 මාර්තු 8 දිනැති අංක 23/0191/628/013 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ආයතනයේ අරමුදල් භාවිතා කොට කුඩා පරිමාණයෙන් ව්‍යාපෘතියේ ප්‍රමුඛතා කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඊට අමතරව, ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාගම විසින් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ඉහත වැඩ සහ ප්‍රමුඛතා කාර්යයේ ඉංජිනේරු ඇස්තමේන්තුව රුපියල් මිලියන 3,300 + වැට් බද්ධ විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ත) ගුවන්තොටුපොළවල ලෝක ශ්‍රේණි ගත කිරීම්

එයාර්පෝට් කවුන්සිල් ඉන්ටර්නැෂනල් (ACI) වර්ල්ඩ් විසින් 2018 වසරේ ලොව ගුවන්තොටුපළ පිළිබඳව නිකුත් කරන ලද තොරතුරුවලට අනුව, ලොව ගුවන්තොටුපළ 2583 න් ශ්‍රී ලංකාව මුළු සංචලනය අනුව 370 වැනි ස්ථානයේද, සමස්ත මගීන් ගණන අතින් 205 වැනි ස්ථානයේද සමස්ත භාණ්ඩ ප්‍රවාහනය අතින් 89 වන ස්ථානය පසුවේ. කෙසේ වෙතත්, 2022 වසරේ ACI වාර්තාවට අනුව, ගුවන්තොටුපළ 2,677 න්, ශ්‍රී ලංකාව සමස්ත සංචලනය අනුව 548 වන ස්ථානයේද, සමස්ත මගීන් සංඛ්‍යාව අනුව 292 වන ස්ථානයේද, සහ සමස්ත භාණ්ඩ ප්‍රවාහනය අතින් 116 වන ස්ථානයේද විය. 2018 සංඛ්‍යා සමඟ සසඳන විට ලෝක ශ්‍රේණිගත කිරීම අතින් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය. කළමනාකාරිත්වය විසින් දක්වන ලද අදහස්වලට අනුව පාස්කු ඉරිදා ප්‍රහාරය සහ කොවිඩ් වසංගත තත්ත්වය යනාදිය මෙම ශ්‍රේණිගත කිරීම් අතින් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

(ද) ආසියා ශාන්තිකර කලාපයේ ගුවන්තොටුපොළ ශ්‍රේණි ගත කිරීම්

එයාර්පෝට් කවුන්සිල් ඉන්ටර්නැෂනල් (ACI) වර්ල්ඩ් විසින් 2018 වසරේ ලොව ගුවන්තොටුපළ පිළිබඳව නිකුත් කරන ලද තොරතුරුවලට අනුව, ආසියා ශාන්තිකර කලාපයේ ගුවන් තොටුපළ 852 න් ශ්‍රී ලංකාව මුළු සංචලනය අනුව 104 වැනි ස්ථානයේද, සමස්ත මගීන් ගණන අතින් 78 වැනි ස්ථානයේද සමස්ත භාණ්ඩ ප්‍රවාහනය අතින් 34 වන ස්ථානය පසුවේ. කෙසේ වෙතත්, 2022 වසරේ ACI වාර්තාවට අනුව, ගුවන්තොටුපළ 2,483 න්, ශ්‍රී ලංකාව සමස්ත සංචලනය අනුව 109 වන ස්ථානයේද, සමස්ත මගීන් සංඛ්‍යාව අනුව 76 වන ස්ථානයේද, සහ සමස්ත භාණ්ඩ ප්‍රවාහනය අතින් 30 වන ස්ථානයේද විය. 2018 සංඛ්‍යා සමඟ සසඳන විට ලෝක ශ්‍රේණිගත කිරීම අතින් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය.කළමනාකාරිත්වය විසින් දක්වන ලද අදහස්වලට අනුව පාස්කු ඉරිදා ප්‍රහාරය සහ කොවිඩ් වසංගත තත්ත්වය යනාදිය මෙම ශ්‍රේණිගත කිරීම් අතින් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**ඩබ්ලියු පී සී වික්‍රමරත්න**
විගණකාධිපති

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්වේ)

| | | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|---|
| | සටහන් | 2023 | 2022 |
| ආදායම | 5 | 38,245,784,487 | 25,936,398,684 |
| වෙනත් ආදායම් | 6 | 130,045,148 | 1,640,400,773 |
| | | 38,375,829,636 | 27,576,799,457 |
| පරිපාලන සහ ආයතන වියදම් | 7 | (19,061,158,765) | (14,941,498,625) |
| **මෙහෙයුම් ලාභය** | | 19,314,670,871 | 12,635,300,832 |
| මූල්‍ය ආදායම | | 10,428,195,594 | 6,206,671,289 |
| මූල්‍ය පිරිවැය | | 3,896,212,133 | (12,408,946,131) |
| ශුද්ධ මූල්‍ය ආදායම/(පිරිවැය) | 8 | 14,324,407,728 | (6,202,274,842) |
| **බදු පෙර ලාභය** | | 33,639,078,598 | 6,433,025,990 |
| ආදායම් බදු වියදම් | 9 | (5,517,423,668) | (1,630,328,423) |
| **වසර සඳහා ලාභය** | | 28,121,654,931 | 4,802,697,567 |
| කොටසක මූලික ඉපැයුම් | 10 | 140,607 | 24,013 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීමේ උපකල්පනවල වෙනස්වීම්වලින් පැන නගින (අලාභය)/ලාභය | 23 | (296,536,179) | (366,067,192) |
| ආයුගණන ලාභය/(අලාභය) මත විලම්බිත බදු | 13 | 88,960,854 | 87,856,126 |
| **වෙනත් මුළු විස්තීර්ණ ආදායම්** | | (207,575,325) | (278,211,066) |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | 27,914,079,606 | 4,524,486,501 |

පිටු අංක 92 සිට 120 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්වේ)

| | | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|
| | සටහන් | 2023 | 2022 |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 11 | 36,177,294,374 | 39,630,716,596 |
| ආයෝජන දේපළ | 11 | 3,927,460,603 | - |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | 11 | 38,443,670,909 | 36,697,665,852 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | 162,669,883 | 15,931,315 |
| විලම්බිත බදු වත්කම් | 13 | 3,509,712,949 | 3,104,834,912 |
| | | 82,220,808,717 | 79,449,148,675 |
| **දිගු කාලීන ආයෝජන** | | | |
| දිගු කාලීන ණය | | 10,388,500 | 11,588,500 |
| දිගු කාලීන ණයකරවල ආයෝජන | 14.1 | 2,199,300,000 | 1,999,300,000 |
| දිගු කාලීන බැංකු තැන්පතු | 14.2 | - | 6,962,540,843 |
| සමාගම් නිලධාරීන් වෙත ලබා දුන් ණය | 16.1 | 102,362,282 | 68,338,785 |
| | | 2,312,050,782 | 9,041,768,128 |
| **ජංගම වත්කම්** | | | |
| බඩු තොග | 15 | 3,509,400,475 | 2,246,363,918 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 16 | 11,811,961,572 | 8,734,298,691 |
| ලැබිය යුතු ආදායම් බදු | 26 | - | 91,084,038 |
| කෙටි කාලීන ණයකරයන්හි ආයෝජන | 14.1 | 800,000,000 | 1,299,000,000 |
| කෙටි කාලීන බැංකු තැන්පතු | 14.2 | 87,716,805,396 | 78,025,787,863 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 17 | 3,171,397,540 | 642,335,995 |
| | | 107,009,564,983 | 91,038,870,506 |
| **මුළු වත්කම්** | | 191,542,424,482 | 179,529,787,310 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 18 | 20,000,200 | 20,000,200 |
| සංචිත | 19 | 6,846,530,966 | 6,848,033,247 |
| රඳවා ගත් ඉපැයුම් | 20 | 60,744,660,339 | 38,389,121,467 |
| | | 67,611,191,506 | 45,257,154,913 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ණය ගැනීම් | 21 | 69,992,369,357 | 93,028,636,038 |
| ණයකර | 22 | 4,000,000,000 | 4,000,000,000 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 23 | 6,993,907,655 | 5,877,345,342 |
| විලම්බිත බදු වගකීම | 13 | 9,211,489,732 | 9,264,909,416 |
| විලම්බිත රජයේ ප්‍රදාන | 24 | 1,385,811,815 | 907,164,185 |
| | | 91,583,578,558 | 113,078,054,980 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 25 | 10,401,426,966 | 7,950,084,768 |
| ණය ගැනීම් | 21 | 19,922,064,751 | 13,244,492,649 |
| ගෙවිය යුතු ආදායම් බදු | 26 | 2,024,162,700 | - |
| | | 32,347,654,417 | 21,194,577,417 |
| **මුළු වගකීම්** | | 123,931,232,975 | 134,272,632,397 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 191,542,424,482 | 179,529,787,310 |

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශනය 2024 මැයි 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි.

සභාපති

අධ්‍යක්ෂ

මුදල් ප්‍රධානී

පිටු අංක 92 සිට 120 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි.

# හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්වේ)

| | සටහන් | ප්‍රකාශිත ප්‍රාග්ධනය | වෙනත් සංචිත | රඳවා ගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|---|
| 2022 ජනවාරි 1 වන දිනට ශේෂය | | 20,000,200 | 6,846,183,247 | 34,448,138,251 | 41,314,321,698 |
| පෙර වර්ෂය හා ගැළපුම් | | - | - | (81,653,286) | (81,653,286) |
| වසර සඳහා ලාභය | | - | - | 4,802,697,567 | 4,802,697,567 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ | | | | | |
| බැඳීම්වල ආයුගණන අලාභය | | - | - | (366,067,192) | (366,067,192) |
| ආයුගණන ලාභය මත විලම්බිත බදු | | - | - | 87,856,126 | 87,856,126 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | - | - | (278,211,066) | (278,211,066) |
| **මුළු විස්තීර්ණ ආදායම** | | - | - | 4,524,486,501 | 4,524,486,501 |
| ගෙවූ ලාභාංශ | 28 | - | - | (500,000,000) | (500,000,000) |
| සංචිත හිණුමට මාරු කිරීම | | - | 1,850,000 | (1,850,000) | - |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **20,000,200** | **6,848,033,247** | **38,389,121,466** | **45,257,154,914** |
| 2023 ජනවාරි 1 දිනට ශේෂය | | 20,000,200 | 6,848,033,247 | 38,389,121,466 | 45,257,154,914 |
| පෙර වර්ෂය හා ගැළපුම් | | - | - | (60,043,013) | (60,043,013) |
| වසර සඳහා ලාභය | | - | - | 28,121,654,931 | 28,121,654,931 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ | | | | | |
| බැඳීම්වල ආයුගණන අලාභය | | - | - | (296,536,179) | (296,536,179) |
| ආයුගණන ලාභය මත විලම්බිත බදු | | - | - | 88,960,854 | 88,960,854 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | - | - | (207,575,325) | (207,575,325) |
| **මුළු විස්තීර්ණ ආදායම** | | - | - | 27,914,079,606 | 27,914,079,606 |
| ගෙවූ ලාභාංශ | 28 | - | - | (5,500,000,000) | (5,500,000,000) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | | - | (5,612,281) | 5,612,281 | - |
| සංචිත හිණුමට මාරු කිරීම | | - | 4,110,000 | (4,110,000) | - |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **20,000,200** | **6,846,530,966** | **60,744,660,339** | **67,611,191,508** |

පිටු අංක 92 සිට 120 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්වේ)

| | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| | | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු වියදමට පෙර ලාභය | | 33,639,078,598 | 6,433,025,990 |
| **ගැළපුම්:** | | | |
| ක්ෂය වීම් | 11 | 2,112,941,365 | 2,354,707,348 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 12 | 8,301,847 | 12,086,369 |
| පෙර වර්ෂයේ ක්ෂය වීම්/ක්‍රමක්ෂය ගැළපුම් | 11-12 | - | 16,674,876 |
| දේපළ, පිරියත සහ උපකරණ මාරු කිරීම් සඳහා ගැළපුම් | 11-12 | 1,065,965,556 | 410,106,958 |
| වත්කම් ඉවත් කිරීම | | 6,610,000 | - |
| ලියා හරින ලද වත්කම්/ බැහැර කිරීම්/ පරිත්‍යාග | 11-12 | (528,765,646) | 516,596 |
| ණය පරිවර්තනය මත විනිමය (ලාභය)/ අලාභය | 8 | (15,204,613,135) | 43,977,059,211 |
| ස්ථාවර තැන්පතු පරිවර්තනය මත විනිමය (ලාභය)/ අලාභය | 8 | 8,467,336,122 | (32,015,382,717) |
| ආයෝජන වෙතින් ලද ආදායම | 8 | (10,366,420,837) | (6,110,206,527) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද අලාභය/(ලාභය) | | - | (1,121,060) |
| පෙර වර්ෂය හා ගැළපුම් | 20 | (60,043,013) | (81,653,286) |
| විලම්බිත රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය/ලැබීම් | 24 | 478,647,630 | (49,507,184) |
| මූල්‍ය පිරිවැය | 8 | 2,225,201,499 | 1,854,365,149 |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සඳහා ප්‍රතිපාදන | 23 | 1,395,653,571 | 1,136,495,208 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | | 23,239,893,558 | 17,937,166,931 |
| බඩු තොග (වැඩි වීම)/ අඩු වීම | | (1,263,036,556) | (1,438,178,634) |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ හි (වැඩි වීම)/ අඩු වීම | | (1,182,133,721) | (2,389,908,897) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ හි වැඩි වීම/ (අඩු වීම) | | 1,729,356,384 | 3,461,203,011 |
| මෙහෙයුම්වලින් උපයන ලද මුදල් | | 22,524,079,664 | 17,570,282,412 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් | 23 | (575,627,437) | (462,956,225) |
| පොලී ගෙවීම් | | (1,503,215,684) | (1,003,285,606) |
| ආදායම් බදු ගෙවීම් | 26 | (3,771,513,797) | (120,214,592) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් උපයන ලද ශුද්ධ මුදල්** | | 16,673,722,746 | 15,983,825,986 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | 11 | (4,876,794,714) | (7,015,703,468) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 12 | (155,040,414) | (16,674,876) |
| ණයකරවල ශුද්ධ ආපසු ගැනීම් | 14 | 299,000,000 | 790,000,000 |
| බැංකු තැන්පතුවල ශුද්ධ (ආයෝජන) | | (11,195,812,812) | (10,191,134,919) |
| ක්‍රීඩා සමාජයෙන් අයකර ගත් ණය | | 1,200,000 | 1,200,000 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම | | - | 1,327,879 |
| පොලී ලැබීම් | | 8,470,891,677 | 3,611,801,476 |
| කාර්ය මණ්ඩල ණය ප්‍රදාන | | (126,536,520) | (90,623,661) |
| කාර්ය මණ්ඩල ණය ලැබීම් | | 92,513,023 | 83,887,082 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් උපයන ලද ශුද්ධ මුදල්** | | (7,490,579,760) | (12,825,920,487) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | |
| ලාභාංශ ගෙවීම් | 28 | (5,500,000,000) | (500,000,000) |
| ණය ලැබීම් | 21 | 321,109,644 | 2,544,341,074 |
| ණය ආපසු ගෙවීම් (දේශීය) | 21 | - | (266,666,666) |
| ණය ආපසු ගෙවීම් (විදේශීය) | 21 | (1,475,191,088) | (4,706,288,922) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් (භාවිත කරන ලද)/ උපයන ලද ශුද්ධ මුදල්** | | (6,654,081,444) | (2,928,614,514) |
| **මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩි වීම/ (අඩු වීම)** | | 2,529,061,545 | 229,290,986 |
| **වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ** | 17 | 642,335,995 | 413,045,010 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | 17 | 3,171,397,540 | 642,335,995 |

පිටු අංක 92 සිට 120 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

## 1 ආයතනික තොරතුරු

### 1.1 පොදු තොරතුරු

ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ('සමාගම') ශ්‍රී ලංකාවේ සංස්ථාපිත නේවාසික පෞද්ගලික සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි පිහිටා ඇත.

### 1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ගුවන්තොටුපළ කළමනාකරණය, අභ්‍යන්තර ගුවන් යානා සහ ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) හරහා පියාසර කරන ගුවන් යානා සඳහා ගුවන් යාන්ත්‍රණ සේවා සහ ගුවන්තොටුපළ පරිශීලකයින්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් සැපයීම යි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනයන් නිකුත් කිරීම සඳහා 2024 මැයි 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුකූලව අනුමැතිය ලබාදෙන ලදී.

## 2 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අනුගමනය කළ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විට මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කළ සියලුම වසර සඳහා නිරතුරුවම යොදාගෙන ඇත.

### 2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKAS) අනුව සහ ඒවාට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. සමහර මූල්‍ය වත්කම් සහ වගකීම් සාධාරණ තක්සේරුව සහ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්තමාන වටිනාකම අනුව හඳුනා ගැනීම වෙනස් කරන ලද අතර ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය විසින් ඔවුන්ගේ තීන්දුව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර, සටහන 4 හි අනාවරණය වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූල වේ.

### *2.1.1 ඒකාබද්ධ කිරීම*

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ ඒකාබද්ධ තත්ත්වය ඉදිරිපත් කරන අතර මෙමගින්:

අ) ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන නියෝජනය කරන වැය ශීර්ෂ අරමුදල; හා

ආ) රඳවාගත් ආදායම් අරමුදලද ඇතුළත් වේ.

මෙය නීතිපතිවරයාගේ මතයක් බලාපොරොත්තුවෙන් 2011 වසර දක්වා වෙන වෙනම සකස් කර ඉදිරිපත් කරන ලදී.

2005 අගෝස්තු 17 දිනැති කැබිනට් අනුමැතියෙන් ලබා දුන් කැබිනට් සංදේශයේ 3.5 ඡේදය යටතේ සඳහන් වන ව්‍යවස්ථාපිත සංශෝධන ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස සමාගම සිවිල් ගුවන් සේවා අධිකාරියට කළ ඉල්ලීමකට අනුව අවශ්‍ය ව්‍යවස්ථාදායක සංශෝධන සමඟ ගුවන් තොටුපළේ වත්කම් සහ වගකීම් සමාගම සමඟ ඒකාබද්ධ කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නීතිපතිවරයාගේ මතය විමසා ඇත.

ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා අවශ්‍ය වූයේ පෙර පැවති ගුවන්තොටුපළ අධිකාරිය සතුව තිබූ වත්කම් වලින් කොටසක පමණක් හිමිකාරීත්වය 1983 වසරේ දී සමාගම පිහිටුවීමත් සමඟ සමාගමට පැවරීමත් ඉතිරි වත්කම් හා වගකීම් සමඟ ගුවන්තොටුපළ අධිකාරිය විසුරුවා හැරීමත් සමඟ වැය ශීර්ෂ සහ රඳවාගත් ආදායම් අරමුදල් යටතේ ගිණුම්ගත කර ඇත.

අරමුදල් දෙකෙහි සටහන් කර ඇති වත්කම් භාවිතයෙන් ආර්ථික ප්‍රතිලාභ ලබා ගනිමින් ද එසේම අදාළ වගකීම් වාර්තා කිරීමකින් තොරව ණය සේවා සැපයීමේ වගකීම් සඳහා ගිණුම්කරණය සිදුකරමින් ද සමාගම විසින් එහි මූලික ක්‍රියාකාරකම් වල නිරත වීමේ පදනම මත මේ අනුව මූලික ගිණුම්කරණ සංකල්පවලින් බැහැර වෙමින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2013 ජූනි 28 දින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට් (SLFRS/LKAS) අනුකූල වන පරිදි ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී.

### *2.1.2 අනුකූලතා ප්‍රකාශය*

සමාගම් පනතේ සහ SLFRSs/LKAS හි විධිවිධාන අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

2023 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය තත්ත්වය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් සහ මුදල් ප්‍රවාහ වල වෙනස්වීම්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ("මූල්‍ය ප්‍රකාශන") සංසන්දනාත්මක තොරතුරු ද සමඟින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/ LKAS) අනුකූල වන අතර සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ. මෙම ප්‍රමිති www.casrilanka.com වෙබ් අඩවිය හි ලැයිස්තුගත කර ඇත.

### *2.1.3 සංසන්දනාත්මක තොරතුරු*

වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වසර සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කොට ඇත.

### *2.1.4 මිනුම් පදනම*

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ලෙස වර්ගීකරණය කරන ලද කෙටි කාලීන ආයෝජන - සාධාරණ වටිනාකම.

ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් - නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්තමාන වටිනාකමට හඳුනා නොගත් ආයුගණක ලාභ එකතු කර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභ අඩුකොට වගකීම් හඳුනාගෙන ඇත.

### 2.1.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් භාවිත කරමිනි (ක්‍රියාකාරී මුදල්). මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ඉදිරිපත් කිරීම් සහ ක්‍රියාකාරී මුදල් වල වෙනසක් සිදු නොවීය.

### 2.1.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති සමාගමේ වත්කම් සහ වගකීම් ස්වභාවය අනුව කාණ්ඩගත කර ඇති අතර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය සහ කල්පිරීමේ රටාව පිළිබිඹු කරන අනුපිළිවෙලකට ලැයිස්තුගත කර ඇත. මූල්‍ය ප්‍රකාශන වලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ මුදල වාර්තා කරනු ලබන්නේ පිළිගත් මුදල් පියවීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් පියවීමට අදහස් කරනවිට හෝ ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ නිරූපණයකින් අවසර දී ඇති අතර, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් අනාවරණය කර ඇත.

### 2.1.7 ප්‍රමාණවත් බව සහ සමාහරණය

සමාන අයිතම වල සෑම ප්‍රමාණාත්මක කාණ්ඩයක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය- LKAS 1 හි 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' මඟින් අවසර දී ඇති පරිදි අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයේ අයිතමයන් ප්‍රමාණාත්මක නොවන ඒවා හැර අනිත් අයිතමයන් වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

### 2.1.8 විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ වාර්තා කර ඇති වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් SLFRSs සහ කළමනාකාරීත්වය සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන අවශ්‍ය විටෙක හඳුනා ගැනේ.

### 2.1.9 අඛණ්ඩ පැවැත්ම

කළමනාකාරීත්වය විසින් අඛණ්ඩ පැවැත්ම සඳහා ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිගත හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳ කළමනාකරණය දැන නොසිටී. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පැවැත්ම පදනම මත සකස් කරනු ලැබේ.

### 2.1.10 මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයක් යනු එක් ආයතනයක මූල්‍ය වත්කමක් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීම් හෝ හිමිකම් උපකරණයක් ඇති කරන ඕනෑම ගිවිසුමකි.

### 2.1.11 විලම්බිත බදු වත්කම්

බදු අලාභ සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇති අතර, එම බදු අලාභ භාවිත කළ හැකි වන්නේ අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති ප්‍රමාණයට. අනාගත බදු-සැලසුම් උපාය මාර්ග සමඟ, අනාගත බදු අය කළ හැකි ලාභයේ විභව කාලය සහ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට උපකල්පන කරනු ලැබේ.

### 2.1.12 සාධාරණ අගය ගණනය කිරීම.

සාධාරණ අගය ගණනය කිරීමකදී වෙළඳපොල සහභාගිවන්නන් අතර වත්කම් විකිණීම හෝ වගකීම් පැවරීම, පවතින වෙළඳපොල තත්වයයන් යටතේ ගණනය කරන දිනයේදී ක්‍රමානුකූල ගනුදෙනුවක් ලෙස වත්කම් වගකීම් හුවමාරු වන බව උපකල්පනය කරයි. සාධාරණ අගය ගණනය කිරීමකදී වත්කම් විකිණීමේ හෝ වගකීම පැවරීමේ ගනුදෙනුව,

(අ) වත්කම් හෝ වගකීම් සඳහා මූලික වෙළෙඳපොළ තුළ; හෝ

(ආ) මූලික වෙළඳපොලක් නොමැති විට, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත්ම වාසිදායක වෙළඳපොළ තුළ සිදුවන බව උපකල්පනය කරයි.

### 2.1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් සහ හෙළිදරව් කිරීම්

**නව සහ සංශෝධිත ප්‍රමිති සහ අර්ථකථන**

වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙනස්වීම් සහ හෙළිදරව් කිරීම් හේතුවෙන් සමාග මේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු නොවීය.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය දක්වා වූ නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකථන පහතින් අනාවරණය කර ඇත.

**ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 සංශෝධනය - ගිණුම්කරණ ඇස්තමේන්තු අර්ථ දැක්වීම.**

සංශෝධන මගින් ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ දෝෂ නිවැරදි කිරීම අතර වෙනස පැහැදිලි කරයි. එසේම, ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීම සඳහා ආයතන විසින් මිනුම් ශිල්පීය ක්‍රම සහ යෙදවුම් භාවිතා කරන ආකාරය එමගින් පැහැදිලි කරයි. සංශෝධිත ප්‍රමිතිය මගින් ආදානයක වෙනසක් හෝ මිනුම් තාක්ෂණයක වෙනසක් නිසා ගිණුම්කරණ ඇස්තමේන්තුවක් මත ඇතිවන බලපෑම් පූර්ව කාල පරිච්ඡේදවල දෝෂ නිවැරදි කිරීමක ප්‍රතිඵලයක් නොවන්නේ නම් එය ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කමක් බව පැහැදිලි කරයි.

සංශෝධන 2023 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලාත්මක වේ.

**ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 සංශෝධනය - තනි ගනුදෙනුවකින් පැන නගින වත්කම්/බැරකම් සම්බන්ධ විලම්බිත බද්ද**

සංශෝධන මගින් වගකීමක් පියවන ගෙවීම් බදු අරමුණු සඳහා අඩු කළ හැකි බව පැහැදිලි කරන බවද, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති වගකීම් (සහ පොලී වියදම) හෝ අදාළ වත්කම් සංරචක වල (සහ පොලී වියදම) බදු අරමුණු සඳහා එවැනි අඩු කිරීම් ආරෝපණය කළ හැකිද යන්න (අදාළ බදු නීතිය සලකා බැලීමෙන්) විනිශ්චය කළයුතු කාරණයක් බවද පැහැදිලි කරයි. වත්කම් සහ වගකීම් මූලික හඳුනාගැනීමේදී යම් තාවකාලික වෙනස්කම් තිබේද යන්න තීරණය කිරීමේදී මෙම විනිශ්චය වැදගත් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

සංශෝධන 2023 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලාත්මක වේ.

**ශ්‍රී. ලං.ගි.ප්‍ර. 1 සංශෝධනය - ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම් ලෙස වගකීම් වර්ගීකරණය කිරීම.**
ශ්‍රී. ලං.ගි.ප්‍ර. 1 සංශෝධනය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වගකීම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

- සමථයකට පත් කිරීම කල් දැමීමේ අයිතියක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න
- වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ කල් දැමීමට අයිතියක් තිබිය යුතු බව
- ආයතනයක් එහි කල් දැමීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමට ඇති සම්භාවිතාවය එම වර්ගීකරණය කෙරෙහි බලනොපාන බව
- පරිවර්තනය කළ හැකි වගකීමක කාවැද්දූ ව්‍යුත්පන්නයක් පමණක්ම හිමිකම් උපකරණයක් වන බවත් වගකීමක නියමයන් එහි වර්ගීකරණයට බලනොපාන බවත්
- හෙළිදරව් කිරීම්

සංශෝධන 2023 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලාත්මක වේ.

## 2.2 විදේශ මුදල් පරිවර්තනය

**(අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්**
මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ('ක්‍රියාකාරී මුදල්') භාවිත කරමිනි. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

**(ආ) ගනුදෙනු සහ ශේෂයන්**
ආ) විදේශ මුදල් ගනුදෙනුවක්, මූලික හඳුනාග ැනීමේදී, ගනුදෙනුව සිදු වූ දිනයේ ක්‍රියාකාරී මුදල් සහ විදේශ මුදල් අතර ස්ථානීය විනිමය අනුපාතය විදේශ මුදල් ප්‍රමාණයට යෙදීමෙන්, ක්‍රියාකාරී මුදල් ඒකකයෙන් වාර්තා කළ යුතුය. එක් එක් වාර්තාකරණ කාල අවසානයේ

- විදේශ මුදල් මූල්‍ය අයිතම අවසාන දින විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කළ යුතුය.
- විදේශ මුදලේ ඓතිහාසික පිරිවැය මත ගණනය කරන ලද මුදල් නොවන අයිතම ගණුදෙණුව සිදු වූ දිනයේ විනිමය අනුපාතිකය භාවිතයෙන් පරිවර්තනය කළ යුතුය.
- විදේශ මුදලේ සාධාරණ අගයෙන් ගණනය කරන ලද මුදල් නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දිනයේ විනිමය අනුපාත භාවිතයෙන් පරිවර්තනය කළ යුතුය.

මූල්‍ය අයිතම පියවීමේදී හෝ මූල්‍ය අයිතම පරිවර්තනය කිරීමේදී පැන නගින විනිමය වෙනස්කම්, එම කාලසීමාවේදී හෝ පෙර මූල්‍ය ප්‍රකාශනවල ඒවා මූලික හඳුනාගැනීමේදී පරිවර්තනය කරන ලද අනුපාතවලට වඩා වෙනස් නම් ඒවා පැනනගින කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභ වශයෙන් හඳුනාගත යුතුය.

## 2.3 ප්‍රවර්තන සහ විලම්බිත ආදායම් බදු

කාල සීමාව සඳහා බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායමක හෝ සෘජුවම හිමිකම් වල හඳුනාගත් අයිතම වලට අදාළ වන ප්‍රමාණයට හැර, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ බදු හඳුනාගෙන ඇත. මෙම අවස්ථාවෙහි දී, බදු පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමක හෝ සෘජුවම හිමිකමක හෝ හඳුනාගනු ලැබේ. ප්‍රවර්තන ආදායම් බදු ගාස්තුව ගණනය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දී පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු නීති මත ය.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තා වල ගනු ලබන තීරණ කළමනාකරණය විසින් වරින් වර ඇගයීමට ලක් කෙරේ. බදු අධිකාරීන් වෙත ගෙවීමට අපේක්ෂා කරන අගයන් මත සුදුසු අවස්ථා වල දී කළමනාකරණය විසින් ප්‍රතිපාදන ස්ථාපිත කෙරේ.

වත්කම් සහ වගකීම් වල බදු පදනම් සහ මූල්‍ය ප්‍රකාශන වල ඒවා රැගෙන යන ප්‍රමාණයන් අතර පැන නගින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත ආදායම් බදු හඳුනා ගැනේ. කෙසේ වෙතත්, විලම්බිත බදු වගකීම්, කීර්තිනාමයේ මූලික පිළිගැනීමෙන් පැනනගින නම් ඒවා හඳුනා නොගනී; විලම්බිත ආදායම් බදු, ගනුදෙනුව සිදුවන අවස්ථාවේ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභය හෝ අලාභය බලනොපාන ව්‍යාපාරික සංයෝජනයක් හැර වෙනත් ගනුදෙනුවක වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් පැන නගින්නේ නම් එය හඳුනා නොගනී. විලම්බිත ආදායම් බදු තීරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළ විලම්බිත ආදායම් බදු වත්කම හඳුනා ගත් විට හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවූ විට යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි, අනාගත බදු අය කළ යුතු ලාභය ලබා ගත හැකි සම්භාවිතාව ඇති ප්‍රමාණයට පමණි.

ප්‍රවර්තන බදු වගකීම් වලට අදාළ හැකි අයිතියක් ඇති විට සහ විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් එම බදු අධිකාරිය විසින් අය කරනු ලබන ආදායම් බදු වලට අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ.

## 2.4 තොග

යල්පැන ගිය සහ සෙමින් සංචලනය වන අයිතම සඳහා නියමිත ගැලපුම් කිරීමෙන් පසු තොග පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයට යන දෙකෙන් අඩු අගයට ගණනය කර ඇත.

2003 දෙසැම්බර් 31 දිනට පෙර මිලදීගත් ගිනි නිවන උපකරණ සඳහා අමතර කොටස් සහ පරිභෝජන ද්‍රව්‍ය ආගණනයක් මත පදනම්ව තක්සේරු කර පසුව බරතැබූ සාමාන්‍ය පදනම මත තක්සේරු කෙරේ.

ඉන්ධන හැර අනෙකුත් භාණ්ඩ තොග එහි වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමේ දී දරන ලද පිරිවැය ගණනය කරනු ලබන්නේ බරතැබූ සාමාන්‍ය පදනම භාවිත කරමින් වන අතර ඉන්ධන ප්‍රථම-ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය (FIFO) මත වටිනාකම ගණනය කරනු ලැබේ.

## 2.5 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ

ලැබිය යුතු වෙළඳ මුදල් මුලින් සාධාරණ වටිනාකමින් හඳුනාගෙන පසුව හානිකරණය සඳහා අඩු ප්‍රතිපාදන සහිත ඵලදායි පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂ වියදම් යටතේ මනිනු ලැබේ.

බොල් ණය සහ අඩමාන ණය ලැබිය යුතු දෑ පිරිවැයට ගැලපීමෙන් පසු අනිකුත් ලැබිය යුතු දෑ හඳුනා ගනු ලැබේ.

## 2.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අර්ථ දැක්වෙන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන වන අතර මේවා දන්නා අගයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීමෙහි සුළු අවදානමකට යටත්ව වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් සහ බැංකු අයිරා වල ශුද්ධ බැංකු තැන්පතු වලින් සමන්විත වේ. කෙටි කල්පිරීමක් සහිත ආයෝජන එනම් අත්පත් කරගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

## 2.7 දේපල, පිරියත සහ උපකරණ

සියලුම දේපල, පිරියත සහ උපකරණ මුලදී පිරිවැය මත වාර්තා කර ඇති අතර සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද ඓතිහාසික පිරිවැයෙන් ප්‍රකාශ කර ඇත. ඓතිහාසික පිරිවැයට අයිතමයන් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ද අයිතමය කඩා ඉවත් කිරීම සහ එය පිහිටා ඇති භූමිය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය පිළ බඩු තොග නිෂ්පාදනය කිරීමට හැර වෙනත් අරමුණු සඳහා යම් කාල සීමාවක් තුළ භාණ්ඩය භාවිත කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස අයිතමය සතු වන වගකීම ද ඇතුළත් වේ.

ස්වයං-නිෂ්පාදිත වත්කම් වල පිරිවැයට ද්‍රව්‍ය වල පිරිවැය, සෘජු ශ්‍රමය සහ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සඳහා සුදුසු සමානුපාතිකයක් ඇතුළත් වේ.

පසුකාලීන වියදම්, වත්කම් ධාරන අගයට ඇතුළත් කර හෝ සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ, භාණ්ඩය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට සම්භාවිතාව ඇති විට පමනක් වන අතර භාණ්ඩයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිවිටය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරන අගය හඳුනා නොගනී. සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු වියදම් ඒවා දරන මූල්‍ය කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය වෙතින් අය කෙරේ.

දිගුකාලීන ප්‍රාග්ධන ව්‍යාපෘති වල පිරිවැය, ව්‍යාපෘති අවසන් කර අදාළ වත්කම් භාවිතය සඳහා පවතින තුරු නොනිමි ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස ඉදිරියට ගෙන යනු ලැබේ.

ක්ෂය වීම ආරම්භ වන්නේ යම් දේපලක්, පිරියතක් සහ උපකරණයක් භාවිතය සඳහා පවතින විට වන අතර, එම කාල සීමාව තුළ අයිතමය අක්‍රිය වුව ද, එය හඳුනා නොගන්නා තෙක් දිගටම පවතිනු ඇත. භාණ්ඩයේ මුළු පිරිවැයට සාපේක්ෂව සැලකිය යුතු පිරිවැයක් සහිත දේපල, පිරියත සහ උපකරණ වල සෑම කොටසක් ම වෙන වෙනම ක්ෂය කළ යුතුය. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. අනෙකුත් වත්කම් වල ක්ෂය වීම් ගණනය කරනු ලබන්නේ සරල රේඛීය ක්‍රමය භාවිත කර ඒවයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයට වඩා ඒවායේ ඉතිරි අගයන් වෙත ඒවාහි පිරිවැය වෙන් කිරීම සඳහා ය.

**වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 50 ට වැඩි |
| පිරියත සහ උපකරණ | වසර 04 සිට 20 දක්වා |
| මෝටර් රථ වාහන | වසර 04 සිට 15 දක්වා |
| ලී භාණ්ඩ, සවිකිරීම් සහ කාර්යාල උපකරණ | වසර 08 ට වැඩි |
| සන්නිවේදන සහ ගගන නාවික උපකරණ | වසර 05 සිට 10 දක්වා |
| වෙනත් උපකරණ | වසර 08 ට වැඩි |
| ගුවන්තොටුපළ යටිතල පහසුකම් | වසර 08 සිට 50 දක්වා |

වත්කමක ධාරන අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම්, වත්කමේ ධාරන අගය වහාම එහි ආපසු ලබාගත හැකි අගය වෙනුවට ක්ෂණිකව ලියා හරිනු ලැබේ.

එක් එක් ප්‍රධාන පරීක්ෂාව සිදු කරන විට, හඳුනාගැනීමේ නිර්ණායක තෘප්තිමත් වන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියත සහ උපකරණ වල රැගෙන යන අගයන් හඳුනා ගැනේ.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් විකිණීමේදී හෝ එය භාවිත කිරීමෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේ ආදායම සහ වත්කමේ ධාරන අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) වත්කම හඳුනා නොගත් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් වේ.

වත්කම්වල සුන්බුන් අගයන්, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂය වීම් ක්‍රම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර සුදුසු නම් ගළපනු ලැබේ.

විකිණීමේදී ලැබෙන ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ධාරන අගය සමඟ ආදායම සංසන්දනය කිරීමෙන් වන අතර මෙය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ශුද්ධ ආදායම්/(අලාභ) තුළ හඳුනා ගැනේ.

ඕනෑම ප්‍රති ඇගයීම් අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායම්වල සටහන් කර හිමිකම් වල වත්කම් ප්‍රති ඇගයීම් සංචිතයට බැර කෙරේ. කෙසේ වෙතත්, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ ප්‍රති ඇගයීම් හිඟයක් ආපසු හරවන ප්‍රමාණයේ වැඩි වීමක් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගනු ඇත. වත්කම් ප්‍රති ඇගයීම් සංචිතයේ එම වත්කමේ හදුනාගෙන ඇති අතිරික්තයක් පියවා ගන්නා ප්‍රමාණයට හැර, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ ප්‍රති තක්සේරු කිරීමේ හිඟයක් හඳුනාගනු ඇත. බැහැර කිරීමෙන් පසු, විකුණනු ලද නිශ්චිත වත්කමට අදාළ ඕනෑම ප්‍රති තක්සේරු සංචිතයක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

**දේපල, පිරියත සහ උපකරණ වල අපහායනය**

දේපල, පිරියත සහ උපකරණ වල ධාරන අගය ආපසු හැරවිය නොහැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්වයන් වෙනස් වන විට අපහායනය සඳහා සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම් සහ ධාරන අගයන් ඇස්තමේන්තුගත අයකරගත හැකි අගය ඉක්මවන විට වත්කම් ඒවායේ අයකරගත හැකි අගයට ලියා හැර ඇත. එම වත්කම සඳහාම පෙර ප්‍රත්‍යාග ණන අතිරික්තයක් ආපසු හරවන්නේ නම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මඟින් අපහායන අලාභ හඳුනා ගැනේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

## 2.8 අස්පෘශ්‍ය වත්කම්

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලැබේ.

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් මූලිකව හඳුනාගනු ලබන්නේ පිරිවැය මත ය.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සීමිත හෝ අවිනිශ්චිත ලෙස තක්සේරු කෙරේ. සීමිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඵලදායි ආර්ථික ජීවිත කාලය තුල ක්ෂය කරන අතර අස්පෘශ්‍ය වත්කමට හානි විය හැකි බවට ඇඟවීමක් ඇති ඕනෑම අවස්ථාවක හානිය සඳහා තක්සේරු කෙරේ.

## 2.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් හිමිකම් ලෙස වර්ග කෙරේ.

## 2.10 වෙළඳ ගෙවිය යුතු දෑ

වෙළඳ ගෙවිය යුතු දෑ යනු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල දී අත්පත් කරගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට ඇති බැඳීම් වේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වෙළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ඒවා වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද අයිතම යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ඒවා වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද අයිතම යනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශ කළ දින සිට වසරක කාල සීමාවකට ඔබ්බෙන් ගෙවීමට නියමිත ඒවා වේ.

ගෙවිය යුතු වෙළඳ මුදල්, ගනුදෙනු මිලට මුලින් හඳුනාගෙන පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂ පිරිවැයෙන් මනිනු ලැබේ.

## 2.11 ණය ගැනීම්

ණය ගැනීම් මුලින් හඳුනාගනු ලබන්නේ සිදු වූ ගනුදෙනු පිරිවැයේ ශුද්ධ සාධාරණ වටිනාකමින් ය. ණය ගැනීම් පසුව ක්‍රමක්ෂ මිලට සඳහන් කරනු ලැබේ; ඵලදායි පොලී ක්‍රමය භාවිත කරමින් ණය ලබා ගත් කාලසීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ලැබෙන ආදායම (ශුද්ධ ගනුදෙනු පිරිවැය) සහ නිදහස් කිරීමේ අගය අතර යම් වෙනසක් හඳුනා ගැනේ.

ණය පහසුකම් ස්ථාපිත කිරීමේ දී ගෙවනු ලබන ගාස්තු ණයෙහි ගනුදෙනු පිරිවැය ලෙස හඳුනාගෙන ඇති අතර එම පහසුකම්වලින් සමහරක් හෝ සියලු පහසුකම් අඩු කිරීමට ඉඩ ඇත. මෙම අවස්ථාවෙහි දී, මුදල ආපසු ගැනීම සිදු වන තෙක් ගාස්තුව කල් දමනු ලැබේ. සමහරක් හෝ සියලුම පහසුකම් අඩු කිරීමට ඉඩ ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැති තාක් දුරට, ගාස්තු ද්‍රවශීලතා සේවා සඳහා පූර්ව ගෙවීමක් ලෙස ප්‍රාග්ධනීකරණය කර එය අදාළ පහසුකමේ කාලසීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.12 ණය ගැනීමේ පිරිවැය

අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් වීමට අත්‍යවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගත වන සුදුසුකම් ලත් වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි සාමාන්‍ය සහ විශේෂිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් ඒවාහි අපේක්ෂිත භාවිතය සඳහා සැලකිය යුතු ලෙස සූදානම් වන කාලය වන තුරු පිරිවැය වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ.

සුදුසුකම් ලබන වත්කම් සඳහා වන වියදම් සඳහා නියමිත නිශ්චිත ණය ගැනීම් වල තාවකාලික ආයෝජනය මත උපයාගත් ආයෝජන ආදායම ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැයෙන් අඩු කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා දරන කාල සීමාව තුළ ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇත.

## 2.13 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට වර්තමාන නෛතික හෝ සාධනීය බැඳීමක් ඇති විට ප්‍රතිපාදන හඳුනාගෙන ඇති අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇති අතර වගකීමෙ හි අගය මත විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ හැකිය. මුදල් වල කාල වටිනාකමෙහි බලපෑම ප්‍රමාණාත්මක නම්, ප්‍රතිපාදන තීරණය කරනු ලබන්නේ මුදල් වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපළ තක්සේරු කිරීම් සහ, සුදුසු අවස්ථාවල දී, වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන බදු පෙර අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි. වට්ටම් භාවිත කරන විට, කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිපාදන වැඩි වීම පොලී වියදමක් ලෙස පිළිගැනේ

## 2.14 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

නිශ්චිත දායක සැලැස්මක් යනු සමාගම විසින් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන විශ්‍රාම වැටුප් සැලැස්මකි. වත්මන් සහ පෙර කාල පරිච්ඡේදය තුළ සියලුම සේවකයින්ට සේවයට අදාළ ප්‍රතිලාභ ගෙවීමට ප්‍රමාණවත් වත්කම් අරමුදල සතුව නොමැති නම්, තවදුරටත් දායක මුදල් ගෙවීමට සමාගමට නෛතික හෝ ඵලදායී බැඳීමක් නොමැත. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන විශ්‍රාම වැටුප් සැලැස්මකි.

සාමාන්‍යයෙන් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මඟින් සේවකයෙකු විශ්‍රාම යාමේ දී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණයක් නිර්වචනය කරන අතර සාමාන්‍යයෙන් මෙය වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතී.

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම, සැලසුම් වත්කම් වල සාධාරණ වටිනාකමට අඩු කළ අගය. වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම ස්වාධීන ආයුගණක ආයතන විසින් ආයුගණක තක්සේරුව භාවිතයෙන් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නම් කෙරෙන සහ අදාළ විශ්‍රාම වැටුප් වගකීමෙහි නියමයන්ට ආසන්නව කල් පිරෙන කොන්දේසි ඇති උසස් තත්ත්වයේ ආයතනික බැඳුම්කර වල පොලී අනුපාත භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් පිටතට ගලායාම වට්ටම් කිරීමෙනි. එවැනි බැඳුම්කර වල ගැඹුරු වෙළෙඳපොළ අනුපාත භාවිත කරනු ලැබේ.

සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීම සඳහා වර්ෂය සඳහා ස්වාධීන ආයුගණක තක්සේරුකරුවෙකුගේ ඇගයීම් සේවාවන් ලබාගෙන ඇත.

පළපුරුද්ද මත කරනු ලබන ගැලපීම් සහ ආයුගණක උපකල්පන වල වෙනස් වීම් නිසා ඇතිවන ආයුගණක ලාභ හා අලාභ ඒවා පැන නැගෙන කාල පරිච්ඡේදයේ දී වෙනත් විස්තීර්ණ ආදායමෙ හි හිමිකම් වෙත අය හෝ බැර කෙරේ.

**(ආ) නිශ්චිත දායක සැලසුම්**

ශ්‍රී ලංකාව තුළ සිටින සමාගමේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර, එම සේවකයින්ගේ මූලික හෝ ඒකාබද්ධ වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හෝ 3% ක් වශයෙන් දායක වේ.

## 2.15 ප්‍රදාන සහ සහනාධාර

ආයතනය විසින් ප්‍රදාන මගින් වන්දි ගෙවීමට අදහස් කරන අදාළ පිරිවැය වියදම් ලෙස පිළිගන්නා කාල සීමාවන් තුළ රජයේ ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් මත ලාභ හෝ අලාභ වශයෙන් පිළිගනු ලැබේ.

රජයේ ප්‍රදානයක් ආයතනයේ ප්‍රයෝජනය සඳහා ඉඩම් හෝ වෙනත් සම්පත් වැනි මුදල් නොවන වත්කම් මාරු කිරීමේ ස්වරූපයක් ගත හැකිය. මෙම තත්ත්වයන් තුළ මුදල් නොවන වත්කම්වල සාධාරණ අගය ගණනය කිරීම සහ එම සාධාරණ අගයට ප්‍රදානය සහ වත්කම් යන දෙකම ගිණුම්ගත කිරීම සාමාන්‍ය කරුණකි.

## 2.16 මූල්‍ය නොවන වත්කම් වල අපහායනය

අවිනිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති වත්කම් - නිදසුනක් වශයෙන්, කීර්තිනාමය හෝ භාවිත කිරීමට සූදානම් තත්ත්වයක නැති අස්පෘශ්‍ය වත්කම් - ක්‍රමක්ෂය කළ නොහැකි අතර වාර්ෂිකව අපහායනය වී ඇත්දැයි දැන ගැනීම සඳහා පරීක්ෂා කෙරේ. ධාරණ අගය අය කර ගත නොහැකි බව සිද්ධීන් හෝ තත්ත්වයන් වෙනස් වීම් මගින් පෙන්නුම් කරන සෑම අවස්ථාවකදීම ක්‍රමක්ෂය කිරීමට යටත් වන වත්කම් අපහායනය සඳහා සමාලෝචනය කෙරේ.

වත්කම් වල ආපසු අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවන ධාරණ අගයක් ඇති විට අපහායන අලාභයක් හඳුනා ගැනේ. වත්කමේ ආපසු අය කර ගත හැකි අගය යනු වත්කමේ සාධාරණ අගයෙන් වත්කම විකිණීමට දරන පිරිවැය අඩු කළ පසු අගය හා වත්කම දැනට භාවිත කරන අයුරෙන් ඉපයිය හැකි ආදායම යන දෙකෙන් වැඩි අගය වේ. අපහායනය තක්සේරු කිරීමේ අරමුණු සඳහා වත්කම් විවිධ මට්ටම් වලට කාණ්ඩ කර ඇති අතර ඒ කාණ්ඩ සඳහා වෙන වෙනම හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් ඇත (මුදල් උත්පාදන ඒකක). එක් එක් වාර්තා කිරීමේ දිනයන්හි දී වත්කම් අපහායනය ආපසු හැරවිය යුතුද යන්න තීරණය කිරීම සඳහා අපහායනය වූ කීර්තිනාමය හැර මූල්‍ය නොවන වත්කම් සමාලෝචනය කෙරේ.

## 2.17 මූල්‍ය වත්කම්

### *2.17.1 වර්ගීකරණය*

සමාගම සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන කාණ්ඩ වලට වර්ගීකරණය කරයි: ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ක්‍රමක්ෂය පිරිවැය යටතේ හඳුනාගන්නා වත්කම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා වත්කම් වශයෙනි. මුල් හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීමට සමාගම භාවිත කරන ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී.

**(අ) ක්‍රමක්ෂය පිරිවැය**

වත්කම් මනිනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශන වල වත්කම් මුලින්ම හඳුනාගැනීමේ දී ගනු ලැබූ අගයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර, එම ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ලාභ/ අලාභ වල සමුච්චිත අගය එකතු කිරීමට හෝ අඩු කිරීමට අවශ්‍ය ගැලපීම සිදු කිරීමෙන් පසු අගයට ය. සඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් පොලී ආදායම ගණනය කෙරෙන අතර එය ලාභ හා අලාභ තුළින් හඳුනාගනු ලැබේ. සාධාරණ අගයෙහි වෙනස්කම් වත්කම් ගිණුම් වලින් ඉවත් කරන විට හෝ නැවත වර්ගීකරණයකට ලක් කළ විට ලාභ හා අලාභ තුළින් හඳුනා ගැනේ.

**(ආ) වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය**

**ණය සහ ලැබීම්** - පොලී ආදායම, අපහායන ලාභ සහ අලාභ, සහ විදේශ විනිමය ලාභ සහ අලාභ වලින් කොටසක්, ක්‍රමක්ෂය කළ පිරිවැය වත්කම් සඳහා සමාන පදනමක් මත ලාභ සහ අලාභයන් හි හඳුනා ගැනේ. සාධාරණ අගයේ වෙනස්වීම් මුලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් (OCI) හි හඳුනා ගැනේ. වත්කම් ගිණුම් වලින් ඉවත් කරන විට හෝ නැවත වර්ගීකරණය කරන විට, වෙනත් විස්තීර්ණ ආදායමෙහි කලින් හඳුනා ගෙන තිබූ අතර සාධාරණ අගයන්හි වත්කම් ලාභ සහ අලාභ හරහා මූල්‍ය වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කිරීමේ දී, ඒ මත පදනම්ව සෑම විටම සාධාරණ අගයට වත්කම් මනිනු ලබන අතර වෙනත් විස්තීර්ණ ආදායමෙන් ලාභ සහ අලාභය කෙරෙහි බලපැවැත්වෙන පරිදි එය ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

**හිමිකම් උපකරණ වල ආයෝජනය** - ලාභාංශ හඳුනාගනු ලබන්නේ ගෙවීම් ලැබීමට ආයතනයට ඇති අයිතිය තහවුරු වූ විට ය. එවිට ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇති අතර එම මුදල විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ලාභාංශ ලාභ සහ අලාභ ඔස්සේ හඳුනාගනු ලබන්නේ ආයෝජනයේ පිරිවැයෙන් කොටසක් නැවත අයකර ගැනීම පැහැදිලිව නියෝජනය නොකරන්නේ නම් ඒවා වෙනත් විස්තීර්ණ ආදායමෙහි ඇතුළත් කළ යුතු ය. සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශයෙ හි හඳුනාගෙන ඇති අතර වත්කම විකිණීම හෝ අපහායනය වීම සිදු වුව ද කිසි විටෙකත් ලාභ හා අලාභ ලෙස නැවත වර්ගීකරණය නොකෙරේ.

**(ඇ) ලාභ සහ අලාභ තුළින් සාධාරණ අගය**

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය (FVOCI) සඳහා වන නිර්ණායකයන් සපුරාලන්නේ නැති වත්කම් ලාභ සහ අලාභ ඔස්සේ සාධාරණ අගයට (FVPL) මනිනු ලැබේ

### *2.17.2 හඳුනා ගැනීම හා මිනුම් කිරීම*

මූල්‍ය වත්කම් නිතිපතා මිලදී ගැනීම් සහ විකිණීම ලභ සහ අලාභ ගිණුම හරහා සමාගම වත්කම් මිලදී ගැනීමට හෝ විකිණීමට එකඟ වූ දිනයේ දී හඳුනා ගැනේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනා නොගන්නා මූල්‍ය වත්කම් මුලින් සාධාරණ අගයට ගනුදෙනු පිරිවැය එකතු කර මුලින් හඳුනා ගනු ලැබිය. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකමකින් ගෙන යන මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමින් හඳුනාගෙන ඇති අතර ගනුදෙනු පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් වශයෙන් සඳහන් කෙරේ. ආයෝජන වලින් මුදල් ගලා ඒමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ මාරු කළ විට සහ සමාගමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු වශයෙන් මාරු කළ විට මූල්‍ය වත්කම් ගිණුම් වලින් ඉවත් කෙරේ.

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම්' කාණ්ඩයේ සාධාරණ අගයේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන ශුද්ධ ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශනයෙහි ඉදිරිපත් කරන කාල සීමාව තුළ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කෙරේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම් වලින් ලැබෙන ලාභාංශ ආදායම සමාගමට ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට වෙනත් ආදායම් යටතේ කොටසක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දී හඳුනාගනු ලැබේ.

විකිණීම සඳහා යොදා ගත හැකි යැයි වර්ගීකරණය කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

සුරැකුම්පත් වල සාධාරණ අගයෙහි වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායමක් ලෙස හඳුනා ගැනේ.

## 2.18 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් ප්‍රමාණය හිලව් කිරීමට නීතියෙන් බලකළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම විකිණීමට සහ එකවර වගකීම් පියවීමට අදහස් කරන මූල්‍ය වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් වන අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරයි. නෛතිකව බලාත්මක කිරීමේ අයිතිය අනාගත සිදුවීම් මත අසම්භාව්‍යයක් නොවිය යුතු අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල දී මෙන්ම සමාගමේ හෝ අදාළ පාර්ශ්වයන්ගේ පැහැර හැරීම, බුන්වත් වීම හෝ සමාගම හෝ සමාන තැනැත්තාගේ බංකොලොත් වීම යන සිදුවීම් වල දී බලාත්මක විය යුතු ය.

## 2.19 මූල්‍ය වත්කම් අපහායනය

සමාගම මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් ප්‍රභේද අපහායනය වීම පිළිබඳ විෂයාත්මක සාක්ෂි ඇත්ද යන්න සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේ දී ම තක්සේරු කරයි. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් ප්‍රභේද වල අගය අඩුවීමක් හෝ අගය අඩුවීම අනුව අලාභයක් මූලිකව හඳුනා ගත් වත්කම් (පාඩුවක් සිදුවන අවස්ථාවක්) සහ අලාභ සිදුවීමක් (හෝ සිදුවීම්) වැනි සිදුවීම් ගණනාවක ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ මත බලපාන්නේ නම් එය විශ්වාසදායී ලෙස තක්සේරු කළ හැකිය.

අපහායනය වීමේ සාක්ෂි වලට ණය ගැතියන් හෝ ණයගැති ප්‍රභේද වල සැලකිය යුතු මූල්‍ය අපහසුතා, පොලී හෝ මුල් මුදල ගෙවීම පැහැර හැරීම හෝ නොගෙවා සිටීම, බුන්වත් වීමේ සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය අපහසුතා ඇතුළත් වන අතර නිරීක්ෂණය කළ දත්ත මගින් හිඟ මුදල් වල වෙනස්වීම් හෝ ප්‍රමාද වීම් සමඟ සම්බන්ධිත ආර්ථික කොන්දේසි වැනි අනාගත මුදල් ප්‍රවාහ වල සැලකිය යුතු අඩුවීමක් ආදිය පෙන්නුම් කිරීම ඇතුළත් වේ.

සියලු ණය සුරැකුම්, ණය සහ වෙළඳ ලැබිය යුතු දෑ වල අපේක්ෂිත ණය අලාභ මාස 12 ක හෝ ජීව කාල පදනමෙන් වාර්තා කළ යුතු යැයි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක SLFRS 9 මගින් ඉල්ලා සිටියි. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා අලාභ දීමනාව නිතරම මිනිනු ලබන්නේ අපේක්ෂිත ණය පාඩු ජීවකාලය (ECL)ට සමාන ප්‍රමාණයකට ය. මූලික හඳුනා ගැනීමේ සිට සහ අපේක්ෂිත ණය පාඩු තක්සේරු කරන විට මූල්‍ය වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇද්ද යන්න තීරණය කිරීමේ දී සමාගම අධික පිරිවැයක් හෝ උත්සහයක් නොමැතිව ලබාගත හැකි අදාළ සාධාරණ සහ සහයවන තොරතුරු සලකා බලයි. සමාගමේ ඓතිහාසික අත්දැකීම් සහ අනාගත තොරතුරු ද ඇතුළුව දැනුවත් වූ ණය තක්සේරු කිරීම් මත පදනම් වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු මෙහි ඇතුළත් වේ. දින 365 කට වැඩි ණය සඳහා මූල්‍ය වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩිවේ යයි සමාගම උපකල්පනය කරයි.

## 2.20 මූල්‍ය වගකීම්

සමාගමේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු ණය සහ අනෙකුත් ණය ගැනීම් සහ අහිතකර මූල්‍ය ඉදිරි ගිවිසුම් ආදිය ඇතුළත් වේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට දක්වන මූල්‍ය වගකීම් හැර අනෙකුත් සියලු මූල්‍ය වගකීම් ආරම්භයේ දී ඒවායේ සාධාරණ වටිනාකමින් හඳුනාගන්නා අතර පසුව වට්ටම් කිරීමේ ප්‍රතිඵලය නොවැදගත් නම් සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මිනිනු ලැබේ. ඒ අනුව ඒවා පිරිවැයට සඳහන් කරනු ලබයි.

## 2.21 ආදායම් හඳුනාගැනීම

ආදායම හඳුනාගැනීම කරනුයේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදු වේ යැයි අපේක්ෂා කළ හැකි ආදායම් හා ඒ ආශ්‍රිතව ඇතිවන හෝ ඇතිවිය හැකි වියදම් විශ්වාසයෙන් යුතුව මැනිය හැකි ප්‍රමාණයට පමණි. ආදායම ලැබූ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය හෝ වෙළඳ වට්ටම් හෝ විකිණුම් බදු වල ලැබිය යුතු ශුද්ධ අගය මත මිනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් විශේෂිත නිර්ණායකයන් භාවිත කරයි.

**(අ) සේවා සැපයීමේදී**

සේවා සැපයීමෙන් ලැබුණු ආදායම එම සේවාව සැපයූ හෝ ක්‍රියාත්මක කළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ දී හඳුනා ගනියි.

**(ආ) පොලිය**

අය කර ගැනීමේ අවිනිශ්චිතතාවයක් නොමැති නම් පොලිය උපචිත ආකාරයෙන් හඳුනා ගනියි.

**(ඇ) බදු කුලී ආදායම**

කුලී ආදායම කුලී ගිවිසුමෙ හි විස්තර කොට ඇති පරිදි උපචිත පදනම මත හඳුනා ගනියි.

**(ඈ) වරලත් ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු**

අදාළ ගිවිසුමේ හරයට අනුකූලව වරලත් ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු උපචිත පදනම මත හඳුනා ගනියි.

**(ඉ) ජාත්‍යන්තර / දේශීය ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම්**

ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම, අවම ගාස්තු සහ ගුවන් තොටුපළ අංගනයෙහි නැවතුම් කාලයට යටත්ව උපරිම ඉහළ නැංවීමේ බර මත පදනම් වන අතර උපචිත පදනම මත හඳුනා ගනියි.

**(ඊ) හරහා පියාසර ආදායම**

හරහා පියාසර ආදායම උපරිම ඉහල නැංවීමේ බර මත පදනම්ව ගණනය කරන අතර උපචිත පදනම මත හඳුනා ගනී. දින සිට ක්‍රියාත්මක වන පරිදි පියාසැර් ආදායමේ එකතුවෙන් 40% ක් මහා භාණ්ඩාගාරයට ගෙවීමට සමාගම බැඳී සිටී.

ගුවන් පාලම් ආදායම ගුවන් පාලම පාවිච්චි කරන කාලය සහ ගුවන් යානා වර්ගය මත පදනම්ව ගණනය කරයි. ආදායම උපචිත පදනම මත හඳුනා ගනියි.

**(උ) ගුවන් යානයට නැගීමේ බදු**

ගුවන් යානයට නැගීමේ බදු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මූල්‍ය පනතට අනුව එකතු කරනු ලබන අතර එක්සත් ජනපද ඩොලර් 9.75 ක් ලෙස ගු.ගු.සේ.ස. සමාගමට ප්‍රේෂණය කරයි. ආදායම උපචිත පදනම මත හඳුනා ගනියි

**(එ)** ඇතුළුවීමේ අවසරපත් ගාස්තු, නැවතුම් ගාස්තු (වාහන), දැනුම් දීම් පුවරුව ආදායම හඳුනාගැනීම සහ එකතු කිරීම මුදල් පදනම මත සිදුවේ.

**(ඒ) වෙනත්**

විවේකාගාර ආදායම්, ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනම මත හඳුනා ගනියි.

දැවීමේ උපකරණ ආදායම් උපචිත පදනම මත හඳුනා ගනියි.

අනෙකුත් ආදායම් මූලාශ්‍ර, ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනමෙන් හඳුනා ගනියි.

## 3 මූල්‍ය අවදානම් කළමනාකරණය

### 3.1 මූල්‍ය අවදානම් සාධක

සමාගමේ ක්‍රියාකාරකම් විවිධ මූල්‍ය අවදානම් වලට විවෘතව පවතී. එනම් වෙළඳපොළ අවදානම (විදේශ මුදල් අවදානම්, මුදල් ප්‍රවාහ සහ සාධාරණ අගයේ පොලී අනුපාත අවදානම ඇතුළුව), ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම වේ.

**(අ) වෙළඳපළ අවදානම**

**(i) විදේශ විනිමය අවදානම**

සමාගම විනිමය අනුපාතයන් හි උච්ඡාවචනයන්ට සංවේදී වන අතර ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර් (USD) යුරෝ සහ ජපන් යෙන් වලට අනුව ශ්‍රී ලංකා රුපියලේ (LKR) උච්ඡාවචනයන්ට විවෘතව පවතී. සමාගමේ ක්‍රියාකාරී මුදල් වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර බොහෝ ගනුදෙනු සිදුකරනු ලබන්නේ රුපියල් වලිනි. අනෙකුත් මුදල් බොහොමයක් විදේශ ණය ගෙවීමේ අරමුණු සඳහා විදේශ මුදල් ලෙස සැලකේ. සමහර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සහ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ද විදේශ මුදලින් සිදු කරය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන බැවින්, පරිවර්තන අවදානම සහ ගනුදෙනු අවදානම යන දෙකෙන්ම විදේශ විනිමය උච්චාවචනයන්ගේ බලපෑමට ලක්වෙයි. විදේශ මුදල් වල විනිමය අනුපාත වෙනස්කම් සමාගමේ ලාභ හෝ අලාභ කෙරෙහි බලපායි. උදාහරණයක් ලෙස එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල දුර්වල වීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව හරහා විදේශ මුදලින් ලබාගෙන ඇති ණය ගෙවීමට යාමේ දී සමාගමේ ලාභදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

එක්සත් ජනපද ඩොලර්, යුරෝ සහ ජපන් යෙන් වලට සාපේක්ෂව අනෙකුත් සියලු විචල්‍යයන් නොවෙනස්ව තිබිය දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයෙහි වියහැකි සාධාරණ වෙනස්කම්වලට සමාගමේ සංවේදීතාවය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කරයි. එක්සත් ජනපද ඩොලර් සහ ජපන් යෙන් යනු, සමාගමේ ඉදිරිපත් කරන සහ ලිඛිත මුදල් ව්‍යවහාරය වන ශ්‍රී ලංකා රුපියල් වලින් පසු සමාගමේ මූල්‍ය උපකරණ සඳහා යොදා ගනු ලබන ප්‍රධාන මුදල් වර්ග වේ. එක්සත් ජනපද ඩොලර්, යුරෝ සහ ජපන් යෙන් හි විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම් වල බලපෑම වගුවෙන් දක්වා ඇත.

**ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරයෙ හි විනිමය අනුපාතිකයේ සංවේදීතාව**

| | 2023 | 2022 |
|---|---|---|
| | ලාභයේ වැඩි වීම/ (අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්) | ලාභයේ වැඩි වීම/ (අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්) |
| එක්සත් ජනපද ඩොලරයෙහි 10% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-10%) | 565,034,429 | (2,295,761,101) |
| එක්සත් ජනපද ඩොලරයෙහි 15% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-15%) | 847,551,643 | (3,443,641,652) |
| එක්සත් ජනපද ඩොලරයෙහි 20% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-20%) | 1,130,068,857 | (4,591,522,203) |

**ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව යුරෝ හි විනිමය අනුපාතිකයේ සංවේදීතාව**

| | 2023 | 2022 |
|---|---|---|
| | ලාභයේ වැඩි වීම/ (අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්) | ලාභයේ වැඩි වීම/ (අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්) |
| යුරෝහි 10% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-10%) | 696,484 | (4,578,571) |
| යුරෝහි 15% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-15%) | 1,044,726 | (6,867,856) |
| යුරෝහි 20% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-20%) | 1,392,968 | (9,157,142) |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

**ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ජපන් යෙන් හි විනිමය අනුපාතිකයේ සංවේදීතාව**

| | 2023 ලාභයේ වැඩි වීම/ (අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්) | 2022 ලාභයේ වැඩි වීම/ (අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|
| යෙන්හි 10% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-10%) | 954,730,401 | (2,097,366,253) |
| යෙන්හි 15% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-15%) | 1,432,095,602 | (3,146,049,379) |
| යෙන්හි 20% ක අගය වැඩි වීම / (අඩුවීම) (2022-20%) | 1,909,460,803 | (4,194,732,505) |

**(ii) මුදල් ප්‍රවාහය සහ සාධාරණ වටිනාකමේ පොලී අනුපාත අවදානම**

සමාගමේ පොලී අනුපාත අවදානම එක්සත් ජනපද ඩොලර්, යුරෝ සහ ජපන් යෙන් මඟින් ගනු ලැබූ දීර්ඝකාලීන ණය ගැනීම් වලින් පැන නගියි. මේවා ස්ථාවර අනුපාතයකට නිකුත් කරනු ලබන අතර එමඟින් ණය ගැනීම මත මුදල් ප්‍රවාහ පොලී අනුපාත අවදානම ලිහිල් කරයි. මෙය තවදුරටත් විචල්‍ය අනුපාත වලට මුදල් දැරීම මඟිනුත් ලිහිල් වෙයි. ස්ථාවර අනුපාතයන්ට නිකුත් කළ ණය ගැනීම සමාගම සාධාරණ වටිනාකම් පොලී අනුපාත අවදානමකට නිරාවරණය කරයි.

සමාගම මෙම පොලී අනුපාතයන්ගේ චලනය පසුගිය වසර පුරාම සලකා බැලූ අතර පොලී අනුපාතයන්ගේ මෙම චලනය හිමිකම් මත ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බවට නිගමනය කර ඇත.

**(ආ) ණය අවදානම**

ණය අවදානම පැන නගින්නේ බාහිර පාර්ශ්වයන්ගෙන් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මඟිනි.

**(ඇ) ද්‍රවශීලතා අවදානම**

මුදල් ප්‍රවාහ පුරෝකථනය මුදල් අංශය විසින් ක්‍රියාත්මක කරයි. මෙහෙයුම් අවශ්‍යතා වලට සෑහෙන මුදල් ඇති බවට සහතික කිරීමට සමාගමේ ද්‍රවශීල අවශ්‍යතා පුරෝකථනය කිරීම මුදල් අංශය මඟින් අධීක්ෂණය කරයි. එවැනි පුරෝකථන සමාගමේ ණය මූල්‍යනය සැලසුම්, අනුකූලතා සම්මුතීන්, අභ්‍යන්තර මූල්‍ය තත්ව අනුපාත ඉලක්ක සමඟ අනුකූල වේ නම් සහ අදාළ වන්නේ නම් බාහිර රෙගුලාසි සහ නෛතික අවශ්‍යතා - උදාහරණයක් ලෙස මුදල් සීමාවන් සැලකිල්ලට ගනියි.

කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා ප්‍රමාණයට වඩා ඇති සමාගම සතු අතිරික්ත මුදල් ද්‍රවශීලතා අවදානම ලිහිල් කර ගැනීමට රජයේ සුරැකුම් වල ආයෝජනය කරයි.

## 3.2 ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී සමාගමේ අරමුණු වන්නේ කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීම පිණිස සමාගම අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව ආරක්ෂා කිරීම, අනෙකුත් උනන්දු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබා දීම සහ ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම වේ. ප්‍රාග්ධන ව්‍යුහය ගැලපීම හෝ පවත්වා ගැනීම පිණිස සමාගම කොටස් හිමියන් වෙත ගෙවනු ලබන ප්‍රතිලාභ ගැලපීම, නව කොටස් නිකුත් කිරීම හෝ ණය අඩු කිරීම සඳහා වත්කම් විකිණීම කරනු ඇත. සමාගම ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට පෙර ලාභාංශ අනුපාතය පවත්වා ගැනීම පිණිස බුන්වත් බව තක්සේරු කරයි. කර්මාන්තයේ අනෙකුත් ආයතන සමඟ සමපාත වීමට සමාගම තෝලන අනුපාත පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු ණය, මුළු ප්‍රාග්ධනයෙන් බෙදීමෙන් ගණනය කරයි. ණය ලෙස ගණනය කරනුයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන "ජංගම සහ ජංගම නොවන" මුළු ණය ගැනීම වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන පරිදි මුළු ප්‍රාග්ධනය "හිමිකම්" ලෙස ගණනය කරයි.

2023 දෙසැම්බර් 31 සහ 2022 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත පරිදි විය:

| | සමාගම 2023 | 2022 |
|---|---|---|
| මුළු ණය ගැනීම් (සටහන 21 සහ සටහන 22) | 93,914,434,108 | 110,273,128,687 |
| අඩු කළා : මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 17) | (3,171,397,540) | (642,335,995) |
| අඩුකළා: කෙටි කාලීන ණයකර ආයෝජන | (800,000,000) | (1,299,000,000) |
| අඩුකළා: කෙටි කාලීන බැංකු තැන්පතු | (87,716,805,396) | (78,025,787,863) |
| ශුද්ධ ණය | 2,226,231,172 | 30,306,004,828 |
| **මුළු හිමිකම්** | 67,611,191,508 | 45,257,154,914 |
| **මුළු ප්‍රාග්ධනය** | 69,837,422,679 | 75,563,159,743 |
| **තෝලන අනුපාතය** | 3% | 40% |

ඉහත ණය මුදල සම්පූර්ණයෙන්ම සමන්විත වන්නේ ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා ස්වෙච්ඡ ආපසුකරය යටතේ මහා භාණ්ඩාගාරය හරහා ලබාගත් ණය, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කොන්ත්‍රාත්කරුගේ හිඟ ශේෂය පියවීම සඳහා නිකුත් කරන ලද ණයකරය සහ ලංකා බැංකුවෙන් ලබාගත් ණයකිනි. වට්ටම් කිරීමේ බලපෑම සැලකිය යුතු නොවන බැවින් ණය ගැනීම් වල සාධාරණ අගය ඒවායේ ධාරණ අගයට සමාන වේ.

### 3.3 සාධාරණ අගය ඇස්තමේන්තු කිරීම

සාධාරණ අගය මත මනින ලද මූල්‍ය උපකරණ සමාගම සතුව නොතිබුණි

## 4 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ඇස්තමේන්තු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීමට ලක් කෙරෙන අතර ඓතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ඇතුළු අනෙකුත් සාධක මත පදනම් වේ.

**තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන**

සමාගම අනාගතය සම්බන්ධයෙන් ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරයි. අර්ථදැක්වීම අනුව ගිණුම්කරණ ඇස්තමේන්තු, ප්‍රතිඵල කලාතුරකින් අදාළ සැබෑ ප්‍රතිඵල සමග සමාන වනු ඇත. ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම් වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පන පහත දක්වා ඇත.

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන අගය රඳා පවතින්නේ උපකල්පන ගණනාවක් භාවිත කරමින් ආයුගණක පදනමක් මත තීරණය කරන සාධක ගණනාවක් මත ය. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේ දී භාවිත කරන උපකල්පන වලට වට්ටම් අනුපාතය ඇතුළත් වේ. මෙම උපකල්පන වල ඕනෑම වෙනසක් නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ ධාරණ අගයට බලපානු ඇත. සමාගම සෑම වසරකම අවසානයේ සුදුසු වට්ටම් අනුපාතය තීරණය කරයි. නිශ්චිත ප්‍රතිලාභ වගකීම් පියවීම සඳහා අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කරන ඇස්තමේන්තුගත අනාගත මුදල් පිටතට ගලා යාමේ වර්තමාන අගය තීරණය කිරීම සඳහා භාවිත කළ යුතු පොලී අනුපාතය මෙයයි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා අනෙකුත් ප්‍රධාන උපකල්පන ප්‍රවර්තන වෙළඳපළ තත්ත්වයන් මත අර්ධ වශයෙන් පදනම් වේ. අතිරේක තොරතුරු 23 සටහනෙ හි අනාවරණය කර ඇත.

**(ආ) ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස පැන නගින වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට සමාගම ප්‍රතිපාදන හඳුනා ගන්නා අතර, වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වන විට විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකිය. ප්‍රතිපාදන වාර්තා කිරීම සඳහා මෙම බැඳීම් වල අවසාන විසඳුම පිළිබඳ විනිශ්චයන් යෙදීම අවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එක් එක් මූල්‍ය තත්ත්වයන් පිළිබඳ ප්‍රකාශය දිනයේ දී ප්‍රතිපාදන සමාලෝචනය කර සමාගමේ වර්තමාන හොඳම ඇස්තමේන්තුව පිළිබිඹු වන පරිදි සකස් කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

## 5. ආදායම්

| | 2023 | 2022 |
|---|---|---|
| ගගන නාවික | 7,575,143,036 | 6,135,995,731 |
| ගගන නාවික නොවන | 30,670,641,452 | 19,800,402,953 |
| | 38,245,784,487 | 25,936,398,684 |
| **ගගන නාවික ආදායම්** | | |
| ගොඩබෑසීමේ සහ නැවතුම් ආදායම් | 4,543,507,581 | 4,006,214,542 |
| හරහා පියාසර ආදායම් | 2,114,565,361 | 1,547,067,263 |
| ගුවන් පාලම් ආදායම් | 895,530,276 | 567,327,572 |
| අභ්‍යන්තර ගොඩබෑසීම් සහ නැවතුම් ආදායම් | 21,539,818 | 15,386,355 |
| | 7,575,143,036 | 6,135,995,731 |
| **ගගන නාවික නොවන ආදායම්** | | |
| ගුවන් යානාවට නැගීමේ ගාස්තු | 8,648,651,187 | 5,195,720,093 |
| අනුග්‍රාහක ගාස්තු | 11,489,266,114 | 8,244,584,960 |
| බදුකුලි | 5,168,896,420 | 3,452,134,576 |
| ඇතුල්වීමේ අවසරපත් | 812,886,979 | 489,845,478 |
| ඉන්ධන සැපයුම් ගාස්තු | 256,201,035 | 159,236,447 |
| බිම් හැසිරවීම සඳහා වරලත් ගාස්තු - ශ්‍රීලංකන් ගුවන් සමාගම | 1,420,987,416 | 503,441,315 |
| වරලත් ගාස්තු - ශ්‍රීලංකන් කේටරින් සමාගම | 786,139,193 | 594,260,137 |
| වාහන නැවැත්වීමේ ගාස්තු | 210,648,560 | 145,240,324 |
| අභ්‍යන්තර බිම් හැසිරවීම කො.ජා.ගු.ර./බ.ජා.ගු. | 9,305,834 | 15,917,318 |
| වෙනත් ගගන නාවික නොවන ආදායම් | 991,037,548 | 442,841,502 |
| මගී ආලින්ද දළ ලාභය | 876,621,167 | 557,180,804 |
| | 30,670,641,452 | 19,800,402,953 |
| | | |
| මුළු ගගන නාවික සහ ගගන නාවික නොවන ආදායම් | 38,245,784,487 | 25,936,398,684 |

## 6. වෙනත් ආදායම්

| | 2023 | 2022 |
|---|---|---|
| රජයේ ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරීම | 53,963,608 | 49,507,184 |
| ඉන්ධන පිරවුම්හලෙන් ලද මෙහෙයුම් ලාභය (සටහන 6.1) | 76,081,540 | 64,860,315 |
| ගනුදෙනු මත ශුද්ධ විදේශ විනිමය ලාභය | - | 1,526,033,274 |
| | 130,045,148 | 1,640,400,773 |

මෙහෙයුම් ක්‍රියාකාරකම්වල විනිමය ලාභය සහ විවිධ ආදායම්වලින් වෙනත් ආදායම් සමන්විත වේ.

### 6.1 ඉන්ධන පිරවුම්හලෙන් ලද මෙහෙයුම් ලාභය

| | 2023 | 2022 |
|---|---|---|
| විකුණුම් | 2,833,249,661 | 1,563,952,074 |
| අඩු කිරීම: විකුණුම් පිරිවැය | (2,757,168,121) | (1,499,091,760) |
| දළ ලාභය | 76,081,540 | 64,860,315 |

## 7. පරිපාලන සහ ආයතනික වියදම්

| | 2023 | 2022 |
|---|---|---|
| අධ්‍යක්ෂ පාරිශ්‍රමික | 12,434,946 | 8,402,305 |
| කාර්යමණ්ඩල පිරිවැය | 7,467,364,871 | 7,424,239,181 |
| නිශ්චිත කල දායකත්ව සැලසුම් පිරිවැය | 898,677,674 | 856,998,376 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 1,395,653,571 | 1,136,495,208 |
| ප්‍රසාද දීමනා | 383,461,779 | - |
| අතිකාල දීමනා | 832,373,375 | 569,224,762 |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 1,254,000 | 1,096,500 |
| ක්ෂයවීම් (සටහන 11) | 2,112,941,365 | 2,354,707,348 |
| ක්‍රමක්ෂය (සටහන 12) | 8,301,847 | 12,086,369 |
| ණය ගැතියන්ගේ අපහායනය සඳහා ප්‍රතිපාදන | 111,730,643 | 144,808,120 |
| අලුත්වැඩියා සහ නඩත්තු | 1,880,496,451 | 475,950,365 |
| විදුලිය වියදම් | 1,967,195,344 | 914,530,672 |
| නෛතික ගාස්තු | 2,512,620 | 1,092,640 |
| පරිත්‍යාග | 228,000 | 510,000 |
| වෙනත් වියදම් | 1,986,532,279 | 1,041,356,781 |
| | 19,061,158,765 | 14,941,498,625 |

## 8. ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම්

| | 2023 | 2022 |
|---|---|---|
| **8.1 මූල්‍ය ආදායම** | | |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර සඳහා පොලී | 131,812,265 | 74,126,627 |
| ඇ. ඩොලර් බැංකු ගිණුම් සඳහා පොලී | 2,650,951 | 4,451,204 |
| ඇ. ඩොලර් ස්ථාවර තැන්පතු සඳහා පොලී | 7,824,771,732 | 4,409,658,097 |
| රුපියල් ස්ථාවර තැන්පතු සඳහා පොලී | 1,888,563,833 | 1,168,117,693 |
| ණයකර ආයෝජන මත පොලී | 518,622,056 | 453,852,907 |
| ක්‍රීඩා සමාජයේ ණය මත පොලී | 322,212 | 322,212 |
| සේවක ණය මත පොලී | 7,860,783 | 10,080,507 |
| ආරක්ෂක තැන්පතු මත පොලී | 1,872,563 | - |
| පැහැර හැරීම් සඳහා පොලී ආදායම | 68,336,471 | 69,996,927 |
| සේවක ණය සඳහා IFRS පොලී | (16,617,272) | 16,065,116 |
| | 10,428,195,594 | 6,206,671,289 |
| **8.2 මූල්‍ය පිරිවැය** | | |
| ණය පොලී | (2,225,201,499) | (1,854,365,149) |
| ගනුදෙනු මත ශුද්ධ විදේශ විනිමය (අලාභ) | (161,712,314) | - |
| ණය පරිවර්තනය මත විනිමය ලාභ/(අලාභ) | 15,204,613,135 | (43,977,059,211) |
| ස්ථාවර තැන්පතු මත විනිමය ලාභ/(අලාභ) | (8,467,336,122) | 32,015,382,717 |
| වෙනත් ගිණුම් පරිවර්තන මත විනිමය ලාභ/(අලාභ) | (454,151,067) | 1,407,095,512 |
| | 3,896,212,133 | (12,408,946,131) |
| ශුද්ධ මූල්‍ය ආදායම (පිරිවැය) | 14,324,407,728 | (6,202,274,842) |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

## 9. ආදායම් බදු වියදම්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ආදායම් බදු වියදම්වල ප්‍රධාන සංඝටක පහත පරිදි වේ:

| | 2023 | 2022 |
|---|---|---|
| **ප්‍රවර්තන ආදායම් බදු** | | |
| ප්‍රවර්තන බදු ගාස්තුව | 5,886,760,534 | 877,223,760 |
| **ආදායම් බදු** | 5,886,760,534 | 877,223,760 |
| **විලම්බිත ආදායම් බදු** | | |
| විලම්බිත ආදායම් බදු සම්බන්ධයෙන් අයකිරීම / (ආපසු හැරවීම) (සටහන 13) | (369,336,867) | 753,104,662 |
| **මුළු බදු වියදම** | 5,517,423,668 | 1,630,328,423 |

2022 අංක 45 දරන සංශෝධිත දේශීය ආදායම් පනතට අනුකූලව ආයතනික ආදායම් බදු ගණනය කර ඇත. 2022 වර්ෂයේ පළමු මාස හය සඳහා 24%ක බදු අනුපාතයක් යොදා ගත් අතර, එකී වසරේම දෙවන මාස හය සඳහා 30%ක් බදු අනුපාතයක් යොදා ගත් අතර, නව සංශෝධන ප්‍රතිපාදන අනුව, 2023 වර්ෂය සඳහාද එම බදු අනුපාතය බලපැවැත්විණ..

| | 2023 | 2022 |
|---|---|---|
| බදු පෙර ලාභය | 33,639,078,598 | 6,433,025,990 |
| එලදායී බදු අනුපාතයට ගණනය කරන ලද බදු (24%-30%) | 10,091,723,580 | 1,736,917,017 |
| බදු සඳහා අඩු කළ නොහැකි වියදම් මත බදු බලපෑම | 3,765,481,113 | 3,834,860,767 |
| බදු සඳහා අඩු කළ හැකි වියදම් / ආදායම් මත බදු බලපෑම | (7,970,444,159) | (2,311,768,220) |
| පෙර වසර සඳහා ව්‍යාපාර අලාභ මත බදු බලපෑම | - | (2,382,785,804) |
| හඳුනානොගත් විලම්බිත ආදායම් බදු වත්කම් සඳහා බදු අලාභ/(ලාභ) | (369,336,867) | 753,104,662 |
| **මුළු බදු වියදම** | 5,517,423,668 | 1,630,328,423 |

## 10. කොටසක මූලික ඉපැයීම්

සාමාන්‍ය කොටස් හිමියන් වෙත ආරෝපණය කළ හැකි වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය, වසර තුළ නොගෙවූ කොටස්වල බරතැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන්, කොටසකට මූලික ඉපැයීම් ගණනය කෙරේ. ප්‍රසාද නිකුතුවක් වැනි සම්පත්වල අනුරූප වෙනසක් නොමැතිව, වර්ෂය තුළ සහ පෙර වසර තුළ පැවති සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාව, සාමාන්‍ය කොටස් හිග ප්‍රමාණය වෙනස් කළ සිදුවීම් සඳහා ගැලපුම් කර ඇත.

එක් කොටසක මූලික ඉපැයීම් ගණනය කිරීමේදී භාවිත වන ආදායම් සහ කොටස් දත්ත පහත දක්වා ඇත.

| | 2023 | 2022 |
|---|---|---|
| කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ශුද්ධ ලාභය - ශ්‍රී ලංකා රුපියල් | 28,121,654,931 | 4,802,697,567 |
| නිකුත් කළ සාමාන්‍ය කොටස් වල බර තැබූ සංඛ්‍යාව | 200,002 | 200,002 |
| කොටසකට මූලික ඉපැයීම - ශ්‍රී ලංකා රුපියල් | 140,607 | 24,013 |

## 11. දේපළ, පිරියත හා උපකරණ

(i) ඉඩම සහ ගොඩනැගිල්ල සඳහා 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රුපියල් 935,980,401ක (2022- ශ්‍රී ලංකා රුපියල් 935,980,401) වටිනාකමකින් යුත් කටුනායක පිහිටි ඇතුළත් වේ.

(ii) 2013 මාර්තු මස මෙහෙයුම් ආරම්භ කරන ලද දෙවන මත්තල ජාත්‍යන්තර ගුවනතොටුපළේ (ම.රා.ජ.ගු.) ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා රජය විසින් වසර 99ක කාලයකට බද්දට දුන් ඉඩමක සිදුකොට ඇත. 2011 වසරේ සිට වසර 50ක සහන කාලයකින් පසු කල්බදු මත මූලික ගෙවීමට නියමිත වේ. කල්බදු ගිවිසුම් දෙකක් පවතින අතර, වසර 50ක සහන කාලය අවසන් වීමෙන් පසු, පළමු වසර 5 සඳහා වාර්ෂික කල්බදු කුලිය රුපියල් 2,141,922 සහ රුපියල් 3,792,711 ගෙවීමට සමාගම බැඳී සිටින අතර, ඉන් පසු සමාගම සෑම වසරකදීම ගෙවීමේ අවස්ථාවේදී තීරණය කරනු ලබන බදු කුලී ගෙවීමට බැඳී සිටී. ඊට අමතරව සමාගම සහන කාලයෙන් පසු (2061) මුල් වර්ෂයේදී රුපියල් 6,425,766 සහ රුපියල් 11,378,133ක කල්බදු කාලසීමාව ගෙවීමට බැඳී සිටී.

දිගුකාලීන බදු ඉඩම් සම්බන්ධයෙන් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 16 ට අනුව, ගිවිසුමක් ආරම්භයේදී, සමාගම විසින් ගිවිසුම් ගත කාල සීමාවක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ගිවිසුමේ තිබේ ද යන්න ගිවිසුම නැතහොත් කල්බදු ගිවිසුම හුවමාරු කර ගන්නා අවස්ථාවේ තක්සේරු කල යුතුය. හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ගිවිසුමක ප්‍රකාශ කරන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, සමාගම ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 16 හි කල්බදු නිර්වචනය භාවිතා කරයි, එවිට සමාගම කල්බදු ආරම්භයේදී භාවිතා කිරීමේ අයිතියක් සහ බදු වගකීමක් ඇති බව පිළිගනියි.

